# දිවයින
## ඉරිදා සංග්‍රහය

www.divaina.lk 2022 මැයි මස 01 වැනිදා ඉරිදා කාණ්ඩය 41 - 31 වැනි පත්‍රය මිල රු.130යි




# ජනපති කිව්වොත් මං යනවා

නෝමන් පලිහවඩන 16 - පිටුවට

# මහින්ද නැතිව හදන අන්තර් ආණ්ඩුවේ
# අගමැති තේරීම ජාතික සභාවකින්



පුදීප් ප්‍රසන්න සමරකෝන්

ඉදිරියේදී පිහිටුවනු ලබන නව අන්තර්වාර සර්වපාක්ෂික ආණ්ඩුවේ අගමැතිවරයා සහ කැබිනට් මණ්ඩලය තෝරාපත්කර ගනු ලබන්නේ සියලු පක්ෂවල නායකයන්ගෙන් සැදුම්ලත් ජාතික සභාවක් මගින් යැයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති සහ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා පවසයි. 16 - පිටුවට

ඡායාරූපය - ජූඩ් ඩෙන්සිල් පතිරාජ



## රඹුක්කන ඝාතනයට එස්එස්පී ඇතුළු 4ක් රිමාන්ඩ්

ඒ. ජේ. ඒ. අබේනායක

16 - පිටුවට

## රට ඉන්න සියුන්ට විදෙස් විනිමය යවන්න බැංකු පහසුකම් දෙන්න

ශ්‍යාම් නුවන් ගනේවත්ත 16 - පිටුවට



## හවාලා - උණ්ඩියල් ක්‍රමවලට භාණ්ඩ ආනයනය තහනම්

ශ්‍යාම් නුවන් ගනේවත්ත 16 - පිටුවට

## ලෝක කම්කරු දිනය අද



ජීවන අරගලය හඬනඟා පවසමු
මාවත තනාගන්නට සැවොම නැගිටිමු
දාඩිය හෙලන මිනිසුනි එක්ව ජයගමු
පීඩිත පංතියේ නව යුගය අරඹමු

- අනුරාධ හිරිපිටියගේ

### ගාලුමුවදොර අරගලයට අදට දින 23යි

ගාලුමුවදොර ආරම්භ කර ඇති ජන අරගලයට අදට (01 දාට) දින 23කි. අප්‍රේල් 09 වැනිදා ආරම්භ කළ මෙම ජන අරගල භූමියේදී අදට යෙදෙන ජාත්‍යන්තර කම්කරු දිනය වෙනුවෙන් විශේෂ සැමරුමක් පැවැත්වීමට එහි සිටින තරුණ තරුණියන් කටයුතු යොදා ඇත.

- ඡායාරූපය කමල් බෝගොඩ

## අන්තර්වාර ආණ්ඩුව හදන්න මෙහෙයුම් කමිටුවක්

අකිත පෙරේරා 16 - පිටුවට

## පරක්කු වෙන්න එපා පාසල් සිසුන් එන්නත ගන්න

වෛද්‍ය දීපාල් පෙරේරා

පුදීප් ප්‍රසන්න සමරකෝන් 16 - පිටුවට

## සර්ව පාක්ෂික ආණ්ඩුවකට සැමට ආරාධනා කරන්න

දහදෙනාගේ කණ්ඩායම සගරුවනෙන් ඉල්ලයි

උපාලි ද සේරම් 16 - පිටුවට

## විදේශ මුදල් සංචිතය ලැල්ලටම හිඳිලා

ශ්‍යාම් නුවන් ගනේවත්ත 16 - පිටුවට

## හෙට රජයේ නිවාඩු

චමින්ද සිල්වා 16 - පිටුවට

## පාගමන කොළඹට ළඟා වූ පසු සජබයෙන් කළු මැයි රැලියක්



අකිත පෙරේරා

සමගි ජනබලවේගය මෙවර සම්ප්‍රදායික රතු මැයි රැලියක් වෙනුවට කළු මැයි රැලියක් පැවැත්වීමට පියවර ගෙන ඇත. එය අද (01 දා) කොළඹ නිදහස් චතුරශ්‍රයේ දී පැවැත්වේ.

16 - පිටුවට

## එජාප තරුණ පෙරමුණ අද අරගල බිමට යයි

චමින්ද සිල්වා

අද (01 දා) ට යෙදෙන ජාත්‍යන්තර කම්කරු දිනය නිමිත්තෙන් එක්සත් ජාතික පක්ෂ තරුණ සංවිධානය කොළඹ ගාලුමුවදොර කොඩි කණුව අසලදී වත්මන් ආණ්ඩුවට ඉවත්වන ලෙස බල කරන විරෝධතාවයක් සංවිධානය කර ඇත. 16-පිටුවට

## පරණ ලේකම්ලා තිදෙනෙක් පුටුවේම ඇලවිලා

මනෝජ් අබයදීර

අමාත්‍යාංශ කිහිපයකට නව ලේකම්වරුන් ජනාධිපතිවරයා විසින් පත් කිරීමෙන් පසුව ද හිටපු ලේකම්වරියන් තිදෙනකු, සිය පත්වීම අවලංගු වුවද, ඊට පසුදා ද තමන් කලින් සේවය කළ අමාත්‍යාංශයේ සේවය සඳහා වාර්තා කර තිබේ.

16 - පිටුවට

## ඛනිජ තෙල් තොග ගබඩාව සිමෙන්ති සංස්ථාවට කෝටි 168 ක් පොලු තියලා

ලලිත් චාමින්ද 16 - පිටුවට

## ලයිසන් දීම නවතියි

පාස් වූ ලක්ෂ 3කට තවම කාඩ් නෑ

චමින්ද සිල්වා 16 - පිටුවට

## ජනපති අගමැති මැයි රැලිවලට නෑ

අනුර බාලසූරිය

16 - පිටුවට



## අවසන් එකඟතාවකට සෙසු පක්ෂ සමග සාකච්ඡා කරනවා

අකිත පෙරේරා 16 - පිටුවට



## විපක්ෂයේ බහුතරය පෙන්වන්න සජබ සූදානම්

අකිත පෙරේරා

16 - පිටුවට

දිවයින රු. 130 යි

දිවයින රු. 40 යි

නිෂ්පාදන වියදම් අධික වීම නිසා අද (1 දා) සිට දිවයින ඉරිදා සංග්‍රහයේ මිල රු. 130 ක් වන බව කරුණාවෙන් සලකන්න. එමෙන්ම හෙට (2 දා) සිට දිනපතා දිවයින පත්‍රයේ මිල රු. 40 ක් වන බව ද කාරුණිකව දන්වමු.



## නියෝජ්‍ය කථානායක තෝරා ගැනීම ලබන සතියේ

අකිත පෙරේරා 16 - පිටුවට



## ජවිපෙන් මැයි දින සැමරුම් 4ක්

සිරිමන්ත රත්නසේකර

ජනතා විමුක්ති පෙරමුණ සංවිධානය කරන මැයි දින සැමරුම් උත්සවය කොළඹ ඇතුළු ප්‍රධාන නගර හතරක් කේන්ද්‍ර කරගනිමින් අද (1 දා) පැවැත්වීමට එම පක්ෂය තීරණය කර ඇත. 16 - පිටුවට





SLT-MOBITEL MOBILE PREPAID සහ POSTPAID පාරිභෝගිකයින් හැමෝටම,

හිත ඇති කියනකං SCROLL කරන්න
ඇඟිලි ඇති කියනකං CHAT කරන්න
ඇස් ඇති කියනකං VIDEO බලන්න

ඔබ කැමතිම ඇප් 9ට ඇති වෙනකං data සහ වැඩිපුර 2GB අමතරව.

රුපියල් 398කට #170# අමතා හෝ SELFCARE APP එක හරහා දැන්ම ඇක්ටිවේට් කරගන්න.

*කොන්දේසි සහිතයි.

TRC/M/PRO/20/07

www.sltmobitel.lk

SLTMOBITEL එකම එක සබැඳියාව



# මුහුදු පතුල ශුද්ධ කරන අමුතු ශ්‍රමදානයක්

# උණවටුනෙන් පටන් අරන්

- ව්‍යාපෘතියේ නම "නිල්ධජ වෙරළ තීරය"
- දැනට කිලෝ 600 ක අපද්‍රව්‍ය ඉවත් කරලා

• ලලිත් චාමින්ද

උණවටුන වෙරළ තීරය දෙස් විදෙස් සංචාරකයන්ගේ පාරාදීසයකි. ඒ විතරක් නොව මෙකී වෙරළ තීරය ස්වභාව ධර්මයේ අපූරු නිමවුමකි. ආචාර්ය ආතර් සී. ක්ලාක් විද්වතා පවසන ආකාරයට මෙකී වෙරළ තීරය ලෝකයේ ඇති දර්ශනීය වෙරළ දොළහෙන් එකකි. කවාකාර හැඩයකින් යුතුව වෙරළ තීරය පිහිටා ඇත්තේය. වෙරළ තීරය කිලෝමීටර් එකහමාරක් පමණ දිගය. 2004 වසරේදී මෙය සුන්දරම වෙරළ තීරය බවට පත්විය. ඒ විතරක් නොව 2013 වසරේදී සංචාරක පාරාදීසයන් දහය අතරට උණවටුන සංචාරක කලාපය පත්විය. එමෙන්ම 2015 වර්ෂයේ දී උණවටුන මුහුදු වෙරළ වසරේ ලොව හොඳම මුහුදු වෙරළ ලෙස නම් කොට තිබුණි. ඒ ඇමෙරිකානු ජනමාධ්‍යවේදීන්ගේ සංගමය හා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය එක්ව සිදු කළ සමීක්ෂණයකට අනුවය.

මෙරට සංචාරක ව්‍යාපාරයත් වෙරළ තීරයත් මහ සයුරත් අතර ඇත්තේ වෙන්කළ නොහැකි තරමේ බැඳීමකි. විදේශීය සංචාරකයන් අපේ රටේ වෙරළ තීරයට හා මහ මුහුදට වහවැටී එහි අසිරිය විඳ දරාගැනීම සඳහා මෙරටට පැමිණෙති. කෙසේ වුවද මිනිසුන්ගේ නොයෙකුත් ක්‍රියාකාරකම් නිසා මෙරට වෙරළ තීරය හා මහ සයුර දූෂණයට ලක්වෙමින් ඇත්තේය. මෙරට සමුද්‍ර දූෂණයේ සියයට 90ක් පමණ ගොඩබිම ක්‍රියාවන් තුළින් සිදුවන අතර සියයට 10ක් පමණ නැව් හා මුහුදු ආශ්‍රිත ක්‍රියාවන් මගින් සිදුවේ. මුහුදු ජලයේ ගුණාත්මක බවට හා සාගරයේ සුන්දර බවට මේ තුළින් සිදුවන්නේ දැඩි බලපෑමකි. ඒ විතරක් නොව අපේ රටේ සංචාරක කර්මාන්තයට ද එය මරුපහරකි. කෙසේ වුවද මේ වනවිට උණවටුන වෙරළ තීරයේ සුන්දරත්වය වියැකී ගොස් ඇත්තේය. ඒ මිනිසුන්ගේ නොයෙකුත් ක්‍රියාකාරකම් හේතුවෙනි.

වර්ෂ 2030 වනවිට ශ්‍රී ලංකාවේ ජනතාව හා ශ්‍රී ලංකා ආර්ථිකයෙහි යහපැවැත්ම හා ස්ථායි සංවර්ධනය සඳහා ශ්‍රී ලංකාව වටා දූෂණයෙන් තොර සමුද්‍රීය පරිසරයක් ඇති කිරීම සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ප්‍රධාන දැක්මයි. උණවටුන වෙරළ තීරය නිල් ධජ වෙරළ තීරයක් බවට පත්කිරීමේ කටයුත්තට සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය විසින් මේ වනවිට අතගසා ඇත්තේය. ලංකාවේ ඇති වෙරළ තීරයන් අතුරින් පළමු වරට උණවටුණ වෙරළ තීරය මේ සඳහා තෝරාගෙන තිබේ. ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය මගින් ලබාදී ඇත. නිල්ධජ වෙරළ තීරයක් යනු ලෝකයේ අංක එකේ වෙරළ තීරයකි. නැතහොත් සුදුසුකම් ලත් වෙරළ, තීරයක් සඳහා ලබාදෙන ජාත්‍යන්තර පාරිසරික සම්මානයකි.

ලෝකයේ රටවල් අතර නිල් ධජ වෙරළ තීරයන් දක්නට ඇත්තේ අතළොස්සකි. යම්කිසි වෙරළ තීරයක් නිල්ධජ වෙරළ තීරයක් බවට පත්කර ගැනීම සඳහා නිර්ණායක 32ක් සපුරාගත යුතු වේ. වෙරළ තීරයේ පිහිනුම් ජලයේ ගුණාත්මකභාවය, පාරිසරික අධ්‍යාපනය සහ තොරතුරු, පාරිසරික කළමනාකරණය, ජීවිත ආරක්ෂාව සහ සේවා යන මාතෘකා යටතේ මෙම නිර්ණායක එකතු කර ඇත. වෙරළ තීරයේ ඇති සියලුම සනීපාරක්ෂක පහසුකම් පැකේජ පවිත්‍රාගාරයට හෝ නාගරික පවිත්‍රාගාරයට සම්බන්ධ කිරීම අනිවාර්ය නිර්ණායක අතර වේ. නිල් කොඩි අපේක්ෂක වෙරළ තීරයන් සඳහා නාන ජල තත්ත්ව රෙගුලාසියට අනුකූලව, සෑම දින 15 කට වරක් මුහුදු ජල සාම්පල ලබා ගන්නා අතර ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක විශ්ලේෂණය සිදු කරනු ලැබේ.

උණවටුන වෙරළ තීරය සඳහා මෙකී නිර්ණායක සපුරාගැනීම සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය මගින් මේ වනවිට වෙරළ තීරය තුළ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතී. ජල සාම්පල්වල තත්ත්වය පරීක්ෂා කිරීම ද සිදුකරමින් පවතී. මේ සඳහා උණවටුන සංචාරක කලාපයේ හෝටල් හිමියන්ගේ, පිහිනුම් මධ්‍යස්ථාන හිමිකරුවන්ගේ සහයෝගය හිමිවී ඇත. ඒ විතරක් නොව නිල්ධජ සංකල්පය යථාර්ථයක් බවට පත්කර ගැනීම සඳහා නිල්ධජ ප්‍රජා ග්‍රාමීය කමිටුවක් පිහිටුවා ඇති අතර මීට අමතරව රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් ද පත්කොට ඇත. මෙකී ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර උණවටුණ වෙරළ තීරය ආශ්‍රිතව මුහුදු පතුල නිරීක්ෂණය කොට අවශ්‍ය දත්ත ලබාගැනීමට සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ගාල්ල දිස්ත්‍රික් කාර්යාලයේ සමුද්‍ර පරිසර නිලධාරි හා සමුද්‍ර විද්‍යාඥ සඳුන් වික්‍රමසිංහ මහතා ඇතුළු පිරිසක් විසින් කටයුතු කරණු ලැබීය. ඒ සඳහා නිල්ධජ ප්‍රජාමූල කමිටුවේ සභාපති රිදීවිලා හෝටලයේ හිමිකරු සුමිත් උඹෙසිරි මහතාද එක්විය.

**මෙකී ව්‍යාපෘතිය භාරව කටයුතු කරනු ලබන්නේ සමුද්‍ර පරිසර නිලධාරි හා සමුද්‍ර විද්‍යාඥ සඳුන් වික්‍රමසිංහ මහතාය. ඔහු අප සමග කතාබහ වැටුණේය.**

උණවටුණ වෙරළ තීරය නිල්ධජ වෙරළ තීරයක් බවට පත්කිරීමේ බලාපොරොත්තුවෙන් තමයි අපි මෙම ව්‍යාපෘතිය ආරම්භ කළේ. උණවටුණ මුහුදු තීරය ආශ්‍රිතව පරියේෂණයක් සිදුකරලා තිබුණේ නැහැ. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සභාපතිතුමිය, සාමාන්‍යාධිකාරිතුමා, දකුණු පළාත් භාර අධ්‍යක්ෂිකා රේණුකා රණවීර මහත්මියගේ උපදෙස් මත දින 04ක් තිස්සේ උණවටුණ මුහුදු පතුළ ගැන පර්යේෂණයක් කළා. කොරල්පර, වැලි තට්ටු තිබෙන ස්ථාන හඳුනා ගත්තා. කොරල්පර නම් මියගොස් තියෙන්නේ. අලුතෙන් කොරල්පර වගාකළ යුතුයි. උණවටුණ වෙරළ තීරය ආශ්‍රිත මුහුදු පතුල තුළ අපද්‍රව්‍ය කඳු ගොඩගැසී තිබුණා. මූලික පියවර වශයෙන් මුහුදු පතුලේ ගොඩගැසී ඇති අපද්‍රව්‍ය කඳු ඉවත් කිරීමට තමයි අපි කටයුතු කළේ මේ සඳහා උණවටුණේ පිහිනුම් මධ්‍යස්ථාන මගින් විශාල සහයෝගයක් ලබා දුන්නා. මුහුදු පතුලේ තිබී ටයර්, ප්ලාස්ටික් කැබලි රෙදි කැබලි, ස්ලෝන් බට ආදි අපද්‍රව්‍ය කිලෝ 600ක් විතර ඉවත් කිරීමට කටයුතු කළා. වෙරළ තීරය තුළ තිබී පොලිතින් බියර් කෑන් වීදුරු බෝතල් 150ක් පමණ ඉවත් කිරීමට කටයුතු කළා. සෑම මාසයකට වරක් මුහුදු පතුල හා වෙරළතීරය පිරිසිදු කිරීමට අපි බලාපොරොත්තුවෙනවා. මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ හා තොරතුරු තාක්ෂණ පීඨයේ ඉගෙනුම ලබන සිසුන් 100 දෙනකු පමණ මේ සඳහා එක්වුණා. එම සිසුන් විසින් rotaract club යනුවෙන් සංවිධානයක් පිහිටුවාගෙන තියෙනවා. එම සිසුන් මෙකී ශ්‍රමදානය සඳහා සිය දායකත්වය ලබා දුන්නා. මේ සඳහා හබරාදූව ප්‍රාදේශීය සභාව, පොලිසිය උණවටුණ සංචාරක හෝටල් හිමියන්ගේ සංගමය, උණවටුන සුළු හා මධ්‍ය පරිමාණ සංචාරක ව්‍යවසායකයන්ගේ සංගමය, උණවටුන කිමිදුම් ආයතන මේ සඳහා විශාල සහයෝගයක් ලබා දුන් බව සඳුන් වික්‍රමසිංහ මහතා සඳහන් කළේය.



සඳුන් වික්‍රමසිංහ



සුමිත් උබේසිරි

**උණවටුන වෙරළ තීරය නිල්ධජ වෙරළ තීරයක් බවට පත්කිරීමේ කටයුත්තට උණවටුන නිල්ධජ ප්‍රජා කමිටුවේ සභාපති හා උණවටුන සංචාරක හෝටල් හිමියන්ගේ සංගමයේ ලේකම් රිදීවිලා නිකේතනයේ හිමිකරු සුමිත් උබේසිරි මහතා සුවිශේෂීවූ දායකත්වයක් ලබාදෙති. ඔහු මෙකී ව්‍යාපෘතිය ගැන කීවේ මෙවැනි කතාවකි.**

නිල්ධජ වෙරළ ව්‍යාපෘතිය සාර්ථක කරගැනීම සඳහා අපි ගොඩක් මහන්සි වෙනවා. උණවටුන වෙරළ තීරය නිල්ධජ වෙරළ තීරයක් බවට පත්වුණාට පසු මෙහි සංචාරක කර්මාන්තය තුළ විශාල පරිවර්තනයක් ඇතිවෙනවා. කොටින්ම කිවහොත් උණවටුණේ සංචාරක කර්මාන්තය උඩුයටිකුරු වෙනවා. මේ සඳහා අනුමැතිය ලබාගැනීමට වසර තුනක් විතර යනවා. දැනට මේ සඳහා ඉල්ලුම්කොට තියෙනවා. ඒ සඳහා අවශ්‍ය නිර්ණායක මේ කාලය තුළදී සපුරාගත යුතු වෙනවා. වෙරළ තීරය පමණක් නෙවෙයි වෙරළ තීරය ආශ්‍රිත මුහුදු පතුලත් පිරිසිදු කළ යුතුයි. එම කාර්යයට තමයි අපි අතගසා තියෙන්නේ. ඇත්තටම උණවටුන මුහුදු පතුල යට තියෙන්නේ සුන්දර ලෝකයක්. එම සුන්දරත්වය දෙගුණ තෙගුණ කිරීම තමයි අපේ අරමුණ. මෙකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු මෙකී ප්‍රදේශයේ යටිතල පහසුකම් දියුණුවෙලා විශාල සංවර්ධනයක් ඇතිවේවි. ඉදිරියේ දී මුහුදු පතුලේ ගල්මල් වගාකිරීමට ද කටයුතු කරනවා යැයිද සුමිත් උබ්සෙරි මහතා කීවේය.












## ලුහුඬු දැන්වීම්

### රැකියා ඇබෑර්තු - ගෘහ සේවය

අවුරුදු 80 ට වැඩි වයෝවෘද්ධ දෙමාපිය යුවළකට ආහාරපාන සැකසීමට/ නිවස පිරිසිදු කිරීමට කාන්තාවක් අවශ්‍යයි. වැටුප 30,000/= යි. 0716990664/ 0718950724


01/6667

### වඩුවැඩ

කඳාන අවට වඩුමඩුවකට පළපුරුදු වඩු බාස්වරු අවශ්‍යයි. ආහාර, නවාතැන් පහසුකම් සැපයේ. වැටුප් සාකච්ඡා කරගත හැක. අමතන්න 0760285203, 0713117865

01/6668

## තිස්ස කොරතොටගේ අරගලයක සැඟවුණු කතා පොත එළිදකී



රෝහණ විජේවීර ඝාතනය කොට වසර 20 ක් පමණ ගතව ගොස් තිබුණ ද පෝල් පීරිස් සතු ඒ මතකයන් හා සම්පත් ලංකාවේ කිසිම මාධ්‍යයකින් හෝ කිසිම පුද්ගලයකුගෙන් එතෙක් මා දැක තිබුණේ නැත. 1977 වැනි ඈත කාලයක යාපනයේ රැස්වීමකදී විජේවීරට එල්ල වන ගල් පහරකින් හිස තුවාළ වී ලේ ගලන අයුරු ද ගමනායක පැමිණ විජේවීර වැළැඳ ගන්නා අයුරු ද රැඳි සජීවී වීඩියෝ පටය ද ඔහු සතු විය. ලංකාවට පැමිණි වතාවක ඒ අවස්ථාව එම රැස්වීමේදීම වීඩියෝ ගත කර තිබුණේ ද ඔහු විසිනි. පෝල් පීරිස් යළි එංගලන්තයට යන්නට පෙර මා ඔහුගෙන් බොහෝ කරුණු හා ඡායාරූප ලබා ගෙන ලිපි මාලාවක් ලියන්නට තීරණය කළෙමි. ඒ අනුව 2008 නොවැම්බර් 23 වැනිදා එහි මුල්ම ලිපිය ''දිවයින ඉරිදා'' පුවත්පතේ පළ විය. පසු කාලයක බොහෝ දෙනකු උපුටා දක් වූ විජේවීරගේ හිසින් ලේ ගලන යාපනයේ පින්තූරය මුලින්ම පළ වුයේ ඒ ලිපියේය.

## කාලයේ තාලයට වෙනස්වෙන මාස්ක්





මුහුණු ආවරණය අප අතර වඩාත් සමීප වූයේ කොවිඩ් වසංගත තත්ත්වය සමගයි. ඒ සෞඛ්‍යාරක්ෂිත පිළිවෙතක් ලෙසින් වුණත් අතීතයේදී මුහුණු ආවරණය භාවිත කර ඇත්තේ වෙස් වලා ගැනීමේ උපක්‍රමයක් ලෙසින් බවත් වාර්තා වෙනවා. ක්‍රි.පූ 6 වැනි සියවසට අයත් පර්සියානු සොහොන්කොත්වල මුඛයට ඉහළින් ආවරණ පැළඳ සිටින සිතුවම් දක්නට ලැබෙනවා. 13 වැනි සියවසේදී චීනයේ මෙහෙකරුවන්ගේ ප්‍රශ්වාස වාතය අධිරාජ්‍යවාදීන්ගේ ආහාරවලට එක් වී එහි රසය සහ සුවඳ වෙනස් වීමට ඉඩ ඇති නිසා ඔවුන් අනිවාර්යෙන්ම වියන ලද රෙදි වර්ගයකින් මුහුණ වසා ගෙන සිටි බැව් මාර්කෝපෝලෝ සඳහන් කරනවා.

**• කුරුළු හිස වැනි මුහුණු ආවරණ**

14 වැනි සියවසේදී (1347-1351) යුරෝපයේ ව්‍යාප්ත වුණ බ්ලැක් ඩෙත් (කළු මරණය) වසංගත සමයේදී සෞඛ්‍ය හේතු මත මුහුණු ආවරණ පැළඳීමේ ප්‍රවනතාව ඇති වුණා. න්‍යායචාරීන්ගේ අදහසට අනුව විෂ වාතය ඔස්සේ සිරුරට ඇතුළු වීම නිසා ශාරීරික තරලවල ඇති වෙන අසමතුලිතතාවය රෝග ඇති වීමට හේතු වෙනවා. ඒ නිසා සුවඳ මල් ආඝ්‍රානය කිරීම සහ මුහුණු ආවරණයක් පැළඳීමට ඔවුන් උනන්දු වුණා. විෂ මීදුමට ප්‍රතිරෝධය දැක්වීම සඳහා මුහුණු ආවරණයේ හොට සහිත කොටස ඖෂධ පැළෑටි සහ සුවඳ ද්‍රව්‍යවලින් පුරවනු ලැබුවා.

**• ලන්ඩන් දුමාරය**

18 වැනි සියවසේදී ඇති වුණ කාර්මික විප්ලවයේ අතුරු ප්‍රතිඵලයක් ලෙසින් කර්මාන්තශාලාවලින් දුමාරය පිටවීම වැඩි වීම සහ නිවෙස්වල ගල් අඟුරු දහනය වීමෙන් විෂ දුම් පරිසරයට එකතු වීම වැඩි විය. ශීත සෘතුවලදී ලන්ඩනයේ අහස කළු පැහැති දුමාරයකින් පිරී ගොස් තිබුණ බැව් වාර්තා වේ. 1952 වසරේ දෙසැම්බර් මාසයේදී දුමාරය දරා ගත නොහැකිව පුද්ගලයන් 8000 කට ආසන්න සංඛ්‍යාවක් මියගිය බැව් වාර්තා වෙනවා.

**• විලාසිතාවක් ලෙසත්**

අපට බොහෝ දේවල් අනුගමනය කිරීම අපහසු වුණත් ඒවා විලාසිතාවක් බවට පත් වීමෙන් පසුව ඉතා පහසුවෙන් අනුගමනය කිරීමේ හැකියාව ලැබෙනවා. එය කිසිම වෙහෙසක් නොමැතිව සිදු කළ හැකි කටයුත්තක් වූ විට අප තුළින්ම ඒ සඳහා උනන්දුව ඇති වෙනවා. යුරෝපයේ තොප්පි විලාසිතාව මෙන් ''දුම් විරෝධී'' මුහුණු ආවරණය විලාසිතාවක් බවට පත් විය. වික්ටෝරියානු රාජ්‍ය කාලයේදී ලන්ඩන් නගරයේ කාන්තාවන් තොප්පිවලට අමුණන ලද වේලයකින් මුහුණු වසා ගත්තා.

**• ගෑස් ප්‍රතිරෝධී මුහුණු ආවරණ**

කාර්මික විප්ලවය සමග කර්මාන්තශාලාවලින් නිකුත් වෙන දුම සහ නිවෙස්වල ගල් අඟුරු දහනය කිරීම නිසා වායු දූෂණය වැඩි වුණා. සමාජයේ සිදු කරන ලද පර්යේෂණයන්ට අනුව රථවාහන බහුල වීම නිසා නාගරික කලාපයන්හි වායු දූෂණය වැඩි වුණා.

වායු විමෝචනයේ කොටසක් ලෙසින් නයිට්‍රජන් ඔක්සයිඩ් සහ රබර් සහ කුඩා ලෝහ කොටස් වාතයට එකතු වෙනවා. පාපැදි කරුවන් පවා වායු දූෂණයෙන් ආරක්ෂාවට මුහුණු ආවරණ පැළඳීමට යොමු වුණ අතර 1971 වසරේදී පමණ ගෑස් ප්‍රතිරෝධී මුහුණු ආවරණ පැළඳ සිටි රියැදුරන් ගැනත් වාර්තා වෙනවා. දෙවැනි ලෝක යුද සමයේදී ක්ලෝරින් සහ අබ ගෑස් භාවිතය සිදු වුණ අතර එයින් ආරක්ෂාව ලැබීමට හමුදා නිලධාරීන්ට මෙන්ම සාමාන්‍ය ජනතාවටත් ගෑස් ප්‍රතිරෝධී මුහුණු ආවරණ රජය විසින්ම ලබා දීමට කටයුතු කරනු ලැබුවා.

• පුනයා චාන්දනි ද සිල්වා

# අරගලය අස්සේ පිස්සු කෙළින මිනිස්සු...



**අරගලය විකුණා රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක් ද විශාල ලෙස මුදල් උපයාගෙන තිබේ. එම සංවිධානවල පිරිස් අරගල භූමියේ පැය කිහිපයක් පෙනී සිටිමින් රාත්‍රි කාලයේ කොළඹ අවට තරු පහේ හෝටල්වල සුර සැප විඳින බවට ද අනාවරණය වී තිබේ.**

‘ගෝටා ගෝ හෝම්’ යන සටන්පාඨය යටතේ වර්තමාන ආණ්ඩුවට සහ එහි පාලකයින්ට විරෝධය පාමින් ගාලු මුවදොර පිටියට ජනතාව එක්රැස්වී සති තුනකුත් ඉක්ම ගොසින්ය. එලෙස අරගල කිරීමේ අයිතියක් ජාති ආගම් භේද නොසලකා ජනතාවට හිමිව තිබේ. මෙම ලිපිය ලියන මොහොත වන විටත් එම අරගලය ක්‍රියාත්මක වෙමින් පවතී. වර්තමාන රජයට සහ එහි පාලකයින්ට විරුද්ධව ගාලු මුවදොර පිටියේ පවත්වාගෙන යන අරගලය පිළිබඳව අපි කිසිවක් නොකියමු. එහෙත් අරගලයට මුවාවී තම තමන්ගේ පෞද්ගලික මෙන්ම වෙනත් අවශ්‍යතාවයන් සපුරා ගන්නා පිරිසක්ද එම භූමියෙන් බිහිවී තිබේ. එවැනි පිරිස් නිසා සැබෑ අරගලකරුවන් දෙසද ජනතාව වපර ඇසින් බැලීමට පටන් ගෙන තිබේ. මෙම ලිපියේ ප්‍රධාන අරමුණ අරගල භූමිය අල කිරීමට පැමිණි එම පිරිස් ගැන හෙළිදරව් කිරීමයි.

තිලන්ත බම්බලපිටිය ප්‍රදේශයේ ජීවත්වන පුද්ගලයෙකි. සම්බාහන මධ්‍යස්ථාන කිහිපයක අයිතිකරුවෙකි. ඔහු ද පසුගිය දින ගාලු මුවදොර පිටියේ පැවැත්වෙන උද්ඝෝෂණයට කිහිප වතාවක්ම සහභාගි විය. ඔහුගේ සැබෑ අරමුණ වූයේ උද්ඝෝෂණයට සහය වීම නොව ඒ හරහා තම පෞද්ගලික අවශ්‍යතාවයන් ඉටුකර ගැනීමයි. ඒ අනුව දින කිහිපයක් ඔහු උද්ඝෝෂණ භූමිය නිරීක්ෂණය කළේය. එලෙස නිරීක්ෂණය කළ ඔහු දිනක් තම සම්බාහන මධ්‍යස්ථානයක කළමනාකරුවකු සමඟ මෙලෙස සාකච්ඡා කළහ.

"අනිල් පහුගිය දවස් දෙක තුනේ මම හිටියේ ගෝල්ෆේස් එකේ."

"එහෙමද සර්. රට වෙනුවෙන් මිනිස්සු එතන හොඳ අරගලයක් කරනවා නේද?"

"රට වෙනුවෙන් අරගල කරන පිරිස අතරේ ආතල් එකට එතැනට යන එන පිරිසකුත් ඉන්නවා."

"ඇත්තද?"

"ඔව් ඔව් මම හොඳටම දැක්කා."

"අපේ මිනිස්සු කොහොමත් එහෙමනේ."

"ඒක නොවෙයි මම කියන්න ගත්තේ."

"එහෙනම් මොකක්ද සර්."

"අපේ ස්පාවලට මේ දවස්වල බිස්නස් අඩුයි නේද?"

"ඔව් බිස්නස් නම් ටිකක් අඩුයි."

"අපි මෙහෙම වැඩක් කරමු."

"ඒ මොකක්ද සර්."

"අපේ වැඩ කරන කෙල්ලො ටිකක් උද්ඝෝෂණය කරන තැනට දාමු. එතනට එනවා කාලා බීලා ආතල් ගන්න සෙට් එකකුත්."

"ඉතින් අපේ කෙල්ලෝ ගිහින් මොනවා කරන්නද?"

"කරන්න තියෙන්නෙ මෙච්චරයි. එතන ආතල් ගන්න එන අයත් එක්ක සෙට් වෙන එක විතරයි. ඊට පස්සේ කෙල්ලන්ට කියන්න උන් එක අපේ හොටෙල් එකට එන්න කියලා. එතකොට අරගලය අස්සේ අපේ බිස්නස් එකත් කරගෙන යන්න පුළුවන්."

"ඒක හරි යයිද සර්."

"හරි යන්නේ නැත්තෙ මොකද? රෑට පාරවල්වල ඉන්න කෙල්ලොත් එතනට බැහැලා ඉන්නේ. මාර ඉල්ලුමක් ඒගොල්ලන්ට තියෙන්නේ. වයසක මිනිස්සු හිටන් ඒ කෙල්ලොත් එක්ක යනවා."

"මම දැනං හිටියෙ නැහැනේ එහෙම එකක්."

"ඒකනෙ කියන්නෙ අනිල් මොලේ පොඩ්ඩක් කල්පනා කරලා වැඩ කරන්න කියලා. අපේ ඉන්න කෙල්ලන්ගෙන් බාගයක් විතර හෙට ඉඳන් ගෝල්ෆේස් එකට යවන්න. දවස් දෙක තුනක් බලමු මොකද වෙන්නේ කියලා. මම හිතන්නේ නැහැ අපිට වරදියි කියලා. ඒ එක්කම කෙල්ලන්ට දෙන්න ඕනා උපදෙස් ටිකත් දන්නවනේ."

"හරි සර් ඒ ගැන බයවෙන්න එපා සේරම වැඩ ටික මම බලාගන්නම්."

සම්බාහන මධ්‍යස්ථාන හිමිකරුගේ කීමට අනුව පසුදිනම අනිල් ඒවායේ සේවය කරන තරුණියන් කිහිප දෙනෙකු ගාලු මුවදොර පැවැත්වෙන උද්ඝෝෂණ භූමියට පිටත් කර හැරියේය. එලෙස ගිය තරුණියන් හිමිකරුත් නොසිතූ අයුරින් ආදායම් උපයා දුන්නේය. එතැන ආතල් ගැනීමට පැමිණි සිටි පිරිස් සම්බාහනයට පමණක් නොව මුදලට යහන් ගතවීමට ද තරුණියන්ව මිලදී ගෙන තිබුණහ. එතැන් පටන් එම සම්බාහන මධ්‍යස්ථානවල හිමිකරු බහුතරයක් තරුණියන් යවා තිබුණේ උද්ඝෝෂණය හරහා තම ආදායම තර කරගැනීම සඳහාය.

තවත් කිහිපයක් ගතවෙද්දී මෙය රැල්ලක් බවට පත්විය. කොළඹ අවට බොහෝ සම්බාහන මධ්‍යස්ථානවල සේවය කරන තරුණියන්, රාත්‍රි සමාජශාලාවල සේවය කරන තරුණියන් දැන් සිටින්නේ අරගල භූමියේය. ඒ අරගලය කරන මුවාවෙන් සැප ගැනීමට පැමිණි පිරිස් මුදලට සතුටු කිරීමටයි. තවද කොළඹ පමණක් නොව තදාසන්න ප්‍රදේශවල සිටින වීදි ගණිකාවන්ද බහුතරයක් දැන් සිටින්නේ අරගල භූමියේය.

ඔවුන් එලෙස කිසිදු බාධාවකින් තොරව තම වැඩකටයුතු කරගෙන යද්දී තවත් තැරැව්කරුවන් පිරිසක් ඒ අවට හෝටල්වල තරුණියන් රඳවාගෙන සුරූපී නිළියන් සිටින බව පවසමින් අරගල භූමියේ සිටින විවිධ වයස් කාණ්ඩවල පිරිමින්ට මුදලට විකුණති. අරගලය මුවාවෙන් සැප ගැනීමට පැමිණි සමහර පිරිස් අත දිග හැර මුදල් වියදම් කරමින් මෙම තරුණියන් සමඟ යහන් ගතවේ.

අරගල භූමියේ තරුණියන් එලෙස මුදලට විකිණෙද්දී තවත් පිරිසක් ඉතාමත් සූක්ෂම ලෙස එහි මත්ද්‍රව්‍ය විකුණති. අයිස්, හෙරොයින්, ගංජා සහ තවත් විවිධ වර්ගයේ මත් පෙති අරගල භූමියේදී කිසිම අපහසුතාවයකින් තොරව මිලදී ගත හැකිය. සවස් කාලය වන විට මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූ බොහෝ පිරිසක් එහි යන්නේ එම මත්ද්‍රව්‍ය මිලදී ගැනීමටයි. එලෙස මිලදී ගන්නා මත්ද්‍රව්‍ය බහුතරයක් පිරිස එම අරගල භූමියේ සිටම භාවිතා කරති. මෙම මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් බහුතරයක් මුස්ලිම් අය වෙති.

තවත් බඩගෝස්තරවාදීන් පිරිසක් අරගලයේ මුවාවෙන් විදේශික ශ්‍රී ලාංකිකයන්ගෙන් සල්ලි ගරා ගැනීමේ ජාවාරමක ද නියැළී සිටිති. උද්ඝෝෂණයේ නියැළෙන ජනතාවට අවශ්‍ය ආහාර වැනි දෑ සැපයීම සඳහා යැයි කියමින් මෙම පිරිස් මුදල් එකතු කර තිබේ. ඒ සඳහා සාක්ෂි ද අප සතුව තිබේ. තවද මෙරට ප්‍රසිද්ධ යූ ටියුබ් ක්‍රියාකරුවන් පිරිසක්ද මෙලෙස අයථා ලෙස මුදල් උපයාගෙන ඇත. එයින් එක් අයෙක් විහිළු සපයන්නෙක් වන අතර අනෙක් පුද්ගලයා අපරාධකරුවකු ලෙස ද හැඳින්වේ.

අරගලය විකුණා රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක් ද විශාල ලෙස මුදල් උපයාගෙන තිබේ. එම සංවිධානවල පිරිස් අරගල භූමියේ පැය කිහිපයක් පෙනී සිටිමින් රාත්‍රි කාලයේ කොළඹ අවට තරු පහේ හෝටල්වල සුර සැප විඳින බවට ද අනාවරණය වී තිබේ.

මෙම අරගලයේ භයානකම තත්ත්වය වන්නේ විවිධ ආගම්වල අන්තවාදීන් පිරිසක් සහ සංවිධාන කිහිපයක් එකතුවී අනෙක් ආගම් එළිපිටම විවේචනය කිරීමයි. ඔවුන්ගේ ප්‍රධාන ඉලක්කය වී ඇත්තේ බුද්ධාගමයි. එම අන්තවාදී පිරිස් සහ සංවිධාන නොයෙක් ආකාරයෙන් විවිධ උපක්‍රම යොදා අරගලය අස්සේ බුද්ධාගම විනාශ කිරීමේ කුමන්ත්‍රණයක ද නියැලෙමින් සිටිති. ඒ සඳහා සමාජයේ පිළිගත් පුද්ගලයන් මුදලට ද මිලදී ගෙන ඔවුන් හරහා ද මෙම කර්තව්‍ය සිදු කරගෙන යමින් සිටී. රටේ අහිංසක ජනතාව යුක්තිය වෙනුවෙන් සිදුකරන අරගලය ඔස්සේ ආගම්වාදය පතුරවා හැරීමට වෙර දරන පුද්ගලයන් හා සංවිධාන තරයේ හෙළා දැකිය යුතුය.

අහිංසක මිනිස්සුන්ගේ දහඩිය කඳුළින් ඇරඹුණු මෙම උද්ඝෝෂණය සැබෑවක් කර ගැනීමට නම් තම බඩගෝස්තරය ගැන සහ විවිධ න්‍යාය පත්‍ර ගැන සිතමින් ඒවා ක්‍රියාත්මක කර ගැනීමට වෙර දරණ අපතයින් අරගලය භූමියෙන් එළවා දැමිය යුතුය. එලෙස එළවා දැමූ පසු මෙරට අහිංසක ජනතාවගේ සැබෑම අරගලය මෙය වනු ඇත.

● ගයාන් සමරසිංහ


## පහසු, වේගවත්, සුරක්ෂිතව, වෙලාවටම, සැමවිටම!




**Sampath Vishwa Corporate** හරහා ඔබේ වැදගත්ම **රාජ්‍ය ගෙවීම් කටයුතු** සිදු කරන්න

**EPF/ETF, රේගු, වරාය අධිකාරිය, දේශීය ආදායම්, BOI සහ ඉලෙක්ට්‍රොනික අධිවේගී මාර්ග ගාස්තු ගෙවීම් ඇතුළුව වැදගත්ම රාජ්‍ය ගෙවීම් කටයුතු වගකීමෙන් කිරීමේදී එකී සියලුම ආයතන සඳහා හරි වෙලාවට හැම විටම ගැළපෙන සරල, ලාභදායී සහ ආරක්ෂිත ඔන්ලයින් විසඳුම**

**Sampath Vishwa Corporate අනෙකුත් සේවා:**

- ණයවර නිකුත් කිරීම් සහ අනෙකුත් වෙළෙඳ සේවා
- බාධාවකින් තොරව බිල්පත් ගෙවීම්
- ඕනෑම බැංකුවකට මුදල් හුවමාරු කිරීම් එවෙලේම
- පහසු මූල්‍ය කළමනාකරණ සේවා
- මූල්‍ය සැපයුම් දාම කළමනාකරණය (ERP පද්ධතිය වෙත සෘජු සබඳතාවය)
- සුළු මුදල් ගෙවීම සඳහා වූ ජංගම මුදල් සේවාව (Mobile Cash Service)
- වැටුප් කළමනාකරණය සහ තවත් බොහෝ දේ

ආයතනික සහ පෞද්ගලික අවශ්‍යතා සඳහා ඔබේ දෛනික ගෙවීම් පහසු කිරීමට Sampath Vishwa Corporate හරහා සම්පත් බැංකුව කටයුතු කරනු ලබයි.

වැඩි විස්තර සඳහා අමතන්න:
**0112 30 30 50** හෝ **www.sampath.lk** හෝ
ළඟම සම්පත් බැංකුව වෙත **පිවිසෙන්න.**

Sampath VISHWA ONLINE BANKING

සම්පත් බැංකුව ෆිච් රේටිංස් AA-(lka) ශ්‍රේණිගතයි.

සම්පත් බැංකුව
හෙට දින එළිය කරයි



# ලෙඩට බෙත් නෑ... කියන්න ආණ්ඩුවක් නෑ...

මේ වන විට රට තුළ නිර්මාණය වී ඇති ඖෂධ හිඟයේ ප්‍රතිඵලයක් ලෙස සමස්ත රෝහල් පද්ධතියටත් රෝහල් පද්ධතියේ ප්‍රධාන බලකණු සියල්ලත් පිරිහී යමින් පවතී. සෞඛ්‍ය අමාත්‍යාංශයේ මධ්‍යම සැපයුම් ඒකකය තුළ ඖෂධ ඇස්තමේන්තු කල්තියා හඳුනාගැනීම සඳහා ඉතා පැහැදිලි ක්‍රමවේදයක් පැවතිය දී මෙයට අවශ්‍ය සැපයුම් සම්බන්ධව සිදුකරන පූර්ව අනතුරු ඇඟවීම් පවා නොසලකා දැඩි සෞඛ්‍ය අර්බුදයක් නිර්මාණය වූයේ කෙසේ දැයි විමසිල්ලට ලක්කළ යුතුය. මෙහි එක් සාධකයක් ලෙස රටේ ආර්ථික අර්බුදය හෙවත් ඩොලර් අර්බුදය පවතින බව අපි පිළිගන්නා නමුත් එම හේතුව නිසාම මෙයාකාර දැඩි සෞඛ්‍ය අර්බුදයක් නිර්මාණය වූ බව පිළිගැනීමට අප සූදානම් නැත.

මෙම ඖෂධ හා ශල්‍යකර්ම සඳහා භාවිතා වන උපකරණ සහ රසායනාගාර පරීක්ෂණ සඳහා භාවිත කරන රසායන ද්‍රව්‍ය හිඟය නිසා මේ වන විට කොළඹ ජාතික රෝහල ද ඇතුළු සමස්ත සෞඛ්‍ය පද්ධතියම කඩාවැටීමේ අනතුරකට මුහුණ පා ඇත. දැනට ඉතා සුළු වශයෙන් ලැබෙන ආධාර මත සෞඛ්‍ය පද්ධතිය පවත්වාගෙන යන නමුත් මෙම තත්ත්වය අඛණ්ඩව සිදු වෙතැයි අපේක්ෂා කළ නොහැක. ඒ නිසා හැකි ඉක්මනින් ඇතිවී තිබෙන ව්‍යාකූල තත්ත්වය විසඳීම සඳහා හදිසි ප්‍රතිචාර ඖෂධ සැපයුම් යෝජනා ඉදිරිපත් කිරීම වඩා වැදගත් වෙයි.

සාමාන්‍ය ක්‍රමවේදය යටතේ ඖෂධ මිලදී ගැනීම වෙනුවට දැනට බොහෝ රෝහල් මගින් ඖෂධ හදිසි මිලදී ගැනීම් හෝ බාහිර මිලදී ගැනීම් ලෙස සිදු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සාමාන්‍යයෙන් ගෙවන මුදල මෙන් සියයට 1300 ඉක්මවා මුදලක් හෝ ඊටත් වඩා වැඩි මුදලක් ගෙවීමට සිදුවන බව අප විසින් සිදුකරන ලද අධ්‍යයනවලින් හෙළිවූ අතර නිදසුනක් ලෙස මාලිගාවත්ත වකුගඩු රෝහලේ අධ්‍යක්ෂ වෛද්‍ය චාර්ල්ස් නුගවෙල මහතා විසින් තමා අත්සනින් නිකුත් කරන එම ලිපිය පරීක්ෂා කිරීමේදී ඉතා පැහැදිලිව පෙනී යනුයේ සාමාන්‍ය ක්‍රමවේදය යටතේ වෛද්‍ය සැපයුම් අංශය මිලදී ගන්නා මුදල මෙන් සියයට 1300 ඉක්ම වූ විශාල මුදලක් බොහෝ ඖෂධ සඳහා හදිස්සි මිලදී ගැනීම් ලෙස ගෙවීමට සිදුව ඇති බවයි. බොහෝ විට මසකට හෝ මාස තුනක කාල සීමාව සඳහා එම ඖෂධය තොග දස දහස් ගණනින් අවශ්‍ය වන තත්ත්වයක් යටතේ එක වරකට වැය වන මුදල රුපියල් මිලියන ගණනක් බව එම ලිපිය පරීක්ෂාවේ දී ඉතා පැහැදිලිව අනාවරණය වේ. රට දැවැන්ත ආර්ථික අර්බුදයකට මුහුණ පා සිටි අවස්ථාවකදී මෙය කිසිසේත්ම දරාගත නොහැකි බව අපගේ විශ්වාසයයි. තවද මෙහිදී එක් රෝහලක පමණක් ඖෂධ විශ්ලේෂණයක් නියැදියක් ලෙස ඔබට ඉදිරිපත් කරන අතර මේ අන්දමට ලංකාවේ සියලුම රෝහල් පද්ධතිය මගින් හදිසි මිලදී ගැනීම් සඳහා මාසිකව වියදම් වන මුදල සමහර විට අපේ රටේ විදේශ ණය සංචිත ගෙවා දැමීමට තිබෙන මුදල කට ආසන්න ප්‍රමාණයක් තරම් ඉහළ අගයක් වීම ඉතා කනගාටුදායක කරුණකි. මෙහිදී අප විසින් කරුණු සාරාංශ ගත කිරීම සඳහා එක් රෝහලකින් පමණක් බාහිර මිලදී ගැනීම් සඳහා වැයවෙන මුදල දක්වා ඇති නමුත් මේ අන්දමට ලංකාවේ සියලුම රෝහල් පද්ධතීන් ඒකාබද්ධව බාහිර මිලදී ගැනීම් සිදුකරන්නේ නම් රටට අහිමි වන ජාතික ධනය ගණනය කළ නොහැකි ප්‍රමාණයක් බව අවබෝධ විය යුතුව ඇත.

වසරකට ඖෂධ සඳහා වැය වූ මුදල රුපියල් බිලියන 3000 ක් වූ අතර මේ වන විට එම මුදල රුපියල් මිලියන 6000 ක් 8000ක් වැනි ඉතා ඉහළ අගයකට පත්වෙමින් පවතී. මෙය ඉතා ඉහළ වියදමක් බව පැවසිය හැක. රජයේ රෝහල්වල නව වෛද්‍ය ඒකක ආරම්භ කිරීම, බෝ වන රෝග වෙනුවට දියවැඩියාව, අධි රුධිර පීඩනය වැනි බෝ නොවන රෝග වැළඳීමේ ප්‍රවණතාව ඉහළ යෑම සහ ජනතාවට සපයන සෞඛ්‍ය සේවාවන් පුළුල් වීම මේ කෙරෙහි හේතු වී ඇත.

ඕනෑම ඖෂධයක් රට තුළට පැමිණෙන්නේ යම් ක්‍රමවේදයකට අනුව ය. එය ඖෂධ යාමනය ලෙස හැඳින්විය හැක. මෙහිදී වෙළෙඳපොළට පැමිණීමට පෙර (Pre market) වෙළඳපොළේදී සහ (market) වෙළඳපොළට නිකුත් වූ පසුව (Post market) පූර්ණ අධීක්ෂණයට ලක්විය යුතුව ඇත. වෙළඳපොළට පැමිණීමට පෙර අවස්ථාවේ දී අදාළ ඖෂධ සමාගමේ ලියාපදිංචිය ඖෂධ සමාගමේ ක්‍රියාකාරීත්වය අධීක්ෂණයට ලක්විය යුතුය. මෙහිදී ශ්‍රී ලංකාව තුළ භාවිතයට ලබා දෙන ඖෂධ සාම්පලය පරීක්ෂා කළ යුතුය. දෙවනුව ටෙන්ඩරය නිකුත් කිරීමේ දී ලබා දෙන ඖෂධ සාම්පලය පරීක්ෂා කළ යුතුය. තෙවනුව ශ්‍රී ලංකාවට පැමිණෙන ඖෂධ තොගය ළඟා වූ අවස්ථාවේ දී පරීක්ෂා කළ යුතුය. අවසානයේ දී ඖෂධය රෝහල්වලට බෙදා හැරීමට පෙර නිසි පරීක්ෂාවට ලක්කළ යුතුය.

ඖෂධයක් වෙළඳපොළට නිකුත් කළ පසුවද එහි තත්ත්වය ආරක්ෂිත බව හා කාර්යක්ෂමතාව සම්බන්ධව අවධානයෙන් සිටිය යුතුය. හදිසි පරීක්ෂාවන්ට ලක්කළ යුතුය.

ඖෂධයක් වෙළඳපොළට නිකුත් කළ පසුව ඒවායේ අතුරු ආබාධ සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු කළ යුතුය. වරින් වර ඖෂධ සාම්පල් ලබා ගෙන අධ්‍යයනය කළ යුතුය.

ශ්‍රී ලංකාව තුළ ඖෂධ භාවිතාව සිදුවන්නේ ඖෂධ කළමනාකරණ චක්‍රයකට අනුවය. මෙය Drug Management Cycle ලෙස හැඳින්විය හැක. මෙහි පළමු අදියර රටට අවශ්‍ය කරන ඖෂධ මොනවාදැයි තේරීමක් සිදුකිරීමයි. මෙය Selection ලෙස හඳුන්වා දිය හැක. දෙවන අදියර තෝරා ගත් ඖෂධ නිසි ලියාපදිංචි ක්‍රමවේදයකට අනුව තත්ත්වයෙන් උසස් හා ආරක්ෂිත ලියාපදිංචිය සහිතව රට තුළට ගෙන්වීමයි. මෙය Procurement ලෙස නම් කරයි. මෙම චක්‍රයේ තෙවන අදියර රට තුළට ගෙන්වන ලද ඖෂධ ගබඩා කිරීම හා බෙදා හැරීමයි -Distribution ලෙස මෙය හඳුන්වන අතර අවසාන අදියරේ දී බෙදා හරින ලද ඖෂධ භාවිතය (Use) සිදුවේ. ඉහත සෑම අදියරක්ම ඉතාමත්ම සුපරීක්ෂාකාරීව අධීක්ෂණයට ලක්කළ යුතුය.

මෙවන් ප්‍රතිපත්ති රාමුවක් පවතිද්දී පසුගිය කාලසීමාව තුළ දීම අපට අසන්නට හා දකින්නට ලැබුණේ දිගින් දිගටම ශ්‍රී ලංකාව තුළ සිදුවන තත්ත්වයෙන් බාල ඖෂධ භාවිතාව හා තහනම් කිරීම සම්බන්ධ ප්‍රවෘත්තියයි. ඉතාම මෑතක දී සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් නිකුත් කළ චක්‍රලේඛයකට අනුව ඉතා විශාල ඖෂධ කාණ්ඩ සංඛ්‍යාවක් මෙරට ගෙන්වීමෙන් හා රෝහල්වලට බෙදා හැරීමෙන් අනතුරුව රෝගීන්ට භාවිතා කොට අතුරු ආබාධ ජනිත වූ පසුව භාවිතයෙන් ඉවත් කිරීම හෝ තහනම් කිරීම සිදුවිය. මෙය ඉතා කනගාටුදායක තත්ත්වයකි. එයට හේතුව මෙම ඖෂධ තොග ගෙන්වීම සඳහා රජය මගින් ඩොලර් බිලියන ගණනක් යළි ලබා ගත නොහැකි ලෙස වියදම්ව තිබීමයි.

පසුගිය දශක දෙක තුනක ආසන්න කාල සීමාව තුළ ශ්‍රී ලංකාව තුළට බටහිර ඖෂධ ගෙන්වීම සම්බන්ධව ආන්දෝලනාත්මක සිදුවීම් රාශියක් වාර්තා වුවද අදාළ සිදුවීම්වලට වගකිව යුතු කිසිවකු හෙළිදරව් වී නැත. ඖෂධ ගෙන්වීමේ අක්‍රමිකතා මෙන්ම ගෙන්වන ලද ඖෂධ ආසාත්මික වීමේ සිදුවීම් රාශියක් දිගින් දිගටම පුවත්පත් මගින් වාර්තා විය. මෙරට සාමාන්‍ය ජනතාව රජයේ රෝහල් වෙත පැමිණෙන්නේ නොමිලේ තම රෝග ස්වභාවයන් සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම පිණිසය. රෝහල් සායනවලින් නිකුත් කරන ඖෂධ නොමිලේ ලබාදුන් පමණින් නිසි ප්‍රමිතියකින් තොර නොවිය යුතුය. එසේම එම ඖෂධ හැකි සෑමවිටම රෝගියාගේ ජීවිතයට අනතුරක් නොවිය යුතුය. ගෙන්වන ලද ඖෂධ ශරීරය තුළ නිසි පරිදි ක්‍රියාත්මක නොවීම හෝ ගෙන්වන ලද ඖෂධ නිසා ආසාත්මික විය හැකි අවස්ථා එක්වරක් හෝ දෙවරක් සිදුවිය හැකි නමුත් රෝගීන්ට ලැබෙන අහිතකර ඖෂධ ලැයිස්තුව දිගින් දිගටම වැඩි වර්ධනය වේ නම් එය නොසලකා හැරිය යුතු තත්ත්වයක් නොවේ.

බලයට පත්වන සෞඛ්‍ය බලධාරීන් වැඩ භාර ගනිමින් පවසන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පැවති දූෂණ අක්‍රමිකතාවලට වගකිව යුතු හිටපු නිලධාරීන්ට දඬුවම් පමුණන බවත් ඉතා ඉක්මනින් සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන බවත්ය. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීය සමිති තම නිලවරණවලදී පාරම්භාන්නේ මේ ප්‍රකාශයම කරමිනි. එහෙත් බාලගිරි දෝෂය අද නෙමෙයි හෙට මෙන් මේ රාජ්‍ය ඖෂධ ප්‍රතිපත්තිය කිසිදා ක්‍රියාත්මක වී නැත.

වෛද්‍යවරයකු තේ කෝප්පයක් බීමට කැන්ටිමට ගිය සැනින් ඒ සම්බන්ධව ලැබෙන පැමිණිලි විභාග කරන සෞඛ්‍ය බලධාරීන් රෝගී ජීවිත දහස් ගණනක් මරණ දොරටුවට තල්ලු කරන වැරදි ඖෂධ ප්‍රතිපත්ති සම්බන්ධව මුණිවත රකින්නේ ඇයිදැයි විමසා බැලිය යුතුය. මේ සියල්ලෙන් අපකීර්තියට පත්වන්නේ කීර්තිමත් රාජ්‍ය චින්තනයක්ය.



- **මේ වනවිටත් සෞඛ්‍ය පද්ධතිය ඖෂධ රෝහල් උපකරණ හිඟය නිසා අර්බුදයක....**
- **වසරකට ඖෂධ සඳහා රුපියල් මිලියන 3000 යි මේ වනවිට එය වැඩි වෙලා**
- **ආණ්ඩුව නිසි මැදිහත් වීමක් කර නෑ**

මිලෙන් අඩු ඖෂධ මිලදී ගන්නා ලෙස රාජ්‍ය ආයතන නිතර ප්‍රකාශ කරන නමුත් මිලෙන් අඩු ආසියානු කලාපයේ රටවලින් ගෙන්වන බොහෝ ඖෂධ අතුරු ආබාධ රැසකින් සමන්විත වන බව රෝගීන්ට ප්‍රතිකාර කරන විශේෂඥ වෛද්‍යවරුන්ම රෝගීන්ට නියම කරන ඖෂධවලින්ම තහවුරු වේ. මේ වනවිට පෞද්ගලික චැනලින් සේවා සඳහා දෛනිකව පැමිණෙන රෝගීන් සංඛ්‍යාව සීඝ්‍රයෙන් ඉහළ යමින් පවතී. මේ බොහෝ රෝගීන් පවසන්නේ "ඉස්පිරිතාලෙන් බෙහෙත් ගත්තට වැඩක් නෑ ලෙඩේ සනීප වුණේ නෑ. කීයක් ගියත් කමක් නෑ චැනල් කරලා ඩොක්ටර් කෙනෙකුට පෙන්නන්න ආවා. ලෙඩේ සනීප වෙනව නම් එච්චරයි" ලෙසිනි. මෙවැනි ප්‍රකාශ රෝගීන් පවසන්නේ ආවාට ගියාට නොවේ.

රෝගීන්ට ඖෂධ නියම කිරීම සම්බන්ධව සෘජු මැදිහත්වීම සිදු කරන්නේ වෛද්‍යවරුන් විසිනි. මේනිසා කවුරුන් කුමන ඖෂධ මෙරටට ගෙන්වුවද එම ඖෂධ නිසා ආසාත්මිකතාවක් හෝ රෝගියා මිය යෑමක් හෝ රෝගී තත්ත්වය සුව නොවීමක් සිදුවුවහොත් බැණුම් ඇසීමට මෙන්ම මරණ තර්ජනවලට ලක්වීමටද ඇතැම්විට අධිකරණය හමුවට ගොස් රෝගියාට වන්දි ගෙවීමට සිදුවන්නේද අහිංසක වෛද්‍යවරයකුට ය.

බටහිර වෛද්‍ය ප්‍රතිකාර ක්‍රමවේදයේ ඉතා වැදගත් ස්ථානයක් ඖෂධ ප්‍රතිකාරවලට හිමිවන බැවින් රෝගීන්ට ලබාදෙන ඖෂධවල ගුණාත්මකභාවය සම්බන්ධව ඉහළ අවධානයක් යොමුකළ යුතුය. වෛද්‍යවරුන් ලෙස අප සෑමවිටම උත්සාහ දරන්නේ රෝගියාට උපරිම සුවයක් අඩු කාල සීමාවකදී ලබාදීමයි. මෙවැනි අවස්ථාවලදී ගුණාත්මකභාවයෙන් ඉහළ ඖෂධවලට ප්‍රමුඛතාවයක් ලැබේ. මිලෙන් අඩු ඖෂධ රෝගීන්ට නියම කරන බොහෝ අවස්ථාවලදී රෝගී තත්ත්වය සුව වීමේ ප්‍රමාදයක් පවතින බව අත්දැක ඇති සත්‍යයි. මේ නිසා වඩා වැදගත් වන්නේ මිලෙන් අඩු වුවත් ගුණාත්මකභාවයෙන් වැඩි ඖෂධ රෝගී ජනතාවට ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථා විවර කිරීමයි. නොමිලේ සෞඛ්‍ය සේවයක් පවතින බව ප්‍රකාශ කරමින් තත්ත්වයෙන් බාල ඖෂධ තොග පිටින් ගෙන්වමින් රටේ ධනය නිරපරාධයේ වියදම් කිරීම හා අල්ලස් දූෂණ ටෙන්ඩර් මගඩි හරහා ජනතාවට වංචා කිරීමට වඩා ගුණාත්මකභාවයෙන් ඉහළ ඖෂධ රට තුළට ගෙන්වීමට බලධාරීන් උත්සුක විය යුතුය.

ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවය තුළ රාජ්‍ය අංශයේ සෞඛ්‍ය සේවය මෙන්ම පෞද්ගලික අංශයේ වෛද්‍ය ප්‍රතිකාර සේවයටද ඉතා ඉහළ ස්ථානයක් මේ වනවිට හිමිව පවතී. මේ නිසා ඖෂධ ආශ්‍රිත යම් ආසාත්මික ප්‍රතික්‍රියාවන් හෝ භාවිතයෙන් ඉවත් වන ඖෂධ නාම ලේබන හැකි ඉක්මනින් රෝගීන්ට ප්‍රතිකාර සේවයේ යෙදෙන වෛද්‍යවරුන් වෙත යොමු කිරීම සිදුකළ යුතුය. එහෙත් බොහෝවිට වෛද්‍යවරුන් මෙවැනි තොරතුරු දැනගන්නේ කටකතා මාර්ගයෙනි. මේ තත්ත්වය වළක්වා ඖෂධ සම්බන්ධ නිවැරදි දැනුම පෞද්ගලික හා රාජ්‍ය අංශයේ වෛද්‍ය නිලධාරීන් වෙත හැකි ඉක්මනින් ලබාදෙන ක්‍රමවේදයක් සකස් කළ යුතුය. එසේ නොවුණහොත් අදාළ ප්‍රමාද වන කාලසීමාව ඇතුළත තවත් රෝගී ජීවිත ගණනාවක් වෛද්‍යවරයා දැනුවත් නොකිරීම නිසා විනාශ වී යා හැක.

අපේ රටේ පෞද්ගලික වෛද්‍ය සේවය නියාමනය කිරීම සඳහා කොමිෂන් සභාවක්ද පවතින අතර පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදෙන වෛද්‍යවරුන්ගෙන් වාර්ෂික බදු මුදලක් ද අය කරයි. මේ නිසා මෙම කොමිෂන් සභාව හරහා පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදෙන වෛද්‍යවරුන්ට ඖෂධ සම්බන්ධ නවතම දැනුම හා තොරතුරු අප්‍රමාද ලබාදීමට බලධාරීන් කටයුතු කළ යුතුය.

ඖෂධ ප්‍රතිපත්ති හා එකම ඖෂධීය නාමය සඳහා විවිධ මිල ගණන් යටතේ ඖෂධ වර්ග රාශියක් පැවතීම සම්බන්ධව අදහස් ප්‍රකාශ කරන බොහෝ විද්වතුන් අමතක කරන කරුණක් වන්නේ ඖෂධවල ගුණාත්මකභාවයයි. විවිධ මිල ගණන් යටතේ පවතින ඖෂධ වර්ග සියල්ලේම ගුණාත්මකභාවය එක හා සමාන වන්නේ නම් කිසිදු ගැටලුවක් නැත.

තත්ත්වයෙන් බාල මිලෙන් වැඩි ඖෂධ රට තුළට ගෙන්වීම මෙන්ම රෝගීන්ට නියම කිරීම ද තහනම් කළ යුතුය. ඊට පෙර තත්ත්වයෙන් ඉහළ ඖෂධ මෙරට ජනතාවට පහසු මිලට ලබා ගත යුතු ක්‍රමවේදයක් සැකසිය යුතුය. ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක විය යුත්තේ එම පදනමේ සිටය. එසේ නොමැතිව කුමන හෝ පෙති කරල් නිදහස් සෞඛ්‍ය සේවයේ නාමයෙන් අහිංසක රෝගී ජනතාව වෙත පෙවීම නතර කළ යුතුය

අද වන විට රෝගීන් වෛද්‍යවරුන් නියම කරන ඖෂධ නියමිත දින ගණනම ලබා නොගන්නා බව මා අත්දැක ඇත. මෙයට හේතුව සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇති ඖෂධ මිලයි. සාමාන්‍ය උණ සෙම්ප්‍රතිශ්‍යාවකට දින තුනකට බෙහෙත් ෆාමසියෙන් ලබා ගතහොත් අවම වශයෙන් රු. දහසක්වත් වැය කළ යුතුය. හෘදයාබාධ රෝගියකුට මසකට ඖෂධ සඳහා වන වියදම රු. පන්දහසකට අධික වේ. බොහෝ රෝගීන්ගේ රෝගී තත්ත්ව උත්සන්න වීම කෙරෙහි ඖෂධ මිල ඉහළ යෑම සෘජුව බලපා ඇති බව මගේ අත්දැකීමයි.

නිදහස් සෞඛ්‍ය සේවය නාමය නිකරුණේ වචන මාලාවක් වීම නවතා රෝගී ජනතාව වෙත තත්ත්වයෙන් ඉහළ ඖෂධ ක්‍රමානුකූලව ලබාදීමේ වැඩ පිළිවෙළක් නව ඖෂධ ප්‍රතිපත්තිය තුළින් ක්‍රියාත්මක විය යුතුය. බටහිර ඖෂධ සමාගම් මිලෙන් වැඩි ඖෂධ ගෙන්වමින් ජනතාව සූරා කෑමත් පෞද්ගලික වෛද්‍ය සේවයේ යෙදෙන වෛද්‍යවරුන් රෝගීන්ට මිලෙන් වැඩි ඖෂධ නියම කිරීම නතර කිරීමත් නවතා දැමිය හැක්කේ එවිටය. වෛද්‍යවරුද බටහිර සමාගම්වල රූකඩ බවට පත්වීම ස්වභාවයෙන්ම නවතිනු ඇත. එසේ නොමැතිව වීදුරු ගෙවල්වල සිට ගල් ගසමින් තත්ත්වයෙන් බාල ඖෂධ රෝගීන්ට සපයමින් නීති රීති පැනවමින් ගැලරිය පිනවීම වගකිය යුත්තන් විසින් නොකළ යුතුය. සෞඛ්‍ය බලධාරීන් වෘත්තීය සමිති හා සෞඛ්‍ය සේවකයන් ඒකාබද්ධව මෙම වැඩපිළිවෙළ නියාමනය විය යුතුය.

තවද ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ ශ්‍රී ලංකාවට ඖෂධ ගෙන්වීම සඳහා දින සියයකට අධික ප්‍රමාණයක් වැය වන බව පවසන ලද නමුත් රටේ සෞඛ්‍ය සේවය දැවැන්ත අර්බුදයකට මුහුණ පා ඇති අවස්ථාවකදී කුඩා දරුවාගේ පටන් වැඩිහිටියා දක්වා ඖෂධ නොමැතිව මිය යෑමේ තත්ත්වයක් උදා වී පවතිද්දී එතරම් විශාල කාල සීමා බලා සිටිනවා වෙනුවට ඊට වඩා අඩු දින ගණනකින් අදාළ ඖෂධ ශ්‍රී ලංකාව තුළට ගෙන්වාදීමේ යාන්ත්‍රණය සක්‍රිය කිරීම සඳහා අප වෘත්තීය සමිති ව්‍යාපාරයක් ලෙස අවශ්‍ය සහයෝගය ලබාදීමට සූදානම් බවත් අවම වශයෙන් දින සියයක් ගත වන ඖෂධ දින තිහකට අඩු ප්‍රමාණයක් තුළ දී ශ්‍රී ලංකාවට ගෙන්වා දීම සඳහා අවශ්‍ය කරන වැඩපිළිවෙළක් ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවක් ලබා දෙන ලෙස ද ඉල්ලා සිටිමු. මෙම අර්බුදකාරී අවස්ථාවේදී මේ රටේ ලක්ෂ 220 කට ආසන්න ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය කඩිනමින් ප්‍රතිස්ථාපනය කිරීමටත් එය බිඳ වැටීම වළක්වා ගැනීම සඳහා ද වෛද්‍ය හා සිවිල් අයිතිවාසිකම් පිළිබඳ වෛද්‍ය වෘත්තීය සමිති සන්ධානය ලෙස ඉතා සක්‍රිය ලෙස මැදිහත් වීමට අප සූදානම් වී සිටින අතර විශේෂයෙන්ම ඖෂධ හිඟය අඩු කාලයක් තුළ විසඳා ගැනීම සඳහා අවශ්‍ය කරන රාජ්‍ය අනුග්‍රහය ලබා දෙන්නේ නම් අදාළ කටයුත්ත ඉතා පහසුවෙන් කළමනාකරණය කර දීමට අප වෘත්තීය සමිති ව්‍යාපාරයට හැකියාවක් ඇති බව ඉතා පැහැදිලි විශ්වාසයකින් යුක්තව මෙසේ දන්වනු කැමැත්තෙමු.

**● වෛද්‍ය ජී. ජී. චමල් සංජීව**
**සභාපති - වෛද්‍ය හා සිවිල් අයිතිවාසිකම් පිළිබඳ වෛද්‍යවරුන්ගේ වෘත්තීය සමිති සන්ධානය (MCPA)**

# ● යොහානිගේ දේශප්‍රේමීත්වය අගය කරමු

සංගීතය සම්බන්ධයෙන් ගත් කල භූගෝලීය සීමාවන් කිසි විටෙකත් වැදගත් නොවන අතර වර්තමානයේ අන්තර්ජාලය විසින් එහි ප්‍රවේශය පුළුල් කර තිබේ. රසාලිප්ත හඬකින් මුසුවුණු සංගීතයේ අවසන් නිෂ්පාදනය ගීතය වන්නේය. 'මැණිකේ මගේ හිතේ' ලොවම වැලඳගත් සිංහල ගීතයයි. එලෙස ලොව ජනප්‍රිය වූ වෙනත් නිර්මාණයක් නොමැත. මේ ප්‍රති නිර්මාණ ගීතය යූටියුබ් වෙත මුදාහැර මාස 3 ක් ඇතුළත මෙම ගීතය යූ ටියුබ් හි මිලියන 100 ක දර්ශන ඉක්මවා ගිය අතර එය ලොව පුරා විශේෂයෙන් ඉන්දියාවේ අතිශය ජනප්‍රිය විය. මාලදිවයින සහ බංග්ලාදේශයේ ද එම වීඩියෝ ගීතය එලෙසම ජනප්‍රිය විය. අද 'මැණිකේ මගේ හිතේ' ගැන කතා කරන්නේ එහි සංගීතය ගැන විග්‍රහයක් සිදුකිරීමට නොවේ. සංගීත තාරකාව යොහානි දිලෝකා ද සිල්වා මෙරට අර්බුදය පිළිබඳව වැදගත් පියවරක් ගෙන තිබීම ගැන සටහනක් තැබීමටය. වෙනත් නළු නිළියන් හා ගායකයින් ගාලු මුවදොරට පැමිණ කළු ඇඳුමින් සැරසී විවිධ නර්තන දක්වන විට වඩා ආදර්ශවත් පියවරක් ගැනීම ගැන යොහානිට රටවාසීන් ස්තුතිවන්ත විය යුතුය. පාරේ ගොන්පාර්ට්වලින් මෙරට ආර්ථික අර්බුදය විසඳෙන්නේ නැත. යොහානි සිය ඉන්ස්ටග්‍රෑම් ගිණුමේ මෙලෙස සටහනක් තබා තිබිණි.

"ලෝකයේ සෑම තැනකම සිටින සියලුම රසික රසිකාවියන් වෙත, මගේ සංගීතයට සම්බන්ධ නැති දෙයක් ගැන කතා කිරීමට ඉඩ දෙනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි. මම පසුගිය සති කිහිපය තුළ ඉන්දියාවේ සිටියත්, ජාතියක් ලෙස ඉතිහාසයේ දරුණුතම ආර්ථික අර්බුදය හරහා ශ්‍රී ලාංකිකයින් පත්ව ඇති පීඩාව මා කම්පනයට පත්කර ඇත. මගේ මිනිස්සු විඳින දුක දැකලා මේ වෙලාවේ ඔවුන් සමග ඉන්න නැති එක ගැන මගේ හිත රිදෙනවා. පසුගිය දින කිහිපය පුරාම පළවුණේ ශ්‍රී ලංකාව පිළිබඳව බොහෝ නිෂේධාත්මක අදහස්. මගේ රට සැබවින්ම අපූරු මිනිසුන්ගෙන් පිරුණු පාරාදීසයක් වන අතර ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් මම මිතුරන් සහ රසිකයන් ලෙස හඳුන්වමි. කලාකරුවෙක් විදියට වගේම පුද්ගලයෙක් විදියටත් මම මගේ වෘත්තීය ජීවිතය පුරාවටම දේශපාලනයෙන් තොර කෙනෙක්. මගේ කණ්ඩායමත් එම ප්‍රතිපත්තියේ සිටිනවා. නමුත්, මගේ රටේ තානාපතිවරයෙකු ලෙස, මගේ නිශ්ශබ්දතාවය බිඳ දමා ආපසු මගේ ජනතාව වෙනුවෙන් කතා කිරීමට තීරණය කළා. මම රටට දැනෙන ආකාරයෙන් දායක වීමට මගේ හැඟීම් බෙදා ගන්නා සහෝදර ශ්‍රී ලාංකික කලාකරුවන් කිහිප දෙනෙකු සමඟ ව්‍යාපෘතියක වැඩ කරමින් සිටිමි. ඉන්දියාවේ සහ ලෝකයේ සිටින මගේ රසික රසිකාවියන් මේ ව්‍යාපෘතියට සහයෝගය දී ශ්‍රී ලංකාව සමඟ සිට ගනීවි කියා මම බලාපොරොත්තු වෙනවා. සහාය සඳහා ඔබ ඇමතීම ගැන මට කනගාටුයි, නමුත් ශ්‍රී ලාංකීය ජනතාවට මෙම දුෂ්කර අවස්ථාවේ එය අවශ්‍යයි. සංගීතය ශ්‍රී ලංකාව යළි නගා සිටුවීමට සැමදෙනා උපකාරී වනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි."

යොහානි රට වෙනුවෙන් ඩොලර් මිලියනයක් එකතු කිරීමේ වැඩසටහන වෙනුවෙන් මෙම සටහන තබා තිබිණි. එය සැබවින්ම අගය කළ යුතුය.




කටින් ආණ්ඩු වෙනස් කිරීමට උත්සහ කරන ඊනියා කලාකරුවන්ට වඩා යොහානි ප්‍රායෝගික වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබේ. මේ පිළිබඳව ඉන්දීය මාධ්‍ය පුළුල් ප්‍රචාරයක් ලබා දී තිබුණේ යොහානි ඉන්දියාව කැලඹූ සංගීත තාරකාවක් වීම නිසාය. ඇය කොතරම් ඉන්දියානුවන්ගේ හදවත් බදා වැළඳ ගත්තේ දැයි කිවහොත් ඉන්දීය සුපිරි නළු අමිතාබ් බච්චන් තම සමාජ මාධ්‍ය ගිණුම ඔස්සේ සටහනක් තබමින් කියා සිටියේ 'මැණිකේ මගේ හිතේ' ගීතය නොඅසා සිටින්නට නොහැකි බවය. ඔහු භාරතවාසීන් සමග මැණිකේ මගේ හිතේ ගීතයට නැටුවේය. මේ නිසාම ඉන්දීය රූපවාහිනී සේවා ලංකාවේ අර්බුදය ගැන මුම්බායි රැඳී සිටින යොහානි ගෙන් විමසා තිබිණි. වියොන් රූපවාහිනිය සමග පැවති සාකච්ඡාවේදී ඉන්දීය නිවේදිකාව "ජනපතිවරයා ඉවත්ව යායුතුද" යන්න විමසූ විට යොහානි පැවසුවේ තමන්ට ඒ ගැන ප්‍රකාශ කිරීමට දේශපාලන දැනුමක් නොමැති බවයි. මෙය සමහරුන් කෝප කිරීමට හේතුවී තිබේ. නමුත් ඇගේ නිර්දේශපාලනික ස්ථාවරය අගය කළ යුතුය. රටට ඩොලර් එවන්නට එපා කියන යම් දේශපාලන කණ්ඩායම් යොහානිගේ ආධාර එකතු කිරීමට එරෙහි වෙති. මේ සැබවින්ම ඔවුන්ගේ කුහකකම ප්‍රදර්ශනය කිරීමකි. අපි යොහානිගේ දේශප්‍රේමීත්වය අගය කරමු.

**● චතුර පමුණුව**

# පිටරටවලට ඇද්ද කළු සල්ලි නැවත ගෙන්වන ක්‍රමය මෙන්න



**රටවල් කිහිපයක්ම නැවත සල්ලි ගෙන්වාගෙන තිබේ**

**ජාත්‍යන්තර නීති, සම්මුති ගණනාවක්**

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2003 වර්ෂය ඔක්තෝබර් මස 31 වන දින මහා මණ්ඩලයට සිදු කරන ලද 58/04 දරන යෝජනාව මගින් අප වැනි තුන් වන ලෝකයේ රටවල ජනතාවට ඉතා වැදගත් සම්මුතියක් එළිදක්වා තිබෙනවා.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය දරන රටවල් 193 අතරින් සාමාජික රටවල් 140 ක් සම්මුතිය එළිදක්වන අවස්ථාවේ දී එයට අත්සන් කර එහි පාර්ශ්වකරුවන් බවට පත්වූ අතර, 2021 නොවැම්බර් මස 18 වන දින වන විට මෙම සම්මුතියට අත්සන් කර එහි පාර්ශ්වකරුවන් බවට පත් වූ සමස්ත සාමාජික රටවල් සංඛ්‍යාව 189 දක්වා ඉහළ ගොස් තිබෙනවා. මෙතෙක් මෙම සම්මුතියට අත්සන් කර නොමැති ප්‍රධාන රටවල් දෙකක් වන්නේ ''උතුරු කොරියාව" සහ ''එරිත්‍රියාව'' පමණයි සිරියානු ජනරජය සම්මුතියට අත්සන් කර ඇතත් එය මෙතෙක් ඔවුන්ගේ දේශීය නීති පද්ධතියට ඇතුළත් කර නැහැ. ''එක්සත් ජාතීන්ගේ දූෂණයට එරෙහි වූ සම්මුතිය" නොහොත් ''United Nations convention against Corruption" ලෙස නම් කර ඇති මෙම සම්මුතියට ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004 වර්ෂයේ අත්සන් කර එහි පාර්ශ්වකරුවකු බවට පත්වීම සිදු කළා. එබැවින් අපි රාජ්‍යයක් ලෙස 2004 වර්ෂයේ සිට එම එම සම්මුතියේ සඳහන් නෛතික වගන්තීන්ට අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිනවා

මෙම සම්මුතිය පහත සඳහන් ප්‍රධාන විෂය ධාරාවන් 5 ඔස්සේ ක්‍රියාත්මක වනවා.

1. වැළැක්වීම (Prevention)
2. අපරාධකාරීත්වය සහ නීතිය ක්‍රියාත්මක කිරීම (Criminalaization) Law Enforcement)
3. ජාත්‍යන්තර සහයෝගිතාව (International Corporation)
4. දූෂණ ක්‍රියාවන් මගින් අහිමි කර ඇති දේපළ සොයා ගැනීම (recovery of illegal assets)
5. තාක්ෂණික සහාය ලබා ගැනීම (Technical assistant)

මෙම සම්මුතිය දූෂණයන්ට එරෙහිව කටයුතු කිරීමේ කිරීමේදී මූලික සිද්ධාන්තයන් (fundamental principles) හතරක් ආවරණය කරනු ලබනවා එනම්

1. අල්ලස
2. වෙළෙඳ ගනුදෙනු සඳහා සිදු කරන මැදිහත්වීම්
3. නිල තත්ත්වය භාවිත කරමින් සිදුකරන රාජ්‍ය මෙන්ම පෞද්ගලික දේපළ අවභාවිතය
4. රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශය තුළ ද විනිවිද භාවයකින් තොරව සිදු කෙරෙන දූෂණ ක්‍රියා

මෙම මූලික සිද්ධාන්තයන් අතරට ගැනෙනවා

තුන්වන ලෝකයේ රටවල රාජ්‍ය නායකයන්, දේශපාලනඥයන්, හමුදා මෙන්ම සිවිල් උසස් රාජ්‍ය නිලධාරීන් තම දේශපාලන මෙන්ම රාජ්‍යය බලයද අවියක් ලෙස භාවිත කරමින් සිදුකෙරෙන රාජ්‍ය දේපළ කොල්ලකෑම සුලබ සිදුවීමක්. මේවා අතරින් බහුතරයක් එම දේපළ අයත් රාජ්‍යයෙන් බැහැරට ගෙන ගොස් විවිධ ක්‍රම උපයෝගී කරගනිමින් වෙනත් රාජ්‍යයන්හි ආයෝජන ලෙස සඟවා තබනවා. මෑතකදී මහත් ආන්දෝලනයට ලක් වෙමින් එළිදැක්වුණු පැනමා පත්‍රිකා සහ පැන්ඩෝරා පත්‍රිකා මගින් හෙළිදරව් කරනු ලැබුවේත් එලෙස කොල්ල කන ලද රාජ්‍ය දේපළ සඟවා ඇති ස්ථානයන් දෙකක් ගැනයි. එහෙත් අවාසනාවකට මෙන් පැනමා පත්‍රිකා හෝ පැන්ඩෝරා පත්‍රිකා සම්බන්ධව මෙතෙක් ශ්‍රී ලංකා රජය ක්‍රියාකාරී මැදහත් වීමක් සිදු කර ඇති බවක් නම් අපට පෙනෙන්නට නැහැ.

එක්සත් ජාතීන් විසින් එළිදක්වා ඇති මෙම වැදගත් සම්මුතියේ 51 වන වගන්තිය මගින් එසේ සඟවා ඇති රාජ්‍ය දේපළ සොයා ගැනීම සඳහා දේපළ අයත් රාජ්‍යයට සම්පූර්ණ සහයෝගය ලබා දීමටත් එම දේපළවල සුරක්ෂිත භාවය ආරක්ෂා කිරීමටත් නිසි නෛතික ක්‍රියාදාමයකින් පසුව එම දේපළ අයිති මුල් රාජ්‍ය වෙත ආපසු ලබා දීමට කටයුතු කිරීමටත් සියලුම සාමාජික රටවල් මෙම සම්මුතිය මගින් බැඳී සිටීම ඉතා සුභදායක තත්ත්වයක්.

බොහෝ අවස්ථාවල මෙම රාජ්‍ය දේපළ කොල්ලකෑමේ ව්‍යසනයේ ගොදුරු බවට පත්වන්නේ තුන්වන ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටවල්. සංවර්ධිත මෙන්ම දියුණු රටවල පවතින ශක්තිමත් නෛතික පද්ධතීන් මෙම තත්ත්වය පිටු දැකීමට ක්‍රියා කරමින් සිටිනවා. රාජ්‍ය නායකයන් දේශපාලනඥයන් සිවිල් මෙන්ම හමුදා උසස් රාජ්‍ය නිලධාරීන් ඇතුළු පාර්ශ්වයන් විසින් තම දේශපාලන සහ සිවිල් බලය උපයෝගී කරගනිමින් කොල්ලකාගෙන ගොස් වෙනත් රටවල සඟවා ඇති මුල් රාජ්‍යයට අයත් දේපළ නැවත එම රටවලට ආපසු ලබා ගැනීමේ අවස්ථාව මෙම සම්මුතිය මගින් එම සංවර්ධනය වෙමින් රටවලට ලබාදී තිබෙන මහඟු වරප්‍රසාදයක්

රාජ්‍ය දේපළ කොල්ලකෑම හේතුවෙන් දරුණු ආර්ථික ආගාධයට වැටී සිටින රාජ්‍යයන්ට තමන්ට අයත්ව තිබී චෞර පාලකයන් විසින් කොල්ලකනු ලැබූ තම රාජ්‍ය සම්පත් මෙම නෛතික තත්ත්වය හේතුකොට තම රටට ආපසු ලබා ගැනීමට හැකි වීම තුළින් කඩා වැටුණු තම ආර්ථිකයන් යළි ගොඩනගා ගැනීමට හැකිවීම වැටී සිටින ආර්ථික අගාධයෙන් ගොඩ ඒමට මහඟු අත්වැලක් ද වනවා නිසැකයි. තවද මෙම සම්මුතිය මගින් කොල්ලකන ලද රාජ්‍ය දේපළ සැඟවීමට ලෝකයේ කිසිදු ස්ථානයක් නොමැති බවට සුවිශේෂ පණිවිඩයක්ද දූෂිත දේශපාලනඥයන්ට මෙන්ම රාජ්‍ය නිලධාරීන් වෙත ද සංජානනය කරනවා. මෙම තත්ත්වය රාජ්‍ය දේපළ කොල්ලකෑම හේතුවෙන් අන්ත අසරණ අඩියකට පත් වී සිටින එම රටවල ජනතාවට ලැබෙන සහනය සුවිශේෂයි.

මෙම සම්මුතිය 43 වන වගන්තිය මගින් සාමාජික රටවල් සියල්ල තම රටෙහි ආයෝජනය කර හෝ සඟවා ඇති වෙනත් රාජ්‍යකට අයත් යම් දේපළක් එම දේපළ හිමි රාජ්‍ය වෙත ලබාදීම සඳහා දිය යුතු පූර්ණ ආරක්ෂාව සහ නෛතික සහාය ලබාදීමට සම්මුතිය මගින් මගින් නෛතිකව බැඳී සිටිනවා. මෙම විෂය අරභයා ප්‍රශ්නයට තුඩු දී ඇති රටවල් අතර සිදු කෙරෙන අන්‍යෝන්‍ය නීති සහාය ලබා දීමේ ක්‍රියාවලිය (mutual legal assistant) තුළින් තමයි මෙම සියලු කටයුතු ක්‍රියාත්මක වන්නේ.

විශේෂයෙන්ම තුන්වන ලෝකයේ දියුණු වෙමින් පවතින රටවල් වෙතින් මෙලෙස කොල්ල කා වෙනත් රටවල සඟවා හෝ ආයෝජනය කර ඇති දේපළ නැවත සොයාගෙන ඒවා එම දේපළ අයිතිය හිමි මුල් රටවල් වලට ලබාදීම සඳහා ස්විස්ටර්ලන්තය කේන්ද්‍රකොටගත් සංවිධානයක් මේ වන විට බිහිවී තිබෙනවා. ස්විස්ටර්ලන්තය බාසිල් විශ්වවිද්‍යාලයට අනුබද්ධව පිහිටා ඇති ලාභ නොලබන සංවිධානයක් (Non profitable organisation) ලෙස පිහිටුවා ඇති ''නීති විරෝධී දේපළ ආපසු ලබා ගැනීමේ ජාත්‍යන්තර මධ්‍යස්ථානය" (International Centre for Asset Recovery- I .C.A. R) ලෙස නම් කර ඇති මෙම සංවිධානය මගින් මේ වන විට ඉතා සාර්ථක ලෙස රාජ්‍ය දේපළ ආපසු ලබාගැනීමේ ක්‍රියාන්විත කීපයක් ලොව පුරා මේ වන විට ක්‍රියාත්මක කර තිබෙනවා ඒවා අතර

1. නයිජීරියාවේ හිටපු ජනාධිපති ජනරාල් සානි අබාචා (General. Sani Abacha) විසින් ඔහු පාලන තන්ත්‍රයේ රැඳී සිටි 1993-1998 කාලය අතරතුර නයිජීරියාවේ රාජ්‍ය දේපළ ලෙස කොල්ලකනු ලැබූ ඩොලර් බිලියන තුනකට අධික වටිනාකමකින් යුත් දේපළ ආපසු නයිජීරියා වෙත ලබාගැනීම
2. පේරු රාජ්‍යයේ බුද්ධි අංශ ප්‍රධානියා මෙන්ම ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශකයා ලෙස ඇල්බර්ටෝ ෆූජියමා ජනාධිපති වරයා යටතේ සේවය කළ ව්ලැඩිමීර් මොන්ටිසිනෝ විසින් 1990-2000 කාලය තුළ පේරු රාජ්‍යයෙන් කොල්ලකා ස්විස් බැංකුවල සඟවා තිබූ ඇමෙරිකානු ඩොලර් බිලියන දෙකකට අධික දේපළ නැවත සොයාගෙන පේරු රාජ්‍යය වෙත ලබාදීම
3. 1960-1986 කාලය තුළ පිලිපීනයේ ජනාධිපති ධුරය දැරූ පර්ඩිනන්ඩ් මාකෝස් විසින් සිය පාලන කාලය තුළ නීති විරෝධී ලෙස උපයා ගන්නා ලද පිලිපීන රාජ්‍යයට අයත් ඩොලර් බිලියන දහයකට ආසන්න වටිනාකමකින් යුත් ලෝකයේ විවිධ රාජ්‍යයන්වල බැංකු සහ පෞද්ගලික ව්‍යාපාර තුළ ආයෝජනය කර සඟවා තැබූ ඩොලර් බිලියන දහයකට ආසන්න වත්කම් ප්‍රමාණයක් සොයාගෙන එම වත්කම් ආපසු පිලිපීනය වෙත ලබා දීමට ක්‍රියා කිරීම
4. උස්බෙකිස්ථානයේ හිටපු ජනාධිපතිවරයා ගේ දියණිය වූ ගුල්නාරා කරිමෝවා විසින් සිය පියා ගේ පාලන කාලය තුළ කසකස්ථානය වෙත ස්වීඩන් රාජ්‍ය මගින් දුරකථන සේවා සැපයුම් පද්ධතියක් ලබා ගැනීමේ ගනුදෙනුවේදී අල්ලසක් ලෙස ඇමරිකානු ඩොලර් බිලියන දෙකක් ලබා ගැනීමේ සිද්ධිය සහ එම මුදලින් කොටසක් නැවත කසකස්ථානය වෙත ලබා ගැනීමට කටයුතු කිරීම





සැලකිය යුතු තත්ත්වයක්. මේ වන විට ශ්‍රී ලංකාව මෙන්ම ලෝකයේ රටවල් 189 ක් එක්සත් ජාතීන්ගේ මෙම සම්මුතියේ පාර්ශ්වකරුවන් වී සිටිනවා. උගන්ඩාව, කෙන්යාව මෙන්ම සීෂෙල්ස් රාජ්‍යයේ ද මෙම සම්මුතියේ පාර්ශ්වකරුවන් බව අපට ලෙහෙසියෙන් අමතක කළ නොහැකියි. එයට ප්‍රධානම හේතුව වන්නේ ශ්‍රී ලංකාවට අයත් රාජ්‍ය දේපළ විශාල ප්‍රමාණයක් ඉහත සඳහන් රටවල් වල ආයෝජන ලෙස සඟවා ඇති බවට මේ දිනවල සමාජය පුරා පැතිර යන කටකතා හේතුකොටගෙනයි.



**ප්‍රියන්ත ජයකොඩි**
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (විශ්‍රාමික)

# රට යළි ගොඩනැගිය හැක්කේ ජනමතය හඳුනන සර්වපාක්ෂික ආණ්ඩුවකට පමණි

## - අග්නිදිග ආසියානු කලාපයේ සංඝ නායක පැල්පොල විපස්සි හිමි

රට තුළ පවතින අර්බුද විසඳිය හැක්කේ ජනමතය හඳුනාගත හැකි සර්වපාක්ෂික ආණ්ඩුවකට පමණක් යැයි පැල්පොල විපස්සි පදනමේ සභාපති සහ අග්නිදිග ආසියානු කලාපයේ සංඝ නායක පැල්පොල විපස්සි හිමියෝ පවසති.


ඒ සම්බන්ධව වැඩිදුරටත් අදහස් දක්වමින් උන්වහන්සේ මෙසේ ද සඳහන් කර සිටිති.

රට තුළ පෙර නොවූ විරූ ආකාරයෙන් ආර්ථික අර්බුදයක් මතුව තිබෙනවා. එනිසා ජනතාවට තම එදිනෙදා අත්‍යවශ්‍ය ආහාරපාන මිලදී ගැනීමට පවා නොහැකි තත්ත්වයක් මතුවෙලා. මෙය නිදහසින් පසු අප මුහුණ දෙන දරුණුම ආර්ථික අර්බුදය ලෙස සැලකිය හැකියි. එනිසා මේ මොහොතේ රටේ සියලුම දේශපාලන පක්ෂ සහ නායකයන් එකට එක්ව මෙම අර්බුදයෙන් රට ගොඩගැනීමට කටයුතු කළ යුතුයි. තනි පක්ෂයකට මෙම අර්බුදයට විසඳුම් සොයන්න අපහසුයි.

මේ මොහොතේ සියලුදෙනා රට ගැන සිතිය යුතුයි. රට තුළ මතුව ඇති ආර්ථික පිරිහීම ජාත්‍යන්තර අවධානයට පවා ලක්ව තිබෙනවා.

රටේ තරුණ පිරිස නැගී සිට ඇත්තේ මෙම ආර්ථික අර්බුදය සහ දේශපාලන නායකයන්ගේ පිරිහීමට එරෙහිවයි. මෙය තවදුරටත් පැවතිය හොත් රටේ අනාගතය මෙන්ම තරුණ පරපුරේ අනාගතය ද විනාශයට පත්වෙනවා. එනිසා සර්ව පාක්ෂික ආණ්ඩුවක් පිහිටුවනවා නම් පළමුව ඔවුන් තරුණයන් ආරම්භ කර ඇති අරගලය හඳුනාගත යුතුයි. ඒ අනුව විසඳුම් සෙවිය යුතුයි. මේ මතුව ඇත්තේ මෙතෙක් කාලයක් දේශපාලන පක්ෂවල අවශ්‍යතාවය මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සකස් කරගෙන රට පාලනය කිරීමේ ප්‍රතිවිපාක බව වටහාගත යුතුයි.

තවම අප රටට ගැළපෙන පොදු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කර ගැනීමට මෙතෙක් රට පාලනය කළ කිසිදු දේශපාලන පක්ෂයකට නොහැකි වී තිබෙනවා. ඔවුන්ගේ අවශ්‍යතා අනුව ව්‍යවස්ථා සංශෝධනය කර ගැනීම මිස රටට ගැළපෙන පරිදි එම සංශෝධන සිදුකර නැහැ. ජපානය දෙවැනි ලෝක යුද්ධයේදී ඇතිවූ විනාශයෙන් පසු යළි නැගී සිටියේ රටේ සියලුදෙනා තම රට ගොඩගැනීම සඳහා එක අරමුණක් ඔස්සේ කටයුතු කළ නිසයි. එනිසා තවම ඔවුනට ඇත්තේ එක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පමණි. නමුත් අප රට නිදහසින් පසු මේ දක්වා වාර 20ක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනයට ලක්කර තිබෙනවා.



මෙම සංශෝධන මගින් රටේ ආර්ථිකය ගොඩනැගීමක් සිදුව නැහැ. සිදුව ඇත්තේ දිනෙන් දින පරිහානියට ලක්වීම පමණයි. එනිසා දූන්වත් සියලු දේශපාලන පක්ෂ සහ නායකයන් තම තමුන් බලයට පත්වන හැටි ගැන සිහින දකින්නේ නැතිව පළමුව රට ගොඩනැගීමට එක්විය යුතුයි. රට ගොඩගැනීමෙන් පසු යළි සුපුරුදු දේශපාලනය නොව රටට ගැළපෙන තරුණ පරපුරේ අනාගතය යහපත් වන දේශපාලනයක නිරත විය යුතුයි.

මෙහිදී නිවැරදි විය යුත්තේ දේශපාලනඥයන් පමණක් නොවේ රාජ්‍ය නිලධාරීන් ද තම ආයතන පිරිහීමකට යා නොදී කාර්යක්ෂමව පවත්වාගෙන යෑමට අවධානය යොමු කළ යුතුයි. ඔවුන් ද දේශපාලන පක්ෂවල සිට තීරණ නොගෙන රට ගැන සිතා අවංකව තම රාජකාරි කිරීමට පියවර ගත යුතුයි.

රට තුළ විදේශ සංචිත පෙර නොවූ විරූ ලෙස අඩුවී තිබෙනවා. ඒවා යළි වර්ධනය කර ගත හැක්කේ ආයෝජන මගිනි. විදේශ ආයෝජකයන් පැමිණීමට නම් රට ස්ථාවරව පැවතිය යුතුයි. සතියෙන් සතිය පිහිටුවන නව ආණ්ඩු සහිත අස්ථාවර රටක ආයෝජනය කිරීමට ආයෝජකයන් එන්නේ නැහැ. ඒ බව සියලු දෙනාම වටහාගත යුතුයි.

නිතර අරගල පවතින උද්ඝෝෂණ, වැඩ වර්ජන පවතින රටකට කිසිදු ආයෝජකයෙක් එන්නේ නැහැ. එය සියලු දේශපාලන පක්ෂ මෙන්ම වෘත්තීය සමිති ද වටහාගත යුතුයි.

SLIC
ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස්
පියෙකු මෙන් මවක මෙන්

**මහජනතාව වෙත කෙරෙන නිවේදනයයි**

**ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනයේ හිමිකාරත්වය සම්බන්ධයෙන් මහජනතාව තුල පැනනැගී ඇති අවිනිශ්චිත තත්ත්වය සම්බන්ධව පැහැදිලි කිරීමක් සිදුකිරීමට ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනය අපේක්ෂා කරයි. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනයේ නීත්‍යානුකූල හිමිකාරත්වය රාජ්‍ය භාණ්ඩාගාරය සතුව පවතින අතර හිමිකාරත්වයෙහි සිදුවන වෙනසක් පිළිබඳව කිසිදු තීරණයක් ගෙන නොමැති බව මහජනතාව වෙත දැනුම් දෙයි.**

**ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනය ශ්‍රී ලංකාවේ වඩාත් ශක්තිමත්ම සහ විශාලතම රක්ෂණ ආයතනය ලෙසින් රක්ෂණ ක්ෂේත්‍රයේ වැඩිම වත්කම් සම්භාරය වන රු.බිලියන 258 ක් සහ වැඩිම ජීවිත රක්ෂණ අරමුදල වන රු.බිලියන 152 ක අරමුදලට හිමිකම් කියයි. එසේම දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වය වෙනුවෙන් AA (lka) ෆිට්ච් ශ්‍රේණිගත කිරීම ලබාගත් සහ පවත්වාගෙන යමින් සිටින එකම රක්ෂණ ආයතනය ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් ආයතනය වේ.**


# ● රටේ නම කැත කරන නරුමයෝ...

අයර්ලන්ත ජාතික තරුණියකට ප්‍රසිද්ධියේම හිරිහැර කරමින්, ඇයට නිදහසේ මහමග ගමන් කරන්නට නොදෙමින් බාධා කරන වීඩියෝ දර්ශනයක් දැන් අන්තර්ජාලයට මුදා හැර තිබේ. මේ සිදුවීම සිදුව ඇත්තේ මහනුවර නගරයේදීය.

ඓතිහාසික මහනුවර නගරයේ ශිෂ්ට බව ලෝකය හමුවේ සුළු මොහොතකින් කෙලෙසා දමන්නට හැදිච්ච දෙමව්පියන්ගේ නැහැදිච්ච දරුවෝ කටයුතු කර තිබුණාහ. මෙය දුර දිග නොබලා සිදුකළ කොලුකමක ප්‍රතිඵලයකි.

නමුත්, දැන් කුමන හෝ අමන වැඩක් සාක්ෂි සහිතව තබා ගන්නට නවීන තාක්ෂණික මෙවලම්වලට හැකියාව ඇති නිසාම, මේ සිදුවීමට ද තටු මැවුණේය. එහි අවසන් ප්‍රතිඵලය ලෙස මේ වන විට මේ දුර්ගුණ ඇති දරුවෝ නීතියේ රැහැනට හසුව ඇත්තේය.





අතවරයට පත් විදෙස් තරුණිය හා ඇයගේ පෙම්වතා

අයර්ලන්ත ජාතික තරුණියකට හා ජර්මන් ජාතික තරුණයකුට මහනුවරදී හිංසා කරමින් තරුණයින් තිදෙනකු කටයුතු කරන බව දැක්වෙන වීඩියෝව ඉකුත් අප්‍රේල් විසි එක්වැනිදා සිට යූටියුබ් ඔස්සේ ප්‍රචාරය වී තිබිණි. අදාළ වීඩියෝ පටය පිළිබඳව මහනුවර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි චමිල් රත්නායක මහතා විශේෂ පරීක්ෂණයක් සිදුකරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී තිබිණි. සෙල්ෆි ඡායාරූපයක් ලබා ගැනීම සඳහා බලකරමින් තරුණයන් තිදෙනෙක් තරුණියට කරදර කරන බවත් ඇයව අපයෝජනයට ලක්කිරීමට තැත් කරන බවත් වීඩියෝ පටයේ සාක්ෂි සහිතව දක්නට ලැබෙන නිසාම තත්ත්වය බරපතළ බව කාටත් වැටහී තිබිණි. ලොවපුරා සංචාරයක නිරත වන තමන්ට මෙවැනි අකටයුත්තක් සිදු වූයේ ශ්‍රී ලංකාවේ මහනුවරදී බව අදාළ විදේශීය යුවල වීඩියෝව ඔස්සේ ප්‍රකාශ කරන්නේය. මෙවැනි සිදුවීම් නැවත නොවිය යුතු බවද, එය විදේශිකයන්ගේ නිදහසට තර්ජනයක් බවද ඔවුහු කියති. තමන්ට අවශ්‍යව ඇත්තේ මේ පිළිබඳව සෙසු සංචාරකයන් දැනුවත් කිරීම සහ නැවත මෙවැනි අකටයුතුකම් සිදු නොවීම බවද ඔවුහු කියති.

සිද්ධිය සම්බන්ධයෙන් සැකපිට අදාළ තරුණයන් තිදෙනා මහනුවර සංචාරක පොලිස් ඒකකය මගින් සොයා ගියහ. ඉකුත් විසිහතර වැනිදා එක් සැකකරුවෙක් අත්අඩංගුවට ගනු ලැබීය. ඔහු අධිකරණය හමුවේ ඉදිරිපත් කිරීමෙන් පසු ඇප මත මුදාහැර තිබේ. නැවත අගෝස්තු අටවැනි දින අදාළ නඩුව කැඳවීමට නියමිතය.

අදාළ තරුණයන් පසුගිය අප්‍රේල් හය වැනි දින මහනුවර නගරයේදී විදෙස් තරුණියගේ අතින් අල්ලා සෙල්ෆි ඡායාරූපයක් ලබා ගැනීමට බලකර තිබෙන බව පොලිස් පරීක්ෂණ මගින් අනාවරණය වී ඇත. මෙම තරුණයන් කටුගස්තොට හා මැදවල ප්‍රදේශවල පදිංචිකරුවෝ වන අතරම වයස අවුරුදු දහඅට දහනවය සහ විස්සක පසුවන අය වෙති.

"මේ සිදුවීම සුළුකොට තැකිය හැකි එකක් නොවේයි. මොකද මහනුවර නගරයේ ආරක්ෂාව පිළිබඳව නිදහසේ ගමන් කිරිමට ඇති ඉඩකඩ ඇහිරී යාම මෙයින් පිළිබිඹු වෙනවා. එය විදේශිය සංචාරකයින් අතර පැතිර යන පණිවිඩයක් වුව හොත් ඉදිරියෙදි විශාල අභියෝගයකට මූණ දෙන්න අනිවාර්යෙන් සිදුවෙනවා. තරුණයින් සෙල්ලමට කල වැඩක් ලෙස මෙය දකින්න කොහෙත්ම බැහැ. මෙවැනි සිදුවීම් සිදුවීමට කොහෙත්ම ඉඩක් තැබිය නොහැකියි. එහෙයින් ඊට අදාල නීතිමය පියවර දැනටමත් ගෙන තිබෙනවා. ඉදිරියේදිත් මීට අදාල පරීක්ෂණ සිදු කෙරෙනවා ...." යැයි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි චමිල් රත්නායක මහතා කියා සිටියේය. සිද්ධිය සම්බන්ධවෙන් සංචාරක පොලිස් ඒකකයේ වැඩ බලන ස්ථානාධිපති පොලිස් පරීක්ෂක ලලිත් මහගෙදර මහතාගේ මෙහෙයවීමෙන් වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

කුමන හෝ චේතනාවකින් යමක් සිදුකරන විට එය හෙට දවසේ තමන්ට බලපානුයේ කෙසේද යන්න නොසිතන ප්‍රබල පිරිස තරුණයින්ය. ආවේග පාලනය , හැඟීම් පාලනය , යහපත් චර්යාව ආදි ගුණාංග දැන් දැන් බොහොමයක් තරුණ පිරිස් අතර දක්නට නොලැබෙන ගති ලක්ෂණ වී ඇත්තේය. ඊට ප්‍රබලව බලපානු ඇත්තේ වැඩිහිටි මග පෙන්වීම් හෝ ගුරු ගෝල සම්බන්ධතා දුරස්ව යාමය. මෙය රටක ඉදිරි යහපැවැත්මට ප්‍රබල ලෙස බලපාන සාධකයක් වන්නේය. මේ අකටයුතුකම් සිදු කොට ඇත්තේද අධ්‍යාපනයක් නැති , පාරතොටෙහි නිකරුණේ රැඳෙන තරුණයින් විසින්ද නොවේ. කවරකු අතින් වුවද සිදු නොවිය යුතු මෙවන් අකටයුතුකම් වහා නතර විය යුතුය. තරුණ ජීවිත වලටත් රටේ අනාගතයටත් මෙහි සෘජු බලපෑමක් එල්ලවන නිසාය. තරුණයින් තමන්ගේ සිතුවිලි පාලනය කිරිමේ වගකීම දැන් දැන්ම සිදු කළ යුතුය. පොලිස් පොතේ නම ලියැවී අධිකරණයේ දි වරදකරුවෙක් වීමෙන් තමන්ගේ ජීවිතයට කළු පැල්ලමක් එක්කාසු වීම අනාගතයේදි පෙරවරදක් ඇති මිනිසෙක් ලෙස හංවඩු ගැසෙන බව මේ තරුණයින් අවබෝධ කර ගත යුතුය. ඒ හෙයින්ම අප හෙට අඬන්නට වන කිසිවක් අද නොකළ යුතුය.

● සමන්තී වීරසේකර



## තෙල් නෑ - පොහොර නෑ

# වී ගොවියෝ යල කන්නය අත්හරිති

පොහොර ඉල්ලා ගොවීන් නගන අඬහැරය රජරට ඇතුළු වී වගාකරන පෙදෙස්හි ගොවිබිම්වලින් යළිත් වතාවක් උස් හඬින් ඇසෙන්නට පටන්ගෙන තිබේ. ඒ යල් කන්නයේ වී වගාව වෙනුවෙනි. වාරි පහසුකම් යටතේ වී වගාකරන බොහෝ ප්‍රදේශවල ජලාශයන්හි මේ වනවිට ජලය නිකුත්කර සති කිහිපයක් ගතව තිබේ. එහෙත් වී වගාවට යොදන පොහොර වර්ග කිසිවක් තමන්ට මෙතෙක් ලැබී නැතැයි ගොවි ජනතාව කියා සිටිති. වගාවට අවශ්‍ය පොහොර කලට වේලාවට නොලැබීමෙන් සිදුවන්නේ පසුගිය කන්නයේ අත්වූ සන්තෑසියම බවද ඔවුහු පෙන්වා දෙති. මෙවරත් රසායනික පොහොර නොලැබෙන්නේනම් ගොවිතැන කරනවාට වඩා අත්හැර දැමීම වඩාත් යහපත් බවයි බොහෝ ගොවීන්ගේ මතය වී තිබෙන්නේ. ඒ අනුව මෙවර යල කන්නයේ වී වගාව නොකර ඇනහිටින්නට ඉඩ තිබෙන බවයි ගොවි සංවිධාන සහ ගොවි ජනතාව පෙන්වා දෙන්නේ.

''රසායනික පොහොර නොලැබෙනවානම් අපි යල් කන්නයේ වී වගාව කරන්නේ නෑ. වගාව අත් හරිනවා මේ විදියට දිගින් දිගටම පාඩු ලබන්න අපිට බෑ.'' රජරට ගොවිබිම් කරා ගිය ගමනේදී ගොවීන් බොහෝ දෙනකු අප සමඟ එසේ කියා සිටියහ.

පොලොන්නරුව දිස්ත්‍රික්කයේ පමණක් වී වගා කෙරෙන කුඹුරු ප්‍රමාණය හෙක්ටයාර් 60,000ක් පමණය. පරාක්‍රම සමුද්‍රය, ගිරිතලේ, මින්නේරිය, කවුඩුල්ල යන මහවැව් යටතේ සහ ඇලහැර අමුණෙන් පෝෂණය වන ඇලහැර මහ ගොවිජනපදයේ කුඹුරුවලට සහ මහවැලි කලාපවල කුඹුරුවලට යල කන්නයේ වී වගාව සඳහා මෙතෙක් ජලය නිකුත්කර නොමැත. එයට හේතුව වගාවට අවශ්‍ය පොහොර සම්බන්ධයෙන් කාරණයට මෙතෙක් විසඳුමක් නොලැබීමය. එහෙත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇතැම් වැව්වල මේ වනවිට ජලය නිකුත් කිරීම ආරම්භ කර ඇත.

එලෙස ජලය නිකුත් කළද ගොවීන් මෙතෙක් වගා කටයුතු ආරම්භ කිරීමට ගොවීන් පියවර ගෙන නොමැති බව අපට දැනගන්නට ලැබිණි. පොහොර ප්‍රශ්නය ඇතුළුව ගොවිතැනට අදාළව තමන් මුහුණදෙන මූලික ප්‍රශ්න කිහිපයකට විසඳුම් ලබා දෙන්නැයි ගොවීහු රජයෙන් ඉල්ලා සිටිති. මේ ගොවීන්ගේ ඉල්ලීම වනුයේ පොහොර ප්‍රශ්නය ඇතුළු එම ඉල්ලීම්වලට කඩිනමින් විසඳුම් ලබාදීමෙන් පසුව යල කන්නයේ වගාව සඳහා වැව්වලින් ජලය නිකුත් කිරීම ආරම්භ කරන ලෙසය. පසුගියදා පොලොන්නරුව පරාක්‍රම සමුද්‍රය ව්‍යාපාර අධිකාරී කාර්යාලයේ පැවැති දිස්ත්‍රික් ඒකාබද්ධ ගොවි සංවිධානයේ රැස්වීමකදී දිස්ත්‍රික්කයේ ගොවි නායකයන් මේ බව රජයෙන් ඉල්ලා සිටියහ. යල කන්නයේ වී වගාව ආරම්භ කිරීමට පෙර රසායනික පොහොර සහ කෘෂි රසායන ගොවීන්ට ලබාදෙන ලෙසත් එමෙන්ම පසුගිය මාස් කන්නයේ කාබනික පොහොර භාවිත කිරීම නිසා අඩුවූ අස්වැන්න වෙනුවෙන් ලබාදීමට රජය පොරොන්දු වී ඇති වන්දි මුදලද නොපමාව ලබාදෙන ලෙසත් ගොවීහු ඉල්ලීම් කළහ. මෙම ඉල්ලීම්වලට කඩිනම් විසඳුමක් ලබාදෙන තෙක් යල කන්නයේ වී වගාව සඳහා දිස්ත්‍රික්කයේ මහ වැව්වලින් ජලය නිකුත් කිරීම ආරම්භ නොකරන ලෙස පොලොන්නරුව දිස්ත්‍රික් ලේකම්වරයාගෙන් ඉල්ලා සිටීමටද ගොවි නායකයෝ මෙහිදී තීරණය කර තිබේ.

**එහිදී අදහස් දැක්වූ පොලොන්නරුව දිස්ත්‍රික් ඒකාබද්ධ ව්‍යාපාර ගොවි සංවිධානයේ සභාපති හා පරාක්‍රම සමුද්‍රය ව්‍යාපාර ගොවි සංවිධානයේ සභාපති ජගත් අරුණ කීර්ති මහතා**

''දැන් යල කන්නයේ වගාව පිහිටුවීමට කාලයත් ඉක්මයමින් තිබෙන්නේ. මැයි මාසයේ පස් වෙනිදට කලින් වගාව ආරම්භ නොකළොත් කන්නයට පමා වෙනවා. එහෙම පහුවෙලා වගා කරලා වැඩක් නෑ. අනිවාර්යෙන්ම කෘමිහානි වසංගත රෝග ආදියට වගාව ගොදුරුවෙනවා. ඒ බව අත්දැකීම් තියෙන ගොවීන් හොඳින්ම දන්නා කාරණයක්. ඒ නිසා කන්නයට පහු නොවී වගාව කරන්න ඕන. නමුත් යල කන්නයේ වගාවට යෑමට පෙර ගොවීන් හැටියට අපිට මූලික ප්‍රශ්න තුනක් තිබෙනවා. ඒ තමයි රසායනික පොහොර, කෘෂි රසායන සහ පසුගිය කන්නයේ වගා හානි වෙනුවෙන් රජය ලබාදීමට එකඟ වී ඇති වන්දි මුදල. ඒවා අපිට කඩිනමින් ලබා දෙන්න. ඒ වන්දි මුදල් දෙනවා කියලා කියනවා විතරයි. කොපමණ මුදලක් දෙනවාද, දෙන ක්‍රමවේදය මොකක්ද ඒ කිසිම දෙයක් ගැන පැහැදිලි පිළිතුරක් නෑ. යල කන්නයේ වගාවට යන්න ලොකු කාලයක් නෑ. ඒ වගේම අඩුම තරමින් පසුගිය මාස් කන්නයේ අස්වනු අඩුවීම සම්බන්ධයෙන් නිසි තක්සේරුවක් තවම කරලා නෑ. නිලධාරීන් අස්වනු සමීක්ෂණ කළා. ඒවයේ ප්‍රතිඵලය මොකක්ද කියලා අපි දිසාපතිවරයාගෙන් අවස්ථා ගණනාවක විමසීම් කළා. නමුත් අපිට මේ වෙනතෙක් කිව්වේ නෑ. හැම වෙලේම කියන්නේ තවම ඒ කටයුතු අවසන් නෑ කියලා. මේ විදියට ආණ්ඩුවයි, නිලධාරීනුයි අපිව රවට්ටනවා. දැන් වැව්වල අවශ්‍ය තරම් වතුර තිබෙනවා. නමුත් වගාවට අවශ්‍ය මූලික යෙදවුම් ටික නැතිව වගාවට යන්න හැකියාවක් ගොවීන්ට නෑ. එම නිසා මේ ඉල්ලීම් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමුකරන්න කියන ඉල්ලීමයි අපි කරන්නේ. කාබනික පොහොර භාවිතය නිසා ගොවීන්ට සිද්ධ වෙලා තියෙන දේ අද ඇස් පනාපිට පේන්න තිබෙනවා. අපි මේ ගැන මේ මුලදිම කිව්වා. අස්වැන්න අඩුවෙලා ගොවියා කබලෙන් ළිපට වැටෙනවා. රටේ වී හිඟයක් ඇතිවෙනවා. හාල් හිඟයක් ඇතිවෙනවා කියලා. නමුත් වගකිවයුතු කිසිම කෙනෙක් ඒ ගැන ඇහුම්කන් දුන්නේ නෑ. දැන් ජනාධිපතිතුමා පවා පිළි අරගෙන තිබෙනවා ගොවීන්ට රසායනික පොහොර නොදීම වරදක් කියලා. රැ වැටුණු වළේ අපිට දවල් වැටෙන්න බෑ. ඒ නිසා කන්නය ආරම්භ කිරීමට පෙර අපිට රසායනික පොහොර දෙන්න. වල් නාශක කෘමි නාශක ටික සහන මිලකට ලබාගන්න අවශ්‍ය වෙළඳපොළ වටපිටාව සකසන්න. අපි සූදානම් යල කන්නයේ වී වගාව කරන්න. එහෙම නොවුණොත් පසුගිය කන්නයට වඩා අන්ත තත්ත්වයත් මේ වතාවේ ඇතිවෙනවා. වගාව අසාර්ථක වෙලා අස්වැන්න අඩු වෙනඑක ස්ථිරයි. එම නිසා පොහොර ලබාදීම සම්බන්ධයෙන් ස්ථිර පොරොන්දුවක් අපිට ලැබෙනතෙක් අපිට වතුර එපා. රසායනික පොහොර නැත්නම් අපි මේ කන්නයේ කුඹුරු වගා කරන්නේ නෑ. ඒ නිසා මේ රටේ වී ගොවිතැන වළ පල්ලට යවන්න එපා කියන ඉල්ලීම අපි කරනවා. රසායනික පොහාර ලබාදීමේ ප්‍රශ්නය ඇතුළුව

## වතුර තිබුණට මදි රසායනික පොහොරත් ඕනෑ!

අපේ මූලික ප්‍රශ්න සම්බන්ධයෙන් අපිට පැහැදිලි පිළිතුරක් අවශ්‍යය. එහෙම නොවුණොත් මේ කන්නයේ වී වගාවෙන් වළකින්න අපට සිද්ධවෙනවා.''

**පොලොන්නරුව ගිරිතලේ ව්‍යාපාර ගොවි සංවිධානයේ භාණ්ඩාගාරික පී. ආර්. යූ. විජේරත්න මහතාගෙන් යල කන්නයේ වී වගාව සම්බන්ධයෙන් අප කළ විමසුමකදී පිළිතුරු දුන්නේ මෙසේය.**

''මේ ආණ්ඩුව බලයට පත්වුණේ ගොවියාට පොහොර සහනාධාරය නොමිලයේ දෙනවා කියලා. නමුත් මේ වෙනකොට නිකංදෙනවා කිව්ව පොහොරත් නෑ. මොනවත් නෑ. පොහොර අපිට ඔරොත්තු දෙන මුදලකට සල්ලිවලට ගන්නත් නෑ. වෙළෙඳපොළේ රුපියල් 1500ට තිබුණු පොහොර හොණ්ඩරය දැන් 45,000යි. ඩීසල් මිල ඉහළ ගිහින්. ඒ නිසා මේ කන්යේ සී සෑමට ඇතුළුව යන්ත්‍ර සූත්‍ර සඳහා විශාල මුදලක් වැයකරන්න වෙනවා. මේකයි තත්ත්වය ඉතින් අපි කොහොමද කුඹුරු ගොවිතැන් කරන්නේ. අවශ්‍ය කරන රසායනික පොහොර, කෘමිනාශක ලැබුනොත් විතරයි අපි මේ කන්නයේ වගාවට කුඹුරට බහින්නේ. මේ බව කියලා ගිරිතලේ ව්‍යාපාරයේ ගොවීන් සියලුම දෙනා අත්සන් කරලා දිස්ත්‍රික් ලේකම්වරයාට ලිඛිතව බාර දීලා තියෙනවා.''

**මින්නේරිය ව්‍යාපාර ගොවි සංවිධානයේ ලේකම් අයි. එම්. එස්. ආර්. බණ්ඩාර මහතා මෙවර යල කන්නයේ වී වගාව සම්බන්ධයෙන් අප හමුවේ සිය අදහස් දැක්වූයේ මෙසේයි.**

''පසුගිය මාස් කන්නයේ අපි වගා කළේ කාබනික පොහාර යොදලා. අපිට ලැබුණේ සියයට 30 විතර ඉතාම අඩු අස්වැන්නක්. මේ හේතුවෙන් ගොවීන් සෑම දෙනෙක්ම අසරණ තත්ත්වයට පත්වෙලා ඉන්නේ. පසුගිය කන්නයේ අපිට මේ විදියේ අඩු අස්වැන්නක් ලැබුණේ රජය ගත්තු වැරදි තීන්දු තීරණ නිසයි කියන එක අපි හොඳකාරවම දන්නවා. ඒ නිසයි අපි මේ වගේ අසරණ තත්ත්වයකට පත්වුණේ. මේ විදියට ලබන කන්නෙත් අසරණ තත්ත්වයට පත්වෙන්න අපේ ගොවි ජනතාව කැමතිනෑ. ඒකට හේතුව යූරියා ඇටයක්වත් අපිට දකින්න නෑ. කෘමිනාශක නෑ. ඩීසල් මිල ඉහළ ගිහිල්ලා. මේ අනුව හෙක්ටයාරයක් වගාකරන්න විශාල මුදලක් වියදම් කරන්න සිද්ධ වෙනවා.ඒ නිසා රසායනික පොහොර දුන්නේ නැත්තම් අපි මේ වතාවේ කුඹුරු වගා කරන්නේ නෑ. ඒක ස්ථිරවම කියනවා.''

**මහවැලි සී කලාපයේදී අපට මුණගැසුණු එහි ගොවි නායකයෙකු වන ජයන්ත රන්දෙණිය මහතා** ප්‍රකාශ කළේ මෙවර යල් කන්නයේ වී ගොවිතැන අත්හැරෙන තත්ත්වයක් පෙනෙන්නට තිබෙන බවයි. එයට හේතුව පසුගිය මාස්කන්නයේ ලැබුණු අස්වනු අඩුවීම සහ යෙදවුම් මිල ඉහළ යෑම නිසා ගොවිතැන සඳහා විශාල මුදලක් දැරීමට සිදුවීම බවද ඒ මහතා කීය.

''මේ මහවැලි සී කලාපයේ ගොවීන් බොහෝ දෙනකුගේ අස්වැන්න මෙවර අඩුවුණා. එයට ප්‍රධාන හේතුව අවශ්‍ය රසායනික පොහොර නොමැතිවීම. වෙනදා හෙක්ටයාරයකින් වී කිලෝ 4000ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ගත්තු ගොවීන්ට මෙවර ලැබුණේ වී කිලෝ 3000කටත් අඩු ප්‍රමාණයක්. ඉදිරි යල කන්නයේ අස්වැන්න ඊටත් අඩුවේවි. මෙහෙම ගොවිතැන්

## හාල් මිල දෙගුණයකින් ඉහළ යෑමේ අවදානමක්...

කරලා වැඩක් නෑ කියලයි ගොවීන් කියන්නේ. පසුගිය කන්නයේ අස්වැන්න අඩුවීම වෙනුවෙන් රජය වන්දි මුදලක් දෙනවා කියලා කියනවා. නමුත් තවම ඒ මුදල් ලැබුණේ නෑ. මුදල් ලබාදෙන දිනයක් ගැනවත් හරි තොරතුරක් නෑ. ඒ විතරක් නොවෙයි මේ වෙනකොට රසායනික පොහොර තියා කිසිම පොහොරක් ගොවීන්ට ලැබිලා නෑ. ගොවීන් හරිම අසරණ තත්ත්වයකට පත්වෙලා ඉන්නේ.''

**ජාතික ඒකාබද්ධ ගොවි සංවිධානයේ ප්‍රධාන ලේකම් නිහාල් වන්නිආරච්චි මහතාගෙන් යල කන්නයේ වී සඳහා මේ රටේ ගොවි ජනතාවගේ සූදානම කෙබඳුද යන්න විමසූ අවස්ථාවේදී ඔහු පිළිතුරු දුන්නේ මේ අන්දමටය.**

''පසුගිය යල් කන්නයේ ගොවීන්ට රසායනික පොහොර නොදීමේ ප්‍රතිවිපාකය අපි අත්වින්දා. රටක් විදියට ලැබුණු ප්‍රතිඵලය අමුතුවෙන් කියන්න වුවමනා නෑ. මුළු රටේම වී අස්වැන්න සියයට පනහකට වැඩිය අඩුවුණා. මෑත ඉතිහාසයේ නොවූවිරූ අන්දමට පිටරටින් සහල් ගෙන්වන්න සිද්ධ වුණා. මේ දක්වා අඛණ්ඩව එය ක්‍රියාත්මක වෙනවා. එමගින් ජාතික ආර්ථිකයට මරු පහරක් එල්ල වුණා. කිව්වොත් නිවැරදියි. දේශීය කෘෂිකර්මාන්තය වළපල්ලට ගියා පමණක් නොවෙයි ගොවි ජනතාවගේ ආර්ථිකයත් එහෙම පිටින්ම බිඳවැටුණා. මේ කන්නයේත් ඒ තත්ත්වය තමයි වෙන්නේ. මම ගොවිතැන් කරන්නේ අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් රාජාංගනය ජලාශය යටතේ. මේ වෙනකොට රාජාංගනය ජලාශයේ යල කන්නයේ වගාවට ජලය නිකුත් කරලා මාසයකට කිට්ටු වෙනවා. අප්‍රියෙල් පළමුවෙනිදා ජලය නිකුත්කළේ. කිසිම ගොවියෙකුට වගාවට අවශ්‍ය කිසිම පොහොර වර්ගයක් මේ වනතෙක් ලැබිලා නෑ. ඒ හේතුවෙන් ගොවීන් තවමත් වගාකටයුතු ආරම්භ කරලා නෑ. අපේ ජලාශය යටතේ ගොවි සංවිධාන 64ක් තියෙනවා. ඒ කිසිම ගොවියෙක් යල කන්නයේ වගාවට පොහොර දෙන දිනයක්වත් තවම දන්නේ නෑ. මේකයි ඇත්ත තත්ත්වය. ආණ්ඩුවේ ඇමැතිවරුයි නිලධාරීනුයි පුරසාරම් දොඩනවා පමණයි. මේ වතාවෙත් ගොවීන්ට වගාවට අවශ්‍ය පොහොර නෑ. ඒ නිසා මේ කන්නයේ වී වගාවට යොමුවෙනවාද නැද්ද කියලා තවම තීරණයක් නැති තත්ත්වයකයි ඉන්නේ.''

**ගොවීන්ට අවශ්‍ය පොහොර සහ කෘෂි රසායන කලට වේලාවට නොලැබීමේ හේතුවෙන් ඇතිවී තිබෙන අර්බුදය සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කළ ගොවි අරගල ව්‍යාපාරයේ මෙහෙයුම් කමිටු සාමාජික ආර්. කේ. ඉන්ද්‍රානන්ද ද සිල්වා මහතා-**

''ආණ්ඩුව පසුගිය වතාවේ කළේත් ගොවියා අන්ත අසරණ තත්ත්වයට පත්කරලා අමාරුවේ දාපු එක. මේ වතාවේ කරන්න සූදානම් වෙන්නෙත් ඒ ටිකමයි. පොහොර නැත්නම් වතුර එපා කියන මතයේ පසුගිය කන්නයේ ගොවීන් හිටියා. නමුත් ආණ්ඩුව ගොවීන්ට පොහොර දෙනවා කියලා පොරොන්දු වුණ නිසා ගොවීන් කුඹුරට බැස්සා. ඒත් පොහොර ටික කලට වේලාවට ලැබුණේ නෑ. පසුගිය කන්නයට වඩා මේ කන්නයේ තත්ත්වය ගොඩක් වෙනස්. ඒ කන්නයේ ආණ්ඩුව රසායනික පොහොර ගෙන්වීම නතර කරනවා කියලා කියනකොට ගොවීන් සතුව කිසියම් ප්‍රමාණයක රසායනික පොහොර වර්ග තිබුණා. අම්පාර, මොණරාගල වගේ දිස්ත්‍රික්කවල බඩඉරිඟු, එළවළු, පලතුරු ආදිය වගාකරන ගොවීන් ළඟත් එවකට වෙළඳපොළේ පැවැතුණු මිලට රසායනික පොහොර වර්ග මිලදීගෙන තිබුණා. උදාහරණයක් විදියට යූරියා හොණ්ඩරය රුපියල් 1500ට වගේ මිලකට වෙළඳපොලේ මිලදීගන්න තිබුණා. මේ රසායනික පොහොරත් කාබනික පොහොරත් දෙකම යොදලා තමයි පසුගිය මාස්කන්නයේ සියයට පනහක පමණ වී අස්වැන්නක් ලැබුණේ. ඒ වගේම මාස්කන්නයේ වර්ෂාව නිසාත් නයිට්‍රජන් ප්‍රමාණයකුත් ලැබුණා. නමුත් මේ කන්නයේ ඒ කිසිම දෙයක් නෑ. දැන් යූරියා හොන්ඩරයක මිල රුපියල් 40,000ක් විතර වෙනවා. ඒ වගේ මිලකට පොහොර මිලදී අරගෙන කොහොමද ගොවියා ගොවිතැන් කරන්නේ. එම නිසා ආණ්ඩුව හැකි ඉක්මනින් මේ ප්‍රශ්නයට විසඳුමක් ලබාදිය යුතුයි. ආණ්ඩුව කියනවා ගොවීන්ට රසායනික පොහොර ගෙන්වලා දෙනවා කියලා. නමුත් මේ වෙනකොට රසායනික පොහොරත් නෑ. කාබනික පොහොරත් නෑ. රසායනික පොහොර ලබා නොදී කාබනික පොහොරවලින් පමණක් මොනම ආකාරයෙකින්වත් පසුගිය කන්නයේ ලබාපු අස්වැන්න මේ කන්නයේ ලබන්න බෑ කියන එක ගොවීන් ඉතා පැහැදිලිව කියනවා.''

රජය රසායනික පොහොර මෙරටට ගෙන්වීම තහනම් කිරීමට තීරණය කළේ පසුගිය මාස් කන්නයේ ආරම්භයේදීය. ඒ අවස්ථාවේදී ගොවීන් එක හඬින් කියා සිටියේ රසායනික පොහොර නොමැතිව කිසිම වගාවකින් සාර්ථක අස්වැන්නක් ලැබීමට නොහැකි බවය. රසායනික පොහොර නොමැතිව වී වගාවෙන් නිසි අස්වනු ලබන්නට බැරි බවත් ඒ හේතුවෙන් මේ රටේ වී ගොවිතැන බිඳවැටෙන බවත් ගොවීහු එදා කියා සිටියහ. අත්දැකීම් බහුල ගොවීන් පළකළ ඒ මතයට ආණ්ඩුවේ වගකිවයුතු කිසිවෙකුත් එදා ඇහුම්කන් දුන්නේ නැත. එහි ප්‍රතිඵලය දැන් ඇස් පනාපිටම පෙනෙන්නට තිබෙන බව ගොවි ජනතාව පෙන්වා දෙති. ආණ්ඩුව සියලු වැඩ අනාගැනීම එතැනින් ආරම්භ කර දැන් හොම්බෙන් යන තැනට කටයුතු යෙදී හමාර බවයි ගොවීන් පවසන්නේ. ආණ්ඩුවේ ඒ අත්තනෝමතික තීරණය නිසා මේ රටේ සමස්ත ගොවිජනතාවටම කබලෙන් ළිපට වැටී අසරණවන්නට සිදුව ඇතැයිද ඔවුහු පවසති. රසායනික පොහොර සහ කෘමිනාශක යළිත් මෙරටට ගෙන්වීමට රජය තීරණයක් ගත් බව වත්මන් කෘෂිකර්ම ඇමැතිවරයා පසුගියදා ප්‍රකාශකර තිබුණි. එම ද්‍රව්‍ය කඩිනමින් ගොවීන්ට ලබාදීමට වැඩපිළිවෙළක්ද ආරම්භ කර

## වන්දි මුදලක් දෙනවා කීවාට ඒකත් නෑ.

ඇතැයිද එම නිසා වහාම ගොවිතැන් කටයුතු අරඹන්නැයිද ඇමැතිවරයා සියලුම ගොවීන්ගෙන් ඉල්ලීමක් කර තිබූ බවක්ද කියැවිණි. එහෙත් මේ ප්‍රකාශය යථාර්ථයක් බවට පත්වීම පිළිබඳව බලවත් සැකයක් පවතින බව බොහෝ ගොවි නායකයන් අප සමඟ කියා සිටියහ. එයට ප්‍රධාන හේතුව ලෙස ඔවුන් පෙන්වාදුන්නේ යල කන්නයේ වගාව ආරම්භ කිරීමට මත්තෙන් අවශ්‍ය පොහොර තොග මෙරටට ගෙන්වා ගොවිජනතාවට ලබාදිය හැකිද යන්නයි. මන්දයත් රට තුළ වී වගාකෙරෙන හෙක්ටයාර් ලක්ෂ 08ක් පමණවන කුඹුරු ප්‍රමාණය සඳහා අවශ්‍ය රසායනික පොහොර කඩිනමින් සපයාදෙන්නේ කෙසේද යන කාරණයයි. අක්කරයකට පොහොර හොණ්ඩර දෙක බැගින් වනසේ පොහොර නිකුත් කිරීමට බලාපොරොත්තුවුවද පොහොර හොණ්ඩර ලක්ෂ 40ක් පමණ අවශ්‍යවන බව ගොවි නායකයන් පවසති. කෙසේ වුවද වගාවට අවැසි රසායනික පොහොර ගොවීන්ට නොලැබුණහොත් යල කන්නයේ වී වගාව පවතිනුයේ අවිනිශ්චිත තත්ත්වයෙක බව ගොවීන්ගේ කථා බහ සහ දැඩි තීරණ තුළ පෙනීයයි. එසේ වුවහොත් ඇතිවන වී නිෂ්පාදනයේ පහලබැසීම නිසා දේශීය සහල් නිෂ්පාදනයට විශාල බලපෑමක් එල්ලවන බව ඉතා පැහැදිලිය. මහා පරිමාණ සහල් මෝල් හිමියන් සතුව වී තොග විශාල වශයෙන් තිබෙන නමුත් වී නිෂ්පාදනය අඩාළ වුවහොත් සහල් මිල දැනට වඩා විශාල ලෙස ඉහළයනු නොවැළැක්විය හැකි යැයි මරඳගහමුල සහල් නිෂ්පාදකයෝ කියා සිටිති. එමෙන්ම රටතුළ දැනටමත් පවතින වී හිඟය හේතුවෙන් මෙතෙක් ක්‍රියාත්මකව පවතින සුළු හා මධ්‍යපරිමාණ සහල් මෝල්ද විශාල ප්‍රමාණයක් වැසීයෑමට තිබෙන ඉඩකඩ වැඩි බවද ඔවුහු කීහ. මේ තත්ත්වයට පිළියම් ලෙස සහල පිරටින් ගෙන්වීමේ රජයේ ක්‍රියාවලිය අඛණ්ඩව සහ වේගවත්ව කිරීමට සිදුවනු ඇතිබවද එම සහල් නිෂ්පාදකයෝ පෙන්වා දෙති.

මෙරට ගොවිතැන සඳහා රසායනික පොහොර භාවිතය තහනම් කිරීමේ අත්තනෝමතික ක්‍රියාව හේතුවෙන් මෙරට කෘෂිකර්මාන්තය වළපල්ලට ඇදවැටුණු බවට කිසිදු විවාදයෙක් නැත. ජීවිතය පුරාවට දුක වළඳමින් රටට බත සපයන මෙහෙවරේ විසල් වගකීමක් උසුලන ගොවි ජනතාව ඉන් දැඩි ලෙස බැටකෑ බව සැවොම දන්නා කරුණෙකි. රසායනික පොහොර නොගෙන්වීමේ රජයේ දරදඬු පිළිවෙත නිසා ආහාර නිෂ්පාදන ක්‍රියාවලියේදී ඇතිවූ බරපතළ පසුබෑම තව තවත් ඔඩුදුවමින් තිබේ. එහිදී ගොවි ජනතාවට සිය ආර්ථිකය බිඳවැටී විඳින්නට සිදුවූ පීඩාකාරී තත්ත්වයන් අපමණ බැව් අමුතුවෙන් කිවයුතු නොවේ. එමෙන්ම මෙරට බත්කන ජනයාටද ගිනිගණන් ගෙවා සහල් මිලදී ගන්නට තවදුරටත් සිදුව ඇත්තේද එහි කරුම ප්‍රතිඵල ලෙසින් බව සඳහන් කළ යුතුය.

● කරුණාරත්න ගමගේ







නිහාල් වන්නි ආරච්චි



ජයන්ත රන්දෙණිය



විජේරත්න



අයි. එම්. එස්. ආර්. බණ්ඩාර



ජගත් අරුණ කීර්ති



ආර්. කේ. ඉන්ද්‍රානන්ද ද සිල්වා

# තුන් වෙනි ලෝක යුද්ධය අනිවාර්යයි



*අප්‍රේල් 26 වැනිදා මොස්කව් නුවර ක්‍රෙම්ලිනයේදී ජගත් මහලේකම් ඇන්ටෝනියෝ ගුටරෙස් හා ජනාධිපති ව්ලැඩිමීර් පුටින් හමුව. සාකච්ඡා මේසයේ දිග. පුටින්ගේ උපාය මාර්ගික බව සහ සාමයේ දිග පළල දර්ශනය කරන බව කිව හැකිය.*

මෙදවන ලෝකය අවසන් වී තිබුණි. මේ 1947 වර්ෂයේ මාර්තු මාසයය. මහාචාර්ය ඇල්බට් අයින්ස්ටයින් සිය සම්භාවනීය මිතුරු සමාජය සමග රාත්‍රියක් ගත කරමින් සිටියේය. බොජුන්, මේසය මතට පැමිණෙන තෙක් සිටි ඔවුහු, සාකච්ඡාව සඳහා ලක් කරන ලද්දේ, විද්‍යාව, දේශපාලනය ආදී මාතෘකාය. අයිස්ටයින්ගේ මිතුරෙකු ඔහුගේ එහිදී විමසා සිටියේ, තුන්වෙනි ලෝක යුද්ධයේ ස්වභාවය කෙසේ වනු ඇතිද කියාය. විශේෂයෙන්ම න්‍යෂ්ඨික අවි නිපදවා, අත්හදා බලමින් තිබූ එම කාලයේ, ඊළඟ ලෝක යුද්ධය, ඈගේ හයිය හෝ හිතේ සවිය අනුව නොව 'තාක්ෂණික - තාක්ෂණික' යන මාදිලියෙන් සිදුවන බවට සියලු අනාවැකි පළවී තිබුණි. එම තාක්ෂණික හැඩරුව පිළිබඳව අයිස්ටයින්ගෙන් අසා ගැනීම, ප්‍රශ්න නගනා මිතුරාගේ අදහස වී තිබුණු බව කිව හැකිය. මඳක් දැහැන්ගත වූ අයින්ස්ටයින් "තුන්වෙනි ලෝක යුද්ධයේ ස්වභාවය සඳහන් කරන්නට මට හැකියාවක් නැහැ මිත්‍රයා... ඒත් මම සිව් වෙනි ලෝක යුද්ධය පිළිබඳව ඔබට අනාවැකියක් කියන්නම්...'' මිතුරා තුෂ්නිම්භූත වූවේ, දෙවැනි ලෝක යුද්ධය අවසන්ව, දැන් වසර දෙකකට වැඩි කාලයක් නොවීය. තෙවන ලෝක යුද්ධයක් පිළිබඳ සේයාවක් තවම නැත. එසේ වෙද්දී අයින්ස්ටයින් සිව් වෙනි ලෝක යුද්ධය පිළිබඳව අනාවැකි ප්‍රකාශ කරන්නේ කෙසේද යන්න කල්පනා කරමිනි. "එය නිසැක ලෙසම පොලු, මුගුරු සහ ගල් වලින් සිදුවනු ඇත.'' අයිස්ටයින් සිව් වෙනි ලෝක යුද්ධය පිළිබඳව අනාවැකිය මිතුරා වෙත ප්‍රකාශ කළේය.

ඇත්ත වශයෙන්ම එහිදී අයින්ස්ටයින් ප්‍රකාශ කරන ලද්දේ, තුන් වෙනි ලෝක යුද්ධයේ දිග පළලය. එය මානව ශිෂ්ටාචාරය මුළුමනින්ම විනාශ කරවන බවට අයිස්ටයින්ගේ අනුමානය විය. මේ මොහොතේ ඇතිව තිබෙන ලෝක දේශපාලන තත්ත්වය අනුව කිව හැක්කේ, රුසියන් - යුක්රේන් ගැටුම නියත ලෙසම තුන් වෙනි ලෝක යුද්ධයක් කරා ගමන් ආරම්භ කරන බවය. යුක්රේන් ප්‍රශ්නය රුසියානු නිමැවුමක් හෝ වුවමනාවක් නොවේ. යුරෝපා බලය, රුසියානු පා මුල ගාල්කර, අවශ්‍ය අවස්ථාවකදී රුසියාව මෙල්ල කිරීම සඳහා නේටෝව ඉදිරියට දමා, එක්සත් ජනපදය සිදු කිරීම සඳහා උත්සාහ දරන ලද වෑයම සඳහා රුසියානු ප්‍රතිචාරය ලෙස යුක්රේනය දෙසට රුසියානු හමුදාව ගමන් කිරීම හඳුන්වා දිය හැකිය. මේ සඳහා එක් අතකින් යුක්රේනයට පිටුපස සිට සියලු සහයන් බටහිර සහ එක්සත් ජනපද ඇණිය ලබා දෙන අතරේ, රුසියාව වෙත සම්බාධක පනවමින්, පුටින් මෙල්ල කිරීම සඳහා එක්සත් ජනපදය තවත් යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කළේය. ඒ අනුව ඒක අතකින් යුක්රේන් යුද්ධය ද අනෙක් පසින් ආර්ථික යුද්ධයක ද රුසියාව පැටලෙන්නට පටන් ගත්තේය.

මේ තත්ත්වය තුළ ගැටලු තුනක් නිර්මාණය වන්නට පටන් ගත්තේය. එම ගැටලු තුන ළිප් ගල් ලෙස ගෙන තුන් වෙනි ලෝක යුද්ධයේ බත ඉදෙන හෙයින්, නියත ලෙසම මේ අප ගෙවන්නේ පූර්ව තුන්වෙනි ලෝක යුද සමය බව කිව හැකිය.

1. ලෝක පරිමාණයෙන් තෙල් සහ ගෑස් අර්බුදයක් නිර්මාණය වීම
2. රුසියානු අභ්‍යන්තරය පුටින්ට එරෙහිව මෙහෙයවීමේ බටහිර උපාය
3. යුරෝපයේ සහ එක්සත් ජනපදයේ බලපෑමට, පුටින්ගේ ප්‍රතිචාරය

**● තෙල් සහ ගෑස් ප්‍රශ්නය**

බටහිර සම්බාධක හේතුවෙන් තෙල් බැරලයක මිල ඩොලර් 300ක් දක්වා ඉහළ යනු ඇතැයි පසුගියදා රුසියානු බලශක්ති නියෝජ්‍ය අමාත්‍ය ඇලෙක්සැන්ඩර් නොවැක් අනතුරු අඟවා සිටියේය. ලෝකයේ තුන් වැනි විශාලතම තෙල් නිෂ්පාදකයා සහ යුරෝපයේ ගෑස් ඉල්ලුම සියයට හතළිහක් පමණ සපයන රුසියාව මත පනවන ලද සම්බාධක ලෝක ආර්ථිකය නිසැක ලෙසම නව දිශානතියක් කරා රැගෙන යනු ඇත. මේ පිළිබඳව ඉන්දියාව ඇසුරෙන් සාකච්ඡා කරන්නේ නම්, එහි මධ්‍යම හා ප්‍රාන්ත රජය අය කෙරෙන බදු, පෙට්‍රල් සඳහා සියයට 58 කින් ද, ඩීසල් සඳහා සියයට 52 කින් ද ඉහළ දමමින් ඉන්ධන අර්බුදයට මුහුණ දෙමින් සිටියි. ලෝකයේ ඛනිජ තෙල් වැඩියෙන්ම භාවිත කරන රටවල් අතුරින් තෙවැනි ස්ථානය හිමි වන්නේ ඉන්දියාවටය. මෙසේ ඛනිජ තෙල් මිල අතිශයින් ඉහළ යෑම සිදුවන්නේ, ගෝලීය ආර්ථිකය කොවිඩ් වසංගතය හේතුවෙන් දැඩි ලෙස ඔත්පලව සිටිනා මොහොතකය. එසේ වෙද්දී එක් එක් රටවල් අභ්‍යන්තරයේ ආර්ථික කඩා වැටීම ද අන්තර්ජාතික වෙළෙඳාම කඩා වැටීම සහ ගෝලීය ආර්ථිකය කඩා වැටීම හේතුවෙන් ලෝකය, පසු කරන ලද සියවසේ විඳින ලද සුව පහසුව මුළුමනින්ම අහෝසි වීමේ තත්ත්වයක් කරා ඇදෙන බව කිව හැකිය. රැකියා අහිමිවීම්, ජීවන බර උසුලා ගැනීමට නොහැකිවීම ආදී අභ්‍යන්තර සාධක හේතුවෙන්, දැනට ශ්‍රී ලංකාවේ පවතින තත්ත්වයට වඩා බරපතළ ලෙස ජනතාව පාරට බැසීමක් එම රටවල් තව ටික කාලයකින් වාර්තා කරනු ඇත. විශේෂයෙන්ම ලෝක ආර්ථිකය දෙස රුසියානු තෙල් සැපයුම අනුව බලන්නේ නම්, යුරෝපයේ ඉන්ධන ගෑස් සැපයුමෙන් 40% ද එක්සත් ජනපදයේ ඉල්ලුම 8% ක් ද සපයන්නේ රුසියාවය. මෙසේ රුසියානු තෙල් සැපයුම සිදු කරනුයේ, ඔපෙක් මිලට වඩා අඩු ගාස්තු යටතේ වීම හේතුවෙන් යුරෝපයට සහ එක්සත් ජනපදයට සිය තෙල් බිල අවම තත්ත්වයක පවත්වාගෙන යෑම සඳහා රුසියාව තීරණාත්මක වී තිබුණි. යම් හෙයකින් රුසියාව වෙනුවට යුරෝපය සඳහා තෙල් සැපයුමට එක්සත් ජනපදය පිවිසෙන්නේ නම් ඒ සඳහා යුරෝපයට දැරීමට සිදුවන තෙල් වැය, කලින් දැරූ මිල මෙන් තුන් ගුණයක් පමණ වන හෙයින්, යුරෝපයේ ආර්ථිකය සපුරා වෙනස් මගක් ගන්නවා නිසැකය. විශේෂයෙන්ම පරිසරවේදී මතවාද හේතුවෙන් යුරෝපය සිය න්‍යෂ්ඨික බලාගාර දිගින් දිගටම වසා දැමූ අතර මේ හේතුවෙන් තමන්ට අනන්‍ය වූ විකල්ප බලශක්ති ප්‍රභවයන්ගෙන් වත්මන් යුරෝපය සන්නද්ධ නැත.

මේ සඳහා යුරෝපයට විකල්ප දෙකක් තිබේ. එකක් වන්නේ චීනය හරහා රුසියාවේ බලශක්ති ප්‍රභවයන් ලබා ගැනීමය. පවතින සම්බාධක හේතුවෙන් රුසියාව, චීනය වෙත නව ගෑස් නළ මාර්ගයක් ඉදිකිරීම සඳහා ගිවිසුම්ගත ව තිබේ. නළ මාර්ග ගෑස් සහ එල්එන්ජී යන මූලයන් දෙකම ඇතුළුව රුසියාව චීනයේ තුන්වන විශාලතම ස්වාභාවික ගෑස් සපයන්නාය. 2021 දී චීනයේ මුළු ගෑස් ආනයනය වන මෙට්‍රික් ටොන් මිලියන 121 න්, 10% ක් පමණ, රුසියානු ස්වභාවික ද්‍රවිකෘත වායුන්ය. 2021 වසරේදී රුසියාව, ස්වභාවික ගෑස් මෙට්‍රික් ටොන් මිලියන 12.145ක් චීනය වෙත අපනයනය කර ඇති අතර, එල්එන්ජී මෙට්‍රික් ටොන් මිලියන 4.61ක් සහ නල මාර්ග ගෑස් මෙට්‍රික් ටොන් මිලියන 7.54ක් ඒ සඳහා ඇතුළත් වේ. මෙම සමස්ත පරිමාව වසරින් වසර 51% කින් ඉහළ ගියේය. සෞදි අරාබියට පසු චීනය සඳහා දෙවන විශාලතම බොරතෙල් සැපයුම්කරු වන්නේ රුසියාවය. මේ හේතුවෙන් රුසියානු චක්‍ර එකඟතාවය මත චීනය හරහා රුසියානු තෙල් සහ ගෑස්, පෙරට වඩා වැඩි මිලකට යුරෝපයට ලබා ගත හැකි වනු ඇත.

රුසියානු තෙල් සහ ගෑස් සඳහා වන අඩුව පුරවාලීමට යුරෝපයට ඇති අනෙක් අන්තය වන්නේ මැද පෙරදිගය. මේ පිළිබඳව යුරෝපා ප්‍රයත්නය පහසු ඉලක්කයක් නොවන බව කිව හැක්කේ ජර්මන් මාධ්‍ය සමග කටාර් බලශක්ති අමාත්‍ය සාද් අල්-කාබි සිදු කරන ලද සාකච්ඡාවක් ඇසුරෙන්ය. කටාර් රාජ්‍යයේ නිෂ්පාදිත ගෑස්, රුසියානු ගෑස් හිඟයට පිළියමක් ලෙස යුරෝපයට ලබාදීම ඉක්මනින් කළ නොහැක්කක් බව ඔහු එහිදී පෙන්වා දුන්නේය. සාද් අල්-කාබිට අනුව, එය වසර ගණනාවක් ගත වන ක්‍රියාවලියකි. කෙටි කාලීනව රුසියා තෙල් සහ ගෑස් සැපයුම් ආවරණය කළ හැකි කිසිවක් ලෝකයේ කිසිදු රාජ්‍යයක් සතුව නැති බව ඔහු එම සාකච්ඡාවේදී අවධාරණය කළේය.

"අද රුසියාව නොමැතිව යුරෝපයේ ගෑස් අවශ්‍යතාව පිරිමසා ගත හැකි බව පැවසීම හාස්‍යජනක ප්‍රකාශයක්. කටාර් හෝ වෙනත් රාජ්‍යකට යුරෝපයේ රුසියානු ගෑස් සැපයුම ප්‍රතිස්ථාපනය කළ හැකි යැයි කිසිවෙකු හෝ පවසන්නේ නම් එය එය විකාර ප්‍රකාශයක්. මෙය කිසිසේත් කළ නොහැක්කකි. එහිදී අමාත්‍ය සාද් අල්-කාබි තහවුරු කර ඇත්තේ කටාර් සහ ජර්මනිය ගෑස් වෙළඳාම සඳහා එකඟ වී ඇති බවට පළ වූ වාර්තා තමා ප්‍රතික්ෂේප කරන බවය. එම සාකච්ඡාවේදී ඔහු පෙන්වා දී ඇත්තේ කටාර් රාජ්‍යය නිපදවන ඛනිජ තෙල් සහ ගෑස් ආශ්‍රිත නිෂ්පාදන වලින් සැලකිය යුතු පරිමාවක් යුරෝපීය වෙළෙඳපොළට සැපයීමට හැකි වන්නේ 2025 වර්ෂයේ සිට පමණක් බවය.

මේ සියල්ලෙන් ගම්‍ය කළ හැක්කේ යුක්රේනය නේටෝවට එක්කර ගැනීම සඳහා යුරෝපය දරන ලද ප්‍රයත්නය හමුවේ රුසියාව වෛරක්කාරයෙකු බවට පත් කර ගැනීම, යුරෝපීය ආර්ථිකය සහ ජන ජීවිතය සඳහා විශාල රිද්දවීමක් සිදු කරනු ඇති බවය.

එසේම යුරෝපය මෙම වාඩුව දෙස බලා හෝ යළි හැරෙන බවක් ද නොපෙනේ. ඒ සඳහා ඇති හොඳම උදාහරණය වන්නේ ප්‍රංශ ජනාධිපතිවරණයය. ප්‍රංශ ජනාධිපතිවරණයේ දෙවන සහ අවසාන වටය තුළ සිය මැරින් ලි පෙන් පරදවා 59% ක ඡන්ද ප්‍රතිශතයක් දිනා ගැනීමට ඉමැනුවෙල් මැක්රොන් සමත්වීම යුරෝපයේ බල තුලනය, මේ ආකාරයෙන්ම පවත්වා ගැනීම සඳහා ලැබූ ප්‍රබල රුකුලකි. රටවල් විසි හතකින් යුත් යුරෝපය නව ක්‍රමවේදයක් අනුව රුසියාව දෙස බැලිය යුතු බවට යෝජනා කරන ලද මැරීන් ලි පෙන්ගේ පරාජය බටහිර විචාරකයන් දුටුවේ, රුසියාව විෂයෙහි යුරෝපය තවත් වසර පහකට එක් මතයක සිටිනු ඇත, යනුවෙනි. ජනාධිපතිවරණයට පෙර බ්‍රහස්පතින්දා මැක්රොන් සහ ලි පෙන් අතර සජීවී රූපවාහිනී විවාදයක් පැවති අතර, එහිදී රුසියන් ජනාධිපති පුටින්, යුක්රේනය සම්බන්ධයෙන් අනුගමනය කරමින් සිටින ක්‍රියාමාර්ගය සාකච්ඡාවට ලක්විය.



**එක්සත් ජනපද රාජ්‍ය ලේකම් ඇන්ටනි බ්ලින්කන් අප්‍රේල් 24 වන දින කිව්හි රහසිගත සංචාරයකදී යුක්රේන ජනාධිපති සෙලෙන්ස්කි හමුවීම**

එහිදී ලි පෙන්, පෙනී සිටින ලද්දේ, රුසියන් ජනාධිපති පුටින්ට පක්ෂ වූ ස්ථාවරයක් අනුගමනය කරමිනි. යුක්රේන ආක්‍රමණය සම්බන්ධයෙන් මැක්රොන් යුරෝපා මතවාදය නියෝජනය කරමින්, පුටින්ට එරෙහිව පෙනී සිටි අතර රුසියා - යුක්රේන අර්බුදය වහා අවසන් කිරීම සඳහා තමන් මැදහත් වී කටයුතු කරන බව විවාදය අතරතුරේ මැක්රොන් ප්‍රංශ ජනතාව වෙත ප්‍රතිඥාවක් ද ලබා දුන්නේය. ප්‍රංශ ජනාධිපතිවරණයෙන් ඉමැනුවෙල් මැක්රොන් ජයග්‍රහණය කිරීමත් සමග පළමුවෙන්ම ඔහුට සුබ පැතුම් එක් කළ විදෙස් නායකයා වූයේ යුක්රේන ජනාධිපති සෙලෙන්ස්කි ය.

ඒ අනුව පෙනී යන්නේ තෙල් ගෑස් පසෙක තබා, පුටින්ට එරෙහිව යුරෝපය දිගින් දිගටම කටයුතු කරනු ඇති බවය.

**● සම්බාධක පීඩනය**

රුසියාව අඩපණ කිරීමේ අරමුණින් ඇමෙරිකාව ඇතුළු බටහිර රටවල් සම්බාධක පැනැවුවද, එම සම්බාධකවලින් රුසියාව අඩපණ නොවූ බවත් තමන් තවත් ශක්තිමත්ව සිටින බවත් රුසියන් ජනාධිපති ව්ලැදිමීර් පුටින් ප්‍රකාශ කරන ලද්දේ, අප්‍රේල් මස මැදදීය. ජපානය, ඔස්ට්‍රේලියාව ආදී රටවල් රැසක් ද මෙම සම්බාධක පැනවීම සඳහා යුරෝපය සහ එක්සත් ජනපදය සමග පෙළ ගැසී සිටියි. මෙම සම්බාධක හේතුවෙන් රුසියානු ව්‍යාපාරික ප්‍රජාව සහ මධ්‍යම පන්තිය විශාල පීඩනයකට ලක්ව තිබේ. මූලික නිෂ්පාදනවල මිල ඉහළ යාම, රැකියා අහිමි වීමේ අවදානමක් ජාත්‍යන්තරය සමග බද්ධ වූ ව්‍යාපාර සහ රුසියානු ජීවිත හුදකලා භාවයට පත්වීම ඒ අතරින් ප්‍රධාන බව, බීබීසී ලෝක සේවය අනාවරණය කර තිබේ.

යුක්රේන ආක්‍රමණයේ පළමු සතිය තුළ රුසියානු පාරිභෝගික මිල දර්ශකය 2.2%කින් ඉහළ ගියේය. එහිදී විශාල ලෙස ඉහළ මිලක් සටහන් කරන ලද්දේ අත්‍යවශ්‍ය ආහාරය. පෙබරවාරි මාසයේදී සීනි සහ ධාන්‍ය මිල, පෙර මසකට පෙරට වඩා, 20%කින් පමණ ඉහළ ගොස් තිබුණි. ස්මාර්ට් දුරකථන සහ රූපවාහිනී යන්ත්‍ර වැනි එදිනෙදා ජීවිතය සමග බැඳී ඇති තාක්ෂණික උපකරණ සහ එම උපාංග මිල 10% කට වඩා වැඩි වී තිබුණි.

ශීතකරණ, විදුලි උදුන්, රෙදි සෝදන යන්ත්‍රයක් වැනි ගේ දොර භාවිත වන තාක්ෂණික නිමැවුම් හි මිල 30%කින් පමණ වැඩි වීම ද සිදුව තිබේ. විශේෂයෙන්ම, රුසියානු බැංකු, ජාත්‍යන්තර ගෙවීම් පද්ධතියෙන් ඉවත් කර තිබීම හේතුවෙන් Visa, Master card, American Express, Apple stores සහ Google Pay වැනි සේවා රුසියාවට සිය සේවා අහිමි කර ඇති අතර එක්කෝ සීමා කර තිබේ. මේ සියල්ල දෙස බලා රුසියානු මහ බැංකුව ගණනය කර ඇත්තේ තම ආර්ථික වර්ධනය මේ හේතුවෙන් 8%කින් පහත වැටීමට ඉඩ ඇති බවය.

ජාත්‍යන්තරය සමග බද්ධ වී දියත් කර ඇති මහා පරිමාණ ව්‍යාපාර මෙන්ම විදෙස් අධ්‍යාපනය, මාර්ගත අධ්‍යාපනය සහ මාර්ගගත ව්‍යාපාරකරණය මේ වන විට රුසියාව තුළ විශාල බිඳ වැටීමකට ලක්ව තිබේ. දරුවන්ගේ විදේශ අධ්‍යාපනය, විදෙස් දේපළ සහ සම්බන්ධතා, විදෙස් සංචාර, බටහිර සන්නාම ආදිය සීමා වීම තුළ රුසියානු මධ්‍යම පන්තිය යම් කඩා වැටීමකට ලක්ව තිබීම, පුටින් විරෝධයක් දක්වා මෙහෙයවීමට බටහිර සහ එක්සත් ජනපදයේ මේ වන විට අවශ්‍යතාව බවට පත්ව තිබේ. දැනට ඇවිලී තිබෙන පුටින් විරෝධී ව්‍යාපාර දැඩි මර්දනීය තත්ත්වයක් යටතේ සහ මාධ්‍ය සීමා යටතේ රුසියාව යටපත් කරගෙන තිබේ.

යුක්රේන් යුද්ධයට එරෙහිව විරෝධතා හි යෙදුණු 13,000 කට වැඩි පිරිසක් රුසියන් රාජ්‍ය විසින් අත්අඩංගුවට ගෙන ඇති බව බීබීසී ලෝක සේවය වාර්තා කරන්නේ, රුසියාවේ මානව හිමිකම් ද ප්‍රශ්න කරමිනි. බටහිර මාධ්‍ය ලෝකය පුරා වපුරමින් තිබෙන මතය වන්නේ, සෝවියට් සංගමය බිඳ වැටීමෙන් පසු රුසියාවේ ආර්ථිකය 1990 සමයේ පැවති තත්ත්වය කරා ළඟා වෙමින් තිබෙන බවය. සීනි, බටර් සහ වොඩ්කා කූපන් සහ ටෝකන් ක්‍රමවේදය අනුව මිල ගැනීමේ ක්‍රමවේදයක් යළි ළඟා වනු ඇති බවට රුසියානු ජනතාව අතර ද මේ වන මතයක් ලෙස ව්‍යාප්ත වී තිබේ. මේ අස්ථාවරභාවය, පුටින් විරෝධයක් බවට පත් කර පුටින්ට එරෙහි රැල්ලක් රුසියාව තුළ මතු කර, ඔහු බලයෙන් පහකර බටහිර ඇලියට සමීප රාජ්‍ය පාලනයක් ස්ථාපනය කර, එම රූකඩ පාලනය යටතේ, කර්නල් අල් ගඩාෆිට, සදාම් හුසේන්ට ලබා දුන් ඉරණම පුටින්ට ද ලබාදීම එක්සත් ජනපදයේ උපාය මාර්ගය බව පෙනී යයි. එම ඉරණම කරා තමන් තල්ලු කිරීමට යුරෝපය සහ එක්සත් ජනපදය දරන උත්සාහයට පුටින්ගේ ප්‍රති උත්තරය වී ඇත්තේ, යුරෝපයට එරෙහි සංග්‍රාමයක් බවට යුක්රේන් යුද්ධය දික් ගස්සා ගැනීම බව කිව හැකිය.

**● සෙල්ලම් එපා, බටහිරට පුටින් අනතුරු අඟවයි**

යුක්රේනයට සහාය පළ කරමින්, රුසියාවේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන ඕනෑම බටහිර රටකට, ක්ෂණික ප්‍රහාරයක් එල්ල කිරීමට පසුබට නොවන බව රුසියන් ජනාධිපති ව්ලැදිමීර් පුටින් අනතුරු අඟවා සිටින ලද්දේ එක්සත් ජනපද සහ යුරෝපා හවුල විසින් යුක්රේනය වෙත ලබාදෙන යුද ආධාර සඳහා දක්වන ප්‍රතිචාරයක් ලෙසය. අප්‍රේල් මස 28 වෙනිදා ඔහු බව සඳහන් කරන ලද්දේ, ශාන්ත පීටර්ස්බර්ග් හිදී, රුසියන් අමාත්‍ය මණ්ඩලය අමතමිනි. රුසියාවේ ආරක්ෂාවට තර්ජනයක් වන ඕනෑම බටහිර රටක් පහර දී, අකර්මණ්‍ය කිරීමට සියලු සැලැසුම් සකස් කර ඇතැයි ද අමාත්‍ය මණ්ඩලය හමුවේ ජනාධිපතිවරයා පෙන්වා දුන්නේය. "යුක්රේනයේ දැන් පවතින තත්ත්වය සඳහා බාහිර පාර්ශ්වයක් සම්බන්ධ වෙනවා නම්; රුසියාව ඊට ක්ෂණික ප්‍රතිචාර දක්වන බව ඔවුන් දැන සිටිය යුතුය. ඕනෑම බටහිර රටක් සමඟ සටන් කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රබල අවි ආයුධ අප සතුයි. අප ඒවා භාවිතයට ගන්නේ අවසන් විකල්පයක් හැටියට පමණයි.'' රුසියන් ජනාධිපතිවරයා බටහිරට අනතුරු දල්වමින් පවසා සිටියේය.

අප්‍රේල් 25 වෙනිදා එක්සත් ජනපදයේ ඉහළම රාජ්‍ය තාන්ත්‍රික නිලධාරියා සහ එහි ආරක්ෂක ප්‍රධානියා යුක්රේනය බලා රහසිගත සංචාරයක් සිදු කළේය. සංචාරය සඳහා රුසියානු පිළිතුර ඊට පෙර සිට ලබා දී තිබුණි.

ලොව ඕනෑම තැනක ඕනෑම ඉලක්කයකට නිවැරදිව පහර දිය හැකි ආකාරයේ නව මිසයිලයක් සාර්ථකව අත්හදා බැලීමට රුසියාව සමත් වූවේ අප්‍රේල් 21 වෙනිදාය. 'සර්මැට්' නම් අන්තර් මහද්වීපික බැලස්ටික් මිසයිලය, ඕනෑම ආකාරයක න්‍යෂ්ටික යුද ශීර්ෂයක් සවි කළ හැකි බව පැවැසෙයි.

ටොන් 200ක බරකින් සමන්විත මෙම මිසයිලය නිපදවීම සඳහා රුසියානු විද්‍යාඥයන්ට වසර 20 කට ආසන්න කාලයක් ගත වී ඇතැයි ද පැවැසෙයි. දැනටමත් රුසියාව සතුව ප්‍රබල දිගු දුර බැලැස්ටික මිසයිලයක් ඇති අතර එය නම් කර ඇත්තේ 'සාතන් 1' යනුවෙනි. බටහිර රටවල් මෙම නව 'සර්මැට්' මිසයිලය හඳුන්වා ඇත්තේ 'සාතන් 2' යනුවෙනි.

එසේම අප්‍රේල් 24 වෙනිදා යුක්රේනයේ ඔඩෙසා නගරයේ ගුවන්තොටුපළක සැපයුම් පර්යන්තයක් විනාශ කරමින් දැවැන්ත පහරදීමකට එදින රුසියාව යොමුවිය.

යුරෝපා සංගමයෙන් සහ එක්සත් ජනපදයෙන් ලබා දුන් යුද උපකරණ සහ ආයුධ විශාල ප්‍රමාණයක් මෙම සැපයුම් පර්යන්තයේ ගබඩා කර තිබූ බව රුසියානු ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රකාශක ජෙනරාල් ඉගෝර් කොනශෙන්කොව් පවසා සිටියේය. ප්‍රහාරය හේතුවෙන් ආයුධ ගබඩාව සම්පූර්ණයෙන්ම විනාශ වූ බව රුසියානු මාධ්‍ය වාර්තා කළේය. නේටෝ සංවිධානය සහ එක්සත් ජනපදය විසින් යුක්රේනය සඳහා ලබා දෙන යුද ආධාර, යුද ඉලක්ක ලෙස සලකන බවට රුසියාව නිරන්තරයෙන් ප්‍රකාශ කළ අතර මෙම ප්‍රහාරය ඒ අනුව සිදු කරන ලද්දකි.

> **මානව ශිෂ්ටාචාරයේ උණුසුම්ම ශීත සමය එළඹීමට නියමිතය**
>
> **ඇමරිකාව සටනට සැරසෙයි**
>
> **වසර තුනක් පුරප්පාඩු වූ යුක්රේනයට, එක්සත් ජනපදයෙන් නව තානාපතිනියක්**
>
> **ඇමරිකානු ප්‍රබලයෝ දෙදෙනෙක් හොරෙන්ම යුක්රේන් ඇවිත්**
>
> **බටහිරට ඕනෑම අවස්ථාවක පහර දෙනවා - පුටින් අනතුරු අඟවයි**

**● හොරෙන්ම ආ ඇමරිකානු ලොක්කන් දෙදෙනා**

රුසියාවේ ප්‍රහාර සංඥා ඊට පෙර දිනයේ ලබා දෙද්දී, එක්සත් ජනපද ප්‍රබලයන් දෙදෙනාගේ සංචාරය සිදුවිය. මෙම සංචාරය පිළිබඳව කල්තබා යුක්රේන් ජනාධිපති වොලඩොමියර් සෙලෙන්ස්කි සඳහන් කර තිබුණ ද ඒ පිළිබඳව සිදු කරන ලද විමසීම් හිදී එක්සත් ජනපදය අනුගමනය කරන ලද්දේ නිහඬ පිළිවෙතකි. එක්සත් ජනපදයේ ප්‍රබලයන් දෙදෙනා යුක්රේනයේ අසල්වැසි රාජ්‍යයක් සහ නේටෝ සාමාජිකයෙක් වන පෝලන්තය වෙත මුලින් පැමිණ, දුම්රිය මාර්ගයෙන් කිව් අගනුවර ජනාධිපති මන්දිරය සඳහා ප්‍රවිෂ්ඨ වූ බව දැනට තහවුරු වී තිබේ. හමුදා ආධාර වශයෙන් යුක්රේනයට ඩොලර් මිලියන 300 කට වැඩි ප්‍රමාණයක් ලබාදීම මෙහිදී සිදු වූ අතර රාජ්‍ය ලේකම් ඇන්ටනි බ්ලින්කන් සහ ආරක්ෂක ලේකම් ලොයිඩ් ඔස්ටින් පසුගිය සෙනසුරාදා සංචාරය අතරේ එහි ජනාධිපති සහ අනෙකුත් ඉහළ යුක්රේන නිලධාරීන් හමුවූ බව පැවසේ. ''යුද අරමුණු සම්බන්ධයෙන් ගත් කල, රුසියාව දැනටමත් අසාර්ථක වී ඇති අතර යුක්රේනය දැනටමත් සාර්ථක වී ඇත. ආපසු පැමිණීමෙන් පසු පෝලන්තයේ පැවති සාකච්ඡාවකදී රාජ්‍ය ලේකම් බ්ලින්කන් පවසා සිටියේය.'' රැස්වීමේදී අපගේ අවධානය යොමු වූයේ වර්තමාන සටන ජය ගැනීමට සහ හෙට දවස ගොඩනගා ගැනීම සඳහා කළ හැකි කාර්යයන් පිළිබඳව සාකච්ඡා කිරීමයි'' ආරක්ෂක ලේකම් ඔස්ටින්, කිව් හමුව අතිශයින් එලදායි බව සඳහන් කරමින් කියා සිටියේය.

යුක්රේනයේ ආරක්ෂක අවශ්‍යතා සාකච්ඡා කිරීම සඳහා එක්සත් ජනපද ආරක්ෂක ලේකම් ලොයිඩ් ඔස්ටින්, රටවල් 20කට අධික ප්‍රමාණයක් සහ සහ නේටෝ මහ ලේකම් ජෙන්ස් ස්ටෝල්ටන්බර්ග් සමග ද සාකච්ඡා කර තිබුණි. ඒ අතර යුක්රේන ජනාධිපති සෙලෙන්ස්කි, යුක්රේන විදේශ අමාත්‍ය ඩිමිට්‍රෝ කුලේබා, ආරක්ෂක අමාත්‍ය ඔලෙක්සි රෙස්නිකොව් සහ අනෙකුත් නිලධාරීන් සමඟ එක්සත් ජනපද රාජ්‍ය ලේකම් බ්ලින්කන් සහ ආරක්ෂක ලේකම් ඔස්ටින් පවත්වන ලද රැස්වීම මුල් අවස්ථාවේ විනාඩි අනූවකට සටහන් කර තිබුණ ද එය පැය තුනකට ආසන්න කාලයක් පැවති බව සඳහන්ය.

මෙම සාකච්ඡාවෙන් පසු එක්සත් ජනපදයෙන් ඩොලර් මිලියන 400 කට ආසන්න මිලිටරි මූල්‍යකරණයක් මධ්‍යම හා නැගෙනහිර යුරෝපයේ සහ බෝල්කන් ප්‍රදේශයේ තවත් රටවල් පහක් සඳහා ලබාදීමට නියමිත බව එහි රාජ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරියෙක් ප්‍රකාශ කර තිබුණි. මේ වන විටත් යුක්රේනය සඳහා යුද ආධාර එක්සත් ජනපදය ලබාදෙමින් සිටින අතර හොවිට්සර් බර කාලතුවක්කු අවි ක්‍රියාත්මක කිරීම සඳහා යුක්‍රේනියානුවන් 50 කට වැඩි පිරිසක් පුහුණුව සම්පූර්ණ කිරීම සූදානම් කර ඇති අතර, දැන් සටන දියත් වී ඇති, ඩොන්බාස් කලාපය කෙරෙහි සිය අවධානය යොමු කර ඇති බව පෙන්ටගනයේ ප්‍රකාශක ජෝන් කර්බි පවසා සිටියේය. ආයුධ ලබාදීම සඳහා ජනාධිපති බයිඩන් අනුමැතිය ලබාදීමෙන් අනතුරුව, "සිතා ගත නොහැකි තරම් වේගයෙන් සහ ප්‍රමාණයෙන් එක්සත් ජනපද අවි යුක්රේනය වෙත ළඟා වනු ඇත'' යනුවෙන් එක්සත් ජනපද ආරක්ෂක ලේකම්වරයා මාධ්‍යට කියා සිටියේය.

සිය ප්‍රබලයන් දෙදෙනාගේ යුක්රේන සංචාරයෙන් පසුව, ධවල මන්දිරය සඳුදා නිවේදනය කරන ලද්දේ, වසර තුනකට ආසන්න කාලයක් පුරප්පාඩුව තිබූ, යුක්රේනයේ එක්සත් ජනපද තානාපති ලෙස බ්‍රිජට් බ්‍රින්ක්, ජනාධිපති ජෝ බයිඩෙන් විසින් නම් කර ඇති බවය.

බ්‍රින්ක්, වර්තමානයේ ස්ලෝවැකියාවේ එක්සත් ජනපද තානාපති ලෙස සේවය කරන්නිය. වසර 25 ක් වෘත්තීය රාජ්‍ය තාන්ත්‍රිකයෙකු වන ඇය උස්බෙකිස්තානයේ සහ ජෝර්ජියාවේ මෙන්ම එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව, ධවල මන්දිරය, ජාතික ආරක්ෂක කවුන්සිලය යන ආදියේ ඉහළ තනතුරු කිහිපයකම සේවය කරන ලද කදිම එක්සත් ජනපද ලකුණකි.

මේ සියල්ලෙන්ම පෙනී යන්නේ රුසියාව තල්ලුවෙමින් පවතින අවස්ථාව සඳහා එක්සත් ජනපදයේ කල් තබා සූදානම් වීමය.

එක්සත් ජාතීන්ගේ මහ ලේකම් ඇන්තෝනියෝ ගුටරේස් කිව් නගරයේ සංචාරය කරන ලද්දේ අප්‍රේල් 29 වෙනිදාය. මෙසේ පෙළින් පෙළට යුක්රේනය සඳහා සිදුවන එක්සත් ජනපද නිලධාරීන්ගේ පැමිණීම, තානාපති සම්බන්ධතා යථාවත් වීම ආදිය දෙස බලා සිටි රුසියාව, එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා කිව් නගරයේ සිටියදීම රොකට් ප්‍රහාරයක් එල්ල කරන ලද්දේ, සති දෙකකට ආසන්න කාලයකට පසු කිව් අගනුවරට එල්ල වූ පළමු රොකට් ප්‍රහාරය ලෙසය. එම ප්‍රහාරයෙන් තිදෙනකු තුවාල ලබා තිබුණි. එක්සත් ජාතීන්ගේ මහ ලේකම් ඇන්තෝනියෝ ගුටරේස් ඇතුළු කණ්ඩායම සිටි ආසන්නයට මෙම රොකට් ප්‍රහාරය එල්ලවූ අතර එම ප්‍රහාරය හේතුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය කම්පනයට පත් වූ බව එහි ප්‍රකාශකයෙක් පවසා සිටියේය.

" එක්සත් ජාතීන්ගේ මහ ලේකම් ඇන්තෝනියෝ ගුටරේස් සමග කීව් හි පැවැත්වූ සාකච්ඡා අවසන් වනවාත් සමග ඒ ආසන්නයට රුසියානු රොකට් ප්‍රහාරයක් එල්ල වුණා. රොකට් පහක්, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ එම සංවිධානය නියෝජනය කරන සෑම දෙයක්ම අවමන් කිරීමට රුසියානු නායකත්වය දරන උත්සාහය ඇතුළුව ගොඩක් දේ මෙම ප්‍රහාරයෙන් කියවෙනවා'' යුක්රේන ජනාධිපති ව්ලොදිමීර් සෙලෙන්ස්කි මේ සඳහා වන වාග් ප්‍රහාරයකදී ප්‍රකාශ කළේය. ජගත් මහ ලේකම්වරයා ඊට පෙර රුසියාවේ මොස්කව් නගරයේ සංචාරය කළ අතර රුසියාවට පැමිණීමට පෙර තුර්කියේ අන්කාරා අගනුවර බලා ගියේය. තුර්කි ජනාධිපති රිජෙප් තායිප් එර්දොවාන් හමුවී, රුසියන් යුක්රේන අර්බුදය පිළිබඳ සාකච්ඡා කිරීම මහ ලේකම්වරයාගේ අරමුණ වී තිබුණි. නේටෝ සාමාජිකයකු වන තුර්කිය රුසියාවේ මිතුරකු වන හෙයින් රුසියන් - යුක්රේන අර්බුදය සඳහා මැදහත්කරුවකු ලෙස තුර්කිය යොදා ගැනීම මහ ලේකම්වරයා, රුසියාවට සහ යුක්රේනයට යෑමට පෙර තුර්කියේ සංචාරය කිරීමේ අරමුණ වූ බව පැවසේ.

ජගත් මහ ලේකම්වරයාගේ මැදිහත්කාර ප්‍රයත්නය හැර අන් සියල්ලම මේ මොහොතේ පෙළ ගැසී ඇත්තේ රුසියාව ලෝක යුද්ධයක් දෙසට මෙහෙයවීම සඳහාය. පුටින් සහ ජගත් මහ ලේකම්වරයාගේ හමුව පැවතියේ ඉතා දිග මේසයක අන්ත දෙකක සිටය. එයින් පෙනී යන්නේ සාමය සඳහා දුර බව කිව හැකිය. විශේෂයෙන්ම තව මාස හයක් පමණ ගත වන විට යුරෝපයට සීත සමය උදාවනවා ඇත. හිට්ලර්ගේ සිහිනය, සෝවියට් නායක ස්ටාලින් බිඳ දමන ලද්දේ මෙවන් සීත සමයකය. යළි උදා වන්නේ එවන් සීත සමයක් වීමේ අවදානම අතිශයින්ම වැඩිය. තුන්වන ලෝක යුද්ධය ඒ සීත සමයේ උදා වන්නේ නම්, මෙතෙක් ලොව උණුසුම්ම සීතල ඒ හරහා හමා යනු ඇත.

**● මනෝජ් අබයදීර**

දිවයින
ඉරිද සංග්‍රහය
2022 මැයි මස 01 වැනිදා ඉරිදා

# පරණ කුණු ගඳ නැවතත් (එමමයි එසේමයි)

අවුරුදු 30 ක් පමණ පැරණි මිනී කුණු ගඳක් යළි දැනෙන්නට පටන් ගෙන තිබේ. 88, 89 දී ආණ්ඩුවේ බලය සියතට ගත් ශ්‍රී ලංකා පොලිසිය ශ්‍රී ලංකා යුද හමුදාවේ ද සහය ඇතිව මේ රටේ තරුණ පරපුරෙන් හොඳම 60000 ක් වෙඩි තබා හෝ කඩු වලින් කපා හෝ ඔළුවට ඇන ගසා හෝ කරන්ට් වද්දවා හෝ ඝාතනය කර පාරවල් අයිනේ පුළුස්සා දැමූහ. එසේ පිළිස්සීම සඳහා ඉන්ධන වශයෙන් පරණ ටයර් යොදන ලදී. ටයර් සහ අමු මස් එකට පිළිස්සෙන විට ඇතිවන දුගඳ මේ දෙවර්ගය වෙන වෙනම පිළිස්සෙන විට හටග න්නා දුගඳට වඩා අපුලය. ටයර් පිළිස්සෙන විට කාබන් මොනොක්සයිඩ් නිකුත් වේ. මිනී මස් පිළිස්සෙන විට එන්නේ බාබිකියු ගඳකි. 88, 89 සිට තවමත් ජීවිත පරිස්සම් කරගෙන සිටින ජනයාට මේ දුගඳ නාසයට වඩා හදවතට පුරුදුය. පසුගියදා රඹුක්කන දී හටගත් වෙඩි තැබීම් මගින් එකවරම එම ගඳ පිළිබඳ හැඟීම නැවත වරක් ඇතිවිය. පොලිසිය යනු මේ රටේ තිබෙන විශාලතම සිවිල් ආයතනයයි. 87000 ට වැඩි පිරිසක් මේ ආයතනය තුළ කාකි ඇඳුම් ඇඳගෙන සේවය කරති. මෙරට පොලිසියේ නිල නාමය ශ්‍රී ලංකා පොලිසිය වේ. එහෙත් යූ එන් පී ආණ්ඩුවක් පැමිණි සැනින් එය යූ එන් පී පොලිසිය බවට නම මාරුකර ගනී. සමගි පෙරමුණු රජය බලයේ තිබුණු කාලයේදී මේ රටේ පොලිසිය සමගි පෙරමුණු පොලිසිය බවට පත්විය. චන්ද්‍රිකා ගේ කාලයේදී මේ රටේ පොලිසියේ නම පොදු පෙරමුණු පොලිසිය විය. ඊළඟට එය එ ජ නි ස පොලිසිය බවට පත්විය. දැනට මෙය පොහොට්ටු පොලිසිය වේ. මේ කතාව මෙතනින් නොනවතී. ඉදිරියේදීත් මේ රටේ බලයට එන හැම ආණ්ඩුවක්ම සිය බල කාලය තුළදී පොලිස් දෙපාර්තමේන්තුව බදු ගන්නවා ඇත. මෙය පොලිසියේ වරද මෙන්ම ආණ්ඩුවේද වරදය. යහපාලන ආණ්ඩුව තිබෙන විට මහින්ද ගේ ආණ්ඩුවක් ආවොත් ඊට සෙට්වීම සඳහා සූදුසුකම් සැපිරූ පොලිස් පිරිස් සිටියහ. මීළඟට මේ රටේ බලයට එන්නේ ස ජ බ නම් ඊට සෙට් වීම සඳහා බලාගෙන සිටින පොලිස්කාරයන් විශාල පිරිසක් පොහොට්ටු පොලිසියේ දැනටමත් සිටිති. ඒ කතාවේ එක් පැත්තක් පමණයි. අනෙක් පැත්ත මෙසේය. බලයට එන ඕනෑම ආණ්ඩුවකට හේත්තු වී ඒවායේ සිටින අටේ පංතිය පමණක් සමත් කුණු දේශපාලනඥයන්ට සර් කියා සෙලියුට් ගසා ඔවුන් ඉදිරිපිට යට ඇඳුම පිටින් ඇවිදීමට සූදානම් කට්ටියක් පොලිසියේ සිටිති. දේශපාලනඥයා සිටින්නේ පොලිසිය කොහොම බා ගන්නේද යන අදහසිනි. ඇතැම් පොලිස් නිලධාරීන් සිටින්නේ කොහොම බැවෙන්නේද යන අදහසිනි. රඹුක්කන වෙඩි තැබීම වැනි කාලකන්නි වැඩ සිදුවන්නේ මෙවනි දෙගොල්ලක් එකට සෙට් වූ විටය.

මෙවර ආණ්ඩු විරෝධී උද්ඝෝෂණ පටන් ගත් මුල් අවස්ථාවේදීම ඉහළ පොලිස් නිලධාරීන් කැඳවූ පොලිස්පති චන්දන වික්‍රමරත්න උද්ඝෝෂණකරුවන්ට මොනම හේතුවකටවත් වෙඩි නොතබන ලෙසත්, අවම වශයෙන් බැටන් ප්‍රහාරයක් හෝ එල්ල නොකරන ලෙසත් දැන්වීය. මෙය පොලිස්පති වික්‍රමරත්න විසින් සිය පොලිස්පති ජීවිතයේදී දෙන ලද එකම සහ හොඳම උපදෙස විය යුතුය. සාමාන්‍යයෙන් උද්ඝෝෂණවලට වෙඩි තබනු නොලැබේ. වෙඩි තැබීමක් සිදුකරන්නේ අයුතු ජනරාශියක් සිදුකරන කැරැල්ලකදී පමණි. උද්ඝෝෂණයක් සහ කැරැල්ලක් අතර වෙනස මෙසේය. උද්ඝෝෂණයකදී සිදුකරන්නේ සටන් පාඨ කීම, පෙළපාලි දැක්වීම සහ සටන් පාඨ ප්‍රදර්ශනය කිරීම පමණි. අයුතු ජනරාශියක් ඇතිකරන කැරැල්ලකදී රජයේ දේපළවලට හානි කෙරෙන අතර, මනුෂ්‍ය ජීවිත හානි සහ තුවාල හටගනී. රඹුක්කන උද්ඝෝෂණයේ වෙඩි තැබීම සිදුකෙරෙන්නේ කෑගල්ලේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කේ. බී. කීර්තිරත්නගේ නියෝගයකට අනුවය. කේ. බී. කීර්තිරත්න බැලූ බැල්මට පෙනෙන්නේ ස්කාගාර සංස්ථාවට අයත් දේපළක් හෙවත් අරක්කු පීප්පයක් ලෙසය. අපේ දැක්ම වැරදිනම් අරක්කු පීප්ප කතාව ඉල්ලා අස්කරගනු ලැබේ. කෙසේ හෝ වේවා උද්ඝෝෂණයට වෙඩි නොතබන ලෙස පොලිස්පති විසින් උපදෙස් දී ඇති අවස්ථාවක කේ. බී. කීර්තිරත්න පොලිස්පතිත් ඉක්මවා යමින් විශාල හයියක් ගෙන වෙඩි තැබීම සිදුකර ඇත. කුමක්ද මේ හයිය? අපට ආරංචි පරිදි ඒ හයිය වූ කලී පොහොට්ටු දේශපාලඥයන් දෙදෙනෙකි. මේ පිළිබඳ සියලු තොරතුරු ඉතා ඉක්මණින් හෙළිදරව් කරමු. කැරලි මර්දන නීතියට අනුව කැරලිකරුවන්ට වෙඩි තැබීමේදී දණහිසෙන් පහළට පමණක් වෙඩි තැබීම සිදුවේ. එහෙත් රඹුක්කන සිද්ධියේදී පොලිසියට උරහිස සහ දණහිස මාරුවිය. සිද්ධියෙන් මියගිය ඉන්දික ලක්ෂාන්ට ඔවුන් වෙඩි තැබුවේ උරහිසෙන් පහළ පිහිටි කොන්දටය. කොන්දෙන් ඇතුළු වූ වෙඩි උණ්ඩය මරණකරුගේ බඩ පළාගෙන එළියට පැමිණි අතර බඩවැල් ද එළියට පැමිණියේය. මරණකරු වෙඩිකා තිබුණේ උද්ඝෝෂණය සිදුවූ පෙට්‍රල් ෂෙඩ් එකට මීටර් 100 ත් 500 ත් අතර දුරකිනි. මෙහිදී මේ මරණකරු පිරිපහදු කිරීමේ අරමුණක් මේ පුවත්පතට නැත. ඔහුට එරෙහිවද නඩු දෙකක් තිබේ. ඒ මිනිහාට එරෙහිව නඩු 100 ක් තිබුණත් ඔහුට වෙඩි තැබීමේ අයිතිය පොලිසියට නැත. කොහොමටත් කේ. බී. කීර්තිරත්නගේ මුහුණ රූපවාහිනිය මගින් පෙන්වන ලද අවස්ථාවේදී අපට හැඟී ගියේ වැඩේ ඔතනින් කෙළවර වීම වාසනාවක් බවය. ඒ පෙනුම එපමණටම අවුල්ය. අරක්කු ලේබලයකට සුදුසුය. (අරක්කු ලේබලයකට නුසුදුසු නම් එයද ඉල්ලා අස්කරගනු ලැබේ.)

රඹුක්කන සිද්ධිය පටන් ගත්තේ එහි පිහිටි ෂෙඩ් එකට ගෙනෙන ලද පෙට්‍රල් බවුසරය හිස්කර පාරිභෝගිකයන්ට බෙදා නොදීම නිසාය. බවුසරය හිස් නොකරේ එදින රාත්‍රි දොළහට පෙට්‍රල් මිල ඉහළ යන බැවින් පසුදා වැඩි මිලට විකිණීම පිණිසය. උද්ඝෝෂණය ඇතිවූ අවස්ථාවේදී කේ. බී. කීර්තිරත්න රඹුක්කන පොලිසියේ නිලධාරීන් සිටින බවක් අමතක කර කෑගල්ලෙන් පොලිස් සෙට් එකක් ගෙන එයි. ඒ එන ගමන් ඔවුහු කනක හේරත්ගේ හෝ දිලුම් අමුණුගමගේ ගෙදරට ද ගියහ. මේ නිසා මේ සිද්ධිය සම්පූර්ණයෙන්ම දේශපාලන බ්ලැන්කට් එකකින් වැසී තිබේ. මේ සිද්ධියේ සම්පූර්ණ වගකීම කේ. බී. කීර්තිරත්නත්, ඔහුව සුරතලයට ඇති කරන දේශපාලනඥයන්ටත් කෑගල්ලෙන් ගිය පොලිස් සෙට් එකටත් පැවරේ. අදට මේ කතාව මෙතැනින් නිමය. සෙස්ස පස්සට.

අංක: 223, බ්ලූමැන්ඩල් පාර, කොළඹ 13.
කර්තෘ මණ්ඩලය - 2448402, 2497500
ෆැක්ස් - 2344253, 2438750

වෙබ් අඩවිය - www.divaina.com
ඊමේල් - divaina@unl.upali.lk
divainapro@unl.upali.lk
www.facebook.com/divainanewspaper
දැන්වීම් අංශය - 2434190 (ප්‍රධාන කාර්යාලය)
ෆැක්ස් - 2344252, 2330024

බෙදාහැරීම් අංශය - 2497568, 2497519, 2497580
ෆැක්ස් - 2334564
කොටුව කාර්යාලය - 011 2334565

## හිටිවනය

ගාලුමුවදොර දී තවමත් අරගලයයි
තව පැත්තකින් වැඩ වර්ජන අඬ හැරයයි
පාලකයන්ට ගාණක් නෑ බලබල යයි
කම්කරු දිනෙත් කම්කරුවා කඳුළැලි බොයි

- අනුරාධ හිරිපිටියගේ




නිල බල සසල වනු දැක වුණු කැළඹිල්ල
පල පල කියද්දිත් ඒකයි දෙඩවිල්ල
පව් කඳුවලට නැත කිසිදා සැනසිල්ල
ඔච් මැඬලන්න බැහැ මේ මහ ජනරැල්ල

ඉතිහාසයක උරුමය අබිමන රැක්ක
හෙළ විරුවන්ට පිටු පා මවුබිම වික්ක
පුරවා ගන්ට හැදු හැමදාමත් බොක්ක
නව පරපුරට නැහැ - ගනුදෙනු උන් එක්ක


- ගාමිණී

# ජනපති කඩුව බිම දමයි!

මේ වනවිට ආණ්ඩුව සිටින්නේ ඇතුළතත් ගිනි පිටතත් ගිනි තත්ත්වයකය. අගමැති මහින්ද පමණක් නොව, ඇමැති, රාජ්‍ය ඇමැති සියල්ලෝම ආයු පිරිහී ගිය දේවතාවුන්ගේ තත්ත්වයට පත්ව සිටිති. රටේ තත්ත්වය ගැන කිවහොත් ලංකාව පූර්ව බංකොලොත් මට්ටමේ රටක් බව කියති. මේ කිසිම දෙයකට ජනතාව වගකිව යුතු නැති වුව ද අද සමස්ත ජනතාව ම එහි වින්දිතයෝ බවට පත්ව සිටිති. හැටනව ලක්ෂයේ හිමිකරුවන්ට පමණක් නොව, එයට දායක නොවූ අයට ද සිදුව ඇත්තේ එකම සන්තෑසියකි. ලෝකෙන් උතුම් රට කට ගාවට ම හිර වී තිබේ. එහෙත් ආණ්ඩුව තවමත් බලය අත්හැරීමට සූදානම් නැත. අගමැති මහින්ද හොඳ දේශපාලන විහිළු දන්නා අයෙකි. එහෙත් ඔහු මේ දිනවල කරන විහිළුවලට කී දෙනකුට සිනාසිය හැකිදැයි නොදනිමු. ආණ්ඩුවේ හිතවතුන් හා පළාත් පාලන නියෝජිතයන් මෙන්ම හිටපු නියෝජිතයන් ද අබියස අගමැතිවරයා පසුගිය දිනක (26 දා) පවසා සිටියේ තමන් අගමැතිකමෙන් ඉල්ලා අස්නොවන බවය.

ඒ සම්බන්ධයෙන් කිසිදු බියක් ඇතිකර ගත යුතු නොවන බවය. එසේම තමන් අස්කළොත් විනා බයේ දුවන්නේ නැති බව ද අගමැතිවරයා කියා තිබිණි. එහෙත් මේවායේ ගත යුතු හරයක් නැත. අගමැතිවරයා ඉල්ලා අස්නොවන්නේ නම් තමන්ට ද කිසියම් තීන්දුවක් ගැනීමට සිදුවන බවට ආණ්ඩුව ඇතුළෙන් ද අනතුරු ඇඟවීම් සිදුවේ. අගමැති ඇතුළු සමස්ත ඇමැති මණ්ඩලයම ඉල්ලා අස්වී අන්තර් පාලනයකට ඉඩදීම මේ බැරෑරුම් දේශපාලන අර්බුදය සමනය කර ගැනීමේ එකම මඟ බව ආණ්ඩුවේ බහුතරයකගේ ම අදහස බව අරුන්දික ප්‍රනාන්දු පැවසූ බවක් ද වාර්තා විය. ඒ සියලු ප්‍රතිචාරවලින් තහවුරු වන්නේ මේ අවදානම් ගමන වෙනස් කිරීමට ආණ්ඩුවට දැඩි බලපෑමක් පීඩනයක් සිදුකරන බවය. මෙහිදී ජ.වි.පෙ. නායක අනුර කුමාර දිසානායක පෙන්වා දෙන කරුණක් ද ඇත. පාර්ලිමේන්තුව තුළ අන්තර්වාර පාලනයක්, සර්ව පාක්ෂික ආණ්ඩුවක් ආදී ඕනෑම පාලනයක් ගොඩනඟා ගතහැකි වුවත් ඒ හැම එකක්ම රඳාපවතින්නේ ජනාධිපතිවරයා අනුව බවය. ඔහු පෙන්වා දෙන්නේ මේ ජනාධිපතිවරයා විශ්වාස කළ නොහැකි බවය. ජනාධිපතිවරයා මුලදී ශ්‍රීලනිපය සමග අභිනව පාලනයක් පිළිබඳ එකඟතාවකට පැමිණ, ඔවුන්ට කනට ගසන්නාක් මෙන් ශ්‍රීලනිපයේ ශාන්ත බණ්ඩාර හා සුරේන් රාඝවන් ද රහසේම තම පාලනයට එක්කර ගත් ආකාරය ඔහු පෙන්වා දෙයි. ඒ වර්ගයේ ජනාධිපතිවරයකු සමග හදන ආණ්ඩුව කුමක්ද යන අනුර කුමාරගේ ප්‍රශ්නයට අපට ද උත්තර නැත. ඒවායින් අපට එළැඹිය හැකි නිගමනය වන්නේ ද ආණ්ඩුවට මේ ප්‍රශ්නය විසඳා ගැනීම සඳහා සමතුලිත මනසක් නැති බවය. විධායක ජනාධිපති ධුරය කොපමණ බලගතු වුවද රට මෙහෙයවීම සඳහා ආණ්ඩුවට සැලැස්මක් හෝ දැක්මක් නොමැති බව ද බොහෝ විට පෙනී යයි. ඇත්ත වශයෙන්ම ආණ්ඩුව නූල ගිලිහී ගිය සරුංගලයක් වැන්න. බොහෝ දේවල් සිදුවන්නේ ආණ්ඩුවේ පාලනයෙන් බැහැරවය. අද වෙළෙඳපොළ ව්‍යාපාරික අභිමතයට යටත් ය. භාණ්ඩ මිල ඉහළ යන්නේ සියයට සියයේ හෝ තුන්සියයේ ප්‍රමිතියකටය. ආණ්ඩුවට කිසිදු මහජන සේවාවක් පවත්වා ගෙන යෑම අසීරුවෙමින් තිබේ. ඩොලර් අර්බුදය, ගෝලීය ආර්ථික ප්‍රවණතාවක් වුවද ආණ්ඩුවේ බල සිඳ බිඳ තිබෙන බව සැබෑවකි. එහෙත් ඇති හැකි අයත් හිඟමනට වැටෙන පසුබිමක නැති බැරි අයගේ ඉරණම කුමක් දැයි දුසිම් ගණනක් සිටින රාජ්‍ය ඇමැතිවරයකුටවත් නොතේරීම පුදුම අවාසනාවකි.

මේ සියල්ලම රාජපක්ෂ පාලන ගිණුමට බැර කළ නොහැක. එහෙත් වර්තමාන පාලකයන් ලෙස යම් ප්‍රමාණයකට හෝ සමාජ - අර්ථික - දේශපාලන ආදී ක්ෂේත්‍ර කළමනාකරණයකට ඔවුහු අසමත් වූහ. උපන් හදවියක ආර්ථික හෝ වෙළෙඳ කළමනාකරණයක් නොකළ විශ්‍රාමික ජෙනාරාල්ලාත්, ආණ්ඩුව බලයට ගෙන ආවේ අප යැයි පාරම්බාන වියත් මඟ විශේෂ (ආ) පදයනුත් තවත් ගජ මිතුරු කල්ලිත් මේ රට 'සෞභාග්‍ය' කරා ගෙන ගිය ආකාරය කෙබඳු දැයි විස්තර කළයුතු නැත. පරිණත දේශපාලනඥයකු වූද, හිටපු ඇමැතිවරයකු මෙන්ම මේ ආණ්ඩුවේ පාර්ශ්වකරුවකු ද වූ කොමියුනිස්ට් නායක ඩිව් ගුණසේකර සඳහන් කළේ කිසිදු දේශපාලන, ආර්ථික පරිචයක් නැති පිරිසක් රටේ සමාජ ආර්ථිකය සමග සෙල්ලම් කළ බවය. වියත් මඟ ලේබලය ගසා ගෙන රාජ්‍ය ආයතනවලට රිංගා ගත් සමහර වියතුන්ගේ හරක් වැඩ ජනතාව බලා සිටියේ පුදුම ඉවසීමකින්ය. දවසින් දවස උග්‍රවන සමාජ, ආර්ථික හා දේශපාලන ගැටලුවලට සංවේදී නොවූ ඇමැතිවරුන්ගෙන් බහුතරය දේශපාලන පංචස්කන්ධ ලෙස විනා පැජ්ජසර ජනතා නියෝජිතයන් ලෙස හැඳින්විය හැකිද? මුළු රටේ ම බත විපතක් කළ පාරම්පරික ගොවි ජනයාට මුඩුබිම් තනා දුන් ටයි දමාගත් මී හරක් විසින් රටට කළ විනාශය සහගහන අපරාධයකි. පොහොර කඳුළක්වත් ගොවියන්ට ලබානොදී, ඒ පොහොර නැව්වලට ජනතාවගේ මුදලින් මිලියන ගණන් ගෙවීමට දායක වූ සියල්ලෝම මතුයම් දිනකදී හෝ ජනතා අධිකරණයක් ඉදිරියට පමුණුවා ඒ මුදල් අයකර ගතයුතු වේ. ඇත්ත වශයෙන්ම මේ රට විසාලා මහනුවරක් වනු ඇතැයි අප සිතුවේ කොවිඩ් වසංගතයට ගොදුරු වීම නිසා ය. එහෙත් ආණ්ඩුව ඒ වසංගතය පරාජය කළ බව කෘතවේදීව කිව යුතුය. (එහිදීත් විවේචන තිබිය හැකිය) එදා කොවිඩ් උවඳුර ජයගත හැකි වුවත් ආණ්ඩුවට රට ඉදිරියට ගෙන යන සැලැස්මක් නොවීය. කොවිඩ් විපතින් වැටුණු හැම රටක් ම ගොඩ ගියත් ලංකාව ඇදී ගියේ අගාධයකටය. ඇතැම් ප්‍රාමාණිකයන්ට අනුව තව මාස කීපයකින් රටට එළැඹෙන විපත් සුලුපටු නොවේ. ආහාර, බෙහෙත්, ඉන්ධන, විදුලිය, කිරිපිටි ආදී බොහෝ දේවල් හිඟය. ගෑස්, සිමෙන්ති ආදී සියල්ලේම මිල දෙගුණ තෙගුණ වී තිබේ. කහට කෝප්පයේ පොඟවා ගිලින්නට පාන් කෑල්ලක් නැතිවන තරමට ම අනාථ වූ ජන කොටස් ද සිටති. පාන් ගෙඩිය, කොත්තුව, බනිස් ගෙඩිය, බත් පැකට් එක ආදී සියල්ලේම මිල ඉහළ ගොසින් ය. ත්‍රීවීලරයකට බැරිම හදිස්සියකට ගොඩවන මිනිසාට මිල ගෙවීමෙන් පසු හෘදය වස්තුව නැවතී මැරී වැටීමට සිදුවන තරම් ය. පොදු ප්‍රවාහනය ගැන කතා කිරීම ද එලක් නැත. මේ අර්බුද මැද්දේ පසුගියදා රැස් වූ අලුත් කැබිනට් මණ්ඩලය ඒ කිසිම දෙයක් ගැන කතා කළ බවක් වාර්තා වී නැත. එ හෙත් ඔවුන් ඒකමතිකව එකඟ වූ කරුණක් තිබිණි. ඒ වහාම ව්‍යවස්ථා සංශෝධනයක් කරමින් 20 වැනි සංශෝධනය අහෝසි කළ යුතු බවය. 21 වැනි සංශෝධනය අප්‍රමාණව සිදු කළ යුතු බවය.



දහසක් ප්‍රශ්න මැද හෙම්බත් වී සිටින ජනතාවට මේ වෙලාවේ එබඳු ව්‍යවස්ථා සංශෝධනයක් අහවල් දේකට දැයි ඇසීම ඉතා සාධාරණය. එහෙත් මේ අලකලංචි අස්සේ වුවද රටේ අනාගත දියුණුවට සුළු හෝ අනුග්‍රහයක් එබඳු පියවරකින් ලැබිය හැකිය. ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව මෙරටේ ඇති වූ සංවාද, වාද විවාද බොහෝය. 1978 ව්‍යවස්ථාව අහෝසි කළ යුතු බව, අනූව දසකයේ (90) සිටම ඇසුණි. එහෙත් ඒ කාර්ය සඳහා බලය ලබාගත් එකම නායකයකු හෝ කැප වූයේ නැත. මේ රට දූෂණය, නාස්තිය, අල්ලස, භීෂණය ආදී සියලු අපරාධවලට සරු බිමක් වූයේ 1978 ඇති කළ ජේ. ආර්. ජයවර්ධනගේ ව්‍යවස්ථාව බව පොදුවේ පිළිගනී. මේ පිළිබඳව වෙනම දීර්ඝ වශයෙන් කරුණු දැක්විය යුතුය. එහෙත් ඉතා සැකෙවින් කිවහොත් ජයවර්ධන මෙන්ම ඉන්පසු බලයට පැමිණි හැම කෙනෙක්ම කර ඇත්තේ ජනතා පරමාධිපත්‍ය මංකොල්ල කෑමකි. ජයවර්ධන ඒ අපරාධය කළ පළමුවැන්නාය. මේ රටේ මහජනතාවගේ ද සහභාගිත්වයෙන් 1972 ක්‍රියාත්මක කළ ව්‍යවස්ථාව සිය හිතු මතයට වෙනස් කළ ජයවර්ධන තමන්ගේ ඇඟේ ප්‍රමාණයට මසා ගන්නා ඇඳුමක් මෙන් තම ගුඪ අරමුණුවලට උචිත පරිදි 1978 ව්‍යවස්ථා සකස් කර බලාත්මක කළේය. පාර්ලිමේන්තුවේ ගෞරවය බින්දුවට දැමූ ඔහු, රටට හඳුන්වා දුන් අලුත් ඡන්ද ක්‍රමය ද තවත් විනාශයක් විය. මනාප ඡන්දවලින් පාර්ලිමේන්තුවට වැඩිපුරම ආවේ උගත් යහපත් පුරවැසියන් නොව, ප්‍රාදේශීය දේශපාලන පොල් කෝම්බ බව පමණක් සඳහන් කිරීම සෑහේ. ඒ පොල් කෝම්බ, කුණු කන්දල් දියවන්නාවේ හිර වී පරිසරයම දුර්ගන්ධයෙන් වසා ගත් අයුරු බොහෝ වාද විවාදවලින් ද පෙනී යයි. ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා සඳහන් කළේ 1978 ව්‍යවස්ථාව ප්‍රජාතන්ත්‍රවාදයේ ඇඳුම් ආයිත්තම් පැළඳගත් ව්‍යවස්ථානුකූල ඒකාධිපතියකු නිර්මාණය කළ බවය. ඒ ව්‍යවස්ථාව 2015 දී යම් යම් සංශෝධනවලට භාජන විය. එහෙත් මෛත්‍රී - රනිල් ගැටුමත්, ඒ ක්‍රියාවලියට දායක වූ ඇතැම් අයගේ පෞද්ගලික න්‍යාය පත්‍රත් රටට ලබා දුන්නේ අපභ්‍රංශ ව්‍යවස්ථාවකි. දේශපාලන කෞටිල්‍යයකු වූ ජයවර්ධන නොඅඩු කූට දේශපාලන බුද්ධියක් ඔහුගේ නෑයකු වන රනිල් වික්‍රමසිංහට තිබීම පුදුමයක් නොවේ.

2020 දී සුවිශාල ජන වරමක් ලබා ගත් පොහොට්ටු පක්ෂයෙන් ජනාධිපති වූ ගෝඨාභයට සිය අභිමතය පරිදි මහජන සේවය ඉටුකිරීමට බව පවසමින් 2015 දී සම්මත කරගත් හොඳ දේවල් ද අවලංගු කැර, 20 වැනි සංශෝධනයක් සම්මත වූයේ ඒ පසුබිම තුළය. එහෙත් විස්සට අත ඉස්සූ අයට ද කොකා පෙන්වූ රාජපක්ෂ පාලනයේ අර්බුද සියල්ල මතු වූයේ ද ඒ 20 වැනි සංශෝධනය නිසා ය. ජනාධිපති වූ ගෝඨාභය ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන යොදා ගනිමින් සිය සහෝදරයකු වන ද්විත්ව පුරවැසියකු වූ බැසිල් පාර්ලිමේන්තුවට පත්කර ඔහුට මුදල් ඇමැති ධුරය ද ලබාදීමට නිර්භය විය. ඔහුගේ කැබිනට් මණ්ඩලයේ ඔහුගේම සහෝදර මහින්ද (අගමැති) චමල්, බැසිල්, මෙන්ම මහින්දගේ පුත් නාමල් ද විය. ශෂීන්ද්‍රට ලැබුණේ රාජ්‍ය ඇමැති පදවියකි. රාජපක්ෂ පවුල් ගස වර්ධනය වූයේ ඒ අයුරින් ය. (තවත් නෑයන්ට ද මන්ත්‍රීකම් හා වෙනත් ප්‍රදාන හිමිවිය. එහෙත් ගෝඨාභයගේ පාලනය බොහෝ තීන්දු තීරණ ද ප්‍රශ්නකාරී විය. ඔහු ප්‍රායෝගික දේශපාලනඥයකු නොවීම ඊට හේතු විය. කිසිදු දේශපාලන පරිචයක් නොමැති ගෝඨාභය වැනි අයෙක් රටේ ජනාධිපති ධුරයට උචිත නොවන බව වේලාසනින්ම කීවේ මහින්ද අගමැතිගේ සමීපතමයකු මෙන්ම හොඳ ශ්‍රී ලංකාකාරයකු ද වූ කුමාර වෙල්ගම හිටපු ඇමැතිවරයා ය. එදා ඔහු දුටු දේ විමල්, උදය, වාසු ඇතුළු බොහෝ දෙනෙක් තේරුම් ගත් බව නිසැකය. එහෙත් ඒ බව සෘජුව කීමට කුමාර වෙල්ගමට මෙන් නිර්භයකමක් අන් අයට නොවූයේ ද? කුමක් වුවත් අද රාජපක්ෂ විරෝධී සටනේ සෙන්පතිවරුන් වී ඇත්තේ ද විමල්, උදය, හා වාසුලා ය. ශ්‍රීලනිපය ද ඔවුන්ට එක්ව සිටියි.

ජනාධිපති පරිශ්‍රය මෙන්ම අරලියගහ මන්දිරය අබියස ද ආණ්ඩු විරෝධී තරුණයන්ගේ අණසකට යටත්ව තිබේ. ගාලු මුවදොර විරෝධතාව මුළු රටම අවදි කළ කාහල නාදයක් විය. දැන් රාජපක්ෂ බලය ගිලිහෙමින් පවතී. එයට මුක්කු ගැසීමට කිසිවෙක් ද නොවෙති. මේ වනවිට අගමැතිවරයා ඇතුළු මුළු කැබිනට් මණ්ඩලයම ඉවත් කර, පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම පක්ෂවල නායකයන් සමග සාකච්ඡා කර, සර්ව පාක්ෂික ආණ්ඩුවක් පිහිටුවීමේ ප්‍රතිපත්තිමය තීරණයකට ගෝඨාභය ජනාධිපතිවරයා පැමිණ සිටියි. ත්‍රෛනිකායික නාහිමිවරුන්, අන්‍යාගමික නායකයන්, සිවිල් සමාජ ක්‍රියාකාරීන් ඇතුළු විවිධ කොටස්වලට සවන් දී තමන් මෙම පියවරට එළැඹ සිටින බව ද ඔහු පවසා තිබේ. එහෙත් ජනාධිපතිවරයාට විධායක අට්ටාලයෙන් බිමට බැසීමට සිදුවූයේත්, අගමැති, ඇමැති සැප අතහැරීමට බොහෝ දෙනෙකුට සිදුවන්නේත් ගාලු මුවදොර නිර්පාක්ෂික තරුණ අරගලයේ අග්‍රඵලයක් වශයෙන් බව ද අපට හැඟේ. හතර වටින් නැඟුණු හා නැගෙන රාජපක්ෂ විරෝධයේ ප්‍රබලත්වය නිසාම ජනාධිපතිවරයාට කඩුව බිම දැමීමට සිදු වූ බව ද අපගේ අදහසය. මම රත්න ශ්‍රී කිවිඳුන්ට ණය ගැති වෙමින් මෙසේ ලියා තබමි.

'බිම්බරක් සෙනඟ වටකළ,
ගාලු මුවදොර අරගල දුටුව
ජනපති කඩුව බිම දමයි'

● ගාමිණී සුමනසේකර

# ඩොලර් හොයන තුරු අර්බුදයෙන් ගොඩ එන්නම මගක් නැද්ද?





මේ මොහොතේ රටේ පවතින්නේ බරපතළ දේශපාලන අස්ථාවර තත්ත්වයකි. ඒ තත්ත්වය සමනය කර ගැනීමට අප අසමත් වුවහොත් කෙතරම් හොඳ ආර්ථික තීන්දු තීරණ ගත්තත් ඒවායේ ප්‍රතිඵල අපේක්ෂිත පරිදි ලබා ගැනීමට ගත වන කාලය වැඩිවනු ඇත. එනම් ජනයාට ආර්ථික පීඩනයෙන් වැඩි කාලයක් විඳවීමට සිදුවනු ඇති බවයි. මේ කියන්නේ මෙතෙක් කලක් රටේ ආර්ථික බලධාරීන් නිවැරදි ආර්ථික තීන්දු තීරණ ගත් බව නම් නොවේ. අද මේ තත්ත්වය රටට සහ ජනයාට උදා වූයේ රජය සහ මහ බැංකුව නිසි වෙලාවට නිසි තීන්දු තීරණ නොගත් නිසාය. දැන් ගිය නුවණ ඇතුන් ලවාවත් අද්ද්වාගත නොහැකිය. ඉතිහාසයේ ප්‍රථම වතාවට රට ණය ගෙවාගත නොහැකිව බංකොළොත් වී ඇත. දැන්වත් අතීතයෙන් පාඩම් ඉගෙන මේ බලවත් ආර්ථික අර්බුදයෙන් ගොඩ ආ යුතු වේ. එහෙත් එය මේ මොහොතේ ආණ්ඩුවට පමණක් කළ හැකි දෙයක් නොවේ. මෙය කළ හැකි වන්නේ පීඩාවට පත්ව සිටින ජනයා වෙනුවෙන් අප සියලු දෙනා එක්ව සිදු කරන සමූහික ප්‍රයත්නයකින් පමණක් බව අපගේ හැඟීමයි. මේ අසීරු මොහොතේ දේශපාලනය කරපින්නාගෙන බොර දියේ මාළු බාන්නට සිදුකරන උත්සාහයන් හමුවේ ඒ සඳහා අප සූදානම් ද යන ප්‍රශ්නය බරපතළ ලෙස මතු වේ.

රටේ බරපතළ දේශපාලන අස්ථාවර තත්ත්වයක් ඇතිව තිබෙන්නේ ආර්ථික සහ විනිමය අර්බුදයට නිසි පිළියම් යෙදීමට රජය අසමත් වීමෙන් එය දේශපාලන අර්බුදයක් දක්වා වර්ධනය වීම නිසාය. ගෝල්ෆේස්හි අඛණ්ඩව පැවැත්වෙන 'ගෝඨා ගෝ හෝම්' විරෝධතාව තවදුරටත් සිදුවෙමින් තිබෙන අතරම රට පුරා නොයෙකුත් විරෝධතා සහ උද්ඝෝෂණ ද අඛණ්ඩව සිදුවෙමින් තිබේ. මේ විරෝධතා පිළිබඳ පුවත් ජාත්‍යන්තර මාධ්‍ය හරහා ලෝකයටම ප්‍රචාරය වෙමින් තිබේ. ඊයේ වාර්තා වූ පරිදි විරෝධතා නිසා කටුනායක ගුවන්තොටුපළට යන විදේශිකයන් ඇතුළු ගුවන් මගීන්ට ද තම ගමන් මළු සමග වාහනවලින් බැස පයින් යෑමට සිදුව තිබුණි. ඒ විදේශිකයන්ට අප රට ගැන කවර හැඟීමක් ඇති වන්නට ඇති ද? ආණ්ඩුවට විරෝධය පළ කිරීම එකකි. එහෙත් පාරවල් වසා විරෝධතා සිදු කිරීමෙන් වන්නේ පීඩිතයන්ම තවත් පීඩාවට පත් වීමයි. මේ නිසා මේ විරෝධතා පිටුපස නොයෙකුත් දේශපාලන පසුබිම් තිබිය හැකිය. එහෙත් මේ වන විට ජනයා මුහුණ දී සිටින බලවත් ආර්ථික පීඩනය හමුවේ පක්ෂ භේදයෙන් තොරව ආණ්ඩුවට එරෙහිව විශාල මහජන කෝපයක් ඇතිව තිබෙන බව ද අප පිළිගත යුතුය.

**● ආර්ථික අර්බුදයට විසඳුම් සෙවීම**

මේ වන විට නිර්මාණය වී ඇති සමාජ හා දේශපාලන අස්ථාවරත්වය හමුවේ මේ ආර්ථික අර්බුදයට විසඳුම් සෙවීම පහසු කාර්යක් නොවේ. සමාජ අසහනය සමනය කර ගැනීමට නම් මේ පවතින පෝළිම් තත්ත්වය සහ විදුලි කැපිල්ල සහ වේගයෙන් බඩු මිල ඉහළ යන තත්ත්වය පාලනය කරගත යුතු වේ. එසේ මහජනයා මුහුණ දෙන ආර්ථික පීඩා සමනය කරගත හැකි නම් එය සමාජ අස්ථාවරත්වය සමනය කර ගැනීමට හේතුවක් වනු ඇත. මේ රට මුහුණ දී සිටින දුෂ්කර මොහොතේ ආණ්ඩුවේ මෙන්ම විපක්ෂයේ දේශපාලන පක්ෂවල මීට වඩා වගකීමෙන් කටයුතු කළ යුතුය. මෙය දේශපාලනය කරන හෝ දේශපාලන වාසි ලබා ගන්නා අවස්ථාවක් නොවිය යුතුය. මහ බැංකු අධිපතිවරයා ලෙස ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා පත් වූ පසුව ඔහු කීවේ ආර්ථික අර්බුදය විසඳා ගැනීම සඳහා දේශපාලන සහ සමාජ ස්ථාවරත්වය අවශ්‍ය වන බවයි. ඒ නිසා මේ ආර්ථික අගාදයෙන් රටත් ජනතාවත් මුදා ගැනීමට නම් ඒ සඳහා සියලු දෙනාගේම කැපවීම අවශ්‍ය වේ. දැන් මහ බැංකු අධිපතිවරයා සහ මුදල් අමාත්‍යාංශ ලේකම් මහින්ද සිරිවර්ධන මහතා මේ ආර්ථික අර්බුදයෙන් රට මුදාගැනීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගනිමින් සිටින බව පෙනේ. මේ අප මුහුණ දෙමින් සිටින්නේ ඉතිහාසයේ බලවත්ම ආර්ථික අර්බුදයටය. ඒ නිසා ආර්ථික අර්බුදයෙන් මිදීමට ප්‍රමුඛත්වය නොදී මේ අවස්ථාවේ දේශපාලන ගැටලු සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පවතින ගැටලු ඇතුළු සියලු ගැටලු විසඳා ගැනීමට උත්සහ කිරීම නුවණට හුරු නොවේ. එය සියලු දෙනාම අකමැත්තෙන් වුවත් තේරුම් ගත යුතුය. මේ ආර්ථික අගාදයෙන් ඉක්මණින් ගොඩ එනවාද? එසේ නැත්නම් පවතින ආර්ථික අගාදයේ තවත් පතුළට ගමන් කරනවා ද? මේ නිසා ආර්ථික අර්බුදය විසඳා ගැනීමට දේශපාලන අස්ථාවරත්වය ද සමනය කරගැනීමට සිදුවන බැවින් ඒ සඳහා මහජනයා වෙනුවෙන් ආණ්ඩුවේ මෙන්ම විපක්ෂයේ දේශපාලන පක්ෂවල කැපවීමද අවශ්‍ය වේ. පොදු මහජනයාට ද කිසියම් ඉවසීමකින් කටයුතු කිරීමට සිදුවනු ඇත.

එසේ නැතහොත් වනුයේ මහජනයා තවත් පීඩාවට පත් වීමයි. ඒ තත්ත්වය වළක්වාගෙන මේ ආර්ථික ප්‍රශ්න සමනය කර ගැනීමට අප සියලු දෙනාම ප්‍රමුඛත්වය දිය යුතු වේ. අප සියලු දෙනාම එකතු වී මේ ආර්ථික අර්බුදයෙන් රටත් ජනයාත් මුදාගත යුතු මොහොතක් බවට මෙය පත්කර ගත යුතුය. මේ ආර්ථික අර්බුදය සමනය කර ගැනීමට සියලු පාර්ශ්වයන් ප්‍රමුඛත්වය දිය යුතුව තිබෙන බව සියලු දෙනාටම සිහිපත් කළ යුතුව තිබේ.

**● මහජනයා දැනුවත් කිරීම**

මුදල් ඇමැති අලි සබ්රි, මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ සහ මුදල් අමාත්‍යාංශ ලේකම් මහින්ද සිරිවර්ධන යන මහත්වරුන් විසින් නිරන්තරයෙන්ම මේ මූල්‍ය අර්බුදය විසඳා ගැනීමේ ඉදිරි සැලසුම් ගැන මහජනයාට දැනුවත් කිරීම ඉතා වැදගත්ය. එය මහජනයා තුළ පවතින නොසන්සුන්තාවන් සමනය කර ගැනීමට හේතු වනු ඇත. හැමෝම අසන්නේ රටට මොකද වෙන්නේ කියාය. ඩොලරය සහ රුපියල අතර අගය ස්ථාවර වෙන්නේ කවදා ද කියාය. මේ පෝළිම් සහ විදුලිය කැපිල්ල තව කොපමණ කාලයක් තියෙයි ද කියය. අසීමිතව පීඩාවට පත්ව සිටින පොදු ජනයාට මේ ආදී දහසකුත් එකක් ප්‍රශ්න ඇත. මේ දිනවල දේශපාලනඥන් කියන දේ ගැන මහජනයාට එතරම් විශ්වාසයක් නැත. මේ නිසා රටේ ආර්ථිකයේ හෙට දවස ගැන වඩා නිවැරදි චිත්‍රයක් විශ්වාසදායී ලෙස ඇති කළ හැකි වන්නේ මේ මොහොතේ මහ බැංකු අධිපතිවරයාට සහ මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාටය. මේ ගැන කරන දැනුවත් කිරීම් මහජනයා තුළ ඉදිරිය ගැන පැහැදිලි විශ්වාසයක් ඇති කිරීමට සමත්වනු ඇත. මේ සන්නිවේදන කාර්යය ද මේ මොහොතේ හරිහැටි ඉටු විය යුතුය.

**● මූල්‍ය අරමුදල කියන දේ**

ශ්‍රී ලාංකික නියෝජිත පිරිස ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කළමනාකරණ අධ්‍යක්ෂ ක්‍රිස්ටලිනා ජෝජිවා සහ එහි අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමග පසුගිය සතියේ සාකච්ඡා කළේය. ඒ ගැන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශ්‍රී ලංකා දූත මණ්ඩල ප්‍රධානී මසහිරෝ නොසාකි මහතා විසින් පසුගිය සෙනසුරදා (23 දා) නිල ප්‍රකාශයක් ද කර තිබුණි. එයට අනුව එහිදී ප්‍රධාන වශයෙන් සාකච්ඡා කර ඇත්තේ ශ්‍රී ලංකාව මුහුණ දී සිටින ආර්ථික අභියෝග ජය ගැනීම සඳහා වන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනය. එහිදී අයිඑම්එෆ් සහාය ලබන වැඩසටහනක් සඳහා වනඳ ශ්‍රී ලංකාවේ ඉල්ලීම ගැන මූලික තාක්ෂණික සාකච්ඡා ආරම්භ වී ඇත. මේ සාකච්ඡාවලදී ශ්‍රී ලංකාවේ මෑතකාලීන ආර්ථික හා මූල්‍ය ප්‍රවණතා, සාර්ව ආර්ථික ස්ථායිතාව යළි ඇති කිරීම සඳහා විශ්වසනීය සහ පැහැදිලි උපායමාර්ගයක් ක්‍රියාත්මක කිරීමට ඇති අවශ්‍යතාව සහ දිළිඳු සහ දිළිඳුකමින් අගතියට පත් විය හැකි ජනකොටස්වලට, පවතින ආර්ථික අර්බුදය හේතුකොටගෙන සිදුවිය හැකි අහිතකර බලපෑම් අවම කිරීම සඳහා ශක්තිමත් සමාජ ආරක්ෂණ ජාලයක ඇති වැදගත්කම ගැන මූලික අවධානය යොමුව තිබේ. එසේම ණය හිමියන් සමග සහයෝගිතාවයෙන් යුතු සංවාදයක නියැළීමට බලධාරීන්ගේ ඇති සැලසුම් මූල්‍ය අරමුදලේ කණ්ඩායම පිළිගෙන ඇත. බලධාරීන් සමග සහ ඔවුන්ගේ ආර්ථික වැඩසටහන් සමග සමීපව කටයුතු කරමින් අර්බුදවලට කාලීන විසඳුම් සෙවීමට උත්සාහ දරන ප්‍රයත්නයට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජිත කණ්ඩායම උපකාර කිරීමට බලාපොරොත්තු වන බව ද සඳහන් කර ඇත. මේ අනුව මූලික තාක්ෂණික සාකච්ඡා සාර්ථක වුවත් අපට අරමුදල් පහසුකමක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබා ගැනීමට නම් තරමක කාලයක් ගතවේ. දැනට අපේ විදේශ ණය තිරසාර නැති බව මූල්‍ය අරමුදල විසින්ම නිගමනය කර තිබෙන නිසා අපට මුලින්ම අපගේ විදේශ ණය ප්‍රතිව්‍යුහගත කර ගැනීමට සිදුවනු ඇත. එසේ කරමින් අපගේ විදේශ ණය තිරසාර කරගන්නා මාර්ගයකට සාර්ථකව අවතීර්ණ කරගෙන අපට මූල්‍ය අරමුදලේ ණය පහසුකම් ලබා ගැනීමට හැකිවනු ඇත. එය බොහෝ විට ඇමෙරිකානු ඩොලර් බිලියන තුනක් හෝ ඊට වඩා වැඩි අගයක් විය හැකිය. ප්‍රශ්නය තිබෙන්නේ අප ඒ කාලය ගත කරන්නේ කෙසේ ද යන්නයි. ඒ කාලයේ අපට අවශ්‍ය අත්‍යවශ්‍ය ආනයන කරගැනීමට අවශ්‍ය විදේශ මුදල් සොයාගත යුතු වේ. මුදල් ඇමැතිවරයා සූම් තාක්ෂණයෙන් වොෂින්ටන් සිට පැවැත්වූ මාධ්‍ය හමුවේ අලි සබ්රි ඇමැතිවරයා කියා සිටියේ අමෙරිකානු ඩොලර් බිලියන 3 ත් 4 ත් අතර මුදලක් මේ සඳහා සොයා ගැනීමට සිදුවනු ඇති බවයි. ඒ ගැන මිත්‍ර රටවල් සමග මෙන්ම ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව ඇතුළු බහුපාර්ශ්වීය ආයතන සමඟ ද සාකච්ඡා කරන බව ද ඔහු සඳහන් කළේය. අප ඇත්ත වශයෙන්ම මූල්‍ය අරමුදලට ගියේ බොහෝ ප්‍රමාද වී විදේශ ණය ගෙවාගත නොහැකිව අප විසින්ම බංකොළොත්භාවය ප්‍රකාශ කිරීමෙන් ද පසුවය. එනම් ප්‍රශ්නය ඉතාම නරක අතට පත් වූ පසුවය. මේ නිසා මීට බොහෝ පෙර අප අයිඑම්එෆ් සහාය ගත්තා නම් මේ වන විට මේ විනිමය අර්බුදය සෑහෙන දුරකට සමනය කර ගැනීමට හොඳටම ඉඩ තිබුණි. එහෙත් වැරදි ප්‍රතිපත්ති අනුගමනය කරමින් අපගේ නාහෙ උඩින් වතුර යනතෙක් ප්‍රශ්නය වර්ධනය කර ගැනීමෙන් පසු අප අයිඑම්එෆ් පිහිට පතා තිබේ.

**● රාජ්‍ය වියදම් කැපීම**

රජයේම වැරදි නිසා මේ වන විට අපේ බදු ආදායම් හොඳටම අඩු වී තිබුණත් අපට මේ මොහොතේ බදු තවත් වැඩි කිරීමට අපහසුය. මේ නිසා මේ මොහොතේ කළ හැක්කේ වියදම් කැපීමයි. මේ පසුබිම තුළ රාජ්‍ය වියදම් ඉතාම අත්‍යවශ්‍ය සේවාවන් සඳහා පමණක් යොදා ගැනීමට හැකිවන පරිදි දැඩිව පාලනය කිරීමට සිදුව ඇති බැවින්, වියදම් දැරීමේ දී සහ දේශීය අරමුදල් භාවිතයෙන් සිදුකරන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී වියදම් පාලන ක්‍රමවේදයන් අනුගමනය කළ යුතු ආකාරය දක්වමින් මුදල් අමාත්‍යාංශ ලේකම් මහින්ද සිරිවර්ධන මහතා විසින් පසුගියදා (26දා) චක්‍රලේඛයක් නිකුත් කළේය. එම චක්‍රලේඛය ප්‍රකාරව සිදු කරන වියදම් සීමා හා පාලනයන් ගැන මහාභාණ්ඩාගාර ලේකම්වරයා විසින් සියලු අමාත්‍යාංශ ලේකම්වරුන් සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇතුළු සෙසු රාජ්‍ය ආයතන ප්‍රධානීන්ට දැනුම් දී තිබේ. මේවා අයිඑම්එෆ් සහාය ලබන වැඩසටහනකට ඇතුළත් වීමට සුදුසුකම් ලැබීමට කරන දේවල් විය හැකිය. මේ නිසා ඉදිරි කාලයේ දී පවතින ආර්ථික අර්බුදය සමනය කර ගැනීමට නිවැරදි ආර්ථිකමය තීන්දු තීරණ ගන්නා බවට කිසියම් විශ්වාසයක් ඇතිකරගත හැකිව තිබේ. එය සතුටට කරුණකි. එහෙත් ඒවා ප්‍රතිඵලදායි වීමට නම් දේශපාලන සහ සමාජ අස්ථාවරත්වය සමනය කර ගැනීම තීරණාත්මක ලෙස බලපාන කරුණකි. කෙසේ හෝ මේ බඩු මිල වැඩි වීම් ඇතුළු වෙනත් බලවත් ආර්ථික අමාරුකම් තවත් යම් සැලකිය යුතු කාලයක් අපට විඳීමට සිදුවනු ඇති බවට නම් කිසිම සැකයක් නැත. මහ බැංකු අධිපති, මුදල් අමාත්‍යාංශ ලේකම් සහ මුදල් ඇමැති වෙනස් වූ පමණින් වහාම සියලු දේ හොඳ අතට හැරෙනු ඇතැයි අප කල්පනා නොකළ යුතුය. මේ අමාරුකම්වලින් විඳවන කාලය අවම කර ගැනීමට අප සැමටම වගකීමක් ඇති බව අප සියලු දෙනා විසින්ම කල්පනා කළ යුතු බව පමණක් සිහිපත් කළ යුතුව තිබේ.

**● දිනෙන් දින පිරිහෙන රුපියල**

මහ බැංකුව විසින් රුපියල පා කිරීමෙන් පසු මේ දක්වා දිගින් දිගටම රුපියල පිරිහෙමින් තිබේ. එනම් ඇමෙරිකානු ඩොලරයකට අප විසින් ගෙවිය යුතු රුපියල් අගය දිනපතාම පාහේ සැලැකිය යුතු අගයන්ගෙන් වැඩි වෙමින් තිබේ. මේ නිසා අප විසින් ආනයනය කරනු ලබන සියලු භාණ්ඩවල මිල වැඩි වේ. මෙය සිදුවන්නේ අප ආනයනය කරන භාණ්ඩවල ලෝක වෙළෙඳපොළ මිල ගණන් වැඩි වීම නිසා නොවේ. අපගේ රුපියලේ අගය පිරිහීම නිසාය. මෙසේ දිනපතාම රුපියල දිගටම විශාල අගයන්ගෙන් පිරිහෙන තත්ත්වය පාලනය කර නොගතහොත් අපගේ බඩු මිල පාලනයෙන් තොරව ඉහළ යනු ඇත. මේ හමුවේ දැනටමත් ඉන්ධන මිල ගණන් විශාල අගයන්ගෙන් වැඩි වී තිබේ. ඒ සමගම ප්‍රවාහන ගාස්තු ඉහළ ගොඩ ප්ලේන්ටියේ, පාන් ගෙඩියේ සිට සියලුම භාණ්ඩවල මිල ගණන් ඉහළ යයි. දැනටමත් භාණ්ඩ මිල ගණන් ඉතිහාසයේ කිසිදා නොවූ විරූ ලෙස ඉහළ ගොස් තිබේ. රුපියල පිරිහෙන තත්ත්වය වහාම පලනය කරගත නොහැකි වුවහොත් ජනයා දැන් මුහුණ දෙන පීඩනය තවත් වර්ධනය වීම වැළක්විය නොහැකිය. එහෙත් මීට සාපේක්ෂව ජනතාවගේ පඩිපත හෝ ආදායම් මට්ටම් කිසිවිටෙකත් ඉහළ යන්නේ නැත. මේ නිසා සමාජ අස්ථාවරත්වය සමනය කර ගැනීමට නම් තෙල් සහ ගෑස් පෝළිම්, විදුලි කැපිල්ල මෙන්ම භාණ්ඩ මිල ගණන් වේගයෙන් ඉහළ යන තත්ත්වය පාලනය කරගත යුතු වේ. මේ සඳහා රජයට හෝ මහ බැංකුවට ඇති වැඩපිළිවෙළ ගැන වහාම ජනයා දැනුවත් කළ යුතුව තිබේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත්කරනු ලබන නිල විනිමය අනුපාතික සටහනට අනුව ඉකුත් අප්‍රේල් 28 දින ඇමෙරිකානු ඩොලරයක විකුණුම් මිල රු. 354.99 ක් දක්වා ඉහළ ගොස් තිබුණි. එසේම මෙරට බලපත්‍රලාභී වානිජ බැංකු කිහිපයක් විසින්ම එදින ඩොලරයක විකුණුම් මිල රු. 360 ක් ලෙසින් දක්වා තිබිණි. මාර්තු මාසේ රු. 203 ට තිබුණ ඩොලරයේ අගය මෙසේ රු. 360 දක්වා ඉහළ ගිය විට එම විනිමය අනුපාත අගය අනුව පිරිවැය ගණනය කර අපගේ භාණ්ඩ මිල ගණනය කළ විට අපගේ භාණ්ඩ මිල අහස උසට වැඩිවෙන බව රහසක් නොවේ. මේ නිසා කවර හෝ ක්‍රමයකින් විනිමය අනුපාත ස්ථාවරත්වය ඇති කරගත යුතුව තිබේ. ඒ සඳහා අපට දැනට බින්දුවටම වැටී ඇති විදේශ සංචිත තත්ත්වය වර්ධනය කර ගැනීමට සිදුවනු ඇත. ඒ සඳහා කොහෙන් හෝ විදේශ විනිමය මුදල් වශයෙන්ම සැලකිය යුතු ප්‍රමාණයක් අපගේ මහ බැංකුවට ලබාගෙන අපගේ විදේශ සංචිත තත්ත්වය ශක්තිමත් කරගත යුතු වේ. මේ සඳහා ඇති සැලසුම් ගැන වඩාත් නිශ්චිතව රජය සහ මහ බැංකුව රටට පැහැදිලි කළ යුතු වේ.

**● මහ බැංකු අධිපතිගේ ප්‍රකාශය**

මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා ඉකුත් අප්‍රේල් 28 දින උදේ ලංකා වාණිජ මණ්ඩලයේ පැවති කමිටු රැස්වීමක් අමතමින් අදහස් දැක්වීමක් කර තිබුණි. එහිදී ඔහු වැදගත් කරුණු ගණනාවක් ගැන අදහස් පළ කර තිබුණි. ඒ අනුව හදිසි ආර්ථික ගැටලු විසඳීමට අතිරේක ක්‍රියාමාර්ග ගන්නා බවත් දැනට අවිධිමත් වෙළෙඳපොළේ ගනුදෙනු කරන ඩොලර් ප්‍රවාහයන් විධිමත් බැංකු පද්ධතිය හරහා ගනුදෙනු වීම දිරිමත් කිරීම සඳහා රෙගුලාසි හඳුන්වාදීම ද මෙම පියවරයන්ට ඇතුළත් වන බවත් ඔහු කියා තිබුණි. එසේම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාකච්ඡා කඩිනම් කිරීම සහ තිරසාර ආර්ථික ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම ප්‍රධාන ප්‍රමුඛතාවය වන බව ඔහු එහිදී කීවේය. රටේ දේශපාලන පසුබිම නොසලකා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ක්‍රියාමාර්ග අඛණ්ඩව පවතිනු ඇති බවත්, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේදී සියලුම ණය හිමියන්ට සමානව සලකන බවත් ඔහු අවධාරණය කළේය.

රජයේ සුරැකුම්පත් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලින් රජය ගෙන ඇති දේශීය ණය ප්‍රතිව්‍යුහගත නොකරන විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීම ශ්‍රී ලංකා රජයේ ප්‍රමුඛතාව බව ද ඔහු කීවේය. සාර්ව මූල්‍ය ප්‍රතිපත්ති රාමුවක් ස්ථාපිත කිරීම සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ආරම්භ කිරීම සඳහා දිරිගන්වන සුළු ප්‍රගතියක් ලබා ඇති බව ද ඔහු සඳහන් කළ මහ බැංකු අධිපතිවරයා ඉදිරි මාස දෙක ඇතුළත ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ කාර්ය මණ්ඩල මට්ටමේ එකඟතාවකට පැමිණීමට ඉඩ ඇති බවට ද ඔහු මෙහිදී විශ්වාසය පළ කළේය.

ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය විසින් දැනටමත් හඳුන්වා දී ඇති ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස, ආනයන වියදම් තවදුරටත් තිරසාර මට්ටම් දක්වා පහත වැටෙනු ඇති බව ද ඔහු කීවේය. මේ අපේක්ෂා සහ ක්‍රියාමාර්ග කෙරෙහි මහජනයා ලොකු විශ්වාසයක් ද ඇතිකර ගෙන තිබේ. ඒ නිසා මේ මොහොතේ අප කළ යුත්තේ මේ දේශපාලන අර්බුදයක් දක්වා ඔඩුදුවා ඇති මේ බලවත් විනිමය අර්බුදය විසඳා ගැනීම සඳහා ප්‍රමුඛත්වය දීමයි.

● ශ්‍යාම් නුවන් ගනේවත්ත
shyam.divaina@gmail.com

## විද්දෙ පඳුරට-වැදුණෙ හාවට

# නිකරුණේ වෙඩි කෑ කසුන්ගේ කතාව



**එක් පුද්ගල මරණයක් සහ තවත් පිරිසක් තුවාලකරුවන් බවට පත් කරමින් නිමාවට පත්වූ රඹුක්කන සිද්ධියේ උණුසුම තවමත් සමාජය තුළින් වරින් වර මතුවෙමින් ඇත. එපමණක් නොව එම සිද්ධිය මුල්කර ගනිමින් අතුරු කතා කීපයක්ද වාර්තා වෙයි**

රඹුක්කන සිද්ධියේදී වෙඩි තැබීම පිණිස අණදුන් හා එම නියෝගය ක්‍රියාත්මක කළ සියලුදෙනා අත්අඩංගුවට ගැනීමට අධිකරණ නියෝග නිකුත් කිරීමත් සමඟ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කෑගල්ල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කේ. බී. කීර්තිරත්න ඇතුළු තවත් පොලිස් නිලධාරීන් සිව්දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත. එක් පුද්ගල මරණයක් සහ තවත් පිරිසක් තුවාලකරුවන් බවට පත් කරමින් නිමාවට පත්වූ රඹුක්කන සිද්ධියේ උණුසුම තවමත් සමාජය තුළින් වරින් වර මතුවෙමින් ඇත. එපමණක් නොව එම සිද්ධිය මුල්කර ගනිමින් අතුරු කතා කීපයක්ද වාර්තාවන අතර මෙම සටහන වෙන් වන්නේ එවැනි එක් අතුරු කතාවක් පිණිසය.

කසුන් 15 හැවිරිදිය. රඹුක්කන ප්‍රදේශයේ පාසලක අධ්‍යාපනය ලබන කසුන් ඉකුත්දා රඹුක්කන සිසුවීම පිළිබඳ දැකබලා ගැනීම පිණිස තම පාසල් මිතුරන් කීප දෙනෙකුත් සමඟ එම ස්ථානයට ළඟාවන්නේ පාසල් වේලාවෙන් අනතුරුවය. නගරයේ කුමක් සිදුවේද යන්න පිළිබඳ කුතුහලයෙන් යුක්තව ඒ ස්ථානයට ළඟාවන කසුන් ඇතුළු ඔහුගේ මිතුරන් පිරිසට මුහුණදීමට සිදුවන්නේ ඔවුන් කිසිසේත් අපේක්ෂා නොකළ අනපේක්ෂිත සිදුවීමකටය. ප්‍රදේශය භාර ඉහළ පොලිස් නිලධාරියකුගේ අණ දීමකට අනුව ප්‍රදේශය දෙවනක් කරමින් පිටවෙන වෙඩි උන්ඩ සමූහයෙන් උණ්ඩ දෙකක් කසුන් සොයා පැමිණෙන අතර එය නතර වන්නේ කසුන්ගේ දකුණු අතටත් තුනටිය ප්‍රදේශයටත් දැඩි තුවාල සිදු කරමින්ය. විරෝධතාවය සිදුවූ ස්ථානයෙන් තරමක් දුර බැහැර වෙනත් ස්ථානයක සිට නගර මධ්‍යයේ සිදුවන දෙය නිරීක්ෂණය කරමින් සිටි කසුන් රඹුක්කන සිද්ධියෙන් තුවාල සිදුවූ පිරිසගෙන් එක් අයෙක් බවට පත්වන්නේ ඒ ආකාරයෙන්ය.

කෑගල්ල මහ රෝහලට ඇතුළත්ව ප්‍රතිකාර ලැබූ කසුන් මේ වනවිට තරමක් සුවය ලබා සිය නිවස වෙත පැමිණ සිටින අතර තම පුතණුවන්ට සිදුවූ විපත පිළිබඳව කසුන්ගේ මෑණියන් මාධ්‍යයට අදහස් දක්වමින් සඳහන් කර සිටින්නේ තම පුතණුවන් හැකි ඉක්මනින් සුවපත් වනු දැකීම තම එකම අපේක්ෂාව බවත් ඒ සඳහා කළ හැකි යමක් වේ නම් තම පුතණුවන්ගේ නාමයෙන් හැකි ඉක්මනින් ඉටුකර දෙන ලෙසත්ය. කඳුළු පිරි දෙනෙතින් යුතුව ඇය වැඩිදුරටත් ඒ පිළිබඳ සඳහන් කර සිටින්නේ මේ ආකාරයෙන්ය.

එදා ඉස්කෝලෙ ඇරිලා ගෙදර ආවාට පස්සෙ පුතයි එයාගෙ යාළුවෝ කීප දෙනෙකුයි නගරයේ සිද්ධවෙන දේ බලන්න කියලා ගෙදරින් පිටත්වෙලා ගියා. මේ කට්ටිය විරෝධය පැවැත්වෙන ස්ථානය හොඳින් දර්ශනය වන වෙනත් ස්ථානයක නතර වෙලා ඉඳිද්දි තමයි මගේ පුතාගෙ අතටයි තුනටියටයි වෙඩි පාරවල් දෙකක් වැදිලා තියෙන්නෙ. එක උණ්ඩයක් පුතාගෙ දකුණු අතට වැදිලා. අනිත් උණ්ඩය වැදිල තියෙන්නෙ තුනටියට. ඒ හේතුවෙන් දකුණු අතට ගොඩක් හානිවෙලා තිබෙනවා. තුනටියෙ තුවාලයට මැහුම් හතක් ගැහුවා. දූන් සතියක් පාසා ක්ලිනික් යන්න ඕන. මගෙ පුතා ලබන අවුරුද්දෙ සාමාන්‍ය පෙළ ලියන්න ඉන්න දරුවෙක්. වෙඩි වැදිලා තියෙන්නෙ දකුණු අතට. එයා ලියන්න කියන්න භාවිතා කරන්නෙ දකුණු අත හින්ද පුළුවන්තරම් ඉක්මනට අත හොඳකර ගන්න ඕන. නැත්නම් මගේ පුතාගෙ අධ්‍යාපන කටයුතු මුළුමනින්ම අඩාළ වෙන්න ඉඩ තිබෙනවා. අපිට පුද්ගලික රෝහල්වලින් ප්‍රතිකාර ගන්න තරම් ආර්ථික ශක්තියක් නෑ. මගේ මහත්තයා කරන්නෙ මේසන් රස්සාව. මට රස්සාව නෑ. එහෙම වුණා කියලා කාටවත් වරදක් කරලා නැති මගේ අහිංසක දරුවගෙ අනාගතය අඳුරු වෙන්න ඉඩ දෙන්න එපා. පුළුවන් කෙනෙක් ඉන්නව නම් ඒ අය මූලික වෙලා මගෙ පුතාව හොඳ කරලා දෙන්න. අම්ම කෙනෙක් විදිහට මම ඉල්ලා සිටින්නෙ එච්චරයි.

ඇය හැඬූ කඳුළින් යුතුව සමාජයෙන් ඉල්ලා සිටින්නේ තම ඇස්දෙකවන් පුතණුවන් හැකි ඉක්මනින් සුවපත් කරදෙන ලෙසය. කසුන් මේ වනවිට පසුවන්නේ තවදුරටත් වෛද්‍ය ප්‍රතිකාර ගතයුතු මට්ටමකය. ඒ සඳහා සතියකට වරක් කෑගල්ල මහ රෝහලේ පැවැත්වෙන සායනය පිණිස සහභාගි විය යුතුය. කොහේවත් යන වෙඩි උණ්ඩයක් විසින් 15 හැවිරිදි පාසල් සිසුවෙකුට බරපතළ තුවාල සිදුකර ඇත්තේ ඒ ආකාරයෙන්ය. වෙඩි තබන ලද පුද්ගලයන් මේ වනවිට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගෙන ඇත. ඔවුන් අත්අඩංගුවට ගත් පමණින් කසුන් සුවපත් වන්නේ නැත. සිදුව ඇති තුවාල හේතුවෙන් යම් හෙයකින් කසුන්ගේ එදිනෙදා කටයුතු මෙන්ම අධ්‍යාපන කටයුතු ආදියට යම් බලපෑමක් සිදුවේ නම් නීතියෙන් මෙන්ම හෘද සාක්ෂියෙන් නිදහස්වීම පිණිස වෙඩි තබන ලද පුද්ගලයන්ට කිසි විටෙකත් අවස්ථාවක් උදානොවනු ඇත.

● රුවන් ජයවර්ධන

# ගෑස් අපට පෙන්නන ගෑස්

## වරද කොතන වුණත් රටේ ජනතාව අමාරුවේ...



මේ රටේ ජනතාව අද දුක් කන්දක සිරවී සිටින්නේ යැයි යන්න කාටත් රහසක් නොවන අවිවාදිත කරුණකි. එවන් තත්ත්වයක් ඇති වීමට ප්‍රබල ලෙස බලපෑ එකම කරුණ වූයේ ආණ්ඩුවේ අදූරදර්ශී ක්‍රියාත්මක වීමය. එය එසේ නොවේ යැයි කියන්නට සිහිබුද්ධිය ඇති කිසිවකුටත් කිසිදු හැකියාවක් නැත.

රටත් ජනතාවත් වෙනුවෙන් ක්‍රියාත්මක වීමේදී ආණ්ඩුවට වැරදුන බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාද මේ වන විට පිළිගෙන ඇත. අවාසනාව වන්නේ සියල්ල විනාශයේ අවසානයටම ළඟාවීමෙන් පසු ජනාධිපතිවරයාට ඒ බව වැටහීමය.

මේ තත්ත්වය තුළ දිනෙන් දින ජනතාව ඉදිරියට එන අර්බුදවල නිමාවක්ද නැත. වැඩකරන ජනතාව ලද ආදායම ඇත්තේ තිබූ තැනමය. එහෙත් ඩොලරය ඉහළ යමින් රුපියල කඩා වැටෙද්දී බඩුමිල උඩු ගුවනේ පාවෙන්නේය. බහුතරයකට රොටියක් කා කහට උගුරක්වත් බීමට නොහැකි වන තැනට සියලු දේ සිදුවී ඇත.

**ඉහළ යන අර්බුදය**

මේ අතරේ දැන් ජනතාව මුහුණ දී සිටින මීළඟ බරපතළම අර්බුදය බවට පත්ව ඇත්තේ දරාගත නොහැකි අයුරින් ගෑස් මිල ඉහළ යෑමය. ලෝක වෙළෙඳපොළේ ගෑස් මිල ඉහළ ගිහින්.. රුපියල අවප්‍රමාණය වෙලා.. සමාගම්වලට පාඩුයි.. ආදී වශයෙන් දැන් මේ තත්ත්වය පිළිබඳව ඇතැම් ලොකු චරිතවලට විවිධ කතා කියන්නට පුළුවන.

එහෙත් අපට කියන්නට තිබෙන්නේ නිවැරදි නොවන රාජ්‍ය පාලනයක් හමුවේ දුකට පත්ව විඳවමින් සිටින ජනතාවට ඒ කිසිත් අදාළම නැතැයි කියාය. මන්ද මෙසේ ගෑස් මිල ඉහළ යෑමේදී රට තුළ පවතින අර්බුදකාරී තත්ත්වය තවත් තුන්හතර ගුණයකින් ඉහළ යන නිසාය.

එසේ අර්බුදය ඉහළට එසවෙද්දී එයට මුහුණදීමට සිදුවන්නේ අද දවසේ දහසක් ගැටලු මැද හොඳටෝම විඳවමින් සිටින දුක් විඳින ජනතාවටය. විවිධ ජාවාරම්කාරයන්ට, රටට කරන්නට යැයි පවසා දේශපාලනයට පිවිසී නූපන් පරම්පරාවන්ට පවා හරිහම්බ කරගත් දේශපාලන කොමිස් කාක්කන්ට ආදී වශයෙන් ඇතැමුන්ට නම් මේ තත්ත්වය ගැටලුවක් නොවිය හැකිය. එහෙත් ගෑස් මිල ඉහළ යෑමේදී කුසගින්නට කෑ පාන් කෑල්ලේ සිට සියල්ලේ මිල වැඩි වෙද්දී ඒ දුක දැඩිව දැනෙන්නේ අති බහුතරයක් වන දුප්පතුන්ට සහ මැද පන්තියටය.

**ගෑස් කතාවේ ආරම්භය**

ගෑස් යන්න රටේ තවත් එක් අර්බුදයක් බවට පත්වෙමින් වත්මන් තත්ත්වය නිර්මාණය වූයේ කෙසේ කොතැනක සිටද? එය ඉකුත් 2021 වසරේ අප්‍රේල් මාසය දක්වා ඈතට විහිදී යන්නකි.

පැහැදිලිවම කිවහොත් මෙරට කොරෝනා වසංගතයේ තෙවැනි රැල්ල හෙවත් 2021 අලුත් අවුරුදු පොකුරත් සමඟම ගෑස් අර්බුදයද මුලින්ම රට ඉදිරියේ මතුවන්නට විය. කොරෝනා නිසා ලෝක වෙළෙඳපොළේ ගෑස් මිල ඉහළ ගොස් ඇති බැවින් ගෑස් මිල ඉහළ දැමිය යුතු බවට ගෑස් සමාගම් ප්‍රකාශ කිරීම එකී ආරම්භය ලෙස පෙන්වාදිය හැකිය.

මෙහිදී මෙරටට ගෑස් සැපයුම සිදු කරන සමාගම් ද්විත්වයම කියා සිටියේ ගෑස් අලෙවියේදී එක් ගෘහස්ත සිලින්ඩරයකින් රුපියල් 700 ක පමණ පාඩුවක් ලැබීමට සිදුව ඇති බවකි. කෙසේ වෙතත් සමාගම්වලට අවශ්‍ය පරිදි මිල ඉහළ දැමීමට රජය මුලදී ඉඩක් ලබා නොදුන්නද පසුව ඒ සඳහා අවසර දෙනු ලැබීය.

ඒ අනුව දෙවරකදී ගෑස් මිල ඉහළ දැමීමට ලිට්රෝ සහ ලාෆ් ගෑස් සමාගම් කටයුතු කළේය. ඒ අන්දමට ගෑස් සමාගම් ලෝක වෙළෙඳපොළ රටට පෙන්වා දෙවැනි වරට ගෑස් මිල ඉහළ දමනු ලැබුවේ ඉකුත් ඔක්තෝබරයේදීය.

එහිදී එතෙක් රුපියල් 1493 ක මිකට අලෙවි කෙරුණු ලිට්රෝ සමාගමේ කිලෝ ග්‍රෑම් 12.5 ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 1257 කින් ඉහළ දමමින් රුපියල් 2750 දක්වා වැඩි කිරීමට එම සමාගම පියවර ගනු ලැබූ අතර ඒ සමඟම ලාෆ් සමාගමේ කිලෝ ග්‍රෑම් 12.5 ගෑස් සිලින්ඩරයක මිලද රුපියල් 2840 ක් දක්වා ඉහළ නැංවීය.

කොරෝනා වසංගතය හමුවේ රටේ ජනතාව හොඳටෝම හෙම්බත්ව සිටියදී මෙසේ ගෑස් මිල ඉහළ යෑමද මෙහිදී සුවිශේෂීය. මෙහිදී අදාළ ගෑස් සමාගම් දෙකම කියා සිටියේ ලෝක වෙළෙඳපොළේ ගෑස් මිල ඉහළ යෑම නිසා මිල වැඩි කිරීමට සිදුවූ බවය.

**රටම සූරාකන ගෑස් මාෆියාව**

හැමදාමත් ලෝක වෙළෙඳපොළේ ගෑස් මිල තීරණය කෙරුණේ මසකට වරක් සංශෝධනය කරනු ලබන සෞදි අරාබියේ ඇරැම්කෝ සමගමේ මිල දර්ශකවලට අනුවය. එහෙත් එම සමාගමේ මිල දර්ශක අනුව ගෑස් මිල පහත වැටුණද කිසිදු කලෙක ශ්‍රී ලංකාවේ ගෑස් මිල පහළ ගිය බවක් අප කිසිවකුත් අසා දැක තිබේද?

මේ රටේ එවන් දේ සිදු වන්නේ නැත. එසේ මිල අඩු කිරීම දේශපාලනඥයන්ගේ ඡන්ද තුරුම්පු බවට පත්ව තිබෙන්නකි. ලෝක වෙළෙඳපොළේ ගෑස් මිල අඩු වුවද ඒ සහන මේ රටේ ජනතාවට ලැබුණා නම් ලැබුණේ ඡන්දයක් ආසන්නයේදීය. එය ශ්‍රී ලංකාවේ ක්‍රමය ය.

මේ අන්දමට ලිට්රෝ සමාගම සහ ලාෆ් සමාගම රුපියල් 2800 ක සීමාවට කිලෝ ග්‍රෑම් 12.5 ගෑස් සිලින්ඩරයක මිල ගෙන එනු ලැබුවේ රට තුළ මාරාන්තික ගෑස් පිපිරීම් මාලාවකුත් සිදු වූ පසුවය. එකී ගෑස් පිපිරීම් හමුවේ ගෑස් යන්න රටේ ප්‍රධාන මාතෘකාවක් බවටද ඒ දිනවල පත්ව තිබුණු අතර මෙරට ඉතිහාසයේ මුල්වරට එවකට ලිට්රෝ සමාගමේ සභාපතිවරයා ලෙස කටයුතු කළ තෙසාර ජයසිංහ මහතා රට තුළ ක්‍රියාත්මක ගෑස් මාෆියාවක සුලමුල රටට අනාවරණය කරනු එහිදීය.

**අපට කියන්නට තිබෙන්නේ නිවැරදි නොවන රාජ්‍ය පාලනයක් හමුවේ දුකට පත්ව විඳවමින් සිටින ජනතාවට ඒ කිසිත් අදාළම නැතැයි කියාය. මන්ද මෙසේ ගෑස් මිල ඉහළ යෑමේදී රට තුළ පවතින අර්බුදකාරී තත්ත්වය තවත් තුන්හතර ගුණයකින් ඉහළ යන නිසාය.**

**එසේ අර්බුදය ඉහළට එසවෙද්දී එයට මුහුණදීමට සිදුවන්නේ අද දවසේ දහසක් ගැටලු මැද හොඳටෝම විඳවමින් සිටින දුක් විඳින ජනතාවටය. විවිධ ජාවාරම්කාරයන්ට, රටට කරන්නට යැයි පවසා දේශපාලනයට පිවිසී නූපන් පරම්පරාවන්ට පවා හරිහම්බ කරගත් දේශපාලන කොමිස් කාක්කන්ට ආදී වශයෙන් ඇතැමුන්ට මේ තත්ත්වය ගැටලුවක් නොවිය හැකිය. එහෙත් ගෑස් මිල ඉහළ යෑමේදී කුසගින්නට කෑ පාන් කෑල්ලේ සිට සියල්ලේ මිල වැඩි වෙමින් ඒ දුක දැඩිව දැනෙන්නේ අති බහුතරයක් වන දුප්පතුන්ට සහ මැද පන්තියටය.**




දිගින් දිගටම සිදුවූ පිපිරීම් නිසා ගෑස් යන්න රටේ ආන්දෝලනාත්මක මාතෘකාවක් වෙද්දී තමන් වෙත එල්ල වූ පීඩනය හමුවේ ඇතැම් විට තෙසාර ජයසිංහ මහතා එකී හෙළිදරව්ව සිදු කළා විය හැකිය. එසේම එකී මාෆියාවට එරෙහිව ක්‍රියාත්මක වීම පැහැදිලි අරමුණක් තරුණ සභාපතිවරයකු ලෙස ඔහු තුළ තිබුණාද විය හැකිය.

ලෝක වෙළෙඳ පොළෙන් අඩු මිලට ගෑස් ලබා ගැනීමට අවස්ථාව තිබියදී එක්තරා සමාගමක් සමඟ ගිවිසුම් අත්සන් කරමින් සංවිධානාත්මක කණ්ඩායමක් වැඩි මිලට ගෑස් ලබාගෙන රුපියල් කෝටි දහසක (කෝටි 1000ක්) පමණ මුදලක් ගසා කන බව තෙසාර ජයසිංහ මහතා කළ එකී අනාවරණය විය.

**ආණ්ඩුවට වැරදුණු හැටි**

රටම උකසට තබමින් සංවිධානත්මක පිරිසක් මෙවැනි ජාවාරමක් සිදු කරන බව තමන් විසින්ම පත් කරනු ලැබූ සභාපතිවරයකු අනාවරණය කරද්දී ඒ පිළිබඳ කඩිනම් විමර්ශනයක් සිදු කිරීමට ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුවට එදා කිසිදු උනන්දුවක් තිබුණේ නැත. ඇතැමුන් නම් කියන්නේ ජනාධිපතිවරයා එය නතර කළ බවය. එහෙත් එසේ කළේ නම් එය රහසේ කළේ ඇයි?

ජනාධිපතිවරයා ඇතුළු සියලු දෙනා මෙසේ මුනිවත රකිද්දී තෙෂාර මහතා හෙළිදරව්ව එදා මතුවූ තැනම යටපත්වී ගියේය. එසේ වූයේ ඇයි? එකී මාෆියාව තවමත් ක්‍රියාත්මක වෙමින් තිබෙන්නක්ද? අද මේ රටේ විඳවමින් සිටින ජනතාවට රුපියල් පන්දහසකට ආසන්න මුදලක් ගෙවා ගෘහස්ත ගෑස් සිලින්ඩරයක් මිලදී ගැනීමට සිදුව ඇත්තේ ඒ මාෆියාව නිසාද?

මේවා අදටත් උත්තර නැති ප්‍රශ්න බවට පත්ව ඇත. මාෆියාවක් පිළිබඳ අනාවරණය කරනු ලැබුවද එකී සංවිධානාත්මක තක්කඩි පිරිස කවුරුන්දැයි හෙළි කිරීමට තෙසාර ජයසිංහ මහතා කටයුතු කළේ නැත. එසේ වූයේ මේ රටේ මජර දේශපාලනයේ පාදඩ හස්තයන් එකී මාෆියාව තුළට කාවැදී තිබුණු නිසාද විය හැකිය.

**ගෑස් සහ මිනිස්සු**

අද දවසේ ගෝඨා ගෝ හෝම් කියමින් රටේ ජනතාව පාරට පැමිණ සිටින්නේ මේ අන්දමට විවිධ අකාරයෙන් දිගින් දිගටම විඳවන්නට සිදුවීම හමුවේය. එය දැන් මහින්ද ගෝ හෝම් කියන තැන දක්වාම දුරදිග ගොස් අවසන්ය. අද රුපියල් 4860 දී ගෑස් සිලින්ඩරයක් ගනින් යැයි ආණ්ඩුව කියන්නේ ආණ්ඩුවේම නොහැකියාව නිසා අනේක විධ දුක් කන්දරාවක් විඳින්නට සිදුවීම හමුවේ මෙසේ රජයට එරෙහිව වීදි බැස සිටින ජනතාවටය. කතා දෙකක් නැත. කවුරු කෙසේ කීවත් අද මේ රටේ අති බහුතරයක් ජනතාවට නිවසේ බත පිසගෙන දරුපවුල සමඟ කුස පුරවා ගැනීම වෙනුවෙන් රුපියල් පන්දහසක් දී ගෑස් මිලදී ගැනීමට කිසිසේත්ම හැකියාවක් නැත.

සියලු දෙනා ඒ තරමටම දුප්පතුන් වී අවසන්ව ඇත. දවසේ කුලියට රැකියාවක් කළ මිනිසාගේ පටන් මාසයක පඩිපත වෙනුවෙන් රැකියාවේ යෙදුණු මධ්‍යම පාන්තිකයා දක්වා සියලු දෙනාටම අත්වී තිබෙන්නේ ඒ ඉරණමය. මේ අතර සිටින්නෝ රටේ ජනතාවගෙන් අතිබහුතරයක් වන්නාහ. මේ අන්දමට ගෑස් සිලින්ඩරයක් මිලදී ගැනීමට ඇති නොහැකියාව හමුවේ ඔවුහු වෙනත් විකල්පයක් වෙත යායුතු වන්නාහ. එහිදී විවිධ සමාජ ස්ථරයන් අනුව සියලු දෙනා මුහුණ දෙන ගැටලු අනන්තය. අප්‍රමාණය. මේ රටේ දේශපාලනඥයන්ට හැමදාමත් නොතේරුණේද එවැනි ජනතා ගැටලුය.

**පිළිතුරක් නැති ප්‍රශ්නය**

කොළඹ ඇතුළු නාගරික පරිසයේ ජීවත් වන ජනතාව ගතහොත් බොහෝ දෙනකුට ගෑස් වෙනුවට දර ලිපක් දල්වා ගැනීමට නොහැකිය. තට්ටු හෝ පේළි නිවාසවල මෙන්ම අඩු ඉඩකඩක් සහිත ස්ථානවල ජීවත් වන ඔවුන්ට එසේ දර ලිප් දල්වීමට නොහැකිය. භූමිතෙල් ලිපක් දල්වා නිවසේ ආහාර ටික පිස ගැනීමේ අවස්ථාවද අද ඔවුන්ට අහිමිවී ඇත. එයට හේතු වී තිබෙන්නේ ඉන්ධන සැපයීමේ ගැටලු නිසා පෝළිම් ගානේ රස්තියාදු වීමට සිදුවීමය.

විදුලියෙන් අහර ටික පිස ගැනීමටද ඔවුන්ට නොහැකිය. එසේ කළහොත් මාසය අවසානයේ දරාගත නොහැකි විදුලි බිලකට හිමිකම් කීමට සියලු දෙනාට සිදුවන්නේය. එම තත්ත්වය තුළ ඔවුන්ට ඇති ඊළඟ විකල්පය වන්නේ ආපන ශාලාවකින් අහර ලබා ගැනීමය.

එහෙත් ගෑස් මිල ඉහළ යෑම හමුවේ හෙට දිනයේ ආපන ශාලාවල බත් පාර්සලයක මිලද දුණු වේග යෙන් ඉහළට යනු ඇත. එසේ නම් ඔවුන් කළ යුත්තේ කුමක්ද? එය පිළිතුරක් නැති ගැටලුවක් වී ඇත. ප්‍රශ්නයට හේතුව ගෑස් මිලය.

අර්ධ නාගරික ප්‍රදේශයක වුවද තත්ත්වය මෙසේමය. දර ලිපක් දැල්වීමට ඇති ඉඩකඩ සීමිතය. වෙනත් විකල්ප පිළිබඳ කල්පනා කිරීමේදීද ඇතිවන දුෂ්කරතා බොහෝය. අද අපේ මුදලාලිලා ඩොලරයට සාපේක්ෂව දර මිටියක මිලද ඉහළ දමා තිබීම සියලු දෙනා මුහුණ දී ඇති තවත් ගැටලුවක් වී ඇත.

ගම්බද ජනතාව ගත් කල දර ලිපක් දල්වා ගැනීමේ හැකියාවක් පැවතියද යම් ආකාරයකින් වර්ෂා තත්ත්වයක් ඇති වුවහොත් නිවසේ අහර ටික පිස ගැනීම වෙනුවෙන් බොහෝ දුෂ්කරතා විඳීමට ඔවුනටද සිදුවන්නේය. මේ අන්දමට ගෑස් මිල ඉහළ දැමීම හමුවේ හෙට දිනයේ පාන් ගෙඩියේ සිට අනෙකුත් සියලු ආහාරවල මිලද ඉහළ යනු ඇත. මෙවන් තත්ත්වයක් නිර්මාණය වී තිබෙන්නේ මේ රටේ ජනතාව කළ වරදක් නිසාද? නැත. වරද ඇත්තේ පාලකයන්ගේය. දේශපාලනඥයන්ගේය. රටේ භාණ්ඩාගාරය හිඳෙන තැනට කටයුතු කළ ආණ්ඩුවක් නිසා සියලු දෙනාට මේ දුක අත්වී ඇත. අද ඇතැමුන් රටේ ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ තත්ත්වය සමනය වන තෙක් මඳක් ඉවසා සිටින්නැයි කියාය.

එහෙත් දේශපාලන හොරුන්ගේ, කොමිස් කාක්කන්ගේ, මාෆියා තක්කඩින්ගේ ගසා කෑම් හමුවේ රට ඇද වැටී දුක දෝරේ ගලද්දී මේ රටේ ජනතාව තව කොතෙක් කලක් අනුන්ගේ පව් කරට ගෙන මාරුවෙන් මාරුවට කල්වාරිය තරණය කළ යුතුද?

අද රජයට එරෙහිව වීදි බැස සිටින සමස්ත ජනතාව එක හඬින් දේශපාලනඥයන්ගෙන් ඉල්ලා සිටින්නේ ඒ ප්‍රශ්නයට අදාළ පැහැදිලි පිළිතුරය.

**සමන් ගමගේ**



# සිනාමු!



## අරගල බිම හදාරා වදාරමු

පැය 8ක වැඩමුරයක් ඉල්ලා ඇරඹුණු කම්කරු සටනක් මහා ලේ වැගිරීමකින් කෙළවර වූයේ, එක්තරා දිනයක් ලෝකයට කිසිදා අමතක නොවන ලෙස සලකුණු කරමිනි. ඒ ජාත්‍යන්තර කම්කරු දිනය හෙවත් මැයි දිනය යි. ඒ 1886 අද වැනි දිනක අමෙරිකාවේ චිකාගෝ නගරය උණුසුම් වූයේ අසාධාරණයට එරෙහිව නැඟී සිටි කම්කරු පිරිසකගේ විරෝධතාවක් හේතුවෙනි. පසුව එම දිනය ලොව පුරා වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් අවධාරණය කරන සුවිශේෂී දිනය බවට පරිවර්තනය විය. එදා සටන් පාඨ කියමින් එම උද්ඝෝෂණයට එක්වූ පිරිස දහසකට අධික සුවහසක් කම්කරු ජනතාවගේ රුධිරය මතින් මැයි 01 දින ජාත්‍යන්තර කම්කරු දිනය බවට පත් වූයේ එලෙසිනි.

ශ්‍රී ලංකාවේ කම්කරු ප්‍රජාව ලෝකවාසී කම්කරුවන් සමග එක්සත්ව පෙළ ගැසුණේ, එලෙස තම අයිතීන් දිනාග ැනීමේ අඛණ්ඩ අරගලයේ නව සන්ධිස්ථානයක් සනිටුහන් කරමිනි. ඒ අනුව, ලංකාවේ ප්‍රථම වරට කම්කරු දිනය සැමරුවේ 1927 වසරේ දී ය. ලංකා ඉතිහාසයේ පළමු මැයි රැළිය 1933 කොළඹ ප්‍රයිස් පිටියෙන් ආරම්භ වී ගාලු මුවදොර පිටියෙන් අවසන් විය. කෙසේ වුවද, රටක වැඩි බර අදිනුයේ වැඩකරන ජනතාව බව කිසිසේත්ම අමතක කර දැමිය නොහැක. ඉතිහාසයේ මෙන්ම වර්තමානයේදීත්, ඉන් අනතුරුව අනාගතයේ දීත් අනේක කැප කිරීම් සිදු කරන වැඩ කරන ජනතාවගේ කර මතින් රට ඉදිරියට ගමන් කරනු ඇත.

සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු යනාදී වශයෙන් පංච පුද්ගල බලවේගයන් ශ්‍රී ලංකාවේ විශාල බලකණු ලෙස තම දායකත්වය මෙරට ඉතිහාසය පුරාවට ලබා දී ඇත. අප අද භුක්ති විඳින අයිතිවාසිකම් හා ගරුත්වයන් වෙනුවෙන් මිනිසුන් සටන් කළ බව ඉතිහාසය අපට උගන්වයි.

මීට පෙර පැවති අරගලයන්වලට වඩා වෙනස් මුහුණුවරක් ගත් ගෝල්ෆේස් අරගලය අද කාගෙත් කතාබහට ලක්වූ භූමියක් වී ඇත. ඇතැම් අයට මෙම භූමිය වරද නිවැරදි කරගන්නා තැනක් බවට පත්ව ඇත. ඇතැම් කලාකරුවන් සමාව ඇයැද අරගලයට සහාය දැක්වූයේ මෙම ස්ථානයේ සිටය. ඒ නිසා මේ අරගල භූමිය ගැන බොහෝ දෙනාට විවිධ මුහුණුවරින් බැලීමේ හැකියාව පවතී. ඒ මෙය නිදහස් භූමියක් නිසාය. ස්වයං විනය මත වැඩකරන ඕනෑම අයකුට ඒ භූමිය තුළ සිටිය හැකි බව පෙනේ. ඒ නිසාම මේ භූමියට ඉතිහාසයේ වෙනම පරිච්ඡේදයක් වෙන්වනු ඇත.

මේ විප්ලවයට සියලු ජන කණ්ඩායම් සම්බන්ධවී ඇත. අතීතයේ පැවති අරගලවල එක් ජන කණ්ඩායමකට එරෙහිව තවත් ජන කණ්ඩායමක් හෝ පක්ෂයක් සිටියේය. මෙය එවැනි අරගලයක් නොවේ. මෙය ක්‍රමයට එරෙහි ජන නැඟිටීමකි. මෙතැන විවිධ දේශපාලන මතධාරීහු සිටිති. විවිධ ආගමික, වාර්ගික, පංතිමය ජන කොටස් සිටිති. එකිනෙකා අභිබවා තම න්‍යාය පත්‍රය සඳහා මේ අරගලය භාවිතා කරන්නට කිසිවකුට අවසරයක් නැති බව පෙනේ. මේ සියලු කොටස් එක්කර ඇත්තේ ජනතාවට සංවේදී පාලනයක උදාව වෙනුවනි. සජීවී ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක උදාව වෙනුවෙනි. මෙම ක්‍රමය වෙනස් කිරීමට ඉල්ලන ජනකාන්ත ව්‍යාපාරයකි.

අද සිදුව ඇත්තේ රාජ්‍යය පාලනයේ බිඳ වැටීමකි. අවශ්‍යව ඇත්තේ ප්‍රායෝගික දර්ශනවාද මිස පැරණි දර්ශනවාද නොවේ. වසර කිහිපයකට වරක් පවත්වන ඡන්ද විමසීමකට පමණක් සීමාවූ ප්‍රජාතන්ත්‍රවාදයක් නොව ඉන් ඔබ්බට ගිය, වඩාත් පුළුල් ජනතා සහභාගිත්වයෙන් නිරතුරු පවත්වා ගන්නාවූ ප්‍රජාතන්ත්‍රවාදයක් සඳහා වන අරගලයක් බවට මෙය පත්ව ඇත. දූෂිත දේශපාලනඥයන් දේශපාලනයෙන් අතුගා දැමීමත්, කොල්ලකන ලද ධනය ලබා ගැනීමත් නව පරපුරේ අරගලයේ එක් අධිෂ්ඨානයක් වී ඇත. එමෙන්ම අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදයක් නොමැතිව, ප්‍රභූ පන්තියේ ආධිපත්‍යයට යටත්ව පවත්වාගෙන යන දේශපාලන පක්ෂවලට හෝ, පැරණි සමාජවාදී, ධනවාදී දර්ශන පෙන්වමින් පැවැත්ම සොයන බලවේගවලට හෝ තවදුරටත් ඒ රැවටීම කිරීමට නැඟී සිටින මේ අලුත් පරපුර වෙතින් අවසරයක් නොලැබෙනු ඇත.

ඇතැමුන්ට අනුව මේ උද්ඝෝෂණය කානිවල් එකකි. එහි සිදුවන්නේ කුණුහරුපය. සුපිරි වාහනවලින් බැස ගිටාර් ගසමින් ගන්නේ තවල් ආතල් එකකි. ආණ්ඩුවේ මාධ්‍ය හා ආණ්ඩුව බලයට ගෙන ඒම සඳහා ක්‍රියා කළ මාධ්‍යවල පැරණි කූට නාටක මෙවැනි දෑ ප්‍රකාශ කළ ද ඒවා දැන් වැඩකරන්නේ නැත. මෑතක් වනතුරුම ඒ මාධ්‍ය තම හාම්පුතුන්ගේ දේශපාලන පැවැත්ම සඳහා මේ රටේ ජනකොටස් අතර විවිධ වාර්ගික ගැටුම් ඇතිකරමින් රඟදැක්වූ විගඩම්ද දැන් අලුත් පරපුර අවබෝධ කරගෙන ඇත. සාම්ප්‍රදායික ඒ මාධ්‍ය මෙහෙයුම් අභිබවා, රටේ ජනතා මතය මේ අරගල තුළින්, සමාජ ජාලා තුළින් මතුව ඒම සිදුව ඇත. පැරණි ප්‍රමිතිවලින් අද අරගලයේ ප්‍රමිතිය නිර්ණය කළ නොහැක. අද ඇත්තේ වෙනස්ම සංස්කෘතියක් මෙන්ම වෙනස්ම අරගලයකි.

එක පැත්තකින් මැයි දින සැමරුම්ය. අනෙක් පැත්තෙන් ගෝල්ෆේස් අරගලයයි. තව පැත්තකින් වීදි බැස ඇති වැඩකරන ජනතාවය. තවත් අතකින් නොකඩවා දින හයක් තිස්සේ මහනුවර සිට කොළඹට එන පාර්ලිමේන්තුවේ ප්‍රධාන විපක්ෂ බලවේගය සංවිධානය කර ඇති සමගි පා ගමනය. මේ හැරෙන්නට රට පුරාම පක්ෂ, පන්ති, වර්ග බේදවලින් තොරව රටම එක් කළ ගෝටා ගෝ ගම්මානයන්ය. ජනතා ජනබලවේගය සංවිධානය කළ පා ගමනක් මෙයට කලින් සිදුවිණ. මේ සියල්ල තුළින් එළිදකින්නේ ජනතාවගේ දරාගත නොහැකි ජීවන අරගලයේ දුක, වේදනාවයි. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් අපයෝජනය කරමින් ගෙනගිය දූෂිත, ගජමිතුරු ධනවාදී, ගෝත්‍රික පාලනයක් හේතුවෙන් බැට කමින් සිටින ජනතාවගේ ආවේගයන්ය. මේ සියල්ල මැද, 69 ජනවරම ලබාගත් පාලකයන්ට මැයි පෙළපාලියක් පවත්වාගත නොහැකි වාතාවරණයක් අද උදාවී ඇත. රැකවල් සමග හෝ ජනතාව අතරට පැමිණිය නොහැකි පසුබිමක් උදාවී ඇත.

මේ අතර අප දන්නාවූ ඉතිහාසයේ නොවූ අයුරින්, අප රටේ සියලුම පළමු පෙළේ ආගමික නායකයන් ජනමතයට හිස නමන ලෙස පාලකයන් අමතමින් ප්‍රකාශ නිකුත් කර ඇත. හැටනව ලක්ෂයක ජනවරම ගැන තවදුරටත් කතා කරමින්, මේ මහා ජනතා නැඟිටීම් සහ විරෝධයන් මධ්‍යයේ තවදුරටත් බලයේ රැඳී සිටීම සදාචාර විරෝධී බව එම ප්‍රකාශවල සඳහන් කර ඇත. නීතිඥ සංගම්, වෛද්‍යවරුන්ගේ සංගම්, විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්, ශිෂ්‍ය ප්‍රජාව, ගොවීන්, රජයේ සේවකයන්, පරිපාලන සේවය, දහසක් පමණ වෘත්තීය, වෘත්තීමය සංවිධාන ඇතුළු මුළු රටම පාලකයන්ට ඉල්ලා අස්වන ලෙස හඬ අවදි කර ඇත. වීදි බැස ඇත. දැන් මුළු රටම අරාජිකය.

මේ අතර රජයේ පාර්ශ්වය දෙපැත්තකට බෙදී අන්තර් කාලීන ආණ්ඩු පිහිටුවීම් ගැන ගැටුම් ඇතිකර ගනිමින්, තවදුරටත් බලයේ සිටීමට උප්පරවැට්ටි යොදමින් සිටීම දකින්නට ඇත. සිදුකර ඇති විනාශයනට, ආර්ථික අතින් සිදුකර ඇති සාපරාධී ක්‍රියාවනට වගවීමක් තිබිය යුතුය. ප්‍රසිද්ධියේ වැරදි කිරීම ගැන ප්‍රසිද්ධ පිළිගැන්මක් ඇත්නම්, ඒ අනුව බලය අත්හැරිය යුතුව ඇත. තවදුරටත් මේ ලෙස බලයේ එල්ලී සිටීම තුළින් සිදුවන්නේ තවදුරටත් රට අස්ථාවර කිරීමකි. රටේ ස්ථාවර පාලනයක් නොතිබීම හේතුවෙන් ජාත්‍යන්තර පිළිගැන්ම මෙන්ම සහයෝගයද තවදුරටත් රටක් හැටියට අපට අහිමිවෙමින් පවතී.

රටේ ව්‍යවස්ථාවට ගරුකර, ජනතාවගේ පරමාධිපත්‍යයට ගරුකර, ජනතාවගේ සුබසෙත උදෙසා, ප්‍රජාතන්ත්‍රවාදී ලෙසින් රටේ ස්ථාවර පාලනයක් ඇතිකර ගැන්මට අවශ්‍ය මග පාදා දීම වහාම සිදුවිය යුතුව ඇත. කුමන්ත්‍රණ, උපායමාර්ග සහ ප්‍රජාතන්ත්‍රවාදී නොවන මංවලින් බැහැරව, නීත්‍යානුකූලව, ප්‍රජාතන්ත්‍රවාදී ලෙසින් ස්ථාවර පාලනයක් ඇතිකර ගැන්මට කටයුතු කිරීම තුළින් ජාත්‍යන්තර පිළිග ැන්ම සහ විශ්වාසය රටක් ලෙසින් අපට දිනාගත හැකිවනු ඇත. මේ සිදුකර ඇති විපතින් සැපත උදාකර ගැන්මට අප්‍රමාදව ගමන ආරම්භ කරගත යුතුව ඇත.

**ඉම්තියාස් බාකීර් මාකාර්**



# සතියේ දේශපාලනය



සියලු විරෝධතාවල හා වැඩවර්ජනවල ප්‍රමුඛ සටන් පාඨය ගෝඨා ගෝ හෝම් වුවත් ප්‍රජාතන්ත්‍රවාදී පාලන රාමුවක් ඇති රටක එය යථාර්ථයක් නොවන බව බොහෝ දෙනා දැන සිටියහ. ඡන්දයකින් බලයට පත්වූ ජනාධිපතිවරයෙක් ආපසු ධූරයෙන් ඉවත් කළ හැකි ආකාරය ද ප්‍රජාතන්ත්‍රවාදී මාර්ගයක්ම වී ය. ගෝඨා ගෝ ගමෙහි වාද, සංවාද, විවාදවලට පැමිණි ඇතැම් නීතිවේදීන් උද්ඝෝෂකයන්ට ඒ පිළිබඳ ඉතා හොඳින් පැහැදිලි කර දුන්හ. එය කළ හැක්කේ පාර්ලිමේන්තුව තුළින් ගෙන එන දෝෂාභියෝගයක් ඔස්සේ බව තරුණ නීතිවේදීන් පැහැදිලි කර දුන්හ. එසේ නම් මුලින්ම යැවිය යුත්තේ ජනාධිපතිවරයා නොව අගමැතිවරයා බව ඔවුහු හොඳාකාරවම තේරුම් ගෙන තිබිණි. රාජපක්ෂවාදී නොවන සර්ව පාක්ෂික ආණ්ඩුවක් බිහි කොට ඒ තුළින් ගෙන එන දෝෂාභියෝගයක් ඔස්සේ ජනාධිපතිවරයා ඉවත් කළ හැකි බව යථාර්ථය විය.

මේ අතරතුර රාජපක්ෂ පාලනය අවසන් කොට ආණ්ඩුවේ හා විපක්ෂයේ සිටින විවිධ පක්ෂවල මන්ත්‍රීවරු එක්වී සර්වපාක්ෂික ආණ්ඩුවක් හදන්නට යෝජනාවන් කීපයක් ද ඒ වන විටත් පාර්ලිමේන්තුව හමුවට පැමිණ තිබිණි. ඒ පිළිබඳව මහනායක හිමිවරුන් ඇතුළු ආගමික නායකයන්ගේ යෝජනා කිහිපයක් ද විය.

මෙහිදී ජනාධිපතිවරයා පෙන්වා දුන්නේ කවර හෝ කණ්ඩායමකට පාර්ලිමේන්තුවේ බහුතරය පෙන්විය හැකි නම් ඔවුන්ට ආණ්ඩුවක් සකස් කර ගැනීම සඳහා අවසර දීමට තමන්ගේ අකමැත්තක් නැති බවය.

**● ස ජ බයෙන් පිරිසකුත් සාකච්ඡාවට ඇවිල්ලා...**

අගමැති මහින්ද රාජපක්ෂ මහතා ඉවත් වී පාර්ලිමේන්තුව තුළින් තෝරාගන්නා වෙනත් අග මැතිවරයකු යටතේ සෙසු පක්ෂවල ද සහයෝගය ඇතිව සර්ව පාක්ෂික ආණ්ඩුවක් පිහිටුවීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ පක්ෂ එකොළහේ සන්ධානය ආරම්භ කළ සාකච්ඡා පසුගිය සතිය වන විට දී සාර්ථක වූ බවක් පෙන්නුම් කළේය. ඊට හේතුව සමගි ජන බලවේගයේ ද පිරිසක් එම සාකච්ඡාවලට එකඟත්වය පළ කර තිබීමයි.

විමල් වීරවංශ උදය ගම්මන්පිල ටිරාන් අලස් දයාසිරි ජයසේකර විජයදාස රාජපක්ෂ අතුරලියේ රතන හිමි ඇතුළු පිරිසක් සමග මේ සඳහා සාකච්ඡා කරන්නට පසුගිය සති අන්තයේ සමගි ජන බලවේගය ද පිරිසක් පැමිණියහ. හර්ෂ ද සිල්වා, එරාන් වික්‍රමරත්න, රාජිත සේනාරත්න ඇතුළු තවත් කිහිප දෙනෙක් එක්කාසු වූ මෙම සාකච්ඡාවේදී හෙළිදරව් වී තිබුණේ සජිත් ප්‍රේමදාස ඇතුළු කීප දෙනෙක් හැරුණු විට චම්පික, ෆොන්සේකා, රංජිත් මද්දුම බණ්ඩාර ඇතුළු බහුතරයක් මේ සඳහා ඒ වන විට කැමැත්ත පළ කර ඇති බවකි. දෙපැත්තම සාකච්ඡා කර සුදුසු අගමැතිවරයෙක් යෝජනා කර ජනාධිපතිවරයාට බහුතරය පේනවා සර්වපාක්ෂික ආණ්ඩුවක් සඳහා එකඟත්වය පළ කිරීමට මෙහිදී මූලික එකඟතා පළවී ඇත. ඒ අනුව පසුගිය සඳුදා වන විට සර්වපාක්ෂික ආණ්ඩුවක් සඳහා විපක්ෂයේ ඇති සූදානම ද විමල් උදය වාසු දයාසිරි පාර්ශ්වයේ යම් යම් ප්‍රකාශකයන් විසින් ඉදිරිපත් කරනු ලැබූහ.

ඒ අනුව විවිධ පාර්ශ්වයන් ගණනාවක් විසින් ඒ වන විටත් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂට අග්‍රාමාත්‍ය ධූරයෙන් ඉවත් වී විපක්ෂය ඉල්ලන සර්ව පාක්ෂික ආණ්ඩුව සඳහා සහාය වන ලෙස සුහද ඉල්ලීම් ගණනාවක්ම කර තිබිණි. ඒ සම්බන්ධයෙන් රාජපක්ෂ පවුලේ සහෝදරයන් හා නෑදෑයන් අතරද උණුසුම් සාකච්ඡාවක් ඇති වූ බව විශ්වාස කටයුතු ආරංචිමාර්ග ඔස්සේ කරුණු වාර්ථා විය.

**● රාජපක්ෂ එලවන්න සජිත් පාගමනක...**

සමගි ජන බලවේගයට සම්බන්ධ එක්තරා පිරිසක් සර්ව පාක්ෂික ආණ්ඩුවකට එකඟත්වය පළ කරමින් සාකච්ඡාවලට සහභාගි වූ අතර එහි නායක සජිත් ප්‍රේමදාස ඇතුළු තවත් පිරිසක් රජයට එරෙහි දැඩි විරෝධතාවයක නිරත වෙමින් සිටියහ. රාජපක්ෂ පාලනයට එරෙහිව ඔවුහු පාගමනක් සංවිධානය කළේ ඒ අතරතුරයි. මහනුවර දළදා මාළිගාවෙන් පටන් ගෙන කොළඹට පැමිණීමට සංවිධානය කර තිබූ එම පා ගමන ආරම්භ කළේ පසුගිය සඳුදා උදේ සජිත් ප්‍රේමදාසගේ ප්‍රධානත්වයෙනි. පළමුව දළදා වහන්සේගෙන් ද ඉන් පසුව මහා නායක හිමිවරුන්ගෙන් ද ආශිර්වාද ලබාගත් සජිත් ප්‍රේමදාස ඇතුළු පිරිස පෙරවරු නමයට පා ගමන ආරම්භ කළහ. හරින් ප්‍රනාන්දු මනුෂ නානායක්කාර කිංස් නෙල්සන්, නලින් බණ්ඩාර, හර්ෂ ද සිල්වා මෙම පා ගමනේ සංවිධායකයෝ වූහ.

පාගමන මහනුවර නගරය පසුකර පේරාදෙණියට එන්නට එදා දවසම ගතවිය. පළමු දිනය කෙටි දුරකින් අවසන් කිරීම ඔවුන්ගේ සැලසුම වූහ. පේරාදෙණියේ දී විශ්වවිද්‍යාල උගතුන් පිරිසක් විසින් පෙළපාලිය පිලිගනු ලැබූහ.

පේරාදෙණියේ නතර වී රාත්‍රී ආහාරය ගන්නා අතරතුර සජිත් ඔහුගේ හිතවතුන් සමඟ මේ පිළිබඳව සාකච්ඡා කරන්නට වූහ.

"නායකතුමාට මහන්සි නැද්ද පයින් ගිහින්" ගයන්ත කරුණාතිලක එදින ගමන ගැන විමසමින් ඇසුවේය.

"මට මොන මහන්සියක්ද? මට මේවා හොඳට පුරුදුයි" සජිත් කීවේය. පේරාදෙනිය නගරයේ බොහෝ පිරිසක් එක්ව සිටීම නිසා ඔවුන්ට තමන් නොපෙනුන නිසා වාහනයකට නැඟ හිටගෙන ටික දුරක් ගමන් කිරීමට සිදුවූ ආකාරයද විස්තර කළේය.

"සුද්දෝ අපේ රට යටත් කරගත්තේ නුවර අල්ලලා. අපි නුවරින් පටන්ගෙන කොළඹට ඇවිත් රාජපක්ෂලා එලවනවා" නලින් බණ්ඩාර කීවේය.

"නුවර ඉඳලා කොළඹට එන පා ගමන් හැම එකක්ම විශේෂයි. නුවර ඉඳලා කොළඹට පා ගමන් ආපු හැම වතාවකදීම ආණ්ඩු පෙරළලා තියෙනවා. ජන බල මෙහෙයුමේ අපි ආපු හැටි මතකයි. එතකොට ගාමිණී අතුකෝරළ ජීවතුන් අතර. ගාමිණී පා ගමනේ මුල ඉඳලා අගටම අපිත් එක්ක ආවා" රාජිත සේනාරත්න කීවේ අසල සිටි තලතා අතුකෝරළ පෙන්වමිනි.

"අපේ අයියා පයින්ම කොළඹට ආවා වගේ නායකතුමත් පයින්ම කොළඹට එනවානේ" තලතා අතුකෝරළ මන්ත්‍රීවරිය අසන විට සජිත් කීවේ තමන් ජනතාව සමග පයින්ම කොළඹට එන බවය.

"අපි පා ගමන ආවාට පාර්ලිමේන්තුවේ තියෙන වැඩ කොටස අතපසු කරන්නේ නෑ. මම පාර්ලිමේන්තුවේ වෙන හැම දෙයක්ම බලාගෙන ඉන්නේ" මහ ලේකම් රංජිත් මද්දුමබණ්ඩාර කීවේය.

ස ජ බය මෙම පා ගමන සංවිධානය කර තිබුණේ සතියක් පුරා කොළඹ පැමිණ ඉරිදා කොළඹ රැස්වීමක් පවත්වා අවසන් කිරීමටය.

**● ගෙදර නොයන්නයි මහින්දට බලපෑම්...**

මේ උණුසුම් අවස්ථාවේ මහින්ද රාජපක්ෂ අග්‍රාමාත්‍ය තනතුරෙන් ඉවත් වීම හැර වෙනත් විකල්පයක් නැතැයි තර්ක කළ අය බොහෝය. ඒ හා සමානවම මහින්ද රාජපක්ෂ තවදුරටත් තනතුරේ තබා ගන්නට වෑයම් කළ පිරිස ද වැඩිය. පහුගිය දිනවල අපි ආණ්ඩුව ඇතුළේ දැක ගත්තේ මේ දෙපාර්ශ්වයේ ගැටුමයි.

අගමැති මහින්ද රාජපක්ෂ ද එක්තරා මට්ටමකින් දෙගිඩියාවක සිටියේය. ජන හඬට හිස නමමින් ගෙදර යනවද නැද්ද යන දෙගිඩියාව ඔහුට විය. එහෙත් ඔහුට හිතවත් තවත් පිරිසක් තර්ක කළේ ආණ්ඩුව පටන් ගත් දා පටන් බරපතළ විවේචන එල්ල කරමින් විපක්ෂය ලෙස කටයුතු කළ ජවිපෙය, පෙරටුගාමී සංවිධානය ඇතුළු නොයකුත් රාජ්‍ය නොවන සංවිධාන විසින් මෙහෙයවන මෙම විරෝධතා ව්‍යාපාරවලින් මුළුමහත් ශ්‍රී ලාංකික පොදුජනතාවගේ හඬ නියෝජනය වන්නේ ද කියාය. පුළුල් ජනතා වරමකින් පත්වූ පොදුජන ආණ්ඩුවක් මෙවන් අන්තවාදී පිරිසකගේ අවස්ථාවාදී ක්‍රියාදාමයක් හරහා ගෙදර යා යුතු දැයි ඔවුන් තර්ක කර සිටියහ.

එම තර්ක විතර්ක නිසා මහින්ද රාජපක්ෂ අගමැතිවරයාගේ හිතත් චංචල විය.

මේ සම්බන්ධයෙන් පොහොට්ටුවේ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයන්ගේ මතය විමසා බැලීමට මහින්ද අගමැතිවරයාට අවශ්‍ය විය. ඔහු කංචන ජයරත්නට කතා කරමින් වහාම ලංකාව පුරාම සිටින පළාත් පාලන නියෝජිතයන් ගෙන්වන හමු දෙකක් සංවිධානය කරන්නට නියම කළේය.

ඒ අනුව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ සංවිධානය වෙනමත් සෙසු ප්‍රාදේශීය සභා හා මහ නගර සභාවල සභාපතිවරුන් හා මන්ත්‍රීවරු වෙනමත් අගමැතිවරයාට හමුවන්නට රැස්වීම් දෙකක් සංවිධානය කළේය.

පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ සංවිධානය අගමැතිවරයා හමු වූයේ ඉකුත් අඟහරුවාදා දහවල් ය.

මුලින්ම රටේ පවතින තත්ත්වය විස්තර කරමින් සාකච්ඡාව ආරම්භ විය. මේ දුෂ්කර අවස්ථාවේ රජය කුමක් කළ යුතු දැයි සාකච්ඡා කිරීම සඳහා මෙම හමුව පැවත්වන්නට තීරණය කළ බව අගමැතිවරයාගේ පැත්තෙන් කියවිණි.

"තත්ත්වය සාකච්ඡා කළාට කමක් නෑ අගමැතිතුමා. හැබැයි මේ ටික දෙනෙක්ගේ ඉල්ලීම්වලට කන්දීලා ඔබතුමා ඉල්ලා අස්වෙන්න නම් එපා..." පළාත් සභා මන්ත්‍රීවරු කෑ ගසන්නට වූහ. මේ අතර එක් අයකු නැඟිට මහින්ද රාජපක්ෂ මහතා මේ අවස්ථාවේ ඉල්ලා අස්විය යුතු නැතැයි කියා යෝජනාවක් ගෙනාවේ ය. මුළු පළාත් සභා මන්ත්‍රී සංසදයම ඒකත් ඡන්දයෙන් එම යෝජනාව සම්මත කළහ. එම යෝජනාව සියලු දෙනාගේම අත්සන් සහිතව ජනාධිපතිවරයා වෙත භාර දීමට ද ලිපියක් සකස් කෙරිණි.

"අගමැතිතුමනි... රට දුෂ්කර අවස්ථාවකට මුහුණ දුන්න බව ඇත්ත. විදුලිය පැය 13 කැපුවා. රටේ ගෑස් නැති වුණා. පෝළිම් හැදුනා. පෙට්‍රල් ඩීසල් භූමිතෙල් නැතිවුණා. මිනිස්සු පෝළින් හැදිලා මහ පාරට බැස්සා. මිනිස්සු පන්න පන්න ආණ්ඩුවට බැන වැදුනා. ඒ ඔක්කොම ඇත්ත.

හැබැයි දැන් මේ පෝළිම් ප්‍රශ්නය ඉවරයි. ලයිට් කැපිල්ල අඩු කරල රටේ ඉන්ධන ගෑස් සැපයුම සුලබ කරලා බඩු මිල පාලනය කළානම් මේ තත්ත්වය පාලනය වෙනවා. හැමදාම තිබුණු උද්ඝෝෂණ සුළු පිරිසක් කරාවි. රට බේරාගත් නායකයා හැටියට ඔබතුමා පස්ස ගහන්න එපා."

අගමැතිවරයා එම යෝජනාවට කන්දෙමින් අනතුරුව කතා කළේය. තමන් අගමැති ධූරයෙන් ඉල්ලා අස්වෙන්නේ නැතැයි ඔහු පළාත් සභා මන්ත්‍රීවරු හමුවේ කියා සිටියේය.

බදාදා දිනයේ ද පළාත් පාලන ආයතන ප්‍රධානීන් හා මන්ත්‍රීවරු සහභාගි වූ තවත් රැස්වීමක් පැවැත්විණි. මෙය සංවිධානය කර තිබුණේ මහර සභාපතිනි සුසීමා චාන්දනී, අත්තනගල්ල සභාපති ප්‍රියන්ත පුෂ්පකුමාර, මොරටුව නගරාධිපති සමන්ලාල්, කැස්බෑව නගරාධිපති ඇතුළු පිරිසකි. ඒ වන විට ජනාධිපතිවරයා සර්ව පාක්ෂික ආණ්ඩුවක් සඳහා එකඟත්වය පළකර ඇතැයිද ඒ සඳහා අගමැතිවරයා ඉල්ලා අස්වීමට තීරණය කර ඇතැයි ද කියා කතාවක් රට පුරා ප්‍රචාරය වී තිබිණ.

"අපි වැඩ කරන්නේ ඔබතුමා එක්ක... ඔබතුමා තමයි අපේ නායකයා. අපිව අතරමං කරන්න එපා..." සුසීමා චාන්දනී ද කීවාය.

"අපි ගුටිකෑවා දුක් වින්දා හිරේ ගියා මේ ආණ්ඩුව හදන්න. දැන් මේක කඩා බිඳ දමන්න අවස්ථාවාදීන්ට ඉඩ දෙන්න බෑ"..සමන් ලාල් කීවේය.

මේ අයුරින් බොහෝ අය කතා කරන්නට වූහ....

"නෑ නෑ ඔය ගොල්ල කලබල වෙන්න එපා. මම දන්නවා අපේ විරුද්ධවාදීන් තමයි අස්වෙන්න කියලා බල කරන්නේ... අපේ ඇතුලේ ඉන්න සමහරුත් විකල්ප හොයනවා. හැබැයි බහුතරය මට විරුද්ධ නැති බව මං දන්නවා. මම ඉල්ලා අස් වෙන්නෙත් නෑ. ජනාධිපතිතුමා මට එහෙම එකක් කියලත් නෑ... ඉදිරියටත් එහෙම එකක් එතුමා මට කියන්නේ නැති වේවි කියල මම හිතනවා. කලබල වෙන්න එපා. මම අස්වෙන්නේ නෑ...."

අගමැතිවරයා පැහැදිලිවම කියා සිටියේය...

මේ අතරතුර විජයානන්ද හේරත් එක්තරා ප්‍රවෘත්තියක් රැගෙනවිත් අගමැතිවරයාට දුන්නේය. සර්ව පාක්ෂික ආණ්ඩුවක් සෑදීමට කැමැත්ත පළ කළ ජනාධිපතිවරයා ඒ සඳහා සාකච්ඡා කිරීමට පක්ෂ නායකයන්ට සිකුරාදා හවස පැමිණෙන්නැයි කියා ආරාධනා කර තිබූ පුවත පළ වූයේ ඒ අවස්ථාවේය. විජයානන්ද ගෙන ආවේ එයයි. අගමැතිවරයා ඒ මොහොතේම එය අසල උන් ප්‍රසන්න රණතුංගට පෙන්නුවේය.

සාකච්ඡා කරන්න එතුමට අයිතිය තියෙනවා නේ... අපි බලමු ප්‍රතිඵලය මොකක්ද කියලා....

මේ අයුරින් එම රැස්වීම ද අවසන් වූයේ මහින්ද රාජපක්ෂ ඉල්ලා අස්වෙන්නේ නැති බවට දැඩි සහතිකයක් පළාත් පාලන නියෝජිතයන් වෙත ලබා දෙමිනි.

**● තෙල් ගෑස් විදුලිය ගැන පක්ෂ නායක හමුවක්...**

පසුගිය බ්‍රහස්පතින්දා උදයේ පාර්ලිමේන්තුවේ කථානායකවරයාගේ මෙහෙයවීමෙන් විශේෂ පක්ෂනායක රැස්වීමක් කැඳවණු ලැබීය. කථානායකවරයා මේ ඉන්ධන අර්බුදය ගැන කතා කරන්නට පටන් ගත් පසු දැනට විපක්ෂයේ වාඩි වී සිටින නිමල් සිරිපාල ද සිල්වා මන්ත්‍රීවරයා දැඩි විවේචනයක් එල්ල කරමින් කතා කළේය...

"අපේ රටේ විදුලි ඉල්ලුම වැඩිවෙලා තියෙනවා. වැඩිවන ඉල්ලුමට අනුව සැපයුම ලබාදෙන්න නිෂ්පාදනය වැඩි කරන්න මොනවද නිලධාරීන් කළේ. මේ නිලධාරීන් ඉන්නකං විදුලිබල මණ්ඩලය අර්බුද විසඳන්න බෑ. නියමිත සැලැස්මකට අනුව සූර්ය බලයෙන් නිවෙස්වලට විදුලිය ලබා දුන්නනම් අපට ඩීසල බලාගාරවලින් වැඩි මිලට විදුලිය ගන්න ඕනේ නෑ. පුනර්ජනනීය බලශක්තිය සපයන්න කරපු යෝජනාවලට නිලධාරීන් අනුමැතිය දෙන්නේ නෑ. මේගොල්ලෝ මේ අර්බුදයෙන් හම්බකරන් කනවා. අර්බුදය වවාගෙන කනවා. බලන්න ඒගොල්ලන්ගේ පඩි. විදුලි බල මණ්ඩලය පාඩුනම් මේ නිලධාරීන් කොහොමද මෙච්චර විශාල පඩි ගන්නේ.. මේ හැම තැනකම කුමන්ත්‍රණ තියෙනවා අපි මේවා ගැන මීට වඩා හිතන්න ඕන..." නිමල් සිරිපාලගේ චෝදනාව ඉතා දැඩි උණුසුම් එකක් විය.

ඉන් පසුව සාකච්ඡා වී තිබුණේ විදුලි බිල වැඩි කිරීම ගැනය...

"ඒකට පාරිභෝගික උපයෝගිතා කොමිටියේ අනුමැතිය ඕන..."

මන්ත්‍රීවරු එම කොමිසමේ අය හොයද්දී ඔවුන් කිසිවෙක් ඊට සහභාගි වී සිටියේ නැත. ඒ ගැන ද මන්ත්‍රීවරු අප්‍රසාදය පළ කර සිටියහ.

"පාරිභෝගික උපයෝගිතා කොමිසම මේවා කතා කරනකොට මෙතන ඉන්න ඕන" කිරිඇල්ල යෝජනා කරද්දී කථානායකවරයාද ඊට එකඟ විය.

"හරි මෙතන ඇමැතිවරු දෙන්නම ඉන්න නිසා මම අහනවා. ඔයගොල්ලන්ට දැන් තියෙනවද ඉදිරියේදී මේ ඉන්ධන අර්බුදය විසඳන්න මිල පාලනය කරන්න මොකක් හරි ප්ලෑන් එකක්. මොකක්ද විදුලිය හා ඉන්ධන ලබා දෙන්න තියන වැඩපිළිවෙළ ඔයාලගේ..." නිමල් සිරිපාල එසේ ප්‍රශ්න කළත් ඇමැතිවරු දෙදෙනාටම ඒ සම්බන්ධයෙන් කිසිදු යෝජනාවක් හෝ උත්තරයක් නොවීය.

" ඔක්කොම පෙට්‍රල් ඩීසල් ගෑස් ගැන විතරයි කතාව... හැබැයි භූමිතෙල් පරිභෝජනය කරන පුංචි මිනිස්සුන්ව අමතක කරලා..." මනෝ ගනේෂන් තවත් අවනඩුවක් කීවේය.

කංචන විජේසේකර මෙහිදී පැහැදිලි කිරීමක් කළත් එය මන්ත්‍රීවරු සතුටු කරවන අන්දමේ උත්තරයක් නොවීය.

"පුනර්ජනනීය බලශක්තිය ගැන යෝජනා ගොඩක් තියෙනවා. නිලධාරීන් ඒවා ප්‍රමාද කරනවා. කැමැත්ත දෙන්නේ නෑ.... එහෙම වෙන්නෙ ඇයි" දිනේෂ් ගුණවර්ධන අසා සිටියේය. විශේෂයෙන්ම ඔවුන් ඇසූවේ නිවෙස්වල හදන විදුලිය මහා පද්ධතියට එකතු කරගන්නේ නැත්තේ ඇයි කියාය.

**● අභ්‍යන්තර සාකච්ඡා උණුසුමින් ඇවිළෙයි..**

ජනාධිපතිවරයා සර්ව පාක්ෂික ආණ්ඩුවක් සෑදීම සඳහා අනුමැතිය පළ කරමින් විපක්ෂයේ පක්ෂ නායකයන්ට තමන් හා සාකච්ඡා කරන්නට ආරාධනා කිරීමත් සමඟ රටේ දේශපාලන කරළිය තව තවත් උණුසුම් විය. ආණ්ඩු පාර්ශ්වයේ ද සාකච්ඡා ඇති විය. ආණ්ඩුව සතුව මන්ත්‍රීවරු 113 තබාගැනීමට විවිධ මට්ටමේ සාකච්ඡා පැවැත්වෙමින් තිබිණ.

ඒ අතර ආණ්ඩුවට විරුද්ධව විපක්ෂයේ නව සන්ධානයේ සාකච්ඡාව ද උණුසුම් එකක් ව තිබුණේ හමුවීම් කතාබහ කිරීම හා විසඳුම්ද අධික වී තිබුණ නිසාය. මේ නිසා විමල්, ගම්මන්පිල, රතනහිමි, විජේදාස රාජපක්ෂ, වාසු, දයාසිරි ඇතුළු ක්‍රියාකාරීන් කාර්යබහුලව සිටියහ.

"මේ සාකච්ඡාවට ඉන්න පුළුවන් ජනාධිපතිවරයා විතරයි. වෙනත් පුද්ගලයෝ හෝ පාර්ශ්ව සහභාගි වෙනවා නම් අපට බෑ..." එම කොන්දේසිය ජනාධිපතිවරයා වෙත දන්වා යවනු ලැබීය.

**● ඩලස්ට අභියෝග කළ නූතන තිස්ස...**

මේ අතර ජනාධිපතිවරයා බ්‍රහස්පතින්දා හවස හදිසියේ ආණ්ඩු පක්ෂයේ කණ්ඩායම් රැස්වීමක් පවත්වන්නට තීරණය කළේය. තීන්දුව ඉතා ඉක්මනින් මැති ඇමැතිවරු වෙත ලබා දුන්නත් සමහරු හිටියේ දුර බැහැරය.

කණ්ඩායම් රැස්වීම ජනාධිපති මන්දිරයේ හවස හතරට පමණ කැඳවා තිබුණු අතර ඊට පෙර මන්ත්‍රීවරු පිරිසක් අගමැති මහින්ද රාජපක්ෂ හමුවන්නට ගියහ...

"ජනාධිපතිතුමා මොනව කියන්න හිතාගෙන අද මේ රැස්වීම කැඳෙව්වාද දන්නෑ..."

"අපි ඕනම දෙයකට මුහුණ දෙමු... කොහොමටත් අපි ඔක්කොම ඉන්නේ අගමැති තුමා එක්ක...." එසේ කතාබහක් එතැන ඇති විය. ප්‍රසන්න රණතුංග, රෝහිත අබේගුණවර්ධන, පවිත්‍රා වන්නිආරච්චි ඇතුළු කිහිප දෙනෙක්ම වූහ....

"ඉස්සෙල්ලා ජනාධිපතිතුමා මොනවද කියන්නේ කියල අහගෙන ඉමු... කලබල වෙන්න එපා..." අගමැති මහින්ද අවවාද කළේය.

හවස ජනාධිපති මන්දිරයේ පැවැත්වූ කණ්ඩායම් රැස්වීමේ ආරම්භය සාම්ප්‍රදායික එකක් විය. මුලින්ම කතාබහ කළේ ලබන සතියේ පාර්ලිමේන්තුවේදී න්‍යාය පත්‍ර අනුකූලව කළ යුතු වැඩ කටයුතු ගැනය. ඉන්පසුව අලි සබ්රි නැගිට අද රට මුහුණ දී ඇති ආර්ථික අර්බුදය හා රටේ මූල්‍ය ශක්තිය හා හැකියාව ගැන ලොකු විස්තරයක් කළේ ය. අද රට ලෝකය තුළ සිටින්නේ කොතැනද කියා ඔහු පැහැදිලි කළේය.

දෙවනුව ඔහු ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග කරන ලද සාකච්ඡාවේ ප්‍රගතිය ගැන කතා කළේය...

"ඉන්පසුව මහින්දානන්ද නැගිට කරුණු පැහැදිලි කරන්නට පටන් ගත්තත් ඔහුට ඒ තරම් මන්ත්‍රීවරු ඇහුම්කන් දුන්නේ නැත. අරුන්දික ප්‍රනාන්දු නැගිට කතා කරන්නට පටන් ගත්තේ එවිටය.

"අපේ ජනාධිපතිතුමාත් අගමැතිතුමාත් මේ රට යුද්ධයෙන් බේරගෙන මේ රටට කළ සේවය අමිලයි. අමරණීයයි. මුළු රටම ඒක දන්නවා. ඒකට මුළු රටම ණය ගැති බව ඇත්ත. හැබැයි දැන් මේ රටේ වෙනත් ප්‍රශ්නයක් තියෙනවා. හැබෑ අරගලයක් තියෙනවා. දැන් මේ අරගලයට උත්තර බඳින්න යුද්ධයේ කීර්තිය හිලව් කරලා බෑ. අපට අඩියක් දෙකක් පස්සට ගන්න වෙනවා. ජනතාව මුළු ආණ්ඩුවටම ගෙදර යන්න කියද්දී අපිට මුරණ්ඩු වෙන්න බෑ. කරුණාකරලා අපේ නායකතුමන්ලා දෙපළ පවුලෙ අයත් එක්කත් කතාබහ කරලා අපි කණ්ඩායම්වල අයත් එක්කත් කතා කරලා මේ වෙලාවේ සුදුසුම පියවර ගන්න.

අපි ගන්න තීන්දුවත් බෙදිලා අරගෙන වැඩක් නෑ. අපි එකතුවෙලා තීන්දුවක් ගමු. ජනාධිපතිතුමා අගමැතිතුමා පැත්තට ප්‍රශ්නය යොමු කරන්නෙ නැතුව අපි ඔක්කොම අගමැති තුමා ඇමැතිවරු ඉල්ලා අස්වෙලා සර්ව පාක්ෂික ආණ්ඩුවකට ඉඩදෙන එක හැරුණාම වෙන විකල්පයක් නෑ..." අරුන්දික කීවේය.

"අරුන්දික ඇමැතිතුමා අපිත් එක්ක එකක් කියලා දැන් මෙතන තව එකක් කියනවා. රාජපක්ෂ පවුල පවුල කිය කිය හැමදේටම චෝදනා කරනවා. වරදක් වුණොත් ඒකට පලි පවුල. හරි දෙයක් කළොත් ආණ්ඩුව. මොකක්ද මේ අපේ පවුලත් එක්ක තියෙන ප්‍රශ්නය.." නාමල් කිව්වේය.

"යෝජනාව ඉතා හොඳයි. හැබැයි මේකත් මතක තියාගන්න. අපි ඇඳුම් ගලවලා විසි කරන්න ඕනේ නැහැ සුදුසු ඇඳුමක් මහා ගන්න තුරු... එහෙම නැත්තං අපිට නිරුවතින් තමයි ඇඳුම් හොයන්න වෙන්නේ... ඒක නිසා ඔබතුමා ඉස්සරවෙලා ඔබතුමාට ඔය යෝජනාව ඉදිරිපත් කරන්න කියපු අයත් එක්ක කතා වෙලා ඔය කියන ආණ්ඩුවේ අගමැති කවුද, ඇමැතිවරු කවුද කියලා අපිට සැලැස්මක් ඉදිරිපත් කරලා පෙන්නන්න..." සනත් නිශාන්ත අභියෝගාත්මකව කීවේය.

"අගමැතිතුමාට අයින් වෙන්න කියලා එක එක්කෙනා කියන්න ඕනේ නැහැ. ඒක එතුමට තීරණය කරන්න දෙන්න..." පවිත්‍රා කීවාය. ඉන්පසු ජනාධිපති කතා කරන්න පටන් ගත්තේය.

"මම මේ හැමෝටම අහගන්නයි කියන්නේ. මම කොයි වෙලාවෙවත් අගමැතිතුමාට අයින් වෙන්න කියලාත් නැහැ. අයින් වෙන්න කියන්නෙත් නැහැ. හැබැයි මේ රටේ තියෙන ඇත්ත ප්‍රශ්නය කවුරුත් තේරුම් ගන්න ඕන. අපි ආණ්ඩුවක් හැදුවා වැඩ කළා. අපිට ප්‍රශ්න ආවා. දැන් පිරිසක් ආණ්ඩුවෙන් ස්වාධීන වෙලා ඉන්නවා. දැන් මේ ආණ්ඩුව බෙදිලා. ඉස්සරහට බෙදිලා ඉඳගෙන අපිට තියෙන ප්‍රශ්න ජයගන්න බෑ. හැබැයි අපි බෙදෙන් නැතුව එකතු වෙලා ගමන පටන් ගත්තොත් අපිට මේක යළිත් ගොඩනගා ගන්න පුළුවන්."

"අපි මන්ත්‍රීවරු 150 ගණනක් හිටපු බහුතර ආණ්ඩුවක්. දැන් අපෙන් පිරිසක් ගිහින්. අපි යළි ගොඩ නැගෙන්න අවශ්‍යයි" කෙහෙලිය කීවේය. මේ වෙලාවේ තිස්ස කුට්ටිආරච්චි නැගිට කතා කරන්නට විය.

"ඇයි කෙළින් කතා කරන්නැතුව වටෙන් කතා කරන්නේ. දැන් ඔය සමහරු අගමැති තුමා අයින් කරන්න ඕනේ කියලානේ කියන්නේ. ඒ සාකච්ඡාවල ඉන්න අය අපි පැහැදිලිව දන්නවා. ඩලස් මැතිතුමාව අගමැති කරන්න කට්ටියක් දඟලනව. කුමන්ත්‍රණ කරනවා. ඒ වගේම ඩලස් ඇමැතිතුමත් ඒකට කැමතියි. ඕකනේ ඇත්ත. ඉතිං අපි ඕක කෙළින් කතා කරමුකෝ." තිස්ස කුට්ටි පත්තු කළේ බෝම්බයකි.

"බොහොම කනගාටු වෙනවා සහෝදරයා මට ඒ කරපු චෝදනාව ගැන. මම ඔය කිසිම කුමන්ත්‍රණයකට නෑ. මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාත් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාත් මං ගැන හොඳට දන්නවා. එතුමන්ලා දන්න මම මොනවද කළේ කියලා මේ පාර්ශ්වය වෙනුවෙන්. කරුණු නොදැන මට ඔය වගේ චෝදනා නගන්න එපා. අනිත් එක මම කියන්න කැමැතියි... සමාජ මාධ්‍යවලින් සමහරු සංවිධානාත්මකව මට මඩ ගහනවා කොටා කොටා කියලා. මම කොට බව ඇත්ත. හැබැයි මගේ ආත්ම විශ්වාසය එවරස්ට් කන්දටත් වඩා උස බව අමතක කරන්න එපා." ඩලස් තරමක් සංවේදීව මේ ටික පැහැදිලිව කීවේය.

"හරි හරි... ඉතින් ඔබතුමා කියන්නකො. මොකක්ද යෝජනාව. මොකක්ද දැන් අපිට කරන්න කියන්නේ...." තිස්ස කුට්ටි නැවතත් කෑගැසුවේය.

ඩලස් ඊට උත්තර දෙන්නට නැගී සිටින්නට පළමුව ඉදිරිපෙළ සිටි ජ්‍යෙෂ්ඨ නායකයෝ කිහිපදෙනෙක්ම තිස්ස කුට්ටි දෙසට හැරී මොන මොනවාදෝ කියා ඔහුට බැණ වැදුනහ.

"පිටුපසින් සිටි කිහිප දෙනෙක් ද කෑගසන්නට වූහ.... මේ වෙලාවේ සියල්ලෝම සන්සුන් කරමින් අගමැතිවරයා නැගී සිටිමින් මෙසේ කීවේය.

"කවුරුත් මේක මතක තියාගන්න. මේ ඩලස් අලහප්පෙරුම කියන්නේ මම බොහෝ කාලයක් තිස්සේ දන්න මගේ හොඳ මිත්‍රයා. මෙතුමාව දේශපාලනයට ගෙනාවේ මම. මෙතුමා ඉතා දක්ෂ ව කැපවීමෙන් අපේ පිල වෙනුවෙන් වැඩකළා. රට වෙනුවෙන් කැප වුණා. ඒ බව කවුරුත් දන්නවා. එතුමා කොහොම කෙනෙක් ද කියලා මම දන්නවා. ඒක නිසා ඔය වගේ විවේචන එතුමා ගැන මම ඉදිරියේ කිරීම මටත් කරන අගෞරවයක්..."

"ඩලස් ඇමැතිතුමා අගමැතිතුමාගේ යහළුවා කියලා කිව්වනේ... අන්න ඒ වගේ තමයි. මම අගමැතිතුමාගේ පුංචි කාලෙ ඉඳලම හිටපු සහෝදරයා. ඒක නිසා අවිශ්වාස කරන්න එපා..." ජනාධිපති ගෝඨාභය ද සිනහවෙමින් කීවේය.

"කවුරුත් මෙතනින් අයින් වෙන්න ඕන නෑ. උද්ඝෝෂකයෝ ගේන සටන් පාඨ වලට අපි යටත් වෙන්න ඕනේ නෑ. අනිත් එක ජවිපෙවත් සජබයවත් ආණ්ඩුව ගන්න එන්නෙත් නෑ. එයාලට ඕන මේ රට අස්ථාවර කරන්න විතරයි." ඩයනා ගමගේ කීවාය.

"මන්ත්‍රීතුමිය හරියට හරි. අපි මේක ගැන තවදුරටත් කතා කළ යුතු නෑ. අපි කවුරුවත් අයින් විය යුත්තේත් නෑ. අපි දැන් මේක මෙතනින් අවසන් කරමු." කියමින් අගමැති මහින්ද රාජපක්ෂ කතාබහ අවසන් කර සභාව විසුරුවා හැරියේය.

# නරක පවුලටලු! හොඳ ආණ්ඩුවට

## රාජපක්ෂ පවුල ගැන නාමල්ගේ විවරණය



**● බුලිත ප්‍රදීප් කුමාර**

# කෝට්ටේ පාර්ලිමේන්තුවට 40යි



ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පිහිටි වර්තමාන ගොඩනැගිල්ල වෙත ස්ථාපිත කොට පසුගිය 29 දිනට වසර 40 ක් සපිරිණි.


පාර්ලිමේන්තුවේ ගාලු මුවදොර පිහිටි පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම නිසා 70 දශකය අගභාගය වන විට එය වෙනත් ගොඩනැගිල්ලකට ගෙනයෑමේ අවශ්‍යතාව මතු විය. මෙහිදී ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රදේශයේ නව පාර්ලිමේන්තු ගොඩනැගිල්ලක් ඉදිකිරීමට යෝජනා විය. ඒ අනුව 1979 වර්ෂයේදී ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ ප්‍රදේශයේ දියවන්නා ඔයේ පිහිටි අක්කර 16 කුඩා දූපතක අභිනව පාර්ලිමේන්තුව ඉදිකිරීම ආරම්භ විය.



එවකට ජනාධිපතිවරයා වූ ජේ. ආර්. ජයවර්ධන මහතාගේ මගපෙන්වීම යටතේ එවකට අග්‍රාමාත්‍යවරයා වූ ආර්. ප්‍රේමදාස මහතා විසින් මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු මෙහෙයවන ලදි. මේ අනුව ජෙෆ්රි බාවා මහතා ප්‍රධාන ගෘහනිර්මාණ ශිල්පියා ලෙස තෝරාගන්නා ලද අතර ජපන් සමාගමකට මෙම නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු පවරා තිබුණි. මෙහිදී ශ්‍රී ලාංකේය සම්ප්‍රදායන් මුල්කරගෙන නිර්මාණය කොට ඇති පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ සියලු ගෘහනිර්මාණ කටයුතු සඳහා දේශීයත්වයට ප්‍රමුඛතාව ලබා දී තිබේ.

මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 1982 වර්ෂයේදී අවසන් වූ අතර 1982 අප්‍රේල් 29 වැනි දින ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ පිහිටි අභිනව පාර්ලිමේන්තුව උත්සවාකාරයෙන් විවෘත කරන ලදි. මේ අනුව එතෙක් ගාලු මුවදොර පිහිටි මෙරට ව්‍යවස්ථාදායකය ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ඉදිකළ අභිනව පාර්ලිමේන්තු සංකීර්ණය වෙත ගෙන ඒම සිදු විය.

විශේෂයෙන් නව පාර්ලිමේන්තු ගොඩනැගිල්ල විවෘත කිරීමත් සමග ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ නගරය ශ්‍රී ලංකාවේ ප්‍රධාන පරිපාලන නගරය බවට පත්වීමද සිදු විය. නා ගස් පෙළකින් සමන්විත පිවිසුම් මාර්ගය පසුකරමින් වර්තමාන පාර්ලිමේන්තු පරිශ්‍රයට පිවිසිය යුතුය. මෙහිදී පාර්ලිමේන්තුව මහජනයා වෙත සමීප කිරීමේ අරමුණෙන් පාර්ලිමේන්තු පරිශ්‍රයේ පැරණි ගෘහනිර්මාණ ශිල්පක්‍රම අනුව ඉදිකර ඇති "අම්බලම" යන සංකල්පය මුල්කොටගත් ස්ථාන කිහිපයක් දැකිය හැකිය. මෙම ස්ථාන දේශපාලඥයන් සහ ඔවුන් නියෝජනය කරන ප්‍රදේශයන්හි ජනතාව එක් රැස්වී සුහදව සාකච්ඡා කිරීමේ අරමුණින් ඉදිකරන ලද බව පැවසේ. එසේම පාර්ලිමේන්තු පිවිසුමේදී ජලය පිරි පොකුණ දැකගත හැකිය. පාර්ලිමේන්තුවේ ප්‍රධාන ද්වාරය අසල ආචාර්ය මංජු ශ්‍රී චිත්‍ර ශිල්පියාගේ විශිෂ්ට බිතු සිතුවම් කිහිපයක් දැකිය හැකිය. සභා ගර්භයෙහි ප්‍රධාන ද්වාරය තඹ වලින් නිමවා රිදී තහඩුවකින් ආවරණය කර ඇති අතර එහි සිංහල, දමිළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පූර්විකාව කැටයම් කොට තිබේ.



පාර්ලිමේන්තුවේ දළ ආකෘතිය චිත්‍ර සටහනක් ලෙස

පාර්ලිමේන්තුවේ සභා ගර්භය හැඩයෙන් ඍජුකෝණාශ්‍රාකාර වන අතර එය මහල් දෙකක් පුරා විසිරී පවතී. එසේම රජවරුන්ට, පන්සල්වලට සහ කෝරලවලට අයත් කොඩි 18ක් සභා ගර්භයේ ඉහළ කොටසේ දැකිය හැකිය. තවද සභා ගර්භයේ මධ්‍යයේ එල්ලා ඇති රිදී ආලේපිත පොකුරු පහන සභා ගර්භයට ගාම්භීර බවක් එක් කරයි.



පිපිරීමෙන් පසු සයින්දමරුදු නිවසේ දර්ශනයක්

# සාරා ජේස්මින්ට මොකද වුණේ...

## සයින්දමරුදු හැරුවාම පාස්කු ප්‍රහාරයේ ඇත්ත හෙළිවෙයිද?

**වසර තුනක් ඉක්ම ගොස් තිබුණද අදටත් පාස්කු වින්දිතයන්ට සාධාරණය ඉටු නොවුණේ යැයි යන්න මේ මොහොතේත් බොහෝ පාර්ශ්ව වෙතින් එල්ල වන චෝදනාවකි. අද වන විට එකී චෝදනා ජාත්‍යන්තරය දක්වාම විහිදී ගොස් අවසන්ව ඇත. එහිදී නිතර නම කියැවෙන එක් ප්‍රකට චරිතයක් බවට පත්ව සිටින්නී පුලස්තිනී මහේන්ද්‍රන් නොහොත් සාරා ජෙස්මින්ය.**

පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් සමාජමය තත්ත්වය එසේ වී තිබියදී එම ප්‍රහාරයෙන් පසුව අම්පාර සයින්දමරුදු ප්‍රදේශයේ නිවසක් තුළදී බිහිසුණු පුපුරවා ගැනීමක් සිදුකරමින් මියගිය පිරිසේ දේහ කොටස් යළි ගොඩගැනීමට අධිකරණ අවසරය මත පොලිසිය ඉකුත් 27 වැනිදා පියවර ගනු ලැබීය.

පාස්කු ප්‍රහාරයේ වින්දිතයන් වෙනුවෙන් සාධාරණය ඉල්ලා සිටින බොහෝ පාර්ශ්වවල ප්‍රබල මාතෘකාවක් බවට පුලස්තිනී මහේන්ද්‍රන් නොහොත් සාරා ජෙස්මින් අදවන විට පත්ව සිටින්නේද මෙකී සයින්දමරුදු පිපිරීම හේතුවෙනි.

එම පිපිරීමෙන් පසු එම නිවසේ සිටි ඇය පොලිස් නිලධාරියකුගේ සහායෙන් විදේශයකට පැන ගියේ යැයි ලෙසින් කතාවක් සමාජගතවී තිබීම එයට හේතුව වී ඇත.

සැබවින්ම පුලස්තිනී එසේ පැන ගියේද? පාස්කු වින්දියන්ට සාධාරණයක් ඉටු නොවුණේද? එම ප්‍රහාරයෙන් මියගිය අහිංසකයන්ගේ ආත්මයන්ට සාධාරණය ඉටු කිරීම කවුරුන් විසින් හෝ මඟහැර යමින් තිබේද? එසේ සිදුවෙමින් ඇතැයි දසතින් චෝදනා රැසක් එල්ලවෙමින් තිබියදී අම්පාර පොදු සුසාන භූමියේ වළදමා තිබූ සයින්දමරුදු පිපිරීමෙන් මියගිය වුන්ගේ සිරුරු යළි ගොඩ ගැනීමට පොලිසිය කටයුතු කරනු ලැබුවේ කුමක් නිසාද?

සියලු අර්බුද අතරේ පාස්කු ප්‍රහාරය පිළිබඳ කතා කිරීමේදී මේවා අද සමාජය ඉදිරියේ ඇති ප්‍රබල ගැටලු බවට පත්ව ඇත. පාස්කු ප්‍රහාරය එල්ල වූයේ ඉකුත් 2019 වසරේ අප්‍රේල් මස 21 වැනිදාය. එම සිද්ධියත් සමඟ ඒ පිළිබඳව පුළුල් ලෙස විමර්ශන සිදු වෙමින් තිබෙන අතරේ හරියට ඉන් දින පහකට පසු අප්‍රේල් 26 වැනිදා සයින්දමරුදු නිවසක් තුළ සැඟවී සිටි සහරාන් හෂීම්ගේ සොහොයුරා වූ මොහොමඩ් රිල්වාන් ඇතුළු පිරිසක් මෙම පුපුරවා ගැනීම සිදු කරනු ලැබීය.

අදාළ නිවස පිළිබඳව ලැබුණු තොරතුරකට අනුව පොලිසිය සහ යුද හමුදාව එම නිවස වැටලීමට කටයුතු කිරීමේදී මොහොමඩ් රිල්වාන් එම පුපුරවා ගැනීම සිදු කරනු ලැබිණි. එහිදී ප්‍රබල පිපිරීම් තුනක් සිදුවන අයුරු එම නිවස වටලා සිටි ආරක්ෂක අංශවලට නිරීක්ෂණය විය. පසුව ආරක්ෂක අංශ සහ පොලිසිය එම නිවස සහ පිපිරීම සම්බන්ධයෙන් සිදු කළ විමර්ශනවලදී අනාවරණය වූ අතිශය වැදගත් කරුණු කාරණා රාශියක්ම තිබිණි. එම නිවස කාමර දෙකකින් සහ කුඩා සාලයක් මෙන්ම මුළුතැන් ගෙයක් හා ඊට යාබදව පිහිටි වැසිකිළියකින් සමන්විත වූ කුඩා ප්‍රමාණයේ එකක් විය. ඉතා බියකරු ලෙස එහි සිදුවූ පිපිරීම්වලින් පසු ඊට පසුදා අලුයම ආරක්ෂක අංශ සහ පොලිසිය එහි ගියේය.

එම නිවසට ළඟා වෙත්ම එහි ගිය නිලධාරීන්ට මුලින්ම අසන්නට ලැබුණේ නිවස තුළින් නැගුණු කෙඳිරිලි හඬකි. ප්‍රබල පිපිරීමක් සිදු වුවද තවදුරටත් නිවස තුළ කිසිවකු හෝ ජීවතුන් අතර සිටින බව වටහා ගත් නිලධාරීහු වහා එහි ඇතුළු වී පරීක්ෂා කර බැලූහ. එහිදී එවුන්ට දැක ගන්නට ලැබුණේ බරපතළ ලෙස තුවාල ලබා සිටි සිඟිති දැරියක සහ කාන්තාවකි. වහාම ක්‍රියාත්මක වූ පොලිස් හා ආරක්ෂක අංශ නිලධාරීහු ඔවුන් දෙදෙනා රෝහල්ගත කිරීමට කටයුතු කරන ලැබූහ. එදා එසේ සයින්දමරුදු නිවස තුළ බරපතළ තුවාල ලබා සිටියදී හමුවූයේ පාස්කු ප්‍රහාරයේ ප්‍රධාන ඝාතකයා වූ සහරාන් හෂීම්ගේ බිරිඳ, හාදියා සහ ඇගේ දියණිය විය. එය ඒ දිනවල මුළු රටම දැන සිටි සිදුවීමකි. ඔවුන් රෝහල්ගත කිරීමෙන් අනතුරුව සිදුකළ වැඩිදුර විමර්ශනවලදී සහරාන්ගේ සොහොයුරා වූ මොහොමඩ් රිල්වාන් විසින් නිවසේ වූ ගෑස් සිලින්ඩරය හා සම්පූර්ණයෙන්ම ඉන්ධන පුරවන ලද යතුරු පැදියක් නිවසේ සාලය තුළට ගෙන ඒමෙන් පසු පුපුරවා ගැනීම සිදුකර ඇති බව අනාවරණය කර ගැනීමට විමර්ශකයෝ එදා සමත්වූහ. සිදුවූ පිපිරීම්වලින් එම නිවස එකම සුන්බුන් ගොඩක් බවට පත්ව තිබුණු අතර මිනිස් සිරුරු කොටස් රාශියක් එම සුන්බුන් අතර විසිරී ගොස් තිබිණි. සහරාන්ගේ බිරිඳ හාදියාගෙන් ලද තොරතුරකට අනුව පිපිරීම සිදුවන මොහොතේ නිවසේ කුඩා දරුවන්ද ඇතුළුව පුද්ගලයන් දහනව දෙනකු සිටි බව ඒ වන විට විමර්ශන නිලධාරීන් අනාවරණය කරගෙන තිබිණි.

එම දහනව දෙනා අතරින් සහරාන්ගේ බිරිඳ සහ දියණිය ජීවත්ව සිටින බැවින් පිපිරීමෙන් මියගොස් ඇත්තේ තවත් දහහත් දෙනකු බව ඒ වන විට විමර්ශකයන්ගේ නිගමනය විය. අද අතුරුදන්ව ඇතැයි කියන සාරා ජෙස්මින්ද පිපිරීම සිදුවන විට සිටියේ එම නිවසේමය. ඒ අනුව ක්‍රියාත්මක වූ ඔවුහු හතර අතේ විසිරී ගොස් තිබුණු මිනිස් සිරුරු කොටස් වෙන් වෙන් වශයෙන් ගොඩවල් දහහතකට එක්කර පසුව කල්මුණේ රෝහල වෙත රැගෙන ගියහ. එසේ ගෙන ගිය සිරුරු කොටස් ගොඩවල් දහහත අතරින් සාම්පල් දහහතක් ගෙන කල්මුණේ රෝහලේ ශීතකරණයක සුරක්ෂිතව තබන ලැබීමෙන් පසු ඉතිරි සිරුරු කොටස් අම්පාර පොදු සුසාන භූමියේ වළ දැමීම සිදු කෙරිණි. ඒ වන විට මියගිය අය අතරින් පුද්ගලයන් හය දෙනකු නිශ්චිතව හඳුනා ගැනීමට විමර්ශන නිලධාරීන් සමත්ව සිටියද අනෙක් කිසිදු පුද්ගලයකු හඳුනා ගැනීමට නොහැකිව තිබිණි. සිරුරු කොටස් අතරින් කොටස් දහහතක් ගෙන කල්මුණේ රෝහලේ ශීතකරණයක තැන්පත් කරනු ලැබුවේද එසේ හඳුනාගත නොහැකි වූ මළ සිරුරු කාගේදැයි දැන ගැනීම පිණිස ඩීඑන්ඒ පරීක්ෂණ සඳහා යොමු කරනු පිණිසය.

මේ අනුව මූලික විමර්ශන අවසානයේ දින කිහිපයකට පසු විමර්ශන කණ්ඩායම් යළි කල්මුණේ රෝහලට පැමිණියේ නියමිත පිරිදි ඩීඑන්ඒ පරීක්ෂණ සඳහා යොමු කිරීම පිණිස රෝහලේ ශීතකරණයක තැන්පත් කර තිබූ සිරුරු කොටස් රැගෙන යෑමටය.

එහෙත් ඒ වන විට සිදුව තිබුණේ අභාග්‍යයකි. අදාළ සිරුරු කොටස් දාහත අතරින් කොටස් තුනක් පරීක්ෂණවලට යොමු කළ නොහැකි තරමට නරක් වී ඇති බව විමර්ශකයන්ට නිරීක්ෂණය විය. එහිදී වහා ක්‍රියාත්මක වූ ඔවුහු කරනු ලැබුවේ අම්පාර පොදු සුසාන භූමියට ගොස් සිරුරු කොටස් වළ දැමූ ස්ථානවලින් තවත් කොටස් තුනක් ලබා ගැනීම වූහ.

පසුව එසේ ලබා ගත් ඒවාද සමඟ මළ සිරුරුවලින් ලබාගත් සාම්පල් කොටස් දහහත ඩීඑන්ඒ පරීක්ෂණයකට යොමු කිරීම සිදු කෙරිණි. අප මේ කතා කරන්නේ මෙතෙක් සමාජය දැන නොසිටි එදා රටම කම්පනයට පත් කරමින් එල්ල වූ පාස්කු ඉරිදා ත්‍රස්තවාදී ප්‍රහාරයේදී ඒ අතිශය බරපතළ සිදුවීම පිළිබඳව අපේ විමර්ශකයෝ විමර්ශන සිදු කළ අන්දම පිළිබඳවය. අහිංසක මිනිස් ජීවිත දෙසීය පනහකටත් අධික සංඛ්‍යාවක් අකාලයේ රටට අහිමි කෙරෙමින් තවත් පන්සියයක් පමණ බරපතළ තුවාල ලැබූ එම සිද්ධියේදී මෙසේ විමර්ශන ආරම්භ වීම කොතෙක් දුරට නිවැරදිද යන්න තීරණය කිරීමේ අයිතිය මෙය කියවන ඔබ සතුය.

මේ අන්දමට සාම්පල ලෙස ලබාගත් සිරුරු කොටස් ඩීඑන්ඒ පරීක්ෂණවලට යොමු කිරීමෙන් පසු සයින්දමරුදු නිවසේ සිදුවූ පිපිරීමෙන් මියගිය පුද්ගලයන් දහසය දෙනකු හඳුනා ගැනීමට විමර්ශන කණ්ඩායම් එදා සමත් වුවද එක් පුද්ගලයකුගේ ඩීඑන්ඒ සාම්ල කිසිදු සිරුරු කොටසක් හා නොගැලපුණි.

එසේ නොගැළපුණේ පුලස්තිනී මහේන්ද්‍රන් නොහොත් සාරා ජෙස්මින්ගේ මවගෙන් ලබාගෙන තිබූ ඇයට අදාළ ඩීඑන්ඒ සාම්පලය. මෙම ඩීඑන්ඒ පරීක්ෂණය සිදු කෙරුණේ පාස්කු ප්‍රහාරය එල්ල වී මසක් ගතවෙමින් තිබියදී ඉකුත් 2019 වසරේ මැයි මාසයේදීය. එහෙත් පාස්කු ප්‍රහාරය සිදුවී මාසයක් ගත වෙද්දී එසේ සයින්දමරුදු පුපුරවා ගැනීම පිළිබඳව බරපතළ ගැටලුවක් විමර්ශන කණ්ඩායම් හමුවේ මතුවුවද එයට විසඳුම සොයා ගන්නට එදා කිසිවකුත් සිටියේ නැත. 2019 වසරේ පැවති ජනාධිපතිවරණයෙනුත් පසු යළිත් ඒ පිළිබඳ අවධානය යොමු කෙරෙන්නේ ඉකුත් 2020 වසරේ අගෝස්තු මාසයේදීය. එහිදී විමර්ශන කණ්ඩායම්වල තීරණය වූයේ යළිත් ඩීඑන්ඒ පරීක්ෂණයක් සිදු කිරීම විය. ඒ අනුව සයින්දමරුදු පිපිරීමේ මළසිරුරු සම්බන්ධයෙන් දෙවැනි ඩීඑන්ඒ පරීක්ෂණයද සිදු කෙරිණි. එහිදීත් පරීක්ෂණයට ලක් කෙරෙන්නේ මුල් අවස්ථාවේ මළ සිරුරු අතරින් ලබා ගත් සාම්පල කොටස් දහහතමය. එකී දෙවැනි පරීක්ෂණයේදීද මුලදී හඳුනාගත් දහසය දෙනා හැරෙන්නට පුලස්ති මහේන්ද්‍රන් නොහොත් සාරා ජෙස්මින්ගේ ඩීඑන්ඒ සාම්පල එම සිරුරු කොටස් අතරින් හඳුනා ගන්නට නොහැකි වන්නේය.

එසේ වූයේ ඇයි? මේ ප්‍රශ්නයට පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ සිදු කෙරුණු විමර්ශනයේදී පැහැදිලි පිළිතුර දී ඇත්තේ ප්‍රහාරයේ ප්‍රධාන ඝාතකයා වූ සහරාන් හෂීම්ගේ බිරිඳ හාදියා ය. ඇය සඳහන් කර ඇත්තේ කුමක්ද? සයින්දමරුදු පුපුරවා ගැනීමෙන් පසු ජීවිතය බේරුණු ඇය පසුව විමර්ශන කණ්ඩායම් ඉදිරියේ සඳහන් කර තිබුණේ මෙවැන්නකි.

'මම එදා වැසිකිළියට ගිහින් නැවත ගේ ඇතුළට එනකොට සාරා ජෙස්මින් එක්ක අනෙක් ඔක්කොම දෙනා ගෙයි මැද සාලේ වාඩි වෙලා හිටියේ. ඒ වෙලාවේ සාරා ජෙස්මින් මරාගෙන මැරෙන ජැකට් එකකුත් දාගෙන හිටියා. එයා මාව දැක්ක ගමන් එන්න අපි ස්වර්ගයට යන්න හදන්නේ ඔයත් එන්න කියල මට කතා කළා.

ඒ වෙලාවේ මගේ හිතට ලොකු බයක් දැනුණා. ඒ නිසා මම දරුවවත් අරගෙන ඉක්මනට ගෙදර කාමරයකට ගියා. තත්පර දෙකතුනක් ගත වෙන්න ඇති. මම කාමරයට යනවත් එක්කම මහා හඬක් සමඟ අපි හිටපු ගේ පිපිරුවා'



මේ සඳහන් කෙරුණේ ඇය සිය ප්‍රකාශයේදී සයින්දමරුදු නිවසේ අවසන් මොහොතේ පැවති වාතාවරණය පිළිබඳ කර ඇති සඳහනේ සරල සාරාංශයකි. මෙම කතාව ඇය විසින් මුලින්ම අම්පාර රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී පොලිසියටත්, අවස්ථා තුනකදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවටත් සහ පාස්කු ප්‍රහාරය පිළිබඳ විමර්ශනයට පත් කළ ජනාධිපති කොමිසමටත් ආදී වශයෙන් වරින් වර අවස්ථා පහකදී කී කතාවක් වන්නීය.

එසේ නම් ඇය කියන ආකාරයට එදා සයින්දමරුදු නිවසේදී සහරාන්ගේ සොහොයුරු මොහොමඩ් රිල්වාන් සිදු කළ පිපිරීමේදී පුලස්ති මහෙන්ද්‍රන් නොහොත් සාරා ජෙස්මින්ට අත්වූ ඉරණම කුමක් විය හැකිද? එය තීරණය කිරීමද මේ සටහන කියවන ඔබට භාරය.

සයින්දමරුදු පුපුරවා ගැනීමේ කතාව මෙසේ වෙද්දී එම පිපිරීම සිදුවූ අවසන් මොහොතේ මරාගෙන මැරෙන බෝම්බ ජැකට්ටුවක් පැළඳඑහි සිටි පුලස්තිනී මහේන්ද්‍රන් නොහොත් සාරා ජෙස්මින් චරිතය යළි සමාජ කතිකාවක් බවට පත්වෙන්නේ එම මළසිරුරු සම්බන්ධයෙන් සිදු කෙරුණු දෙවැනි ඩීඑන්ඒ පරීක්ෂණයත් සමඟය.

ඒ වන විට පාස්කු ඉරිදා ප්‍රහාරය පිළිබඳ ජනාධිපති කොමිසමද ක්‍රියත්මකව තිබිණි. ප්‍රධාන පොලිස් පරීක්ෂක අර්ජුන මාහින්කන්ද යනු එම ජනාධිපති විමර්ශන කොමිසමේ විමර්ශන ඒකකයේ ස්ථානාධිපතිවරයාය. පසුව ඔහු සහකාර පොලිස් අධිකාරීවරයකු ලෙස උසස්වීමක්ද ලැබීය. පාස්කු කොමිසම ක්‍රියාත්මක වෙද්දී දිනක් විමර්ශන ප්‍රධානියා ලෙස ඒ වෙත යන ඔහු තමන්ගේ විශ්වාසවන්ත ඔත්තුකරුවකු පාස්කු ප්‍රහාරය පිළිබඳ වැදගත් තොරතුරක් අනාවරණය කරන බව සඳහන් කරන්නේය. ඒ අනුව සිය විශ්වාසවන්ත ඔත්තුකරුවා කොමිසම ඉදිරියට ගෙන ඒමට සීඅයි මාහින්කන්දට අවස්ථාව ලැබෙන අතර එසේ කොමිසමට පැමිණෙන මාහින්කන්දගේ ඔත්තුකරුවා සඳහන් කරන්නේ කුමක්ද?

අපි ඔහුව එම්ජ් ලෙස හඳුන්වමු. එසේ කරනුයේ අනන්‍යතාව සුරක්ෂිත වනු පිණිසය. කොමිසම ඉදිරියට පැමිණෙන ඔහු කියන්නේ සයින්දමරුදු පිපිරීමෙන් ටික දිනකට පසු එවකට අම්පාර පොලිසියේ සේවය කළ ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයකු වූ අබුබක්කර් නමැති පොලිස් නිලධාරියා කැබ් රථයකින් කලවංචිකුඩි ප්‍රදේශයට පැමිණ පුලස්තිනී මහේන්ද්‍රන් නොහොත් සාරා ජෙස්මින්ව එහි නංවාගෙන පලා ගිය බවකි. සාරා ජෙස්මින් පාස්කු ප්‍රහාරය පිළිබඳ කතාවේ ප්‍රධාන චරිතයක් වන්නේ එතැන් සිටය. අලුයම තුනට පමණ අබුබක්කර් එසේ පැමිණ සාරා ජෙස්මින්ව රැගෙන ගිය බවද කොමිසම හමුවේ කියන මාහින්කන්දගේ ඔත්තුකරුවා වූ එම්ජ් එම සිදුවීම තමන්ගේ ලොරි රථයේ සහායකයා දුටු බවද සඳහන් කරන්නේය.

අපි ඒ සහායකයා එස්ආර් ලෙසින් හඳුන්වමු. පසුව එකී ලොරි සහායකයාද පැමිණ සාරා ජෙස්මින්ව එසේ රැගෙන යනු තමන්ද දුටු බව ජනාධිපති කොමිසම ඉදිරියේ සඳහන් කරන අතර ඒ අනුව එම සිද්ධිය පිළිබඳ විමර්ශනයක් සිදු කරන ලෙස ජනාධිපති කොමිසම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දැනුම්දෙනු ලැබිය. ඒ අනුව විමර්ශන ආරම්භ කෙරිණි. අම්පාර පොලිසියේ සේවය කළ ප්‍රධාන පොලිස් පරීක්ෂක අබුබක්කර් අත්අඩංගුවට ගැනිණි. එකී අත්අඩංගුවට ගැනීම සිදුවන්නේ ඉකුත් 2020 වසරේ ජූලි මාසයේදීය. පසුව රක්ෂිත බන්ධනාගාරගත කෙරුණු ඔහු අදටද සිටිනුයේ බන්ධනාගාරගතවය. අනතුරුව අදාළ තොරතුර ලබාදුන් පුද්ගලයන් දෙදෙනා පිළිබඳව විමර්ශන අරඹන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දුරකථන දත්ත වාර්තා ඔස්සේ පරීක්ෂණ සිදු කරමින් අනාවරණය කර ගනු ලබන්නේ සයින්දමරුදු පිපිරීම සිදුවූ කාලයේ ඔවුන් දෙදෙනා නිකමටවත් කලවංචිකුඩි හෝ ඊට ආසන්න ප්‍රදේශයකටවත් පැමිණ නැති බවකි. එම කාල සීමාව තුළ ලොරි සහායකයා සිට ඇත්තේ වව්නියාව ප්‍රදේශයේ බවද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හෙළිකර ගන්නේය.

එසේම අත්අඩංගුවට ගනු ලැබූ අම්පාර පොලිසියේ සේවය කළ ප්‍රධාන පොලිස් පරීක්ෂක අබුබක්කර් නමැති නිලධාරියා සම්බන්ධයෙන් පවත්වන විමර්ශනයේදී දුරකථන දත්ත වාර්තා අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තහවුරු කරගනු ලබන්නේ වැරදීමකින්වත් ඔහු කලවංචකුඩි ප්‍රදේශයට ගොස් නැති බවය.

මේ අන්දමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මාහින්කන්ද විසින් ජනාධිපති කොමිසම ඉදිරියට ගෙන ආ ඔහුගේ විශ්වාසවන්තම ඔත්තුකරුවන්ගේ පැටිකිරිය අනාවරණය කරගනිද්දී එස්ආර් හෙවත් මහින්කන්දගේ ඔත්තුකරුගේ ගෝලයා වූ ලොරි සහායකයා ක්ලමුණේ අධිකරණය වෙත ගොස් ඉකුත් 2020 වසරේ ඔක්තෝබර් 5 වැනිදා විශේෂ රහස් ප්‍රකාශයක් සිදු කරන්නේය.

ඉන් අනතුරුව 2021 වසරේ මාර්තු මාසයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යන එස්ආර් හෙවත් ලොරි සහායකයා එහිදී කියා ඇත්තේ තමන් අබුබක්කර් කියන පොලිස් නිලධාරියා කැබ් රථයකින් සාරා ජෙස්මින්ව රැගෙන ගිය බවට කියා සිටියේ ලොරි හිමියාගේ බලපෑම නිසා බවය. එවන් සිදුවීමක් තමා කිසිදා නොදුටු බවද ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඉදිරියේ පසුව ප්‍රකාශ කර ඇත. මෙම සිදුවීමත් සමඟ වහා ක්‍රියාත්මක වන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මාහින්කන්ද නමැති විමර්ශන නිලධාරියාගේ ඔත්තුකරු කී සියල්ල අසත්‍ය බවට පාස්කු ප්‍රහාරය පිළිබඳ ජනාධිපති කොමිසමට දැනුම් දෙනු ලබන අතර ප්‍රධාන පොලිස් පරීක්ෂක අබුබක්කර්ට එරෙහිව චෝදනා එල්ල වූ සිද්ධිය තහවුරු කිරීමට කිසිදු සාක්ෂියක් අනාවරණය නොවූ බව සඳහන් කරමින් විමර්ශනයේ උධෘත නීතිපතිවරයාටද යොමු කරන්නේය. මෙම සිදුවීමත් සමඟ කලකට පෙර හිමිවී තිබූ ග්‍රීන් කාඩ් වීසා අවසරයක් මගින් පාස්කු කොමිසමට ව්‍යාජ සාක්ෂි ඉදිරිපත් කළ අර්ජුන මාහින්කන්ද නමැති නිලධාරියා සහකාර පොලිස් අධිකාරිවරයකු ලෙස උසස් වීමක්ද ලබා සිටියදී පොලිස් ඇමරිකාව බලා පිටත්ව ගියේය. එය සිදුවූයේ මීට මාස දෙක තුනකට ඉහතදීය.

එහෙත් අම්පාර පොලිසියේ සේවය කළ ප්‍රධාන පොලිස් පරීක්ෂක අබුබක්කර් තවමත් සිටින්නේ බන්ධනාගාරගතවය. මේ වන විට ඔහුට එරෙහිව බී වාර්තාවක් මගින් නඩුවක්ද පැවරී තිබෙන බව දැනගැනීමට ඇත.

එසේ වීමට හේතුව කුමක්දැයි අපට වැටහෙන්නේ නැත. එවැන්නක් සිදුව ඇත්තේ අබුබක්කර් නමැති එකී පොලිස් නිලධාරියාගේ අවාසනාව නිසාද? නැති නම් වෙන කුමක් හෝ හේතුවක් නිසාද? තේරුම් ගත නොහැකිව ඇත්තේද ඒ ටිකය. පසුගිය දිනක පාර්මේන්තුවට පැමිණ පාස්කු ප්‍රහාරයේ වින්දිතයන් පිළිබඳව වැළපෙමින් පාර්ලිමේන්තු මන්ත්‍රී මනුෂ නානායක්කාර මහතා කියා සිටියේ පාස්කු ප්‍රහාරය මෙහෙයවනු ලැබුවේ රාජ්‍ය බුද්ධි ප්‍රධානී මේජර් ජෙනරාල් සුරේෂ් සලේ කියාය. ඒ සම්බන්ධයෙන් දැනටමත් මේජර් ජෙනරාල් සුරේෂ් සලේ විසින් කඩිනම් විමර්ශනයක් පවත්වන ලෙස ඉල්ලා පොලිස්පතිවරයාට පැමිණිල්ලක්ද ඉදිරිපත් කර ඇත. එහෙත් පාස්කු වින්දිතයන්ට සාධාරණය ඉටු කිරීමට නම් මනුෂ නානායක්කාර වැනි අය කළ යුත්තේ මෙසේ පාර්ලිමේන්තුවට පැමිණ වරප්‍රසාදවලට මුවා වී කෑමොර දීමද?

නැත ඔහු සැබෑවටම පාස්කු වින්දිතයන් වෙනුවෙන් පෙනී සිටින්නේ නම් සිදුකළ යුතු වන්නේ සියලු සාක්ෂි සමඟ ගොස් මේජර් ජෙනරාල් සුරේෂ් සලේට එරෙහිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් කිරීමය.

එසේ නොහැකි නම් නීතිඥයකු සමඟ අධිකරණය හමුවට යෑමේ අවස්ථාවට ඔහුට ඇත. එලෙස නිවැරදි දේ කරනු වෙනුවට මේ අන්දමට කටයුතු සිදු කිරීමෙන් පාස්කු වින්දිතයන්ට හිමිවන කිසිදු සෙතක් නැත. මේජර් ජෙනරාල් සුරේෂ් සලේ හෝ වෙන යම් කෙනකු වුවද මේ අපරාධයට සම්බන්ධ නම් කාට වුව තරාතිරම නොබලා දඬුවම් හිමිවීම නියත වශයෙන්ම සිදුවිය යුතු දෙයකි. එහෙත් ඊට අවස්ථාව නොතබා මනුෂ නානායක්කාර වැනි අය මේ අන්දමට කටයුතු කරන්නේ ඇයි? ඉහත සටහන් වූ සමස්තය ද සමඟ බලන කල ඉන් කියැවෙන්නේ පාස්කු ප්‍රහාරය එල්ල වූ දිනයේ සිටම කිසියම් අදිසි යාන්ත්‍රණයක් ඒ පසුපස ක්‍රියාත්මක වූ බවද? එවැන්නක් සිදුවූයේ නම් පාස්කු ප්‍රහාරකයන්ට දඬුවම් කරනවාක් මෙන්ම රටත් සමාජයත් නොමඟ යවමින් කුමන්ත්‍රණකාරීව ක්‍රියාත්මක වූ ඒ සියලු දෙනාටද දඬුවම කළ යුතුය.

කාට හෝ එසේ නීතියෙන් දඬුවම් නොලැබුණද පාස්කු ප්‍රහාරයෙන් මියගිය අහිංසකයන්ගේ නාමයෙන් ඒ කිසිවකුටත් කිසිදා ස්භාවධර්මයෙන් නම් ගැලවීමක් ලැබෙන්නේම නැත.

● සමන් ගමගේ

**ආණ්ඩුවට එරෙහිව තවදුරටත් වර්ධනය වෙමින් පවතින ජනතා විරෝධය සම්බන්ධයෙන් අපූරු පැහැදිළි කිරීමක් අග්‍රාමාත්‍ය මාධ්‍ය ඒකකය අප්‍රේල් 26 දින කළේය. අග්‍රාමාත්‍ය මාධ්‍ය ලේකම් රොහාන් වැලිවිට අගමැති මහින්ද රාජපක්ෂ සහ පළාත් සභා මන්ත්‍රී සංසදය සමඟ අරලියගහ මන්දිරයේ පැවති හමුවකින් පසුව නිකුත් කළ වර්තමාන අර්බුදය පිටුපස සිටින කණ්ඩායම හෙළිදරව් කර තිබිණි. ඒ අනුව රජයට එරෙහිව කුඩා කණ්ඩායමක් ක්‍රියාත්මක කර ඇති විරෝධතාවයට අනවශ්‍ය ප්‍රචාරයක් ලබා දීමෙන් සමාජ මාධ්‍ය සහ ප්‍රධාන පෙළේ මාධ්‍ය අර්බුදය වර්ධනය කර ඇත. ආණ්ඩුවට එරෙහි විරෝධතාව තුළ අන්තවාදී බලවේග, දෙමළ ඩයස්පෝරාව (ද්‍රවිඩ ඩයස්පෝරාවට ශ්‍රී ලංකාව තුළ මුදල් ආයෝජනය කිරීමට අවස්ථාවක් ලබා දීම සම්බන්ධයෙන් ආණ්ඩුව සහ ද්‍රවිඩ ජාතික සන්ධානය පසුගියදා සාකච්ඡා කළ බව අමතකවී ඇති බව පෙනේ) සහ රට අරාජික කිරීමට විදේශ බලවේග ඇති බව හෙළිදරව් කෙරිණි. ශ්‍රී ලංකාවට වෙනත් කිසිදු බුද්ධි අංශයක් අවශ්‍ය නැත. රටට උහුලාගත නොහැකි ඩොලර් ණය ප්‍රමාණයක් ගැනීමට ශ්‍රී ලංකා රජය පෙළඹවූයේ අන්තවාදී බලවේග, දෙමළ ඩයස්පෝරාව සහ විදේශීය බලවේග බවට පොහොට්ටු රජය ප්‍රකාශ කළත් පුදුම විය යුතු නැත. ජනාධිපති මාධ්‍ය ඒකකය පැඟිරිවත්ත පාරේ සිද්ධියෙන් පැය 24 ක් යෑමට පෙර අන්තවාදීන් එම ප්‍රහාරය එල්ල කළ චෝදනාව ජනතාව පිළිකුලෙන් බැහැර කළ බව අවධාරණය කළ යුතුය. පසුගිය සතියේ අගමැති මාධ්‍ය ඒකකය නිකුත් කළ ප්‍රකාශ නිවේදන අංක 767 (අග්‍රාමාත්‍යවරයා ඉල්ලා අස්විය යුතු නැතැයි පළාත් සභා මන්ත්‍රී සංසදය ඒකමතිකව තීන්දු කරයි), අංක 768 (අත්‍යවශ්‍ය සේවා වෙනුවෙන් පවතින පෝළිම් වහා නැති කළ යුතුයි, අංක 769 (රට අරාජික වීමට කිසිසේත් ඉඩ තබන්නේ නැහැ - අග්‍රාමාත්‍ය, අංක 770 (අග්‍රාමාත්‍යවරයා ඉල්ලා අස්විය යුතු නැතැයි ප්‍රාදේශීය සභා සභාපතිවරු සහ නගරාධිපතිවරු ඒකමතිකව තීන්දු කරති සහ අංක 771 (ජනාධිපතිවරයා කිසිවිටක මට ඉල්ලා අස්වෙන්න කිව්වෙත් නැහැ, කියන්නෙත් නැහැ කියල මට විශ්වාසයි - අග්‍රාමාත්‍යවරයා අවධාරණය කළේ ආණ්ඩුවේ අස්ථාවරභාවයයි.**

# ලංකාවේ ඉරණම ජාත්‍යන්තර බලවතුන් අතේ !



පෙරමුණු කිහිපයක සටන් ඇවිලෙමින් පවතී. දේශපාලන අස්ථාවරත්වය සහ අවිශ්වාසය ශ්‍රී ලංකාව අකර්මණ්‍ය කර ඇත. ජාතික ආර්ථිකය කඩාවැටී ඇති බව අමුතුවෙන් කිවයුතු නැත.

සමස්තයක් ලෙස මහජන නියෝජිතයන් කරන සෑම ප්‍රකාශයක්ම තවදුරටත් අස්ථාවරත්වය වර්ධනය කරන බවද අවධාරණය කළ යුතුය. වර්තමාන ආර්ථික -දේශපාලන සහ සමාජීය අර්බූදය විසඳීමට රජයට, පාර්ලිමේන්තුව නියෝජනය කරන සහ ඉන් පිටත විපක්ෂයට ශක්තියක් තවදුරටත් නැත. ජනතාව වටහා ගත යුතු සත්‍ය එයයි.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ මිරිහානේ පැඟිරිවත්ත පාරේ මාර්තු 31 පුපුරා ගිය ජනතා විරෝධය මාසයක් තුළ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම පක්ෂ ප්‍රබල අර්බුදකට ලක් කර ඇත. රට මුහුණ දෙන අභියෝගය ජය ගැනීමේ ශක්තිය රජයට හෝ විපක්ෂයට නැත. රජය සහ විපක්ෂය කුමන ආකාරයට ඒකාබද්ධ වුවත් රට තුළ විසඳුමක් නැත. තිත්ත ඇත්ත එයයි. කෙටියෙන් කිවහොත් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීම විදේශීය බලවතුන් අතට පත්වී හමාරය.

විදේශ ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස් සමඟ ජාත්‍යන්තර රතුකුරුස කමිටුවේ කොළඹ සිටින නියෝජිතවරයා පවසා තිබුණේ මානුෂීය ආධාර ලබා දීමට සූදානම් බවයි. ජනතාවට අවශ්‍ය බෙහෙත් ගැනීමට ජාත්‍යන්තරය මැදිහත් වී ඇති අවස්ථාවක මානුෂීය ආධාර ලබා දීමට රතු කුරුස සංවිධානය ඉදිරිපත් වීම පිළිබඳව පුදුම විය යුතු නැත. මහජන නියෝජිතයන් ලැජ්ජා විය යුතුය.

ශ්‍රී ලංකා ආර්ථිකය ගොඩගැනීමට වර්තමාන රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පිහිට පැතීම ඉන්දියාව සහ චීනය අතර විරසකයකට මෙන්ම චීන - ශ්‍රී ලංකා මිතුදම පළුදුවීමටද හේතු වූ බව පැහැදිලිය. තත්ත්වය ඉතාමත් බරපතළය. ඉන්දියාවට සහ චීනයට යටවී ඇති ශ්‍රී ලංකාවට නවදිල්ලිය හෝ බීජිං නායකත්වය කිසිසේත් අමනාප කරගත නොහැක. ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පිහිට පැතීම චීනයේ බලවත් නොසතුටට හේතු විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ශ්‍රී ලංකාව සමඟ පැවති තීරණාත්මක සාකච්ඡාවේදී ඉන්දියාව ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ ආණ්ඩුව වෙනුවෙන් පෙනී සිටීම චීනයට ඉහිලුම් නැත. ශ්‍රී ලංකාව චීනයෙන් ලබා ගෙන ඇති ණය සම්බන්ධයෙන් විශේෂ තත්ත්වයක් අවශ්‍ය නොවන බවත් සියලු පාර්ශ්ව එකම ආකාරයෙන් සැලකිය යුතු බවත් ඉන්දියාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට පැවසීම චීනයට අර්බුදකාරී තත්ත්වයකි. මූල්‍ය අර්බුදයෙන් ගොඩ ඒමට ජාත්‍යන්තරයේ උදව් බලාපොරොත්තු වන වර්තමාන ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඇමෙරිකානු බළල් අතක් බව සිහියේ තබා ගත යුතුය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාව අවබෝධ කර ගත යුතු සත්‍ය වර්තමාන අර්බුදයට නැතහොත් අභියෝගයට විධායකයට, ව්‍යවස්ථාදායකයට සහ අධිකරණයට පිළිතුරු නොමැති බවයි.

විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය යන බල කණු තුනම දුර්වල වී ඇත. තීන්දු තීරණ ගත්තත් ඒවා ක්‍රියාත්මක කිරීමේ මූල්‍යමය ශක්තිය නැත. බොරු ෂෝක් හමාරය.

සමස්තයක් ලෙස දේශපාලන න්‍යායන්ට අනුගතව කටයුතු කළ සියලුම මාධ්‍යද වර්තමාන ආර්ථික - දේශපාලන සහ සමාජීය කඩාවැටීමට වගකිව යුතුය. ප්‍රතිපලය පැහැදිලිය. නිදහසින් පසුව ශ්‍රී ලංකාව මේ අකාරයෙන් අසරණභාවයට පත්වූ අවස්ථාවක් නැත.

පෙරමුණු කිහිපයක සටන් - පැඟිරිවත්ත පාරේ මාර්තු 31 සිදුවූ 'ජනතා පිපිරීම' සහ අප්‍රේල් 28 වැඩවර්ජනය අතරතුර සමස්ත දේශපාලනය උඩු යටිකුරු කළ සිදුවීම මහින්ද රාජපක්ෂ අගමැතිවරයා ඉවත් වියයුතු බවට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ තුළින් මතුවූ ප්‍රබල ඉල්ලීමයි.

එම පක්ෂයෙන් පාර්ලිමේන්තුවට පත්වූ 145 වූ මහජන නියෝජිතයන්ගේ කණ්ඩායමෙන් තුනෙන් එකක් අගමැතිවරයා ඉවත්විය යුතු බවට ජනාධිපතිවරයාගෙන් කළ ඉල්ලීම නැතහොත් වර්තමාන දේශපාලන අර්බුදය විසඳීමට අග මැතිවරයා බලවත් බාධාවක් බව පැවසීම අස්ථාවරත්වය අවධාරණය කරයි. නමුත් දේශපාලන අර්බුදය විසඳීමෙන් පමණක් ආර්ථික සහ සමාජීය අභියෝග ජයගත නොහැකි බව අමුතුවෙන් කිවයුතු නැත.

කවුරු කීවත් නොකීවත් අගමැතිවරයා තවදුරටත් ප්‍රශ්නයේ කොටසක් මිසක් පිළිතුරක් නොවේ. දේශපාලන උප්පරවැට්ටි වලින් පමණක් අර්බුදය කිසිසේත් විසඳිය නොහැකි බව රජය සහ විපක්ෂය වටහා ගත යුතුය. නමුත් දෙපාර්ශ්වයම වර්තමාන තත්ත්වය නිසි ලෙස අවබෝධ කරගෙන නැත. සාම්ප්‍රදායික ක්‍රියාමාර්ගවලින් පමණක් අර්බුදය විසඳීමට නොහැකි තත්ත්වය ආණ්ඩු පක්ෂය, ආණ්ඩුවෙන් වෙන්වූ කණ්ඩායම සහ විපක්ෂය තවමත් තේරුම් ගෙන නැත. දේශපාලන - ආර්ථික සහ සමාජීය අර්බුදය මාසයක් තුළ පරාජය කළ නොහැකි මහා රකුසෙකු බවට පත්වූයේ රජයට එල්ලවූ දේශපාලන අභියෝගයේ දිග පළල නිසියාකාරයෙන් තේරුම් ගැනීමට අවශ්‍යතාවයක් නොතිබූ නිසාය.

මාර්තු 31 දින පැඟිරිවත්තේ පාරේ පුපුරා ගිය ජනතා බෝම්බය, අප්‍රේල් 03 රට පුරා පැවැත්වූ විරෝධතාවයක් බවට පත්වී අප්‍රේල් 09 දින 'ගෝ ගෝඨා හෝම්' ව්‍යාපාරය ලෙස ගාලු මුවදොර අත්පත් කර ගැනීම ඓතිහාසික දේශපාලන සිදුවීමකි. වර්තමාන රජය ක්‍රියාකළ ඉතාමත් අදූරදර්ශී, උද්දච්ඡ සහ මුරණ්ඩු ක්‍රියාකලාපය හේතුවෙන් ඇතිවූ සමාජීය කැළඹීම 'ගෝ ගෝඨා හෝම්' ව්‍යාපාරය බවට පත්කළ බලවේගය සාම්ප්‍රදායික දේශපාලනය /පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය කකුල් දෙකෙන් උස්සා පොළොවේ ගසා ඇත.

ජනාධිපති ලේකම් කාර්යාලය ඉදිරිපිට ක්‍රියාත්මක මෙහෙයුම පාර්ලිමේන්තුව නියෝජනය කරන විපක්ෂ දේශපාලන පක්ෂයක හෝ ඒකාබද්ධ විපක්ෂයේ නායකත්වයෙන් ආරම්භ වූවානම් එම ක්‍රියාදාමය පැය 24 පවත්වාගෙන යෑමට ඔවුන්ට ශක්තියක් නැත. ඔවුන්ට ජනතා ආකර්ෂණයක්ද නැත. ජනතාවට ආණ්ඩුව මෙන්ම විපක්ෂය සම්බන්ධයෙන්ද විශ්වාසයක් නැත. තිත්ත ඇත්ත එයයි.

ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය භූමියේ තත්ත්වය තවමත් නිසිලෙස වටහා ගෙන නොමැත. පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂ අතර ඇතිකර ගන්නා පුළුල් එකඟතාවයකින් 'ගෝඨා ගෝ ගම' හෝ අග මැතිවරයාගේ නිළ නිවාසය වන අරලියගහ මන්දිරය ඉදිරිපිට අප්‍රේල් 26 දින ආරම්භ කරන ලද 'මහින්ද ගෝ ගම' මෙහෙයුම අවසන් කළ හැකිද? නොයෙකුත් දේශපාලන පක්ෂවලට සම්බන්ධ වෘත්තීය සමිති නායකත්වය දෙන වැඩ වර්ජන රැල්ලකට මුහුණ දිය හැකිද. කවුරු බලයේ සහ විපක්ෂයේ සිටියත් වටහා ගත යුතු සත්‍ය රජයට එරෙහිව ක්‍රියාත්ම මෙහෙයුමේ සාර්ථකත්වය ඊට ලැබුණු මීට පෙර කිසිදු තත්ත්වයක් සමඟ සංසන්ධනය කළ නොහැකි පුළුල් ජනතා සහභාගිත්වයයි. ආණ්ඩුව මෙන්ම විපක්ෂයද මෙම තත්ත්වය අවබෝධ කර ගත යුතුය.

මෙහෙයුමේ ඉදිරියෙන්ම සිටින සමාජවාදී පෙරටුගාමී පක්ෂය මෙන්ම අනෙකුත් කණ්ඩායම්ද භූමියේ තත්ත්වය සැබෑ ලෙසම අවබෝධ කරගත යුතුය. අසාර්ථක රාජ්‍යයක් ලෙස ශ්‍රී ලංකාව හංවඩු ගැසීමට ද්‍රවිඩ ත්‍රස්තවාදයට එරෙහිව අප රට සටන් කළ කාලයේ යම් බටහිර බලවේග සහ ඔවුන්ගේ අතකොළු උත්සහා කළ බව රහසක් නොවේ. එම දුෂ්ට අරමුණු ඉටු කර ගැනීමට ඔවුන්ට නොහැකි විය. නමුත් වසර 30 පමණ කාලය තුළ, විශේෂයෙන්ම මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ පාලන කාලයේදී (2005 - 2014) ආණ්ඩුව ලබාගත් දේශීය සහ විදේශය ණය කන්දට ශ්‍රී ලංකාව යටවී ඇත. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපති ධූරයට පත්වීමත් සමගම ඇතිවූ කොවිඩ් ව්‍යසනය ණය බෝම්බය පුපුරා යෑම වසර කිහිපයකින් ඉක්මන් විය. ඒ ආදායම් මාර්ග නැතිවී යෑම නිසාය. ඇත්ත වශයෙන්ම කොවිඩ් ප්‍රහාරයට ශ්‍රී ලංකාව ලක්වීමට පෙර විදේශ ණය අර්බුදය නිර්මාණය වී තිබිණි. ජනාධිපතිවරණය පවත්වන අවස්ථාවේදී මහා බැංකු අධිපති ලෙස කටයුතු කළ ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි තමන් දැරූ තනතුරින් ඉවත් වීමට පෙර ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුවට ජාතික ආර්ථිකය මුහුණ දී ඇති සැබෑ තත්ත්වය සම්බන්ධයෙන් පැහැදිලි කළේය.

පොහොටුවේ නායකත්වය එතුමාගේ උපදෙස් ඉවත දැම්මේය. ගෝඨාභය රාජපක්ෂට 2019 නොවැම්බර් මාසයේ ලැබුණු ලක්ෂ 69 ජනවරම සහ පොහොට්ටු පක්ෂයට 2020 අගෝස්තු ලැබුණු තුනෙන් දෙකකට ආසන්න පාර්ලිමේන්තුවේ බලය අනුවණ දේශපාලන නායකත්වයට සහ ඉහළ රාජ්‍ය නිලධාරීන් කිහිප දෙනාට අවියක් විය. කිසිදු අවවාදයක්, අනතුරු ඇඟවීමක් සැලකිල්ලට ගත්තේ නැත. යහපාලන ආණ්ඩුවද මහින්ද රාජපක්ෂ ජනාධිපති ධූරය දැරූ කාලයේ ජාත්‍යන්තරයෙන් ගත් ණය පියවීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය ගත් බවද ආචාර්ය කුමාරස්වාමි ඉහළම නායකත්වයට අවධාරණය කළේය. එම අවවාදයෙන් කිසිදු පලක් නොවීය. ආචාර්ය කුමාරස්වාමි තනතුරින් ඉවත් විය. මහාචාර්ය දේශමාන්‍ය ඩබ්ලිව්. ඒ. ලක්ෂ්මන් (දෙසැම්බර් 2019 - සැප්තැම්බර් 2021) සහ ඔහුගේ අනුප්‍රාප්තිකයා වූ අජිත් නිවාඩ් කබ්රාල් (සැප්තැම්බර් 2021 - මාර්තු 2020) කළ හරිය ජනතාව දනී. අත්‍යවශ්‍ය සියලුම ආහාර පාන, භාණ්ඩ සහ සේවා ජනතාවට උහුලාගත නොහැකි ලෙස ඉහළ ගොස් ඇත්තේ මුදල් මණ්ඩලය කැබිනට් මණ්ඩලය නොමඟ යැවූ නිසාද ?

නැතහොත් පස් දෙනකුගෙන් සමන්විත මුදල් මණ්ඩලය දුන් උපදෙස් කැබිනට් මණ්ඩලය නොසලකා හැරිය නිසාද? නැතහොත් මෙම හේතු දෙක නිසාද? මුදල් මණ්ඩලය සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත වේ. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාට සහ කැබිනට් මණ්ඩලයට උපදෙස් දීමට එමෙන්ම ජනතාවට වගකිව යුතු සහ වගවිය යුතු මූල්‍ය මණ්ඩලයේ එවකට සිටි සාමාජිකයන් හඳුනා ගනිමු. ඒ මහා බැංකු අධිපතිවරයා (මහාචාර්ය ඩබ්ලිව්. ඒ. ලක්ෂ්මන් සහ අජිත් නිවාඩ් කබ්රාල්), මුදල් ලේකම් (එස්. ආර්. ආටිගල), ආචාර්ය රානි ජයමහ, ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන සහ සමන්ත කුමාරසිංහයි. මූල්‍ය මණ්ඩලයේ වගකීම සහ වගවීම සාමූහික විය යුතුය.

පොහොට්ටු මන්ත්‍රී අනුර ප්‍රියදර්ශන යාපාගේ නායකත්වයෙන් ක්‍රියාත්මක පාර්ලිමේන්තුවේ මූල්‍ය කොමිටිය මූල්‍ය මණ්ඩලයේ ක්‍රියාකලාපය දැඩි ලෙස දෝෂාරෝපණයට ලක් කළේය. ඒ වර්තමාන මූල්‍ය අර්බුදය සම්බන්ධයෙන් කරුණු විමසීමට පාර්ලිමේන්තුවට කැඳවීම නොසලකා හැරිය බවට චෝදනා කරමිනි. ශ්‍රී ලංකාව මුහුණ දෙන සමස්ත අර්බුදය සම්බන්ධයෙන් විමසීමේදී මූල්‍ය මණ්ඩලය කටයුතු කළ ආකාරය අවධානයට ලක් කළ යුතුමය. මූල්‍ය මණ්ඩලය ආර්ථික අර්බුදය විසඳීමට ඇති ප්‍රධානම විසඳුම ලෙස මුදල් අච්චු ගැසීම ලෙස තීරණය කළ බව පැහැදිලිය. ගෝඨාභය රාජපක්ෂ රජයේ පළමු මුදල් ඇමැති අගමැති මහින්ද රාජපක්ෂ සහ එම තනතුරට 2021 ජූලි මසදී පත්වූ බැසිල් රාජපක්ෂ මුදල් අච්චු ගැසීම කර්මාන්තයක් ලෙස කළ බව අමුතුවෙන් කීමට අවශ්‍ය නැත.

මුදල් අච්චු ගැසීම සම්බන්ධයෙන් පැවති සියලු වාර්තා අලුත් කළේය. උද්ධමනය නහුතෙටම නැග්ගේය. තීන්දු තීරණ ගන්නා පොහොට්ටු කණ්ඩායම ආර්ථිකය විදුලි වේගයෙන් විනාශ කළේය. අවසානයේ රුපියල 2022 මාර්තු මාසයේ මුල හදිසියේම අවප්‍රමාණය කරන විට ආර්ථිකය හතර ගාතෙන් වැටී අවසානය. ආණ්ඩුවේ හිතුවක්කාර, වගකීම් විරහිත ක්‍රියාදාමය දේශපාලන සුනාමියක් නිර්මාණය කළ බව වටහා ගැනීමටවත් පොහොට්ටු රජයට වුවමනාවක් නැත. රජය පලවාහැරිය යුතු බවට අති බහුතරය තීරණය කළේ ජනාධිපතිවරයාගේ පැඟිරිවත්ත පාරේ පිහිටි නිවාසය ඉදිරිපිට මාර්තු 31 දින විරෝධතාවයට පෙරය. කුරුණෑගල බුවනෙකබා රාජ මණ්ඩපය විනාශ කර (2020 ජූලි) ආරම්භ කළ පොහොට්ටුවේ පිරිහීම ආලවිලුන්දාව රම්සා තෙත් බිම විනාශ කිරීම (2020 සැප්තැම්බර්) සමඟම වේගවත් විය. 'යහපාලනය' ඇතුළුව ඊට පෙර පැවති සෑම ආණ්ඩුවක් සේම 'සෞභාග්‍යයේ දැක්ම ද' වැරදිකරුවන් ආරක්ෂා කිරීම ඉහළින්ම කළේය.

එවකට ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ජොන්ස්ටන් ප්‍රනාන්දු නීතියට අභියෝග කළේ කුරුණෑගල සිද්ධියට වගකිවයුතු ප්‍රධාන සැකකරුගේ මයිලකටවත් අත තැබීමට තමන් ඉඩ නොදෙන බවයි. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකගේ කාර්යාලය හිටපු මන්ත්‍රී භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මරාදැමීමේ චෝදනාවට වැරදිකරු වූ ආර්. දුමින්ද සිල්වා ට ජනාධිපති සමාව ඉල්ලා ආණ්ඩු පක්ෂ කණ්ඩායමෙන් අත්සන් ගත්තේය. (2020 ඔක්තෝබර්) පක්ෂ, විපක්ෂ මහජන නියෝජිතයන් එම පෙත්සමට දායක විය. ගෝඨාභය රාජපක්ෂ මන්ත්‍රීවරුන්ගේ එම ඉල්ලීම ඉටු කළේය (2021 ජුනි). ජනාධිපති සමාව ලැබූ හිටපු මහජන නියෝජිත කලක් ආරක්ෂක අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රීවරයා ලෙස කටයුතු කළ ආර්. දුමින්ද සිල්වාට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති ධූරය පිරිනැමිණි. යහපාලන ජනාධිපති වූ මෛත්‍රිපාල සිරිසේන අධිකරණයට අපහාස කිරීමේ වරදට වසර 19 ක සිර දඬුවමක් ලබා සිටි පූජ්‍ය ගලගොඩඅත්තේ ඥානසාර හිමියන්ට ජනාධිපති සමාව දුන්නේය. ඒ 2019 මැයි මාසයේදීය.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා ඥානසාර හිමියන්ව 'එක රටක්, එක නීතියක් ජනාධිපති කාර්ය සාධක බළකායේ සභාපති ලෙස පත් කළේය. ඒ 2021 ඔක්තෝබර් මාසයේදීය. පොහොට්ටු රජය තමන් විසින්ම නොයෙකුත් අර්බුද නිර්මාණය කරමින්, ඉතාම හදිසියෙන් විසඳිය යුතු ආර්ථික ප්‍රශ්නය පසෙකින් තැබුවේය. අභියෝගය විසඳීමට අවශ්‍ය ක්‍රියාමාර්ග වෙනුවට මාධ්‍ය සංදර්ශන පවත්වමින් විදේශ මුදල් අර්බුදය වර්ධනය වීමට ඉඩ හැරියේය. මහා බැංකු අධිපතිවරුන් දෙදෙනාම සහ එවකට ජනාධිපති ලේකම් වූ ආචාර්ය පී. බී. ජයසුන්දර ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යෑමේ කිසිදු අවශ්‍යතාවයක් නැති බව දිගින් දිගටම අවධාරණය කළ බව රහසක් නොවේ. මුදල් ඇමැති මහින්ද රාජපක්ෂ ආර්ථික අර්බුදය සම්බන්ධයෙන් අදහස් පල කළේ නැත. බැසිල් රාජපක්ෂ මුදල් අමාත්‍ය ධූරයට 2021 ජූලි මාසයේදී පත්වූ පසුවත් තත්ත්වයේ වෙනසක් නොවීය. විදේශ මුදල් අර්බුදය තවදුරටත් වර්ධනය වීමට ඉඩ හැරියේය. නව අර්බුදයක් නිර්මාණය කළේය. ඒ 2021 ජූලි මාසයේදී කඩිමුඩියේ ගත් තීරණයක් මත 2021 සැප්තැම්බර් 17, 2021 මධ්‍යම රාත්‍රියේ යුගදනවි බලාගාරයේ ආණ්ඩුව සතු කොටස් 40% ඇමෙරිකානු ඉතාමත් ආන්දෝලනාත්මක ආකාරයට විකුණා දැමීමෙනි.

එදා ජනාධිපතිවරයාද එම තීන්දුව සමඟ සිටිය බව අමතක නොකරන්න. යුගදනවි ගිවිසුම ආරක්ෂා කිරීමට පැවති මාධ්‍ය සාකච්ඡාව පැවැත්වූයේ ජනාධිපති මාධ්‍ය ප්‍රකාශක කින්ස්ලි රත්නායකගේ ප්‍රධානත්වයෙනි.


කිසිදු පසු විපරමක් කිරීමට පොහොට්ටු බලවතුන්ට සහ ජනාධිපතිවරයාට අවශ්‍යතාවයක් නොවීය. අවසන් ප්‍රතිඵලය 50 කට ආසන්න පොහොට්ටු මන්ත්‍රීවරු ගණනක් අගමැතිවරයා ඇතුළු සමස්ත අමාත්‍ය මණ්ඩලයට එරෙහි වීම නොවේද?

'ගෝ ගෝඨා හෝම්' ජනතා ව්‍යාපාරය සමස්ත දේශපාලන ක්‍රමයටම, විශේෂයෙන්ම ආණ්ඩුවට එල්ල කරන අභියෝගය පිළිබඳව විමසා බැලිය යුත්තේ පොහොට්ටු පක්ෂය දෙකඩ වීම පිළිබඳව ද අවධානය යොමු කිරීමෙනි.

**● ශමින්ද ෆර්ඩිනැන්ඩෝ**

# වෙනිසියුලානු අර්බුදය ගැන හෙළිකරන පොත






විලියම් නියුමන්, වෙනිසියුලාවේ නිව්යෝර්ක් ටයිම්ස් වාර්තාකරු කටයුතු කළේ 2012 සිට 2016 කාලය තුළය. ඒ කාලය වෙනිසියුලානු අර්බුදයේ උච්චතම අවස්ථාව විය. කරාකස් නුවර සිට වාර්තා සැපයූ ඔහු වෙනිසියුලානු දේශපාලන හා ආර්ථික බිඳවැටීම පිළිබඳව ලියූ ග්‍රන්ථය Things Are Never So Bad That They Can't Get Worse: Inside the Collapse of Venezuela මැයෙන් නිකුත්ව ඇත. වෙනිසියුලාව එරටින් තෙල් සම්පත සොයාගත්තේ 1914 දීය. 1928 වන විට වෙනිසියුලාව එක්සත් ජනපදයට පසුව ලෝකයේ ඉහළම තෙල් අපනයනකරු සහ දෙවන විශාලතම තෙල් නිෂ්පාදකයා විය.

එතැන් පටන් වෙනිසියුලානුවන් තෙල්වලින් ලැබුණු ආදායමෙන් ජීවත් වූ අතර අනෙකුත් සම්පත්වලින් ප්‍රයෝජන ගැනීම නොසලකා හැර තිබිණි. රටේ සාරවත් ඉඩම්, ඛනිජ සම්පත්, ජල විදුලි විභවය, සුන්දර වෙරළ තීරයන් සහ ප්‍රසන්න දේශගුණයක් අනුව ඔවුන්ට තෙල් නොමැතිව වුවද සමෘද්ධිමත් ජාතියක් වීමට හැකියාව තිබිණි. නමුත් තෙල්වලින් පහසු මුදල් ලැබීමට පටන් ගත් විට, වෙනිසියුලානුවන් අනෙකුත් සියලු සම්පත් අතහැර තෙල් ආදායමෙන් පමණක් ජීවත් වීමට පටන් ගත්හ. ඉහළ තෙල් මිල ගණන්වලදී, මධ්‍යම පාන්තික වෙනිසියුලානු ජාතිකයන් මියාමි වෙත සාප්පු සවාරි යෑමට සහ සුඛෝපභෝගී භාණ්ඩ මිලදී ගැනීමට කටයුතු කළහ. මේ කතාව මේ පොතේ ලියවී ඇත.

එහෙත් තෙල් මිල පහත වැටුණු විට, කරාකස් ආණ්ඩුව විදේශ ණය ගෙවීමට, සංවර්ධන සහ සුබසාධන වියදම් කපා හැරීමට කටයුතු කළ විට ජනතාව අරගල කළහ. මෙම අවස්ථාවන්හිදී මැතිවරණ හෝ කුමන්ත්‍රණ මගින් ආණ්ඩු වෙනස් කරන ලදී. හියුගෝ චාවේස් පවා මෙම චක්‍රයම පුනරුච්චාරණය කර රට විශාල චීන ණය උගුලකට ඇද දැමීය. චාවේස්ගේ අනුප්‍රාප්තිකයා වූ නිකොලස් මදුරෝ ආර්ථිකය වැරදි ලෙස කළමනාකරණය කළ අතර, අධි උද්ධමනය, මුදල් වෙනස්වීම් සහ විනිමය අගය ක්ෂයවීම් සමඟ රට අවුලට පත්විය.

විලියම් නියුමන් වෙනිසියුලාවේ බොහෝ ප්‍රදේශවලට ගොස් විවිධ තරාතිරම්වල සාමාන්‍ය වෙනිසියුලානු ජාතිකයන් සමඟ සම්මුඛ සාකච්ඡා කර මේ ග්‍රන්ථයට ඔවුන්ගේ අත්දැකීම් එක්කර ඇත. දුක්ඛිත කතන්දර සහ දුප්පත්කම, අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හිඟය, විදුලිය විසන්ධි වීම වැනි දුක්ඛිත කතා වලින්, අපරාධ, ප්‍රචණ්ඩත්වය ගැන තොරතුරු එහි ඇතුළත්ය.

මේ කතුවරයා ඇමෙරිකානු සහ වෙනිසියුලානු විපක්ෂ නායකයන් සමඟ සම්මුඛ සාකච්ඡා කර ඇති අතර ජනාධිපති මදුරෝ පෙරළා දැමීමේ ආක්‍රමණ උත්සාහය පිළිබඳ විස්තර ගෙන එයි. ඔහුට අනුව, කුමන්ත්‍රණ නායකයන් වෙනිසියුලාව ආක්‍රමණය කිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් අත්සන් කළේ 2019 ඔක්තෝබර් 16 වැනිදාය. මෙම කොන්ත්‍රාත්තුවට අනුව, ඇමරිකානු ආරක්ෂක සමාගමක් වන Silvercorp වෙත "නිකොලස් මදුරෝ අල්ලා ගැනීමට / රඳවා තබා ගැනීමට / ඉවත් කිරීමට" ඩොලර් මිලියන 213 ක් ගෙවා තිබේ. මදුරෝ වෙනුවට ජුවාන් ගුවයිඩෝ පත්කිරීමේ සැලසුම එවකට රහසිගතව තබා ඇත.

චාවේස් පිළිකාවකින් මිය ගිය මදුරෝ ජනපති විය. කියුබානු පාලනය චාවේස්ට බලකර තිබුණේ මදුරෝ ජනාධිපති ලෙස පත් කිරීමටය. තරුණ කාලයේ කියුබාවේ දේශපාලන පුහුණුව ලැබූ මදුරෝ කියුබානුවන් විසින් පාලනය කළ හැකි වත්කමක් ලෙස හඳුනාගෙන තිබිණි. මදුරෝට බිම් මට්ටමේ සහයෝගයක් තිබුණේ නැත. වඩා බලවත් වූ හමුදා කණ්ඩායම් පාලනය කිරීමට ඔහුට නොහැකි විය. එබැවින් ඔහුට තීරණ ගැනීමට හෝ කිසිදු ප්‍රතිපත්තියක් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. මෙය අධි උද්ධමනය සහ මුදල් අවප්‍රමාණය වීම සමඟ ආර්ථික ව්‍යසනයකට පත්විය.

ජනපති මදුරෝට එරෙහිව කටයුතු කළ ජුවාන් ගුවයිඩෝගේ දැන් විශ්වසනීයත්වය නැති වී ඇත. වෙනිසියුලාවේ වැඩ බලන ජනපති ලෙස ඇමෙරිකානු උවමනා අනුව කටයුතු කළ ඔහු අසාර්ථක විය. කරාකස් පාලන තන්ත්‍රය වෙනස් කිරීම සඳහා සිදුකළ ඇමරිකානු උත්සාහයන් සම්පූර්ණයෙන්ම අසාර්ථක වී ඇත. ඇමෙරිකාවේ අනුකම්පා විරහිත ආර්ථික සම්බාධක හේතුවෙන් වෙනිසියුලානු ජනතාවගේ දුක් වේදනා වඩාත් නරක අතට හැරී ඇත. නමුත් කියුබානුවන් යැංකි සම්බාධක සහ හුදෙකලා කිරීම සහ සීඅයිඒ කුමන්ත්‍රණ ප්‍රයත්නයන්ගෙන් බේරෙන්නේ කෙසේද යන්න පිළිබඳව වෙනිසියුලානුවන්ට පුහුණු කර උපකාර කර ඇත. සමහර බටහිර ආණ්ඩු මදුරෝ රජය සමඟ ගනුදෙනු නැවත ආරම්භ කර තිබෙන අයුරුත් විලියම් නියුමන් ගේ ග්‍රන්ථයේ විස්තර කර ඇත. මේ කුමන්ත්‍රණ වෙනස් ආකාරයෙන් ලංකාවේද ක්‍රියාත්මකය. මෙරට ආර්ථික අවුල ජනපති ගෙදර යවා බේරාගත නොහැකිය. එය වෙනම දේශපාලන ආගමික කුමන්ත්‍රණයකි. ලෝගුකාරයන් වැඩියෙන් ගාළු මුවදොර සක්මන් කරන්නේ එනිසාය. පෙරටුගාමීන්ගේ පෙළපාලිවල කන්‍යා සොහොයුරියන් ඇත්තේ කුමන හේතුවකටද?

**● චතුර පමුණුව**

## අගමැති තේරීම ...

එසේම කැබිනට් ඇමැති මණ්ඩලය ද 15ත් 20ත් අතර සංඛ්‍යාවකට සීමා වනු ඇතැයි ද ඔහු සඳහන් කරයි.

අන්තර්කාලීන සර්වපාක්ෂික ආණ්ඩුවක් පිහිටුවීම සඳහා සාකච්ඡා කිරීමට ආණ්ඩු පක්ෂය නියෝජනය කරන පාර්ලිමේන්තුවේ ස්වාධීන වූ පක්ෂ 11 ක නායකයෝ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පෙරේදා (29දා) හමු වූහ.

එහිදී පක්ෂ 11 විසින් යෝජනා කළ නව අගමැතිවරයකු, නව කැබිනට් මණ්ඩලයක් සහිත අන්තර්කාලීන සර්වපාක්ෂික ආණ්ඩුවක් පිහිටුවීමට ජනාධිපතිවරයා එකඟ වූ බව හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා සඳහන් කළේය.

හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන, නිමල් සිරිපාල ද සිල්වා, සුසිල් ප්‍රේමජයන්ත, වාසුදේව නානායක්කාර, විමල් වීරවංශ, උදය ගම්මන්පිල, මහින්ද අමරවීර, අනුර ප්‍රියදර්ශන යාපා, විජේදාස රාජපක්ෂ, තිස්ස විතාරණ, ඩබ්. ඩී. ජේ. සෙනවිරත්න, දයාසිරි ජයසේකර, පූජ්‍ය අතුරලියේ රතන හිමි, ලසන්ත අලගියවන්න, නිමල් ලන්සා, ජයන්ත සමරවීර, ජයරත්න හේරත්, ටිරාන් අලස්, ජගත් පුෂ්පකුමාර, නලීන් ප්‍රනාන්දු, එම්. එම්. අතාවුල්ලා, ගෙවිඳු කුමාරතුංග, වීරසුමන වීරසිංහ සහ අසංක නවරත්න යන මහත්වරු ජනාධිපතිවරයා සමග වූ සාකච්ඡාවට එක්ව සිටියහ.

## පාගමන කොළඹට ළඟා වූ...

ඒ සඳහා මහනුවර සිට ඉකුත් 26 වැනිදා පැමිණි විරෝධතා පාගමන පෑලියගොඩ නගරයෙන් 30 වැනිදා අවසන් කර, අද දහවල් පෑලියගොඩ සිට නිදහස් චතුරශ්‍රය වෙත මැයි දින පාගමනක් සංවිධානය කර තිබේ.

එහිදී පක්ෂ නායක සහ විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා ඇතුළු පක්ෂයේ ජ්‍යෙෂ්ඨයන් පවතින දේශපාලන සහ සමාජ ගැටලු පිළිබඳව අදහස් දැක්වීමට නියමිය.

## එජාප තරුණ පෙරමුණ...

මෙම විරෝධතාවය සවස 4.00 ට ආරම්භ කරන බවත් අනතුරුව තරුණ සංවිධාන සාමාජිකයන් ගාලුමුවදොර අසල පැවැත්වෙන නිර්පාක්ෂික විරෝධතාවයට සහාය දැක්වීම සඳහා එකතුවන බවත් එජාප මහ ලේකම් පාලිත රංගෙ බණ්ඩාර මහතා පැවසීය. විරෝධතාවය සඳහා එජාප ජ්‍යෙෂ්ඨයන් සහභාගි නොවන බවත් මහ ලේකම්වරයා වැඩිදුරටත් පැවසීය.

## පරණ ලේකම්ලා ...

වසන්තා පෙරේරා (විදුලිබල), කේ. ඩී. ආර්. ඔල්ගා (බලශක්ති), හද්‍රානි ජයතිලක (වෙළෙඳ හා වාණිජ) මෙසේ තමන් කලින් සේවය කරන ලද අමාත්‍යාංශයන් හි පසුදා ද රාජකාරි කටයුතුහි යෙදුණු බව වාර්තා වේ.

අදාළ අමාත්‍යාංශ සඳහා පත්වූ නව ලේකම්වරුන් වෙත වැඩ භාර ගැනීමට ඉඩ නොදී, මෙසේ මෙම පිරිස සිය සේවා කටයුතු සිදුකරගෙන ගොස් තිබේ. ඉහත අමාත්‍යාංශ තුනම අධිමිලැති ටෙන්ඩර් ගනුදෙනු ආදිය සිදුවන ස්ථාන බැවින් වංචනික ලෙස කළ කටයුතුවලට අදාළ ලේකම්වරියන් සම්බන්ධ දැයි වහාම පරීක්ෂණ පවත්වන ලෙස එම අමාත්‍යාංශ වෘත්තීය සමිති ඉල්ලා සිටී.

## ජවිපෙන් මැයි දින...

ඒ අනුව කොළඹ, මාතර, අනුරාධපුරය සහ යාපනය නගර කේන්ද්‍ර කරගනිමින් මැයි දින සැමරුම් පැවැත්වෙයි.

එම පක්ෂයේ මෙවර මැයි දින තේමාව 'ජන පීඩක ආණ්ඩුව පරදවමු - ජනතාවාදී පාලනයක් ගොඩනගමු' යන්නයි. කොළඹ සැමරුම් උත්සවය ජවිපෙ නායක අනුර කුමාර දිසානායක සහ කේ. ඩී. ලාල්කාන්ත යන මහත්වරුන්ගේ සහභාගිත්වයෙන් සවස 3.00 ට කොටුව දුම්රියපළ ඉදිරිපිට දී පැවැත්වෙයි. උද්ඝෝෂණ පෙළපාලිය සවස දෙකට පංචිකාවත්ත පී. ඩී. සිරිසේන ක්‍රීඩාංගණයෙන් ආරම්භ වෙයි. මාතර සැමරුම් උත්සවය සවස 3. 00 ට උයන්වත්ත ක්‍රීඩාංගණයේ දී සුනිල් හඳුන්නෙත්ති, විජිත හේරත් සහ නලින්ද ජයතිස්ස යන මහත්වරුන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වෙයි. අනුරාධපුර සැමරුම් උත්සවය සවස 4.00 ට වලිසිංහ හරිශ්චන්ද්‍ර ක්‍රීඩා පිටියේදී වසන්ත සමරසිංහ මහතා ඇතුළු පිරිසකගේ සහභාගිත්වයෙන් ද යාපනය සැමරුම් උත්සවය පෙරවරු 10.00 ට වීරසිංහම් ශාලාවේ දී ටිල්වින් සිල්වා මහතා ඇතුළු පිරිසකගේ සහභාගිත්වයෙන් ද පැවැත්වෙයි.

# රට ඉන්න සිසුන්ට විදෙස් විනිමය යවන්න බැංකු පහසුකම් දෙන්න

ශ්‍යාම් නුවන් ගනේවත්ත

විදේශවල අධ්‍යාපන කටයුතු සිදු කරන ශ්‍රී ලාංකික ශිෂ්‍යයන්ට යැවීමට අවශ්‍ය විදේශ විනිමය බැංකු ක්‍රමයෙන් සපුරාලන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව, බැංකුවලට උපදෙස් දී ඇතැයි මහ බැංකුවේ අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා පැවසීය.

ඒ සඳහා අදාළ දෙමව්පියන් ඉල්ලුම් කරන්නේ විශාල මුදල් ප්‍රමාණ නොවන බවත් එම විදේශ විනිමය ලබා ගැනීම සඳහා කළුකඩයට යොමු නොවී බැංකු ක්‍රමයට යොමු වන ලෙස එම විදේශ විනිමය ඉල්ලුම් කරන්නන්ගෙන් තමා ඉල්ලා සිටින බවත් මහ බැංකු අධිපතිවරයා කීවේය.

එම අධ්‍යාපන කටයුතු සඳහා බැංකුවලින් විදේශ විනිමය ලබා දෙන්නේ නැත්නම් වැඩි අගයකට අවිධිමත් වෙළෙඳ පොළෙන් විදේශ මුදල් ලබාගැනීමට එම දෙමව්පියන්ට සිදුවන බවද මහ බැංකු අධිපතිවරයා කීවේය.

මේ නිසා අධ්‍යාපන කටයුතු සඳහා විදේශ විනිමය ලබාගැනීම සඳහා වන ඉතා මානුෂික ඉල්ලීම් රැසක් මහ බැංකුවට ද ඉදිරිපත්ව ඇති බවත් ඒ නිසා එම පොඩි පොඩි විදේශ විනිමය ඉල්ලීම් බැංකුවලින් ලබාදෙන ලෙස ඉල්ලා සිටින බවත් එහිදී යම් විදේශ විනිමය අඩුපාඩුවක් වුවහොත් මහ බැංකුවට මැදිහත් විය හැකි බවත් මහ බැංකු අධිපතිවරයා තවදුරටත් කීවේය. ශ්‍රී ලංකා මහ බැංකුවේදී පෙරේදා (29 දා) පැවැති මාධ්‍ය හමුවේදී ඔහු මේ බව කීවේය.

# නියෝජ්‍ය කථානායක තෝරා ගැනීම ලබන සතියේ




අකිත පෙරේරා

පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කථානායක ධුරය සඳහා සුදුස්සකු තෝරා පත් කර ගැනීම ලබන සතියේ පාර්ලිමේන්තු කටයුතු ආරම්භක දිනය වන මැයි 04 වැනිදා සිදු කිරීමට නියමිතව ඇත.

නියෝජ්‍ය කථානායක ලෙස සිටි රංජිත් සියඹලාපිටිය මහතා එම ධුරයෙන් ඊයේ (30දා) ඉවත්වීම මත ඇතිවන පුරප්පාඩුව පිරවීම සඳහා නව නියෝජ්‍ය කථානායකවරයකු තෝරා පත් කර ගැනීම සිදුවෙයි.

# ජනපති කිව්වොත් මං යනවා

නෝමන් පලිහවඩන

අලුත් අගමැති කෙනෙකු පත් කර අලුත් ආණ්ඩුවක් අවශ්‍ය බව ජනාධිපතිවරයා දැනුම් දීමක් කළහොත් ඊට අවනත වෙන බව අගමැති මහින්ද රාජපක්ෂ මහතා 'දිවයින ඉරිදා සංග්‍රහය'ට ප්‍රකාශ කළේය.

එමෙන්ම එම දැනුම් දීම අනුව තමාට අගමැතිකමෙන් ඉවත් වීමට සිදු වෙන බව ද අගමැතිවරයා වැඩිදුරටත් පැවසීය.

# රඹුක්කන ඝාතනයට එස්එස්පී ඇතුළු 4ක් රිමාන්ඩ්

ඒ. ජේ. ඒ. අබේනායක

රඹුක්කන පැවැති මහජන උද්ඝෝෂණයකදී උද්ඝෝෂකයන්ට වෙඩි තැබීමට අණ කළ කෑගල්ල හිටපු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කේ. බී. කීර්තිරත්න මහතා ලබන 6 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ශලනි පෙරේරා මහත්මිය පෙරේදා (29 දා) පස්වරුවේ නියෝග කළාය.

කෑගල්ල මහෙස්ත්‍රාත් වාසනා නවරත්න මහත්මිය විසින් කරන ලද දැනුම්දීමක් අනුව පෙරේදා (29 දා) පස්වරුවේ නාරාහේන්පිට පිහිටි පොලිස් රෝහලට ගොස් සැකකරු නිරීක්ෂණය කළ අතිරේක මහෙස්ත්‍රාත්වරිය එම නියෝගය කළාය.

මේ අතර මහනුවර කුණ්ඩසාල ප්‍රදේශයේදී අත්අඩංගුවට ගනු ලැබූ සෙසු පොලිස් නිලධාරීන් තිදෙනා මැයි මස 13 දා දක්වා රිමාන්ඩ් බන්ධනාගාරගත කරන ලෙස තෙල්දෙණිය මහෙස්ත්‍රාත් අධිකරණය පෙරේදා නියෝග කළේය.

වර්තමාන රජයට එරෙහිව ප්‍රදේශවාසී ජනතාව විසින් පසුගිය 19 වැනිදා රඹුක්කන ප්‍රදේශයේ පැවැති මහජන උද්ඝෝෂණයකදී පොලිසිය සිදු කළ වෙඩි තැබීමකින් චමින්ද ලක්ෂාන් නමැති 42 හැවිරිදි දෙදරු පියකු මියගොස් තිබිණි. ඒ සම්බන්ධයෙන් අධිකරණය හමුවේ පැවැති සාක්ෂි විභාගයේදී ඉදිරිපත් වූ සාක්ෂි අනුව එය මිනීස් ඝාතනයක් බවට තීරණය කළ කෑගල්ල මහෙස්ත්‍රාත් වාසනා නවරත්න මහත්මිය එම වෙඩි තැබීමට අණ දුන් හා වෙඩි තැබීමට සම්බන්ධ වූ සියලු පොලිස් නිලධාරීන් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරන ලෙසට පොලිස්පතිවරයාට නියෝග කොට තිබිණි.

එකී නියෝගය සලකා බැලූ පොලිස්පතිවරයා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කේ. බී. කීර්තිරත්න මහතා නාරාහේන්පිට පොලිස් රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබමින් සිටියදී පෙරේදා (28 දා) රාත්‍රියේ අත්අඩංගුවට ගෙන තිබිණි.

# හවාලා - උණ්ඩියල් ක්‍රමවලට භාණ්ඩ ආනයනය තහනම්

ශ්‍යාම් නුවන් ගනේවත්ත

ඉදිරියේදී සියලු ආනයනවලට අවශ්‍ය මුදල් ගෙවීම බැංකු ක්‍රමයෙන් පමණක් කළ යුතු බවත් ඒ අනුව යම්කිසි කාලයක් ලබාදී හවාලා සහ උණ්ඩියල් ක්‍රමයට මුදල් ගෙවා භාණ්ඩ ආනයනය කිරීම තහනම් කරන බවත් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා කීවේය.

මේ සඳහා මුදල් අමාත්‍යාංශය මගින් ආනයන හා අපනයන පාලන පනත යටතේ නව ගැසට් පත්‍රයක් වහාම නිකුත් කරනු ඇති බවත් මහ බැංකු අධිපතිවරයා කීවේය.

රේගුව හරහා බඩු මෙරටට ආවත් ඒ සඳහා දැනට මුදල් ගෙවීම් හවාලා සහ උණ්ඩියල් ක්‍රම යටතේ බැංකු ක්‍රමයෙන් පිටතින් සිදුවන බව ද මේ නිසා බැංකු ක්‍රම ඇතුළත විදේශ විනිමය හිඟයක් පවතින බව ද මහ බැංකු අධිපතිවරයා සඳහන් කළේය.

මේ තත්ත්වය වැළැක්වීම සඳහා පියවර කිහිපයක් ගන්නා බව ද එහි පළමු පියවර ලෙස මෙසේ ආනයන සඳහා මුදල් ගෙවීම විධිමත් බැංකු පද්ධතිය හරහා කළ යුතු බවට සහ විවෘත ගිණුම් හරහා නොකළ යුතු බවට රෙගුලාසි පනවමින් නව ගැසට් නිවේදනය නිකුත් කරන බව ද මහ බැංකු අධිපතිවරයා කීවේය.

අපනයනකරුවන්ට අවශ්‍ය ආනයන ගෙන්වීම සඳහා පමණක් ව්‍යතිරේඛ අවස්ථාවක් ලබා දෙන බව ද ඔහු කීවේය.

මෙසේ අවිධිමත් වෙළෙඳපොළ තුළ සිදුවන විදේශ විනිමය වෙළෙඳාම බැංකු ක්‍රමය තුළට ගැනීමට හැකිවනු ඇතැයි ද ඒ අනුව අදාළ සියලු ආනයනවලට බැංකු ක්‍රමය හරහා පමණක් මුදල් ගෙවීමට සිදුවනු ඇති බව ද ඔහු සඳහන් කළේය.

මේ සමග අවිධිමත් වෙළෙඳපොළ සහ විධිමත් බැංකු ක්‍රමය අතර පවතින විනිමය අනුපාතයේ පරතරය අඩු වී අවිධිමත් වෙළෙඳපොළට ඇති විදේශ විනිමය ඉල්ලුම අඩුවනු ඇති බව ද ආචාර්ය වීරසිංහ කීවේය.

මේ ගැසට් නිවේදනය නිකුත් වී සති දෙකකින් පමණ පසු බැංකු ක්‍රමයෙන් මුදල් ගෙව්වේ නැත්නම් රේගුවෙන් භාණ්ඩ නිදහස් කර ගැනීමට නොහැකි වනු ඇති බව ද මහ බැංකු අධිපතිවරයා කීවේය.

දැනට විදේශ විනිමය අනුපාතය අධිතක්සේරු වී ඇති බවත් ඉතා ඉක්මනින් එම ප්‍රවණතාව ආපස්සට හැරී ස්ථාවර වනු ඇති බවත් මහ බැංකු අධිපතිවරයා කීවේය.

විදේශ සංචාරකයින්ට මෙරටේ විදේශ විනිමයෙන්ම ගෙවීම් කළ යුතු බවට වන නියමය සංචාරක කර්මාන්තයට අහිතකර බව තම අදහස බවත් ඒ නිසා එම නියමය ඉදිරියේදී ඉවත් කිරීමට කටයුතු කරන බවත් ඔහු සඳහන් කළේය.

ඉදිරි මාස දෙකක පමණ කාලයේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග කාර්යමණ්ඩල මට්ටමේ එකඟතාවකට පැමිණීමට හැකිවනු ඇති බවත් ඉන්පසු සති කිහිපයකින් අරමුදල් පහසුකමකට ඇතුළත් වී පළමු ණය වාරිකය ශ්‍රී ලංකාවට ලබා ගැනීමට හැකිවනු ඇති බවත් ඊයේ (29 දා) මාධ්‍ය හමුවේදී දිවයින ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා තවදුරටත් කීවේය.

# විපක්ෂයේ බහුතරය පෙන්වන්න සජබ සූදානම්

අකිත පෙරේරා

සමගි ජනබලවේගයට විපක්ෂයේ පවතින බහුතර බලය ලබන පාර්ලිමේන්තු සතියේදී පෙන්වන බව විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ලක්ෂ්මන් කිරිඇල්ල මහතා 'දිවයින ඉරිදා සංග්‍රහය'ට පැවසීය.

කෙසේ වෙතත් එම බහුතර බලය පෙන්වන්නේ කෙසේ දැයි කියා ඒ මහතා සඳහන් කළේ නැත.

මේ අතර ආණ්ඩුවට එරෙහිව සමගි ජන බලවේගය විසින් අත්සන් කරගෙන යනු ලබන විශ්වාසභංග යෝජනාව ද ලබන සතියේදී කථානායකවරයාට භාර දීමට එම පක්ෂය සැලසුම් කර තිබේ.

මේ වන විට එම යෝජනාවට මන්ත්‍රී අත්සන් 120ක් පමණ පවතින බව විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා පෙර ප්‍රකාශ කර තිබිණ. කෙසේවෙතත් විශ්වාසභංග යෝජනාව භාර දීම සම්බන්ධයෙන් අවසන් තීරණය ගනු ලබන්නේ පාර්ලිමේන්තු රැස්වීම්වලට පෙර පවත්වන කණ්ඩායම් රැස්වීමේදී බව ද ලක්ෂ්මන් කිරිඇල්ල මහතා සඳහන් කළේය.

# අවසන් එකඟතාවකට සෙසු පක්ෂ සමග සාකච්ඡා කරනවා

අකිත පෙරේරා

අලුතින් පිහිටුවන අන්තර් පාලන රජයක අවසන් එකඟතාවකට එළඹීමට තවදුරටත් විපක්ෂයේ පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂ සමග සාකච්ඡා කර උත්සාහ කරන බව ඊට පත් කර ඇති මෙහෙයුම් කමිටුවේ සාමාජික හිටපු ඇමැති උදය ගම්මන්පිල මහතා 'දිවයින ඉරිදා සංග්‍රහය'ට පැවසීය.

එවැනි පාර්ශ්ව සමග වන සම්මුතියකින් නව අගමැතිවරයා පත් කිරීම සිදුවනු ඇතැයි ද ඇතැම් විට එහිදී අප නොසිතන කෙනෙකු 'අගමැති' විය හැකි යැයි ද ඔහු කීවේය.

දැනට අන්තර් පාලන ආණ්ඩුවකට විරුද්ධත්වය පළ කර ඇති සජබ, ජවිපෙ සමග ද යළි සාකච්ඡා කරන අතර එජාපය හා සෙසු පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු පක්ෂවල නායකයන් සමග ද මේ අනුව යළිත් ඉතා ඉක්මනින් සාකච්ඡා කෙරෙනු ඇති බව ද ඔහු කීය.

# ඇමරිකානු පුරවැසිභාවය ඇති ශ්‍රී ලාංකිකයන්ගේ පිල්මාට් සොයයි

කීර්ති වර්ණකුලසූරිය

මුදල් විශුද්ධිකරණ සහ දූෂණ ක්‍රියා සිදුකළ ඇමරිකානු පුරවැසියන් වූ ශ්‍රී ලාංකිකයන් පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමට ඇමරිකානු කොන්ග්‍රසය සහ එරට අධිකරණ දෙපාර්තමේන්තුව තීරණය කර ඇත.

ඇමරිකාවේ ක්‍රියාත්මක විදේශ දූෂණ ක්‍රියා පනත යටතේ මෙම විමර්ශන ආරම්භ කෙරේ. ඒ සඳහා වූ යෝජනාවක් කොන්ග්‍රස් මන්ත්‍රී ස්ටීවන් නෝර්ස්පෝඩ් විසින් කොන්ග්‍රස් සභාවට ඉදිරිපත් කර තිබේ.

මෙම කොන්ග්‍රස් පරීක්ෂණයේදී ඇමරිකාවේ පදිංචි ශ්‍රී ලාංකිකයන් අයථා ලෙස බැංකු ගිණුම් පවත්වාගෙන යන බවට හෙළිවීම හෝ දේපළ සහ නිවාස මිලයට ගැනීම ගැන තහවුරුවීම හෝ වුවහොත් එම සියලු දේ රාජසන්තක කර දඩයක්ද නියම කළ හැකිය.

ඇමරිකානු කොන්ග්‍රසය මෙයට පෙරද ශ්‍රී ලංකාවේ හමුදාවට එරෙහිව යෝජනාවක් සම්මත කර තිබුණි.

ඇමරිකානු ආරංචි මාර්ග පැවසුවේ ඇමරිකාවේ පදිංචි ශ්‍රී ලාංකිකයන් 10 දෙනෙකු ගැන මෙම පරීක්ෂණ පැවැත්වෙන බවයි.

# ලයිසන් දීම නවතියි පාස් වූ ලක්ෂ 3කට තවම කාඩ් නෑ

චමින්ද සිල්වා

රටේ පවතින ඩොලර් අර්බුදය නිසා රියැදුරු බලපත්‍ර කාඩ්පත් නිකුත් කිරීමද නතරවී ඇතැයි මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් කාර්යාලය පවසයි.

ඒ අනුව රියැදුරු බලපත්‍ර ලබා ගැනීමට අදාළ පරීක්ෂණවලින් සමත්වූවන් ලක්ෂ තුනකට ආසන්න පිරිසකට මෙතෙක් රියැදුරු බපලපත්‍ර කාඩ්පත් නිකුත් කර නැතැයි එම කාර්යාලයේ ප්‍රකාශකයෙක් සඳහන් කළේය.

මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් කාර්යාලය විසින් මසකට රියැදුරු බලපත්‍ර හැටදහසක් පමණ නිකුත් කරන බවත් 2021 දෙසැම්බර් මස සිට මේ දක්වා අලුතින් රියැදුරු බලපත්‍ර කාඩ්පත් මුද්‍රණය කර නිකුත් කිරීමට නොහැකි වී ඇති බවත් එම ප්‍රකාශකයා පැවසීය.

රියැදුරු බලපත්‍ර කාඩ්පත් ලක්ෂ දහයක් මිලදී ගැනීමට ඉල්ලුම්කර ඇතත් එම කාඩ්පත් මිලදී ගැනීමට අදාළ ණයවර ලිපි නිකුත් කිරීමට අවශ්‍ය ඩොලර් නොලැබීම නිසා මෙම ප්‍රමාදය මතුව ඇතැයි ද මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් කාර්යාලයේ ප්‍රකාශකයා වැඩිදුරටත් සඳහන් කළේය.

# ඛනිජ තෙල් තොග ගබඩාව සිමෙන්ති සංස්ථාවට කෝටි 168 ක් පොලු තියලා

ලලිත් චාමින්ද

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට අයත් කන්කසන්තුරේ පිහිටි තෙල් ටැංකි දෙකක් සහ නළ පද්ධතියක් භාවිතා කිරීම වෙනුවෙන් ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත රාජ්‍ය සමාගම වසර දහයක් තිස්සේ රුපිල් කෝටි 168 ක බදු කුලී මුදල් ගෙවා නැතැයි ජාතික විගණන කාර්යාලය මගින් නිකුත් කළ විගණන වාර්තාවේ සඳහන් වේ.

ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාවට අයත් කන්කසන්තුරේ පිහිටි තෙල් ටැංකි 02 ක් හා නළ පද්ධතිය ලිඛිත ගිවිසුමකට එළැඹීමකින් තොරව ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත රාජ්‍ය සමාගම වෙත 2010 වසරේදී ලබාදී තිබුණි.

මේ සම්බන්ධයෙන් තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2010 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ රුපියල් කෝටි 168 ක මුදලක් සිමෙන්ති සංස්ථාවට ගෙවිය යුතු බවට තක්සේරුකොට තිබිණි. බදු කුලී අය කර ගැනීම සඳහා 2020 ජනවාරි 24 හා ජුනි 30 දිනැති ලිපි මගින් බලශක්ති අමාත්‍යාංශය දැනුවත් කළ ද මේ දක්වා එම මුදල් අයවී නොතිබූ බව විගණන වාර්තාවේ සඳහන් වෙයි.

මෙකී මුදල ලබා ගැනීමට බලශක්ති අමාත්‍යාංශය සමග සාකච්ඡා සිදුකරගෙන යන බව සිමෙන්ති සංස්ථාවේ කළමනාකාරිත්වය විසින් විගණනයට දැනුම් දී ඇත.

# අන්තර්වාර ආණ්ඩුව හදන්න මෙහෙයුම් කමිටුවක්

අකිත පෙරේරා

අන්තර්වාර ආණ්ඩුවක් පිහිටුවීම සඳහා පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම පක්ෂ සමග නව සාකච්ඡා වටයක් පැවැත්වීමට ස්වාධීන මන්ත්‍රී කණ්ඩායම විසින් මෙහෙයුම් කමිටුවක් පත් කර ඇත.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පස්දෙනකුගෙන් සමන්විත මෙම විශේෂ කමිටුව සඳහා නිමල් සිරිපාල ද සිල්වා, අනුර ප්‍රියදර්ශන යාපා, විමල් වීරවංශ උදය ගම්මන්පිල, ටිරාන් අලස් යන මහත්වරුන් පත් කරගෙන තිබේ.

ඒ අනුව මෙම පස්දෙනකුගෙන් යුතු කමිටුව ඉතා ඉක්මනින් දේශපාලන පක්ෂ නියෝජිතයන් සමඟ සාකච්ඡා වට පවත්වන බව පාර්ලිමේන්තු මන්ත්‍රී උදය ගම්මන්පිල මහතා ''දිවයින ඉරිදා සංග්‍රහය''ට පැවසීය.

# හෙට රජයේ නිවාඩු

චමින්ද සිල්වා

මෙවර ජාත්‍යන්තර කම්කරු දිනය ඉරිදා දිනයක යෙදී තිබීම නිසා ඊට පසු දින රජයේ නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට රජය පියවර ගෙන ඇත.

ඒ අනුව හෙට (02 දා) සඳුදා රජයේ නිවාඩු දිනයක් ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් ජේ. ජේ. රත්නසිරි මහතා විසින් ප්‍රකාශයට පත් කර තිබේ.

# පරක්කු වෙන්න එපා පාසල් සිසුන් එන්නත ගන්න

**වෛද්‍ය දීපාල් පෙරේරා**

ප්‍රදීප් ප්‍රසන්න සමරකෝන්

කොවිඩ් තවමත් සමාජයෙන් පහවී ගොස් නොමැති බැවින් පාසල් යන දරුවන්ට නොපමාව කොවිඩ් එන්නත ලබා දීමට උනන්දු වන්නැයි බොරැල්ල රිජ්වේ ආර්යා ළමා රෝහලේ ළමා රෝග විශේෂඥ වෛද්‍ය දීපාල් පෙරේරා මහතා සියලු දෙමාපියන්ගෙන් ඉල්ලා සිටියි.

කොවිඩ් ආසාදනය වූ දරුවන් කීපදෙනකු ළමා රෝහලේ ප්‍රතිකාර ලබන බවද හෙතෙම කීවේය.

දරුවන් අතර කොවිඩ් පැතිරීම යම් මට්ටමකට පාලනය වී ඇත්තේ කොවිඩ් එන්නත ලබාදීම හා සෞඛ්‍ය පුරුදු නිසියාකාරව අනුගමනය කිරීම නිසා බව ද හෙතෙම සඳහන් කළේය.

මෙහිදී තවදුරටත් කතා කළ ළමා රෝග විශේෂඥ වෛද්‍ය දීපාල් පෙරේරා මහතා මෙසේද කියා සිටියේය.

දැන් මේ එන්නත දරුවකු ලබා ගැනීම ඉතා වැදගත්. මොකද කොවිඩ් තවම සමාජයේ තිබෙනවා. අවුරුදු 12 ට අඩු දරුවන්ට තාම මේ එන්නත ලබා දෙන්න අනුමැතිය ලැබිලා නැහැ. නමුත් අවුරුදු 12 ට වැඩි දරුවන්ට එන්නත් මාත්‍රා එකක්ද, අවුරුදු 16 ට වැඩි දරුවන්ට එන්නත් මාත්‍රා දෙකක්ද ලබා දෙනවා. පාසල් යන දරුවො අපි විශේයෙන්ම ආරක්ෂා කරගන්න ඕනෑ.

# සර්ව පාක්ෂික ආණ්ඩුවකට සැමට ආරාධනා කරන්න

# දහදෙනාගේ කණ්ඩායම සඟරුවනෙන් ඉල්ලයි

උපාලි ද සේරම්

සර්ව පාක්ෂික අන්තර්වාර පාලනයකට සහාය දක්වන ලෙස සියලු දේශපාලන පක්ෂ, සංවිධාන, තරුණ කණ්ඩායම් සහ මහජනතාවට යළි ආරාධනා කරන්නැයි ත්‍රෛනිකායික මහනායක ස්වාමීන් වහන්සේලා වෙත ලිපියක් යවමින් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පාර්ලිමේන්තු මන්ත්‍රී දසදෙනාගේ කණ්ඩායම සඳහන් කරති.

රටේ මතුව ඇති ආර්ථික පීඩනයෙන් පීඩාවට පත්වූ ජනතාව වෙතින් මතුවන අර්බුදය දවසින් දවස ශ්‍රී ලංකාවේ ආර්ථිකය වේගයෙන් විනාශ මුඛයට ඇද දමන අවස්ථාවේ ත්‍රෛනිකායික මහනායක ස්වාමීන්වහන්සේලා විසින් සර්ව පාක්ෂික අන්තර්වාර පාලනයක් ඇති කිරීම සඳහා ලබාදුන් උපදෙස් සම්බන්ධව තම කණ්ඩායමේ වන්දනීය ප්‍රණාමය පුදකර සිටින බවද පවසයි.

සර්ව පාක්ෂික ආණ්ඩුවක් සකස් කිරීම ආණ්ඩු පක්ෂයට පමණක් තනිව සිදු කළ හැකි කාර්යයක් නොවන බැවින් ආණ්ඩුවෙන් වෙන්වී ගිය සියලු කණ්ඩායම් හා පාර්ලිමේන්තුව නියෝජනය කරන අනෙකුත් පක්ෂ සමඟ සාකච්ඡා කර ඒකාබද්ධ ප්‍රවේශයක් ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම තම කණ්ඩායම ආරම්භ කර ඇතැයි ද සඳහන් කරයි.

එසේම ආණ්ඩු පක්ෂයට සහ සියලු විපක්ෂ බලවේගවලට මෙම යුගයේ අවශ්‍යතාවය වෙනුවෙන් කැප වන ලෙසද ඉල්ලා සිටියි.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන කේ. පී, එස්. කුමාරසිරි, ලලිත් එල්ලාවල, සුදත් මංජුල, නීතිඥ වසන්ත යාපා බණ්ඩාර, වෛද්‍ය උපුල් ගලප්පත්ති, නීතිඥ උදයන කිරිඳිගොඩ, කරුණාදාස කොඩිතුවක්කු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ගුණපාල රත්නසේකර, අකිල සාලිය එල්ලාවල සහ උදය කාන්ත ගුණතිලක යන මහත්වරු මෙම දස දෙනාගේ මන්ත්‍රී කණ්ඩායම නියෝජනය කරති.

# විදේශ මුදල් සංචිතය ලෑල්ලටම හිඳිලා

ශ්‍යාම් නුවන් ගනේවත්ත

මේ වන විට ශ්‍රී ලංකා මහ බැංකුව සතු විදේශ සංචිත පෙර නොවූ ආකාරයට හිඳී ඇති බව වාර්තා වෙයි. පසුගිය මාර්තු අග වන විට දළ නිල සංචිත ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 1.9 ක් වුවත් එහි ඇති චීන විදේශ විනිමය හුවමාරු පහසුකමේ ඇති මුදල අඩු කළ විට ඉතුරු වන භාවිතා කළ හැකි මුදල් සංචිත ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 200කට පමණ අඩු වෙයි.

එසේම මේ දක්වා අනෙකුත් අත්‍යවශ්‍ය ආනයන සිදු කිරීමට ඩොලර් මුදාහැරීමට විටින් විට සිදුවීම නිසා එම සංචිත ප්‍රමාණයද තවදුරටත් අඩු වී අපේ විදේශ සංචිත තත්ත්වය ලංකාවේ අඩුම අගය දක්වා මේ වන විට පහත වැටී ඇති බවද ආර්ථික හා මූල්‍ය විශේෂඥයෝ පෙන්වා දෙති.

මේ තත්ත්වය හමුවේ දිනෙන් දින පිරිහෙන රුපියල ස්ථාවර කර ගැනීමටද දුෂ්කර තත්ත්වයක් උද්ගත වී තිබෙන බවද වාර්තා වේ.

# ජනපති අගමැති මැයි රැලිවලට නෑ

අනුර බාලසූරිය

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සහ අගමැති මහින්ද රාජපක්ෂ යන මහත්වරු මෙවර මැයි දින රැලි සඳහා සහභාගි නොවෙති.

එබැවින් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට අයත් වෘත්තීය සමිති නායකයන්ගේ ප්‍රධානත්වයෙන් මැයි දින රැලියක් අද (01 දා) සවස 2.00 ට නුගේගොඩ ආනන්ද සමරකෝන් එළිමහන් පීඨයේදී පැවැත්වේ.



# නාඳුනන අය නොමිලේ දෙන මත්පැන් වීදුරුවට කෑදර වෙන්න එපා....

# රට පුරාම මෙය ක්‍රියාත්මකයි!

# බාර්වලට ගිහින් සූර්වෙන්නේ ප්‍රවේසමෙන්!

## සූර් වෙන අය සුද්ධ කරන අමුතු ගේමක්...

සෙල්වා නඩරාජන් ජා-ඇල ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකි. වයස අවු 48කි. තිදරු පියෙකි. කලක් ඔහු ගල්කිස්ස ප්‍රදේශයේ හෝටලයක් පවත්වාගෙන ගියේය. මත්පැන්වලට දැඩි ලෙස ඇබ්බැහි වී සිටි ඔහුට එම හෝටලය නිසියාකාරව පවත්වාගෙන යෑමට නොහැකි විය. එහි අවසන් ප්‍රතිඵලය වූයේ හෝටලය වසා දැමීමයි.

තම එකම ආදායම් මාර්ගය වූ හෝටලය වසා දැමූ පසු ඔහුට ජීවත් වීම සඳහා ස්ථිර ආදායම් මාර්ගයක් නොතිබුණි. එම නිසා ඔහු දස අතේ කල්පනා කළේ ජීවත් වීම සඳහා මුදල් සොයා ගන්නේ කෙලෙසද කියාය. ඒ අනුව දිනක් ඔහු මෙලෙස සිතුවේය.

"දැන් අතේ සල්ලිත් නැහැ. එන්න එන්නම ගෙදර ප්‍රශ්නත් වැඩියි. දරුවන්ට හරියට කන්න දෙන්න විදිහකුත් නැහැ. සල්ලි නැහැ කියලා ආයි හොටෙල් කරලා මැරෙන්න බැහැ. මේ වයසත් එක්ක ජොබ් එකකුත් කරන්න බැහැ. ඒක නිසා සල්ලි හොයාගන්න වෙන විදිහක් කල්පනා කරන්න ඕනා."

"අයිස් කුඩු වැනි මත්ද්‍රව්‍ය විකුණන්නත් බැහැ. ඒවා විකුණලා අහු වුණොතින් මාස ගණනක් හිරේ ළගින්නත් වෙනවා. ග්‍රෑන්ඩ්පාස්වල මගේ යාළුවෙක් ඉන්නවා. මිනිහා ළඟ විසකුඩු තියෙනවා. ඒ විස කුඩු මිනිස්සුන්ට දුන්නහම සිහිය නැතිවෙනවා. ඒ හරහා ගේමක් ගහන්න පුළුවන් නම් කිසි කරදරයක් නැතුව හොඳ ගාණක් හොයාගන්න පුළුවන්. මේකට කාව හරි සම්බන්ධ කර ගන්නත් ඕනා. සින්නයියා තමයි විශ්වාසවන්ත මිනිහා."

සින්නයියා යනු මඩකලපුව ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකි. වයස අවුරුදු හැත්තැවකි. ලොන්ඩරියක සේවය කළ ඔහු සෙල්වාගේ මිතුරෙකි. සෙල්වා එම පුද්ගලයාව දැන හඳුනා ගන්නේ ගල්කිස්ස ප්‍රදේශයේ හෝටලය පවත්වාගෙන ගිය කාලය තුළදීය.

දිනක් සෙල්වා සහ සින්නයියා මෙලෙස කතාබස් කළහ.

"මගේ හෝටලය වැහුවට පස්සෙ ආර්ථික අතින් මම ගොඩක් වැටිලා ඉන්නේ."

"මමත් එහෙම තමයි. ලොන්ඩරියේ දැන් වැඩත් නැහැ හරියට."

"ඒක තමයි. මේ රටේ තියෙන තත්වෙත් එක්ක ආයි බිස්නස් එකක් කරන්න හිතන්නවත් බැහැ."

"ඒකනම් ඇත්ත සෙල්වා. සමහර දවස්වල හරියට කෑම වේලක්වත් කන්න විදිහක් නැහැ."

"මටත් ඔය ප්‍රශ්න ටිකම තමයි තියෙන්නේ."

"ඉතිං අපි මොකද කරන්නේ."

"කරන්න නියම වැඩක් තියෙනවා. ඒක කියන්න තමයි මම කතා කළේ."

"මොකක්ද අප්පා ඒ. දන්නවනේ මම ඕන දෙයකට එනවා."

"මට මේ වැඩේට හොඳ විශ්වාසවන්ත කෙනෙක් ඕනා. ඒක නිසා තමයි මම උඹට කතා කළේ."

"දන්නවනේ මගේ හැටි. බෙල්ල කැපුවත් මම පාවා දෙන්නේ නැහැ. මොකක්ද දැන් ඔය කරන්න හදන වැඩේ."

"මගේ යාළුවෙක් ඉන්නවා ග්‍රෑන්ඩ්පාස්වල. මිනිහා ළඟ විස කුඩු තියනවා. ඒවා මිනිස්සුන්ට දුන්නාම සිහිය නැතිවෙනවා."

"ඉතින්."

"අපි ඒ කුඩු මිනිස්සුන්ට බොන්න දීලා උන්ව සුද්ද කරමු."

"කොහොමද මිනිස්සුන්ට ඒවා දෙන්නේ."

"හැම තැනදිම දෙන්න බැහැ. බාර් එකකදී තමයි දෙන්න ඕනා. ඒකට මගෙ ළඟ ප්ලෑන් එකක් තියෙනවා. ඉක්මනට ඇවිත් මාව හම්බවෙන්න."

"මම හෙටම එන්නම්. අපි ඇවිත් ඉතුරු ටික කතා කරමු."

පසු දිනම සින්නයියා සෙල්වා මුණ ගැසීමට පැමිණියේය. එහිදී සෙල්වා විස කුඩු ලබාදී මිනිසුන්ගෙන් මුදල් සහ වටිනා ද්‍රව්‍ය පැහැර ගන්නා ආකාරය ගැන විස්තර කළේය. ඉන් පසු දෙදෙනා ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශයේ සෙල්වාගේ මිතුරා මුණගැසීමට ගියේය. ඒ විසකුඩු ලබාගැනීම සඳහාය.

සෙල්වා එම පුද්ගලයාගෙන් විස කුඩු ග්‍රෑම් කිහිපයක් මිලදී ගත්තේය. එලෙස මිලදී ගත් පසු යළි නිවසට පැමිණි ඔවුහු තව මොනවාදෝ එකතු කරමින් ඒවා කුඩා පැකට් බවට පත්කර ගත්හ. අවසානයේ කුඩා පැකට් දෙකක් රැගෙන සවස හයට පමණ ඔවුහු නිවසින් පිටවූහ. එලෙස පැමිණි දෙදෙනා දෙමටගොඩ ප්‍රදේශයේ තැබෑරුමක් අසල නැවතී මෙලෙස කතාබස් කළහ.

"සින්නයියා හොඳට ඇහැගහගෙන හිටපන් තැබෑරුමට බොන්න යන අය ගැන."

"හරි හරි මං බලාගෙන ඉන්නේ."

"යමක් කමක් තියෙනවා වගේ පෙනෙන තනියෙන් යන කෙනෙක් කොහොම හරි හොයාගන්න ඕනා."

"හරි හරි අපි බලමු."

පැයක් පමණ ඔවුන් තැබෑරුම අසල එලෙස බලා සිටියේය. එහෙත් එවැනි පුද්ගලයකු පැමිණියේ නැත. අවසානයේ දෙදෙනා තැබෑරුම ඇතුළට යෑමට තීරණය කළහ. ඇතුළට ගිය දෙදෙනා මද වෙලාවක් ඇතුළත නිරීක්ෂණය කළහ. එහිදී එක් ස්ථානයක තනිවම මත්පැන් පානය කරමින් සිටින පුද්ගලයෙකු දුටුවේය.

"සින්නයියා අර ඉන්නේ අපි හොයන ජාතියෙ මිනිහෙක්. කොහොම හරි එතනට ගිහිල්ලා මිනිහා එක්ක බොන්න සෙට් වෙන්න ඕනා."

"හරි සෙල්වා අපි මිනිහා ළඟට යමු."

එලෙස දෙදෙනා තනිව මත්පැන් පානය කරමින් සිටි පුද්ගලයා අසලට ගොස් මෙලෙස විමසූහ.

" සර් අපි පිට පළාතකින් ආවෙ. වැඩිය මේ පැත්ත ගැන දන්නේ නැහැ.පොඩ්ඩක් මෙතනින් වාඩි උනාට කමක් නැද්ද?"

"ප්‍රශ්නයක් නැහැ වාඩිවෙන්න. මම බීල ඉවරයි දැන්."

"අපි නුවර ඉඳන් කොළඹ ආවේ ඥාතියකුගේ ගෙදර. ඉතින් පොඩ්ඩක් බොන්න එළියට ආවා."

"ආ එහෙමද?".

"ඔව්. සර් දැන්ම යන්න එපා අපේ ගාණේ ටිකක් බොමු."

"බැහැ බැහැ... මම හොඳටම බීලා ඉන්නේ."

"එහෙම කරන්න එපා අපි නරක මිනිස්සු නොවෙයි. ගම්වල හැදුණු වැඩුණු අය. අපි ආසයි සර් ඉන්නව නං ටිකක් වෙලා."

"හරි හරි ඕගොල්ලො බල කරනවා නම් ටිකක් වෙලා ඉන්නම්."

"අනේ ඒක ලොකු දෙයක්. අපේ ගාණේ සර් තව ටිකක් බොන්න ඕනා."

ඒ අනුව සෙල්වා මත්පැන් බෝතලයක් ඇනවුම් කළේය. මත්පැන්වලට දැඩි කෑදරකමක් දැක්වූ එම පුද්ගලයා සෙල්වා සහ සින්නයියා සමඟ යළි මත්පැන් පානය කළේය. පැය බාගයක් පමණ විවිධ තොරතුරු කතා බහ කරමින් ඔවුන් තිදෙනා මත්පැන් පානය කළහ. ඒ අතරතුර සෙල්වා ආගන්තුක පුද්ගලයාගේ වීදුරුවට ඉතාමත් සූක්ෂම ලෙස ළඟ තිබූ විසකුඩු මුසු කළේය.

විසකුඩු මිශ්‍ර කළ මත්පැන් වීදුරුව පානය කළ පසු එම පුද්ගලයාට කරකැවිලි ගතියක් ඇති විය. ඒ සමගම ඔහු මේසය මත ඔළුව ගසා ගත්තේය. තප්පර කිහිපයක් මොන මොනවාදෝ මිමිණූ ඔහුට එක්වරම සිහි නැති විය. ඉන්පසු සෙල්වා සහ සින්නයියා අන් අයට නොපෙනෙන අයුරින් ඔහු ළඟ තිබූ මුදල් ඇතුළු සියලුම වටිනා දෑ සොරා ගෙන මත්පැන් පානය කළ බිලත් නොගෙවා හොර රහසේ මෙම ස්ථානයෙන් පැන ගත්හ.

එදින ඔවුන් එම පුද්ගලයාගේ පසුම්බියේ තිබූ රුපියල් අටදහසකට ආසන්න මුදලක්, ඔහුගේ අත පැළඳි ඔරලෝසුව සහ රන් මුදුව ද සොරා ගෙන නිවසට පැමිණියහ.

"සින්නයියා බලපන් මගේ අයිඩියා එක කොහොමද කියලා."

"ඒකනෙ අපිට කිසිම ගේමක් නැතුව වැඩේ කරන්න පුළුවන් උනානේ."

"ඒකනෙ කියන්නෙ. අපිට දැන් කිසිදු මහන්සියක් වෙන්නේ නැතිව මේ විදියට මුදල් හොයන්න පුළුවන්."

"ඒක තමයි. අපි මේක දිගටම කරගෙන යමු."

"හෙට උදේම ගිහිල්ලා ඔය මුද්ද උගස් තියන්න ඕනා. පවුමකටත් වැඩියි වගේ හොඳ ගාණක් ගන්න පුළුවන්."

"පවුමේ එවා නොවෙයි පවුම් තුන හතරේ ඒවා අපි හොයන්න ඕනා."

"හරි හරි ටිකක් ඉවසගෙන හිටපන්."

එතැන් සිට දෙදෙනාගේ රැකියාව වූයේ එයයි. සමහර දිනවල සෙල්වා තනියම පවා ගොස් මත්පැන් සමඟ විස කුඩු මිශ්‍රකර මිනිසුන්ට සුද්දය දුන්නේය. කලක් යද්දී මේ පිළිබඳව සෙල්වාගේ මිතුරන් කීපදෙනෙක්ද දැන ගත්තේය. එම මිතුරන්ද සෙල්වා මුණගැසීමට පැමිණ ඔහුගෙන් මුදලට විසකුඩු ලබාගෙන මෙම වංචාව සිදුකර ගෙන ගියේය. කලක් යද්දී මේ පිළිබඳව කටින් කට ගොස් විශාල පිරිසක් සෙල්වා මුණගැසීමට පැමිණ විස කුඩු මිලදී ගත්තේය. ඒ හරහා ද සෙල්වා විශාල මුදලක් සෙව්වේය.

මාස කීපයක් ගත වූ පසු සෙල්වා ජාඇල ප්‍රදේශයේ තම ඥාති සහෝදරියකගේ ඉඩමක සින්නයියාට නිවසක් සාදා ගැනීමට ද අවසර දුන්නේය. කලක් තිස්සේ මොවුන් දෙදෙනා එකතු වී මෙම වංචා සහගත ක්‍රියාවලිය දිගටම සිදුකරගෙන ගියේය. කොළඹ දිස්ත්‍රික්කය තුළ පමණක් නොව කොළඹින් පිට විවිධ පළාත්වලට පවා ගොස් කිසිදු බියක් සැකක් නොමැතිව මොවුන් මෙම වංචා සහගත ක්‍රියාව සිදු කළේය.

දැනට මාස කිහිපයකට ඉහතදී මොවුන් දෙදෙනා නුවර ප්‍රදේශයට පැමිණියේය. ඔවුන්ගේ අදහස වී තිබුණේ මාසයක් දෙකක් පමණ නුවර ප්‍රදේශය තුළ සැරිසරා එම ජාවාරම සිදු කරගෙන යෑමටයි. එලෙස පැමිණි ඔවුන් දෙදෙනා දිනක් කඩුගන්නාව ප්‍රදේශයෙන් රා පානය කර මාවනැල්ල ප්‍රදේශයට ගියහ. ඒ සල්ලි යහමින් ඇති මිනිසකු කොටු කර ගැනීමටයි.

මාවනැල්ල තැබෑරුමක් අසල ඇස ගසාගෙන සිටි ඔවුන් දෙදෙනාට ධර්මලිංගම් නමැති මිනිසකු සමග මිතුරු වීමට හැකි වූහ. ධර්මලිංගම් යනු මාවනැල්ල නිව් ලෑන්ඩ් වත්තේ පදිංචිව සිටි හැට හැවිරිදි පුද්ගලයෙකි. ඔහු කසාද දෙකක් කරගත් අයෙකි. පළමු කසාදයෙන් දරුවන් තිදෙනකුත් දෙවැනි කසාදයෙන් දරුවන් තිදෙනෙකුත් ඔහුට සිටියේය. එහෙත් ඔහු පළමු බිරිඳ අතහැර ජීවත් වූයේ දෙවැනි බිරිඳ සමඟයි.

පෙබරවාරි 26 ඔහුගේ දෙවැනි බිරිඳගේ උපන් දිනය යෙදී තිබුණි. එදින ඔහු බිරිඳ සහ දරුවන් තිදෙනා සමග මාවනැල්ල නගරයට ගොස් ඔවුන්ට ඇඳුම් පැළඳුම් කෑම බීම ආදිය මිලදී ගෙන දුන්නේය. ඉන්පසු ඔවුන් ත්‍රිරෝද රථයක නංවා නිවස වෙත පිටත් කර යැව්වේය.

බිරිඳ සහ ළමයි එලෙස පිටත් කර යැවූ පසු ඔහු කෙලින්ම ගියේ තැබෑරුම වෙතයි. සෙල්වා සහ සින්නයියා ඔහුට මුණගැසෙන්නේ එම අවස්ථාව තුළදීය.

විනාඩි කිහිපයක් ඇතුළත ධර්මලිංගම් සමග ලොකු සම්බන්ධතාවයක් ඇති කර ගැනීමට ඔවුන් දෙදෙනා සමත් වූහ. ඒ සමග සෙල්වා, ධර්මලිංගම් මෙලෙස පැවැසුවේය.

"අයියේ මගේ ගාණෙ අරක්කු බෝතලයක් බොමු."

"එපා එහෙම හරි නැහැනේ."

"ඒක ප්‍රශ්නයක් නැහැ. අයියා දැක්ක ගමන් කියන්න පුළුවන් හොඳ පුද්ගලයෙක් කියලා."

"නැහැ මමත් ගාණක් දෙන්නම්."

"අයියගේ සතයක්වත් එපා අපිත් එක්ක බොන්න විතරක් එන්න."

එලෙස පැවසූ සෙල්වා මත්පැන් බෝතලයක් මිලදී ගත්තේය. එලෙස මිලදී ගෙන යළි ධර්මලිංගම්ට මෙලෙස පැවසුවේය.

"අයියේ මෙතන බොන්න බැහැ. අපි නිදහස් තැනකට යමු."

"කොහෙටද අපි යන්නේ."

"මා ඔය තියෙන්නෙ මේ ළඟනේ. අපි එතනට ගිහිල්ලා බොමු."

ධර්මලිංගම් ද එම යෝජනාවට කැමැති විය. ඉන් පසු තිදෙනා මා ඔය ගඩොල් පාලම යටට ගොස් මත්පැන් පානය කිරීමට පටන් ගත්හ. පැය බාගයක් පමණ ඔවුන් ආ ගිය තොරතුරු විමසමින් මත්පැන් පානය කළේය. ඒ අතරතුර සෙල්වා සුපුරුදු පරිදි ධර්මලිංගම්ගේ මත්පැන් වීදුරුව ට ඉතාමත් සූක්ෂම අයුරින් විස කුඩු එකතු කළේය.

ඒ කිසිත් නොදත් ධර්මලිංගම් එම මත්පැන් වීදුරුව ද එක හුස්මට පානය කළේය. ගතවූයේ සුළු මොහොතකි. ඔහු ගල් තලාව මත සිහිසුන්ව ඇද වැටුණේය. ඒ සමගම ඔහු සන්තකයේ තිබූ මුදල් සෙල්වා ගත්තේය. එයට අමතරව ඔහුගේ පසුම්බියේ තිබූ බැංකු කාඩ්පත ද ඔහුට හසුවිය. එම බැංකු කාඩ්පතෙ රහස් අංකය ද එම පසුම්බිය තුළ තිබුණි.

බැංකු කාඩ් පත සමඟ රහස් අංකය තිබීම ඔවුන්ට සතුට දනවන කාරණයක් විය. අවශ්‍ය දෑ ගත් පසු සෙල්වා "අපි මෙතනින් ඉක්මනට යමු යැයි" සින්නයියා ට පැවසුවේය.

ඔවුන් එලෙස පිටත් වීමට සූදානම් වනවාත් සමගම අඩසිහියෙන් සිටි ධර්මලිංගම් අවදි වීමට උත්සාහ කළේය. එය දුටු සෙල්වා කලබල විය. වහාම ඔහුගේ අවසන් හුස්ම හෙළන තුරුම ධර්මලිංගම්ගේ ගෙල සිර කර ගෙන සිටියේය. විනාඩි කිහිපයක් ජීවිතය බේරා ගැනීම සඳහා ධර්මලිංගම් සටන් කළේ ය. එහෙත් පලක් වූයේ නැත. එලෙස ධර්මලිංගම් මරා දැමූ සෙල්වා සහ සින්නයියා එම ස්ථානයෙන් පිටව ගියහ.

එලෙස ගිය ඔහු පළමුව මාවනැල්ල නගරයේ තිබූ ඒටීඑම් යන්ත්‍රයක් වෙත ගොස් ධර්මලිංගම්ගේ බැංකු කාඩ්පතෙන් ලක්ෂ එකහමාරක මුදලක් ලබා ගත්තේය. එම මුදල්වලින් රුපියල් දහදාහක මුදලක් සින්නයියාට දුන්නේය. ඉන්පසු දෙදෙනාම නුවර බලා පිටත් විය.

නුවර නගරයේ දී තවත් ඒටීඑම් යන්ත්‍රයකින් රුපියල් පහළොස් දහසක මුදලක් සෙල්වා යළි ලබා ගත්තේය. එතැනින් නොනැවතුණු ඔහු රෙදි සාප්පුවකට ගොස් රුපියල් තිස් හතරදාහක පමණ ඇඳුම් සහ සුපිරි වෙළෙඳ සලකින් රුපියල් දහහත්දහසක පමණ ආහාර ද්‍රව්‍ය ද මිලදී ගත්තේය. ඉන් පසු දෙදෙනා බස් රථයකින් කොළඹ බලා පැමිණියහ.

කොළඹට පැමිණි සෙල්වා යළි මුදල් ලබා ගැනීමට උත්සාහ කළේය. එහෙත් එම ගිණුමේ මුදල් නොතිබුණි. ඉන්පසු ඔහු එම බැංකු කාඩ්පත අසල තිබූ තැපැල් පෙට්ටියකට දමා සින්නයියා සමග කිසිවක් සිදු නොවූ අයුරින් නිවෙස් බලා ගියහ.

රාත්‍රී එකොළහ පසුවීත් ධර්මලිංගම් නිවසට නො පැමිණීම නිසා ඔහුගේ දෙවන බිරිඳ සහ දරුවන් සිටියේ ඉමහත් චකිතයකිනි. ඔහුගේ ජංගම දුරකථනය ද ක්‍රියා විරහිත කර ඇත. වෙන කිසිම දිනෙක මෙසේ ප්‍රමාද වී නිවසට පැමිණ නොමැත. දන්නා කියන සෑම තැනකින්ම ඔහු ගැන විමසුවේය. එහෙත් කිසිදු තොරතුරක් සොයා ගැනීමට නොහැකි විය. අවසානයේ ඔවුන් මාවනැල්ල පොලීසියට ගොස් මේ පිළිබඳව පැමිණිලි කළේය.

පසු දින ද ඔහු ගැන කිසිදු තොරතුරක් නොමැත. පොලිසියට ඔහු පිළිබඳව වැදගත් තොරතුරක් සොයා ගැනීමට නොහැකි විය. ඒ අතර මා ඔය අසල මියගිය පුද්ගලයෙකුගේ සිරුරක් තිබෙන බවට තොරතුරක් ලැබුණි. පොලිසිය වහාම ගොස් ඒ පිළිබඳව සොයා බැලුවේය. එහි දී දැනගන්නට ලැබුණේ එම සිරුර ධර්මලිංගම්ගේ බවයි.

පොලිස් පරීක්ෂණවලදී අනාවරණය වූයේ එය මනුෂ්‍ය ඝාතනයක් බවයි. එහෙත් ඝාතකයන් පිළිබඳ කිසිදු හෝඩුවාවක් සොයා ගැනීමට පොලිස් නිලධාරීන්ට නොහැකි විය. පසුව පොලිසිය මාවනැල්ල නගරයේ සීසීටීවී කැමරා පරීක්ෂා කළේය. එහිදී ඔහුට දැනගන්නට ලැබුණේ ධර්මලිංගම් තවත් පුද්ගලයන් දෙදෙනකු සමග මත්පැන් මිලදී ගන්නා ආකාරයයි. එහෙත් අනෙක් පුද්ගලයන් දෙදෙනා පිළිබඳ සොයා බැලුවත් කිසිදු හෝඩුවාවක් සොයා ගැනීමට ඔවුනට නොහැකි විය.

එම ඝාතනය සිදු වී මාසයක් පමණ ගත විය. එහෙත් කිසිදු තොරතුරක් සොයාගැනීමට පොලීසියට නොහැකි විය. ඒ අතර කෑගල්ල පොලිසියට තවත් පැමිණිල්ලක් ලැබුණි. ඒ හිටපු බන්ධනාගාර නිලධාරියකුගෙනි.

ඔහු පොලිසියට පවසා තිබුණේ බස් නැවතුම්පොළ දී දැනගත් පුද්ගලයකු සමග මත්පැන් පානය කිරීමට ගොස් සුළු මොහොතකට පසු තමා සිහිසුන් වූ බවයි. ඉන් පැය භාගයකට පමණ පසු අසිහියෙන් මෙන් මහ පාරට පැමිණි ඔහු රෝහල්ගත වූ බවයි. පසුව දැන ගන්නට ලැබුණේ ඔහුගේ රන් ආභරණ, මුදල් සහ ජංගම දුරකථනය මත්පැන් පානය කරමින් සිටි පුද්ගලයා රැගෙන ගොස් ඇති බවයි.

පොලිස් නිලධාරීහු එම සිද්ධිය පිළිබඳ පුළුල් පරීක්ෂණයක් පැවැත්වූහ. ඒ අනුව පැමිණිලිකරුගේ නැති වූ ජංගම දුරකථනය ඔස්සේ පරීක්ෂණ අරඹා එම සැකකරු අත්අඩංගුවට ගැනීමට පොලිස් නිලධාරීන්ට හැකි විය. අත්අඩංගුවට ගත් පුද්ගලයා මීට පෙර ද විසකුඩු ලබාදෙමින් මිනිසුන් සිහිසුන් කර මුදල් සහ රන් ආභරණ සොරාගෙන තිබුණි. ඒ පිළිබඳව පැමිණිලි කිහිපයක් විවිධ පොලිස් ස්ථානවල පවා තිබුණි.


පරීක්ෂණ සිදුකළ පොලිස් නිලධාරීන් ධර්මලිංගම් ගේ ඝාතකයන් පිළිබඳව ද යම්කිසි තොරතුරක් මෙම සැකකරුගෙන් දැනගත හැකි යැයි සිතා සීසීටීවීවලින් ලබාගත් ඡායාරූප ඔහුට පෙන්නුවේය. එහිදී මෙම සැකකරු එහි සිටි එක් පුද්ගලයෙක් හඳුනාගත්තේය. ඒ අනුව ඔහු පැවසුවේ සැකකරු කොළඹ ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකු බවයි.

පොලිස් නිලධාරීහු වහාම ක්‍රියාත්මක වී කොළඹ ප්‍රදේශයේ පොලිස් ස්ථානවලට මෙවැනි පැමිණිලි ලැබී ඇත්දැයි සොයා බැලූහ. එහි දී දැනගන්නට ලැබුණේ මෝදර පොලිසියට ද මෙවැනි ආකාරයේ පැමිණිල්ලක් ලැබී ඇති බවයි. ඒ අනුව පරීක්ෂණ පැවැත්වූ පොලිස් නිලධාරීන්ට ධර්මලිංගම් ඝාතනයේ ප්‍රධාන සැකකරුවන් වන සෙල්වා සහ සින්නයියා ජාඇල ඔහුගේ නිවසේදී ම අත්අඩංගුවට ගැනීමට හැකි විය. එලෙස අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමේදී ඔවුන් ධර්මලිංගම්ගේ ඝාතනය ඇතුළු සිදු කළ සියලුම අපරාධ පිළිබඳ තොරතුරු පැවසුවේය. එයට අමතරව සෙල්වා පැවසුවේ තවත් බොහෝ පිරිසකට සිහිසුන් වන විසකුඩු ඔහු මුදලට විකුණූ බවයි.

ඒ අනුව පෙනී යන්නේ තැබෑරුම් අසලදී හෝ වෙනත් ස්ථානයක මිතුරු වී තමන් ගාණේ මත්පැන් පානය කිරීමට ආරාධනා කර විසකුඩු දමා පුද්ගලයන් සිහිසුන් කර ඔවුන්ගේ වටිනා දෑ සොරා ගැනීමේ කල්ලියක් බිහි වී ඇති බවයි. එබැවින් ඔබත් මත්පැන් පානය කරන අයකු නම් මෙවැනි පුද්ගලයන්ගෙන් ප්‍රවේශම්වීමට වගබලාගන්න.

● ගයාන් සමරසිංහ

# රැජිනගේ පළමු ලංකා ගමනේදී ඇයට හමුවූ ඔහු



සිදුවීම් නා නා ප්‍රකාර විය හැක. විශේෂයෙන් කුඩා කල සිදුවීම් මැරෙන තුරා මතකයෙන් බැහැර නොවන බව දූනට අවුරුදු 75ක ජීවන යාත්‍රාවේ නියැළෙන මා හට පසක් වූ බව පවසන්නට සුදුසුම අවස්ථාව උදා වූයෙන් මේ තාකල් කල්මැරූ මතකය සටහන් කිරීම භාග්‍යයක් සේ සලකමි.

දීර්ඝ කාලයක් රජ කිරුළ දරා රජකම් කළ ඉතිහාසගත උත්තමාවිය වූ 2 වැනි එළිසබෙත් මහ රැජිනගේ අවුරුදු 96 ජන්ම දිනය අප්‍රේල් 19 වැනි දින සැමරූ අවස්ථාවේදී මාගේ කුඩා අවදියේ දී සිට මැරෙන තුරා අමතක කළ නොහැකි ඒ අමරණීය තත්පර කිහිපය නැවත නැවත මතකයේ රඳා පැවතීමට භාග්‍ය උදාකර දුන් ඒ උත්තමාවියට 'සුභ උපන් දිනයක් වේවා' කියා ප්‍රාර්ථනා කරන අතරතුර එතුමියට ගෞරවයක් වශයෙන් මෙසේ ලියා සිටිමි.

1954 වර්ෂයේදී ශ්‍රීමත් ජෝන් කොතලාවල අගමැතිතුමාගේ පාලන කාලයේදී 2 වැනි එළිසබෙත් මහ රැජිනගේ පළමු ලංකා සංචාරයේදී කොළඹ නගරය අවට සැරිසැරීමේ එක් අවස්ථාවක් වූයේ කොළඹ 3, කොල්ලුපිටියේ 'ගල් පල්ලිය' නමින් ප්‍රසිද්ධ එංගලන්ත සභාව අයත් 'සාන්ත මයිකල් දේවස්ථානයේ දේව මෙහෙයට සහභාගි වීමයි.

එතුමිය පිළිගැනීමට වයස අවුරුදු 7ක් වූ මා 'සාන්ත මයිකල් පාසලේ ඉගෙනුම ලබමින් පන්තියේ කුඩාම ශිෂ්‍යයා (හුරුබුහුටි) වශයෙන් සිටි නිසා මගේ පන්තිය භාර ඉංග්‍රීසි ගුරුවරිය වූ 'ගුණතිලක ගුරු මෑණියෝ' විසින් දේවස්ථානයේ ඇතුළට පිවිසෙන පඩිපෙළේ පහළ සිට ඉහළට ශිෂ්‍යයන් පෙළ ගැස්සූ අතර ඉහළම පඩියේ සිටි මා හට උදාවූ ඒ වාසනාව කෙසේදැයි පවසනවා නම් පඩිපෙළේ ඉහළට නැගී ආ මහ රැජිනගේ සුදු අත් වැසුම් ලාගත් දකුණතින් මගේ 'ඔළුව' තත්පර කිහිපයකට පිරිමැද, නිකට ද අල්ලා වූ දක්වූ ඒ සිනාමුසු මුව මඬල මතකයට එන සෑම අවස්ථාවකදීම, අමුතු චිත්ත ධෛර්යයක් හා ආත්ම විශ්වාසයක් උද්දීපනය වන නිසා කලකිරීමක් හෝ කිසිදු පසුබෑමක් නොවන බව පවසන්නේ අවංකවමය.

මගේ ජීවිතයේ දෙමව්පියන්ගේ ආදරය, කරුණාවට අමතරව පිටස්තර අයෙකුගෙන් ලැබුණු ඒ 'තත්පර පිරිමැදීම හා ඇල්ලීම' කෙනෙකුට පවසන අවස්ථාවකදී නෙතට කඳුළු එන්නේ නිරායාසයෙනි.

දෛවයේ හාස්කම කෙසේ වීද යත්, වර්ෂ 1974 සිට වර්ෂ 2001 වන තෙක් පිටරට නැව් සමාගම් වාණිජ නාවික සේවයේ යෙදුණු මා හට එංගලන්තයට යෑමට අවස්ථා කිහිපයක් උදාවූ හෙයින් 'බකිංහැම් මාළිගය', 'කිව් උද්‍යානය', 'ලන්ඩන් අයි' වැනි සංචාරකයෙක් නැරඹිය යුතු තැන් දූකබලා ගන්නට ලැබීම භාග්‍යයක් ලෙස සලකන අතර බෞද්ධ පිළිගැනීම් අනුව යහපත් අය දූකීමත්, යහපත් අයගේ පහස ලබන්නටත් පෙර පින් අනිවාර්යයෙන්ම තිබිය යුතු බව සක්සුදක් සේ තරයේ විශ්වාස කරමි.

● එම්. එම්. සී. රත්නායක
අංක: 126/3, 2 වෙනි පටුමග,
සිරිමංගල පාර,මාකොළ දකුණ - මාකොළ.



# බිලක බර ජනතාවට පටවන රට අඳුරේ තියන විදුලි මාෆියාවේ පැටිකිරිය මෙන්න

විදුලිබිල සියයට සියයකින් ඉහළ දැමිය යුතු බවට ලංකා විදුලිබල මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසම් සභාවෙන් ඉල්ලා තිබුණද ඒ සඳහා අවසර හිමිනොවීය. එහෙත් කොයි මොහොතක හෝ විදුලිබිල වැඩිවිය හැකි බවට රටවුන් තුළ නම් සැකයක් පවතී. මක්නිසාද යත් මේ වනවිට ගෑස්, ඉන්ධන ඇතුළු සෑම භාණ්ඩයක හා සේවාවකම මිල හත්අට ගුණයකින් වැඩිවී තිබේ. මේ වනවිට රටවුන් දැඩි ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටිති විදුලි බිල ද වැඩි කළහොත් එය ගහෙන් වැටුණු මිනිහාට ගොනා ඇන්නා වගේ දෙයකි.

විදුලිබල මණ්ඩලය දිගින් දිගටම පාඩු ලබමින් පවතින අතර 2020 වර්ෂය අවසන් වනවිට විදුලිබල මණ්ඩලය රුපියල් බිලියන 62.5ක ශුද්ධ අලාභයක් වාර්තාකොට තිබුණි. ඒ කොයිහැටි වුවද 2020 වර්ෂයේ ජාතික විගණන කාර්යාලය මගින් නිකුත්කොට ඇති වාර්ෂික විගණන වාර්තාවට අනුව එම වර්ෂයේ දී සේවකයන්ගේ නිවාඩු දින දීමනා ගෙවීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් රුපියල් බිලියන 1.2ක් වැයකොට තිබුණි. මෙම ගෙවීම සිදුකොට ඇත්තේ අමාත්‍යාංශයේ විගණන කමිටුවේ තීරණයට පටහැනිවය. එමෙන්ම ජාතික සම්ප්‍රේෂණ ජාලය උදෙසා පුනර්ජනනීය බලශක්ති අවශෝෂණය කරගැනීමේ ව්‍යාපෘතිය විදේශීය ණය ගිවිසුම් අනුව ක්‍රියාත්මක වේ. එකී ව්‍යාපෘතියේ කාර්යමණ්ඩලය සඳහා 2020 වර්ෂයේ දී ප්‍රතිපාදනවලට පටහැනිව නිවාඩු දින දීමනා හා ප්‍රසාද දීමනා වශයෙන් රුපියල් 24,813,513ක මුදලක් ගෙවා තිබුණි.

විදුලි මාෆියාවක් හා ඒකාධිකාරියක් ගැන කථාබහට ලක්වෙන පසුබිමක් තුළ මේ වනවිට රට තුළ විදුලිබල අර්බුදයක් නිර්මාණය වී ඇත. විදුලි පාරිභෝගිකයන්ගේ ඉල්ලුමට අනුව විදුලිය සැපයීමට නොහැකිවීම නිසා විදුලිය කැපීමට සිදුවී ඇත. මේ නිසා රටේ ආර්ථිකයට වන බලපෑමද සුළුපටු නොවේ. මෙරට මුළු බලශක්ති අවශ්‍යතාවයෙන් වැඩි ප්‍රමාණයක් විදුලිබලය මත රඳෙන අතර මුළු විදුලිබල ජනනයෙන් සියයට 63ක් ඉන්ධන ගල් අඟුරු හා තාප බලාගාර මත යැපීමට සිදුවී ඇත. මෙකී බලාගාර සඳහා පොසිල ඉන්ධන ආනයනය කිරීමේ දී ඇමෙරිකානු ඩොලර් විශාල ප්‍රමාණයක් විදේශීය රටවලට ඇදී යති. මෙකී විදුලි අර්බුදයෙන් මිදීම සඳහා ගල්අඟුරු ඉන්ධන බලාගාර මතම යැපෙනවාට වඩා පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවලට යොමුවිය යුතුය.

කෙසේ වුවද 2020 වර්ෂයේ දී අප රටේ පුනර්ජනනීය බලශක්ති උත්පාදනය මුළු බලශක්ති සැපයුමෙන් සියයට 37 කි. නව පුනර්ජනනීය බලශක්ති උත්පාදනය මුළු බලශක්ති සැපයුමෙන් සියයට 12කි. රජයේ ප්‍රතිපත්තියට අනුව 2030 වර්ෂය වනවිට මුළු පුනර්ජනනීය බලශක්ති උත්පාදනය සියයට 70 දක්වා වර්ධනය කරගැනීමට අපේක්ෂිතය. අනාගතයේ දී ගල් අඟුරු බලාගාර ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීමට ද තීන්දු කොට ඇත. මෙරට විදුලිබල කර්මාන්තයට අදාළ පොදු ප්‍රතිපත්ති මාර්ගෝපදේශ මත පදනම්ව අවම පිරිවැය දිගුකාලීන ජනන සැලැස්මක් (2022 - 2041) සකස්කරණ ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිවරයාට නියමකරන ලෙස අමාත්‍යාංශයේ ලේකම් උපදෙස් ලබාදී තිබුණි. ඒ 2021 වර්ෂයේ සැප්තැම්බර් මස 13 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදීය. අමාත්‍ය මණ්ඩලයේ උපදෙස් අනුව ලංකා විදුලිබල මණ්ඩලය විසින් සකස් කරනු ලැබූ අවම පිරිවැය දිගුකාලීන ජනන සැලැස්මට අදාළ කෙටුම්පත ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසම් සභාවට ඉදිරිපත් කරනු ලැබීය.

කෙසේ වුවද විදුලිබල මණ්ඩලය විසින් එම කෙටුම්පත වර්තමාන රජයේ ප්‍රතිපත්තියට අනුකූල නොවන අයුරින් සකස්කොට තිබුණි. රජයේ නව ප්‍රතිපත්තියට අනුකූල වන පරිදි නව දිගුකාලීන විදුලි ජනන සැලැස්ම නැවත සකස්කොට ඉදිරිපත් කරන ලෙස මහජන උපයෝගිතා කොමිසම් සභාව විසින් විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිවරයාට දැනුම් දී තිබුණි. එහෙත් ලංකා විදුලිබල මණ්ඩලය විසින් රජයේ නව ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි 2021 වර්ෂයේ ඔක්තෝබර් මස මෙකී අවම පිරිවැය දිගුකාලීන ජනන සැලැස්ම (2022 2041) සකස්කොට එළිදක්වන ලදී. එම සැලැස්මට අනුව 2041 වසර දක්වාම පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් විදුලිබල උත්පාදනය සියයට 50කි. ගල් අඟුරුබලාගාර 02ක් ද ඇතුළත් කර තිබුණි. 2021 වර්ෂයේ පැවති එක්සත් ජාතීන්ගේ බලශක්ති සමුළුවට



ජනාධිපතිවරයා විසින් මෙකී නව ඉලක්ක දැනුම් දී තිබුණි. ලක්විජය ගල්අඟුරු බලාගාරයෙන් පමණක් වසරකට කාබන්ඩයොක්සයිඩ් ටොන් 5000ක් පමණ වායුගෝලයට මුදාහැරෙන අතර ඒ පිළිබඳ කිසිදු සැලකිල්ලක් දක්වා නොතිබුණි.

එමෙන්ම 2018 -2037 දිගුකාලීන ව්‍යාපෘති උත්පාදන සැලැස්මෙහි 2018,2019,2020, යන වර්ෂයන්වල පිළිවෙළින් මෙ.වො. 500, මෙ. වො. 657, මෙ. වො. 430ක් ලෙස එකතුව මෙ.වො. 1587ක නව ජනනයන් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කොට තිබුණි. එහෙත් මෙ.වො. 275.8ක ධාරිතාවයකින් යුතු බලාගාර පමණක් ආරම්භකර තිබුණි. මේ හේතුවෙන් නව උත්පාදන බලාගාර ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සැලකිය යුතු අයුරින් අඩුවී තිබුණි. මේ නිසා අවම පිරිවැයට විදුලිය සැපයීම හා නිෂ්පාදනය කිරීමට නොහැකි විය. මේ නිසා 2020 වර්ෂයේදී පමණක් රුපියල් බිලියන 22.2ක වටිනාකමක් සහිත ගිගා වොට් පැය 811ක හදිසි විදුලිය මිලදී ගැනීමට විදුලිබල මණ්ඩලයට සිදුවී තිබුණි. ඒ විතරක් නොව විදුලිබල මණ්ඩලය විසින් අධික මිලකට හදිසි විදුලිය මිලදීගෙන තිබූ බව විගණන කාර්යාලය මගින් කිකුත්කොට ඇති 2020 වර්ෂයේ වාර්ෂික විගණන වාර්තාවේ සඳහන් වේ. ලංකා විදුලිබල මණ්ඩලය විසින් අවම මිලක් යටතේ වර්ෂයකට කිලෝ වොට් පැය 697,674,432ක විදුලිය මිලදී ගැනීම සඳහා ඒසීඊ පවර් ඇඹිලිපිටිය පුද්ගලික සමාගම සමග ගිවිසුම්ගතව තිබුණි. 2020 වර්ෂය තුළ විදුලි කිලෝවොට් පැය ඒකකයක් රුපියල් 24.42 බැගින් කිලෝ වොට් 475,831,835 මිලදීගෙන තිබුණි. ලබානොගත් විදුලිය කිලෝ වොට් පැය 221,842,597ක් සඳහා විදුලිබල මණ්ඩලය විසින් ගෙවීම කර තිබූ බවද විගණනය මගින් අනාවරණය කොට ඇත.

ඒ විතරක් නොව ලංකා විදුලිබල පනතේ විධිවිධාන හා වගන්තිවලට පටහැනිව ජනන බලපත්‍ර ලබාගෙන නොතිබූ ස්වාධීන බලශක්ති නිෂ්පාදකයන් තිදෙනකුගෙන් ගිගා වොට් පැය 732,192 විදුලිය මිලදීගෙන ඒ සඳහා රුපියල් බිලියන 18.91 මුදලක් විදුලිබල මණ්ඩලය විසින් ගෙවා තිබුණි.

කෙසේ වුවද මේ වනවිට මහාපරිමාන විදුලි බලාගාර ජනන ධාරිතාවය උපරිම වශයෙන් ළඟාකරගෙන ඇත. එවැනි පසුබිමක් තුළ විදුලි අර්බුදයට මුහුණදීම සඳහා තවදුරටත් වර්ධනය කරගැනීමට හැකියාව ඇත්තේ නව පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් පමණි. කෙසේ වුවද නව පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා අනුමැතිය ලබාගැනීමට වසර 02ක සිට 05ක් අතර කාලයක් ගතවේ.

## ● පුනර්ජනනීය බලශක්ති ගැන කතාවක්වත් නෑ

## ● ජනන බලපත්‍ර නැති අයට රුපියල් බිලියන 18.91ක් ගෙවලා

## ● විගණන වාර්තා තිබුණාට ඒ ගැන සැලකිල්ලක් දක්වා නෑ.

අදාළ ආයෝජකයන් උත්පාදන බලපත්‍රය ලබාගැනීමේ දී රාජ්‍ය ආයතන 10කින් පමණ අනුමැතිය ලබාගත යුතුය. මෙකී බලපත්‍ර ලබාගැනීමේ ක්‍රියාවලිය සරල නොවීම නිසා ආයෝජකයන් ගැටලු රැසකට ලක්ව තිබේ. නව පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා බලශක්ති බලපත්‍ර නිකුත්කොට ඇති ව්‍යාපෘති 58ක් විවිධ හේතූන් මත නතර වී ඇති බැව් ජාතික විගණන කාර්යාලය මගින් නිකුත්කොට ඇති විගණන වාර්තාවේ සඳහන් වේ. මෙකී ව්‍යාපෘති නතරවීම නිසා මෙගාවොට් 129.75ක විදුලි ධාරිතාවයක් ජාතික විදුලිබල පද්ධතියට එක් කිරීමට නොහැකිවී ඇත. ලංකා විදුලිබල මණ්ඩලය විසින් බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් නොකිරීම නිසා මෙගාවොට් 80ක ධාරිතාවයක් සහිත ව්‍යාපෘති 25ක් ඒ අතර වේ.

එමෙන්ම ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලි බලය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් නොකිරීම හේතුවෙන් සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් බලපත්‍ර හා තාවකාලික අනුමැතිය ලබාදී ඇති සහ ජාල එකඟතාවය ඉදිරිපත්කොට ඇති මෙගාවොට් 4014.84 ව්‍යාපෘති 1374ක ක්‍රියකාරීත්වය නතරවී ඇත. ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2017 වර්ෂයේ සිට තරගකාරී මිල කැඳවුම් ක්‍රමයට අවතිරණය වීම හේතුවෙන් සම්මත අයක්‍රමය මත පුනර්ජනනීය බලශක්තිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කිරීම අත්හිටුවීම මෙම තත්ත්වයට හේතුවී තිබේ. මේ දක්වා කුඩාජල විදුලිබලාගාර සඳහා කිසිදු ආකාරයේ මිල ගණන් කැඳවීමක් සිදුකර නොතිබූ අතර එම නිසා කුඩා පරිමාන ජලවිදුලි බලාගාර ඉදිකිරීමේ බලාපොරොත්තුවෙන් සිටි සැපයුම්කරුවන් කර්මාන්තයට පිවිසීම වැළකී තිබුණි. එමෙන්ම ලංකා විදුලිබල මණ්ඩලයට අඩු මිලකට විදුලිය මිලදී ගැනීමට ඇති හැකියාවද අහිමිවී ඇත. මෙම තත්ත්වය නිසා පුද්ගලික ඩීසල් බලාගාරවලින් අධික මිලට විදුලිය මිලදී ගැනීමට ලංකා විදුලිබල මණ්ඩලයට සිදුවී තිබේ. 2017 වර්ෂය සාපේක්ෂව 2020 වර්ෂයේ දී සමස්ත හදිසි විදුලිය මිලදී ගැනීමේ වැඩිවීමේ ප්‍රතිශතය සියයට 14 කි. ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති කර්මාන්තය 2017 වර්ෂය දක්වා සම්මත ගාස්තු මිල ක්‍රමය මත පදනම්ව ක්‍රියාත්මක විය. දේශීය ආයෝජකයන් ආකර්ශනය කරගැනීම සඳහා සම්මත මිල ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබීය. කුඩා පරිමාන ජලවිදුලි බලාගාර ක්ෂේත්‍රය මේ යටතේ ඉහළ කාර්යසාධන මට්ටමක් ළඟාකරගෙන තිබුණි. කෙසේ වුවද 2017 වර්ෂයේ සිට තරගකාරී මිල ක්‍රමය මත පදනම්ව කොන්ත්‍රාත් පිරිනැමීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් තීන්දු කරනු ලැබීය. එම අවස්ථාව වනවිට කුඩාජල විදුලි බලාගාර සූර්යබලාගාර සුළං බලාගාර ආදී නව පුනර්ජනනීය ක්ෂේත්‍රයන්හි ආයෝජනය කිරීමට බලාපොරොත්තුවෙන් නව ආයෝජකයන් 144ක් සුනිත්‍ය බලශක්ති අධිකාරිය ලියාපදිංචිවී පොරොත්තු ලේඛනය රැඳීසිටි අතර ආයෝජකයන් 1374 දෙනකු බලාගාර ඉදිකිරීමේ ක්‍රියාවලියේ විවිධ අදියරයන්හි අනුකූලතා සපුරාලමින් සිටියහ.

සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් 2017 වර්ෂයේ සිට මේ දක්වා කාලය තුළ සූර්යබල, කුඩාජල විදුලි බලාගාර, ඇතුළු බලාගාර 144ක් ඉදිකිරීම සඳහා ආයෝජකයන්ගෙන් මුදල් හා අයැදුම්පත් ලබාගෙන ලංකා විදුලිබල මණ්ඩලය වෙත අනුමැතිය සඳහා යෙමුකොට තිබුණි. එහෙත් එම ව්‍යාපෘති සම්බන්ධව මෙතෙක් කිසිදු ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණි. ඒ අනුව ප්‍රභවයන් 07ක් යටතේ ව්‍යාපෘති 144ක් වෙනුවෙන් ඉදිරිපත්වූ අයැදුම්පත්වලට අනුව ධාරිතාවය මෙගාවොට් 699.96කි. මෙකී ව්‍යාපෘති සඳහා අයැදුම් කිරීමේදී අයැදුම්පත් ගාස්තු වශයෙන් රුපියල් 42,233,000ක මුදලක් සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් අයකරගනු ලැබීය. එමෙන්ම ඉදිරිපත්වන අයැදුම්පත් සඳහා අනුමැතිය ලබාදීම දිගින් දිගටම ප්‍රමාද වී පැවතුණ බවද විගණන වාර්තාවේ සඳහන් වේ. අදාළ ආයතන දෙක අතර සම්බන්ධීකරණයේ පැවති දුර්වලතාවයන් මෙකී ප්‍රමාදවීම්වලට මූලික හේතුව බවද විගණනය මගින් අනාවරණය කොට ඇත.

කෙසේ වුවද විදුලිබල මණ්ඩලය විසින් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළ තරගකාරී මිල ක්‍රමය යටතේ ජාතික විදුලිබල පද්ධතියට එකතුකර ඇත්තේ මෙගා වොට් 01 බැගින් වූ සූර්යබල ව්‍යාපෘති 13ක් පමණි. එමෙන්ම සුළං විදුලිබලාගාර සම්බන්ධයෙන් 2022 වර්ෂයේ අපේක්ෂිත ඉලක්කය මෙගාවොට් 268කි. එහෙත් මේ සඳහා දැනට අයැදුම්පත් කැඳවා ඇත්තේ මෙගාවොට් 60ක ධාරිතාවයක් සඳහා පමණි. සූර්ය බල සංග්‍රාම වැඩසටහන යටතේ මෙගාවොට් 269ක ධාරිතාවයක් පමණක් විදුලිබල පද්ධතියට සම්බන්ධ කර තිබුණි. මෙකී ව්‍යාපෘතිය යටතේ 2025 වර්ෂය වනවිට මෙගාවොට් 1000ක විදුලි ධාරිතාවයක් ජනනය කිරීමට සැලසුම්කොට ඇත. කෙසේ වුවද වාර්ෂිකව ළඟාකරගත යුතු ඉලක්කයන් හඳුනා ගැනීමක් සිදුකර නොතිබුණි.

මෙරට විදුලිය සැපයුම් සහිත ජනගහනයේ ප්‍රමාණය සියයට 99.9කි. එහෙත් සමස්ත විදුලි සැපයුමේ පුනර්ජනනීය බලශක්ති උත්පාදනය සියයට 37කි. මින් නව පුනර්ජනනීය බලශක්ති උත්පාදනය සියයට 12කි. ලංකා විදුලිබල මණ්ඩලය විසින් වසර 20ක් සඳහා දිගුකාලීන ජනන සැලැස්මක් පිළියෙල කරන අතර එය වසර 02කට වරක් යාවත්කාලීන කෙරේ. නියඟයකදී, විදුලිබලාගාර ක්‍රියාවිරහිතවීමකදී විදුලි කප්පාදුවකදී පිළියම් යෙදීම දිගුකාලීන විදුලි ජනන සැලැස්මේ අරමුණයි. එමෙන්ම මෙකී අවම පිරිවැය සැලැස්මට පරිබාහිරව හදිසි විදුලිය මිලදී ගැනීම් සඳහා අවකාශ නොලැබෙන පරදි කටයුතු කළයුතු වේ. එහෙත් විදුලි බල මණ්ඩලය විසින් අවම පිරිවැය දිගුකාලීන ජනන සැලැස්මක් සකස්කොට එය ප්‍රකාශයට පත්කොට තිබුණද විදුලි කප්පාදුවට නම් විසඳුමක් ලැබී නොතිබුණි.

**● ලලිත් චාමින්ද**

# නාන්න සබන් කෑල්ලක් නැති තරමට බඩු මිල ඉහළ ගිය හැටි

රට දිනෙන් දින බරපතළ ආර්ථික අගාධයක් කරා ගමන් කරමින් ඇත. රටවැසියන් ලෙස අප මේ වන විටද එම ආර්ථික අගාධයේ කරවටක් ගිලී හමාරය. තෙල්, ගෑස්, ඖෂධ ඇතුළු අත්‍යවශ්‍ය ආහාර වර්ග හිඟවීමෙන් ඒවායේ මිල ගණන් දිනෙන් දින ඉහළ යමින් ඇත. ඒ හේතුවෙන් ඉදිරියේදී උග්‍ර ආහාර හිඟයක් රට තුළ නිර්මාණය වීමේ අසුබ පෙරනිමිති පහළ වෙමින් ඇත. එබැවින් දුප්පතුන් ලෙස ඉපිද දුප්පතුන් ලෙසම මියයන බහුතරයක් වූ ජනතාවක් ජීවත්වන රටක හෙට දවස පිළිබඳ බොහෝ දෙනෙක් තුළ පවතින්නේ වචනයෙන් විස්තර කළ නොහැකි අවිනිශ්චිත බවක්ය. එවැනි තත්ත්වයක් තුළ වුවද පුදුම උපදවන සුළු කරුණ බවට පත් වන්නේ රට වැටී ඇති අගාධයේ තරම නොදකින පාලකයන් තම තමන්ගේ බලය රැකගැනීම පිණිස යෙදී සිටින කැත හිරිකිත උත්සාහයන් තවදුරටත් දකින්නට ලැබීම පිළිබඳය.

මෙම සටහන තබන අවස්ථාව වන විට කොළඹ ගාලුමුවදොර ආරම්භ කොට ඇති නොනිදන අරගලයට දින 20ක් සම්පූර්ණ වී හමාරය. එහි එක්රැස්වන මෙරට තරුණ ප්‍රජාව ඇතුළු විවිධ වෘත්තිකයන් කලාකරුවන් ඇතුළු සියල්ලන් උස්හඬින් ඉල්ලා සිටින්නේ අසමත් රාජ්‍ය පාලනය ගෙදර යා යුතු බවත් ඉන් අනතුරුව රටට හිතකර පාලනයක් ඇතිකළ යුතු බවත්ය. එය ගාලුමුවදොරට පමණක් නොව මේ වනවිට රටේ පොදු ප්‍රකාශනය බවට ද පත්වී අවසන්. කනගාටුවට කරුණ වන්නේ ඒ පිළිබඳව මේ වන තුරුත් රට කරවන ඇත්තන් වගේ වගක් නැති ආකාරයෙන් කටයුතු කරන අයුරු දකින විටය.

එවැනි වටපිටාවක් තුළ මෙරට භාණ්ඩ හා සේවා වෙළඳපොළ මුළුමනින්ම කළු කඩ මාෆියාවක් බවට පත්වෙමින් තිබෙන ආකාරයක් දැකගත හැක. මිල පාලනයෙන් මිදුන භාණ්ඩ මිල අකාරුණික ලෙස රටවැසියාගේ ගෙල සිරකර තබමින් දිනෙන් දින ඉහළ නගින ආකාරයක් මේ දිනවල දැකගත හැක. අත්‍යවශ්‍ය ආහාර වර්ගවලින් ආරම්භ වන මිල ඉහළ යෑම මේ වනවිට සබන් කැටය, ගිනිපෙට්ටිය පවා 'ගිනිගණන්' බවට පත්කොට ඇත. දිනෙන් දින ගණන් උස්සන බඩු මිල පිළිබඳව අවස්ථා කීපයකදී කොළඹ පිටකොටුව තොග වෙළඳුන්ගෙන් අප කළ විමසීමේදී ඔවුන් පවසා සිටියේ රට තුළ ඩොලර් හිඟවීම හේතුවෙන් ඉහළ යන බඩු මිල පාලනය කිරීම ඔවුන්ට කළ නොහැකි බවක්ය.

එබැවින් තවදුරටත් බඩුමිල පිළිබඳ කතාබහ කිරීම පිණිස කොළඹ තොග වෙළඳුන් මුණ ගැසීම කාලය නාස්ති කිරීමක් බැවින් කොළඹින් බැහැර තම ව්‍යාපාර පවත්වාගෙන යන කුඩා කඩ හිමියන් කීපදෙනෙකු සමඟ කතාබහ කිරීම අපගේ අරමුණ බවට පත්විය. එහිදී මුණ ගැසුණු එක් ව්‍යාපාරිකයෙක් බඩුමිල ඉහළ යෑම පිළිබඳව සිදුකළ කතාබහ පිණිස වෙනස්ම ප්‍රවේශයක් ලබාගනිමින් මෙයින් දශක දෙක තුනකට පමණ එපිට මතකයක් අවදි කරන්නට විය. එම අදහස් දැක්වීම තුළ නූතන පාරිභෝගික ජනතාවට උගත හැකි පාඩම් බොහෝ විය.

''මම වෙළෙඳාම ආරම්භ කරලා දැන් අවුරුදු තිස් පහක් හතලිහක් පමණ ගතවෙලා තිබෙනවා. ඔය කාලය අතර තුර වෙළෙඳාම විතරක් නොවෙයි වෙළඳපොළ තුළ සිද්ධ වෙච්ච වෙනස්කම් රාශියක් දකින්නත් මට අවස්ථාව ලැබුණා. මේ දවස්වල වැඩිපුර කතාබහ වෙන සබන් වලින්ම මම කතාව පටන් ගන්නම්. මම බිස්නස් පටන්ගත්ත කාලය ගත්තොත් ඒ දවස්වල යමක් කමක් තියෙන කෙනෙක් තමයි සබන් කැටයක් මිලට ගත්තේ. වැඩි දෙනෙක් ගත්තේ සබන් භාගයයි. එහෙමත් නැත්නම් සබන් කාලයි. හැම කඩේකම වගේ සබන් කැටේ කපල අලෙවි කරන්න තංගුස් නූල් පොටක් තිබුණා. අද වගේ ඔළුවට එකයි හමට එකයි කියලා සබන් වර්ග ගොඩක් තිබුණේ නෑ. රෙදි හෝදන සබන් භාගයක් දෙන්න කිව්වොත් ඒකෙන් දෙනවා. ඇගේ ගාන සබන් භාගයක් ඉල්ලුවොත් ඒකෙන් දෙනවා එච්චරයි. ඒ කාලෙත් සුවඳ සබන් වර්ග කීපයක් තිබුණා. නමුත් ඒවා මිලදී ගන්න තරම් ලොකු උවමනාවක් ගමේ ගෙඩේ මිනිස්සුන්ට තිබුණේ නෑ. දැන් තත්ත්වය එහෙම නෑ. ඊයේ පෙරේදා සබන් මිල ඉහළ යන්නත් කලින් කඩේක එක සබන් කැටයක්වත් ආසාවකට ඉතුරු කළේ නෑ. කාක්කො වහගත්ත වගේ ආව ගෙනිච්ච.''

පසුගිය දිනවල දෙතුන් ගුණයකින් මිල ගණන් ඉහළ ගිය සබන් මිල මුල්කර ගනිමින් ආරම්භ කළ කතාව තව දුරටත් ඉදිරියට ගෙන යමින් වෙනත් වෙනත් ආහාර ද්‍රව්‍ය හා බඩු භාණ්ඩ පිළිබඳව ඔහු විසින් තව දුරටත් අදහස් දක්වන්නට විය. මීට දශක කීපයකට පෙර මෙරට මිනිසුන් ගතකළ සරල සුන්දර දිවි පෙවත පිළිබඳ බොහෝ තොරතුරු ඔහුගේ අදහස් දැක්වීම තුළ අන්තර්ගතව තිබීම විශේෂත්වයකි.

''අසූව දශකයේ මැද භාගය වනවිට මම අර මුලින් සඳහන් කළ තත්ත්වය වෙනස් වෙන්න ගත්තා. ඒ වෙනකම් අපේ රටේ මිනිස්සු කන්න බොන්න අඳින්න පළඳින්න වියදම් කළේ තමන්ගේ ආදායමේ හැටියට පමණයි. ගමේ ජීවත්වෙන සෑම කෙනෙකුටම ගොඩ මඩ ගොවිතැන් බත් තිබුණා. ඒ වගේම ගමක ගෙවල් පනහක් ගත්තොත් අඩුම තරමින් ගෙවල් හතරක පහකවත් කිරි ගවයො තුන් හතර දෙනා හැදුව. තව පිරිසක් කුකුල්ලු ඇති කරල ඒ හරහා ආදායම ලැබුව. ඒ කාලෙ අද වගේ ෆාම් කුකුලන් ඇති කරන පුරුද්දක් තිබුණේ නෑ. එහෙමයි කියලා මිනිස්සු බිත්තර කෑවේ නැද්ද. අහුලගෙන කෑව කිකිළි දාන බිත්තර ගම්වල ඕන තරම් තිබුණා. ගෙදර හදන වැස්සියන්ගෙන් දොවාගත්ත කිරි ටික තිබුණා. අල බතල ටික තිබුණා. පවුලක දරුවො හතර පස්දෙනා හිටියත් අද වගේ අහේනියක් එදා තිබුණේ නෑ. පුළුවන්නම් ඒ මොකද කියලා හොයලා බලන්න. එදා අපට නිවහල් ආර්ථිකයක් තිබුණා. ඒ වගේම වගා කරගෙන කන පුරුද්දක් තිබුණා. ලංකාවට රූපවාහිනිය ආවට පස්සේ තමයි මේ හැම දෙයක්ම වෙනස් වෙන්න ගත්තේ. එහෙම වුණේ කොහොමද කියලත් මගේ අත්දැකීම් ඇසුරෙන් පොඩි විස්තරයක් කරන්නම්. පුළුවන්නම් මේව පත්තරයට ලියන්න. එතකොටවත් අපේ මිනිස්සු තේරුම් ගනීවි රටේ පවතින දේශපාලන ක්‍රමයයි මහා පරිමාණ ව්‍යාපාරික ප්‍රජාවයි එකතුවෙලා මේ රටට කරපු විනාශයේ තරම.''

මේ වනවිට රට තුළ බිත්තරයක් අලෙවි වන්නේ රුපියල් හතළිහත් පනහත් අතර අගයකටය. කිරිපිටි කිලෝවක් මිලදී ගැනීමට නම් ඒ සඳහා රුපියල් දෙදහසකට අධික මුදලක් වැයකළ යුතුව ඇත. කුකුළු මස් කිලෝවක් රුපියල් එක් දහස් පන්සීයේ සීමාවට ඔන්න මෙන්න අගයක් ගෙන ඇත. හාල්, සිල්ලර අල, ලූනු මිල ගණන්වලට කඩි කුලප්පුව වැලඳී ඇත. එම මිල ගණන් නිතර නිතර වෙනස්වෙමින් ඇත. එබැවින් පාරිභෝගික ජනතාවට විඳින්නට සිදුව ඇති දුක් ගැහැට නිමක් නැත. ඒ පිළිබඳ වඩාත් හොඳ අවබෝධයක් වෙළෙඳ ප්‍රජාව තුළ ඇත. මා හා අදහස් දක්වන ලද ව්‍යාපාරික මහතා තම කටහඬ නැවතත් අවදිකර සිටියේ ඒ පිළිබඳව අදහස් දැක්වීම පිණිසය.

''ඊයේ කඩේට ආව කෙනෙක් අද නැවත බඩුවක් ගන්න ආවොත් ඊයේ ඒ බඩුව මිලට ගත් මුදලට අද ඒ දෙය මිලදී ගන්න බැරි තත්ත්වයක් තමයි අද තියෙන්නේ. මම මුලින් කිව්වනෙ අපේ රටට රූපවාහිනිය ආවට පස්සේ හුඟක් දේවල් වෙනස් වුණා කියලා. රූපවාහිනිය ආව එකේ වරදක් නෑ. ඒ දේවල් රටක තියෙන්න ඕන. නමුත් අපේ රටේ සිද්ධ වුණේ මොකක්ද. රූපවාහිනී නාලිකා ආරම්භවීමත් එක්ක දැවැන්ත වෙළෙඳ ප්‍රචාරන ආයතන රටපුරා ක්‍රියාත්මක වෙන්න ගත්තා. ඒ හරහා උපභෝගී, පරිභෝග භාණ්ඩ පිළිබඳ පුළුල් ප්‍රචාරයක් දෙන්න ගත්ත. උදාහරණයක් දෙකක් කියන්නම්. සබන් කැට දවටන තුනක් තැපැල් කරලා එව්වොත් රන් පවුම් තෑගි වශයෙන් ලබාදෙනවා කියලා ප්‍රචාරය කිරීමත් එක්ක සබන් කාල, භාගය ගත්ත මිනිස්සු ඒ පුරුද්ද අත් හැරලා සබන් කැටය බැගින් මිලට ගන්න පුරුදු වුණා. වෙළෙඳ ප්‍රචාරණ කලාව විසින් පාරිභෝගික මනස ඉතාමත් සූක්ෂම ලෙස වෙනස් කරන්න ගත්තෙ එහෙමයි. අසූව දශකයේ මැද භාගයක් වෙන කොට රටම මේ උගුලෙ පැටලෙන්න ගත්ත. මහා පරිමාණ කුකුළු මස් ව්‍යාපාර රටපුරා ආරම්භ වෙන්න ගත්ත. බොයිලර් කුකුල් මස් වෙළෙඳපොළට එන්න ඉස්සර රූපවාහිනී දර්ශන මගින් ඒ දේවල් අපේ මිනිස්සුන්ට රසකර කැව්ව. ඔය විදිහට සමස්ත වෙළෙඳපොළම වෙළෙඳ ප්‍රචාරණයේ ගොදුරක් බවට පත්වෙන්න ගත්ත. ඒ විතරක් නොවෙයි එහෙම කාලයක් යද්දී රටපුරා හන්දියක් හන්දියක් ගානේ සුපිරි වෙළෙඳසැල් ඇති කරන්න තවත් පිරිසක් කටයුතු කළා. ඉන් පස්සේ මොකද වුණේ. රටම සුපිරි වෙළෙඳ සැල් සංස්කෘතියේ ගොදුරක් බවට පත්වෙන්න ගත්ත. ඕක තමයි මහත්තයො ඇත්ත කතාව. අද අපේ මිනිස්සුන්ට ඒ තත්ත්වයෙන් මිදෙන්න බැරිව දුක් විඳිනවා. ඒ බව හොඳින්ම දන්න මහ පරිමාණ ව්‍යාපාරිකයෝ ඩොලර් නෑ කිය කියා හිතෙන හිතෙන මිල ගණන්වලට බිස්නස් කරගෙන යනවා. ගමේ ගොඩේ සිල්ලර කඩයක් කරන අපි වගේ පුංචි ව්‍යාපාරිකයන්ට ඒ තත්ත්වය වෙනස් කරන්න පුළුවන් කමක් නෑ. අපි කරන්නෙත් පුංචි ලාභයක් තියාගෙන කීයක් හරි හොයාගන්න එක විතරයි. අද අපේ රට පත්වෙලා තිබෙන තත්ත්වය කල්තියා දුටුව දෙන්නෙක් මේ රටේ හිටිය. එක්කෙනෙක් තමයි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය. එතුමිය රට තුළ නිෂ්පාදන ආර්ථිකයක් ඇති කරන්න ලොකු වැඩකොටසක් කළා. අනිත් කෙනා තමයි විශිෂ්ට ව්‍යාපාරිකයකු වූ උපාලි විජයවර්ධන මහත්තය. එතුමත් දේශීය ව්‍යාපාරිකයෙකු ලෙස අලුත් අලුත් දේ රට තුළම නිෂ්පාදනය කරමින් ලොකු දැක්මක් සහිතව කටයුතු කළා. ඒ දේවල් අදත් ඒ විදිහට ක්‍රියාත්මක වුණා නම් ලෝකයට ණය නැති රටක් ලෙස අපිට ඔළුව උස්සන්න ඕන තරම් ඉඩකඩ පැවතුණා.''

කුඩා ව්‍යාපාරිකයකු වුවද මා සමීපයේ සිටින මිනිසා සංකල්පමය වශයෙන් පොහොසත්ය. රට හිඟමනට වැටී ඇති වටපිටාවක් තුළ ඔහු සමඟ සිදුකළ කතාබහ තුළ උගත හැකි පාඩම් බොහෝය. වෙළෙඳ ප්‍රජාව විසින් මෙරට ජන මනස වෙනස් කළ ආකාරයත් ඒ හරහා රට තුළ කළුකඩ මාෆියාව ක්‍රමිකව හිස ඔසවන ආකාරයත් පිළිබඳව ඔහු විසින් විස්තර කර සිටි කරුණු කිසිසේත් බැහැර කළ නොහැක්කේ වෙළෙඳපොළ වෙනස්කම් උදාහරණ සහිතව ඔහු විසින් විස්තර කර සිටීම හේතුවෙන්ය. එබැවින් තව දුරටත් කළු කඩ මාෆියාවේ ගොදුරු බවට පත්නොවී සිටීම පිණිස තම තමන් විසින් කළයුතු දේ කුමක්ද යන්න තීරණය කිරීම මෙම ලිපිය කියවන පාඨකයන් සිහි බුද්ධියෙන් යුතුව කල්පනා කළ යුතුය. ඉදිරියේ යම්කිසි ආහාර අර්බුදයක් ඇතිවේ නම් ඒ සඳහා පිළියම් ඇත්තේ තම තමන් සතු දැනුමේ සහ අවබෝධයේ තරම මතය.

> **ඒ කාලේ සබන් කාලක්, භාගයක් මිලදී ගන්න එක ලැජ්ජාවට කරුණක් වුණේ නෑ. කිරිපිටි වෙනුවට බිව්වේ එළකිරි. රූපවාහිනිය පැමිණීමත් එක්ක හැමදේම වෙනස් වෙන්න ගත්ත. මිලදී ගන්නේ මොකක්ද කියන එක තීරණය කිරීමේ බලය වෙළෙඳ ප්‍රචාරණ සමාගම් භාර ගත්ත. රට පුරා හතු පිපෙන්නාක් මෙන් සුපිරි වෙළෙඳ සැල් බිහිවීමත් එක්ක තත්ත්වය තවත් නරක අතට හැරුණා.**



**● රුවන් ජයවර්ධන**



# ඇමැති කැමැති අකැමැති විමසූ ජාතික ක්‍රීඩා සභාව

රටේ ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳව ක්‍රීඩා ඇමැතිවරයාට උපදෙස් ලබාදීම පිණිස පත් කෙරෙන ක්‍රීඩා සභාව ජාතික ක්‍රීඩා සභාව නම් වේ. ක්‍රීඩා පනත ප්‍රකාරව බිහි කෙරෙන ජාතික ක්‍රීඩා සභාව පිහිටුවීම හෝ නොපිහිටුවීම ක්‍රීඩා ඇමැතිවරයාගේ කාර්යයකි. අවශ්‍ය නම් ක්‍රීඩා ඇමැතිවරයාට ජාතික ක්‍රීඩා සභාවක් නැතුව වුව ද ගමන් කළ හැක. ඇමැතිවරයා සතු ඒ අයිතියට කිසිවකුටත් බලපෑම් කළ නොහැක.

රටේ ක්‍රීඩාව සම්බන්ධයෙන් තමාට උපදෙස් ලබා දීම පිණිස ඇමැතිවරයා පත් කර ගන්නේ ද තමන්ට විශ්වාස, හිතවත් සහ ක්‍රීඩා ක්ෂේත්‍රය පිළිබඳව මනා දැක්මකින් යුත් ඇතැම් විට එම ක්ෂේත්‍රයට සම්බන්ධ ප්‍රවීණයෝ වෙති. ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතා විසින් පිහිටුවන ලද ජාතික ක්‍රීඩා සභාවට කමිටු සාමාජිකයෝ 15 දෙනෙක් වූහ. එහි සභාපතිවරයා වූයේ හිටපු ශ්‍රී ලංකා ක්‍රිකට් නායක මහේල ජයවර්ධන මහතාය. යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා ද එහි සාමාජිකයෙක් වූයේය. එමෙන්ම හිටපු ශ්‍රී ලංකා ක්‍රිකට් නායක කුමාර් සංගක්කාර මහතා ද ජාතික ක්‍රීඩා සභාවට එක් වූයේය. එම කමිටුවට ජුලියන් බෝලිං, ඩිලන්ත මාලගමුව, කස්තුරි චෙල්ලරාජා විල්සන්, සුපුන් වීරසිංහ, රොෂාන් ප්‍රනාන්දු, රුවන් කැරගල, සංජීව වික්‍රමනායක, මේජර් ජෙනරාල් පාලිත අම්පෙ මොහොට්ටි, රොවේනා සමරසිංහ, යශ්වන්ත් මුත්තෙට්ටුවේගම, ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් අමල් එදිරිසූරිය සහ තියුමි අබේසිංහ යන මහත්ම මහත්මීහු සෙසු සාමාජිකයෝ ලෙස එක් වූහ. ක්‍රීඩා පනතට අනුව ජාතික ක්‍රීඩා සභාවේ නිල කාලය වසර 3 කි. එහෙත් නිල කාලය වසර 3 ක් වුව ද ඊට පෙර ක්‍රීඩා ඇමැතිවරයා එම ධුරයෙන් ඉවත් වුවහොත් හෝ වෙනත් අයකු එම ධුරය සඳහා පත් කළහොත් හෝ ජාතික ක්‍රීඩා සභාවේ නිල කාලය ඉන් අවසන් වන බවක් පනතේ සඳහන් නොවේ.

එහෙත් පනතේ සඳහන් කාලයටත් පෙර ජාතික ක්‍රීඩා සභාවේ සාමාජිකයෝ සිය තනතුරුවලින් ඉවත් වූහ. එයට හේතුව වූයේ ඊට පෙර නාමල් රාජපක්ෂ මහතා ක්‍රීඩා ඇමැති ධුරයෙන් ඉවත්වීමය. ඇමැතිට උපදෙස් දෙන්න පත්කළ කමිටුවකින් ඇමැති නැතිව ඇති ඵලය කුමක්දැයි සිතූ අදාළ සාමාජිකයෝ එම ධුරවලින් ඉවත්වීමට පොදු තීරණයක් ගත්හ.

ඇමැති ඉවත් වුණ පුරප්පාඩුව පිරවීම පිණිස නව ඇමැතිවරයෙක් පත් කෙරිණි. හේ නාමල් රාජපක්ෂ ක්‍රීඩා ඇමැතිවරයා ලෙස කටයුතු කරන කාලයේ ග්‍රාමීය සහ පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන හිටපු රාජ්‍ය ඇමැතිවරයා වූ තේනුක විදානගමගේ ය. ජාතික ක්‍රීඩා සභාව රැස්වන අවස්ථාවල රාජ්‍ය ඇමැතිවරයා ලෙස ඊට සාමාන්‍යයෙන් සහභාගි වීමට තේනුක ඇමැතිවරයා ද එකල වග බලාගෙන තිබිණි. එහෙත් රාජ්‍ය ඇමැති තේනුක, ක්‍රීඩාව භාර කැබිනට් ඇමැති වීමට පෙර ජාතික ක්‍රීඩා සභා සාමාජිකයෝ සිය සාමාජිකත්වයෙන් ඉවත් වී තිබිණි. ඒ අනුව නව ක්‍රීඩා ඇමැතිවරයා ද ජාතික ක්‍රීඩා සභාවක් පත් කර ගැනීමට අරමුණු කර ගත්තේය. එය තමන්ගේ අභිමතයට පත්කර නොගෙන ජාතික ක්‍රීඩා සභාවේ හිටපු සාමාජිකයන් වන සභාපති මහේල ජයවර්ධන මහතා ප්‍රමුඛ සාමාජිකයන් සමග සාකච්ඡා කර පත් කිරීමට තේනුක ඇමැතිවරයා ක්‍රියා කළේය. ඒ අනුව පසුගිය 22 වැනිදා ජාතික ක්‍රීඩා සභාවේ හිටපු සාමාජිකයන් සියලු දෙනා ක්‍රීඩා අමාත්‍යාංශයට රැස්කර ඔවුන් සමග සාකච්ඡා කිරීමට කටයුතු යෙදිණි. එහෙත් ඇමැතිවරයාගේ ඇරයුම පෙරදැරිව ඊට පැමිණ සිටියේ සාමාජිකයන් තිදෙනකු පමණි. තවත් සාමාජිකයෝ තිදෙනෙක් අන්තර්ජාලය ඔස්සේ ඊට සම්බන්ධව සිටියහ. පැමිණ සිටියේ ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල් අමල් එදිරිසූරිය, යශ්වන්ත් මුත්තෙට්ටුවේගම සහ රොෂාන් ප්‍රනාන්දු යන සාමාජිකයන් පමණි. මේජර් ජෙනරාල් රාජිත අම්පෙ මොහොට්ටි, රුවන් කැරගල සහ රොවේනා සමරසිංහ යන සාමාජිකයෝ අන්තර්ජාලයෙන් එක් වූහ.

හිටපු සභාපති මහේල මහතා ඒ වනවිට සිටියේ ඉන්දියාවේය. එමෙන්ම කුමාර් සංගක්කාර මහතා ද මහේල මහතා මෙන්ම සිටියේ ඉන්දියාවේ අයිපීඑල් තරගාවලියට සම්බන්ධවය. ඒ නිසා ඔවුන් දෙදෙනාගේ පැමිණීමක් කොහෙත්ම බලාපොරොත්තු වූයේ නැත. එහෙත් අන්තර්ජාල පහසුකම් ඔස්සේ සූම් තාක්ෂණය මගින් අදාළ රැස්වීමට සහභාගි වන ලෙසට ඔවුන්ට දැනුම් දී තිබිණි. අවසානයේ අදාළ රැස්වීමේදී එකඟ වූයේ අනෙක් සාමාජිකයන්ගේ මතය පසුව පෞද්ගලිකව විමසීමටය.

ඒ අනුව ජාතික ක්‍රීඩා සභාවේ හිටපු සාමාජිකයන්ගෙන් කිහිප දෙනකු නැවත ඒ සඳහා පත්වීමට නියමිතව ඇති බව ද වාර්තා වේ. එහෙත් හිටපු සභාපති මහේල මහතා ඒ සඳහා කැමැති වූ බවක් වාර්තා නොවේ. කවුරු කැමැති වුව ද අකැමැති වුව ද ජාතික ක්‍රීඩා සභාව මේ සතියේදී පත්වීමට නියමිතය.

**● කුෂාන් සුබසිංහ**

## පේලේ නේමාර් ගෙන් කළ ඉල්ලීම



ලොව එතෙක් මෙතෙක් බිහි වූ විශිෂ්ටතම පාපන්දු තරුවක් ලෙස සැලකෙන බ්‍රසීලයේ පේලේ මේ වන විට සිටින්නේ එතරම් හොඳ සෞඛ්‍ය තත්ත්වයකින් නොවේ. වයස අවුරුදු 82ක් වන පේලේ පසුගිය දිනෙක මහ බඩවැල ආශ්‍රිත ආබාධයක් හේතුවෙන් රෝහල්ගතවද සිටියා. 1958, 1962 සහ 1970 වසරවල පාපන්දු ලෝක ශූරතාවය දිනූ බ්‍රසීල කණ්ඩායමේ ගෞරවනීය සාමාජිකයකු වූ පේලේ විසින් සිදු කරන ලද ඉල්ලීමක් නිසා බ්‍රසීල පාපන්දු පිටිය සංවේදීජනක වුණා. ඔහු එම ඉල්ලීම කර තිබුණේ වත්මන් බ්‍රසීල පාපන්දු කණ්ඩායමේ ප්‍රබල ක්‍රීඩකයෙක් වන නේමාර් ගෙන්.

"ඔබ තවත් ලෝක කුසලානයකට සූදානම්ද? මම නම් සූදානම්. අපේ කණ්ඩායම නැවතත් පාපන්දු ලෝක කුසලානය ජයග්‍රහණය කරනවා දකින්නට මට ඇත්තටම ආසයි."

පේලේ නේමාර් ගෙන් එසේ විමසා තිබුණා.

ලෝක කුසලාන පාපන්දු ශූරතාව වැඩිම ප්‍රමාණයක් ජයග්‍රහණය කළ කණ්ඩායම ලෙස බ්‍රසීලය ලෝකයේ පරසිදු වුවත් 2002 වසරෙන් පසුව ඔවුන් පාපන්දු ලෝක කුසලානයක් ජයග්‍රහණය කර නැහැ. පේලේ සමග ජයග්‍රහණය කළ ලෝක කුසලාන 3ට අමතරව බ්‍රසීලය පාපන්දු ලෝක කුසලාන දිනා ගෙන තිබූ වර්ෂ වන්නේ 1994 සහ 2002 වර්ෂයි. දශක දෙකකින් පසුව ඔවුන් පාපන්දු ලෝක කුසලානයක් ජය ගෙන නැහැ. එමෙන්ම පේලේට පසුව බ්‍රසීලය වෙනුවෙන් වැඩිම ගෝල් සංඛ්‍යාවක් වාර්තා කළ ක්‍රීඩකයා ලෙස සටහන් වන්නේත් නේමාර්ය. වයස අවුරුදු 18දී බ්‍රසීලය වෙනුවෙන් තරග වැදීමට වරම් ලැබූ නේමාර් මේ වන විට තරග 117කදී එරට වෙනුවෙන් ගෝල් 71ක් රැස් කර ගෙන තිබෙනවා. පේලේ ගේ ඉල්ලීම ඉටු කිරීමට නේමාර් ප්‍රමුඛ බ්‍රසීල කණ්ඩායමට මෙවර පාපන්දු ලෝක කුසලාන තරගාවලියේ දී හැකි වෙයිද යන්න එරට පාපන්දු රසිකයන් මහත් උනන්දුවෙන් බලා සිටිනවා.

# වසර විස්සක 20/20 කණ්ඩායම



පන්දුවාර විස්සයි විස්ස ක්‍රිකට් තරගවල ඉතිහාසය තවමත් වසර දශක දෙකක් නොඉක්මවයි. එහෙත් ක්‍රිකට් ක්‍රීඩාවේ ජනප්‍රියතම තරග රටාව ලෙස පන්දු වාර විස්සයි විස්ස ක්‍රිකට් රටාව පෙරමුණට පැමිණ ඇත. 2005 වසරේ දී ඔස්ට්‍රේලියාව සහ නවසීලන්තය අතර ඕක්ලන්ඩ් පිටියේදී පැවති පළමු ජාත්‍යන්තර පන්දු වාර 20 - 20 තරගයේ පටන්ම ක්‍රිකට් රසිකයෝ ඊට ලොබ බැඳගත්හ. එම පළමු තරගයෙන් ජය ගත්තේ සංචාරක ඔස්ට්‍රේලියානු ක්‍රීඩකයෝ ය. එම කණ්ඩායමේ එවකට නායකයාව සිටි රිකී පොන්ටින් ප්‍රතිවාදී කණ්ඩායමේ ඩැරිල් ටෆී විසින් ක්‍රියාත්මක කරන ලද 19වන පන්දු වාරයේ දී ලකුණු තිහක් ලබා ගත්තේය. පොන්ටින් ගේ පිත්තෙන් ටෆී ට එරෙහිව එවර හයේ පහර හතරක් සහ එක් හතරේ පහරක් එල්ල විය. ප්‍රේක්ෂකයෝ අමන්දානන්දයට පත් වූහ. පන්දු වාර විස්සයි විස්ස ක්‍රිකට් තරගවල ප්‍රේක්ෂක ආකර්ෂණයට හොඳම නිදසුන ලෙස එම පළමු තරගයම සාක්ෂි සපයයි.

දශක දෙකක් නොඉක්මවන මේ අලුත් ක්‍රිකට් තරග රටාවේ එතෙක් මෙතෙක් බිහිවූ ක්‍රීඩකයන් අතර දක්ෂතම සහ හොඳම ක්‍රීඩකයන් එකොළොස් දෙනාගෙන් යුත් කණ්ඩායමක් නම් කිරීමට ඉන්දියාවේ සුප්‍රසිද්ධ 'ද හින්දු' පුවත්පත කටයුතු කර තිබුණි. එම කණ්ඩායමට ශ්‍රී ලංකාවේ හිටපු සුපිරි වේග පන්දු යවන ක්‍රීඩක ලසිත් මාලිංග ද එක් කිරීමට එම පුවත්පත කටයුතු කර තිබේ. ක්‍රිස් ගේල්ගේ සිට ලසිත් මාලිංග දක්වා යන ශීර්ෂ පාඨයෙන් යුතුව නම් කර ඇති එම කණ්ඩායමට ඇතුළත් වීමට නොහැකි වූ සුපිරි ක්‍රීඩකයෝ තවත් බොහෝ වෙති. ඉන්දියාවේ රෝහිත් ෂර්මා, ජස්ප්‍රිට් බුම්රාහ්, ඔස්ට්‍රේලියාවේ ශේන් වොට්සන්, එංගලන්තයේ ජොස් බට්ලර්, බංග්ලාදේශයේ තුන් ඉරියව් ක්‍රීඩක ෂකිබ් අල් හසන්, දකුණු අප්‍රිකාවේ වේග පන්දු යවන ක්‍රීඩක ඩේල් ස්ටයන්, පකිස්තානයේ ෂහීඩ් අෆ්රිඩි සහ බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායමේ සුනිල් නරයින් ද එසේ මෙම කණ්ඩායමට ඇතුළත් වීමට වරම් නොළත් පිරිසට අයත් වෙති. එහෙත් 'ද හින්දු' පුවත්පත ප්‍රශ්න කරමින් කියා සිටින්නේ තමන් මේ කණ්ඩායමට ඇතුළත් කරන ලසිත් මාලිංග සහ රෂිඩ් ඛාන්ට වඩා ජස්ප්‍රිට් බුම්රාහ් සහ සුනිල් නරායින් දක්ෂයෝ ද යන්නයි. මෙම කණ්ඩායම නම් කිරීමේදී ජාත්‍යන්තර ක්‍රිකට් පිටියේ පමණක් නොව ප්‍රිමියර් ලීග් ක්‍රිකට් තරගාවලිවලදී ද එක් එක් ක්‍රීඩකයන් දැක්වූ දක්ෂතා සැලකිල්ලට ගෙන ඇත.

**● ක්‍රිස් ගේල්**

දශක දෙකකට ආසන්න පන්දු වාර විස්සයි විස්ස ක්‍රිකට් තරගවල හොඳම කණ්ඩායමේ ආරම්භක පිතිකරු ස්ථානය බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායමේ සුපිරි ප්‍රහාරාත්මක පිතිකරු ක්‍රිස් ගේල්ට හිමි වී ඇත. පන්දු වාර විස්සයි විස්ස ක්‍රිකට් තරග රටාවේ දොන් බ්‍රැඩ්මන් ලෙස සැලකෙන ගේල් එම තරගවලදී ලකුණු දස දහසේ සීමාව ඉක්ම වූ පළමු පිතිකරුවා වේ. රටවල් හයක ප්‍රිමියර් ලීග් තරගාවලි නියෝජනය කර ඇති ඔහු එම තරගාවලි ආශ්‍රිතව කණ්ඩායම් 26කට ක්‍රීඩා කර ඇත. එහිදී ලොව කිසිදු ක්‍රීඩකයකුට වඩා හයේ පහර සහ හතරේ පහර එල්ල කර ඇති ගේල් පන්දු වාර විස්සයි විස්ස ක්‍රිකට් පිටිය වර්ණවත් කළ ආරම්භක පිතිකරුවෙකි.

**● විරාත් කෝලි**

පන්දු වාර විස්සයි විස්ස තරගවල ලකුණු 50ක පමණ සාමාන්‍යයක් රඳවා ගැනීම පිතිකරුවකුට එතරම් ලේසි පහසු කාර්යයක් නොවෙයි. එහෙත් ඉන්දියාවේ හිටපු නායක විරාත් කෝලි එම දස්කම කළ ක්‍රීඩකයෙකි. ලකුණු හඹා යැමේ රජුද ලෙස සැලකෙන කෝලි මෙම කණ්ඩායමේ ක්‍රිස් ගේල් සමග ඉනිම ආරම්භ කරන අනෙක් පිතිකරුවා වේ.

**● ඒ බී ඩිවිලියර්ස්**

පන්දු වාර 20 - 20 විස්සයි විස්ස තරග රටාව ගත් විට දකුණු අප්‍රිකාවේ ඒ බී ඩිවිලියර්ස් අමතක කළ නොහැක. පිටිය සිසාරා සිව්දෙසට පන්දු පහර එල්ල කරන ඩිවිලියර්ස් මෙම කණ්ඩායමේ අංක 3 පිතිකරුවා වේ. විශිෂ්ට පන්දු රකින්නකු සහ කඩුලු අතර දිවීමේ දක්ෂයකු ලෙසද නිතැතින් පිළිගැනෙන ඩිවිලියර්ස් මෙම තරගවලදී වැඩිම ලකුණු ලාභීන් අතර 150 කට වඩා ප්‍රහාරාත්මක වේගයක් රඳවා ගෙන ඇති පිතිකරුවන්ගෙන් එක් අයෙකි.

**● ඩේවිඩ් වෝනර්**

ඔස්ට්‍රේලියාවේ ඩේවිඩ් වෝනර් සාමාන්‍යයෙන් ආරම්භක පිතිකරුවකු වුවද මෙම කණ්ඩායමේ දී ඔහුව අංක 4 පිතිකරණ ස්ථානයේ පන්දුවට පහර දීමට තෝරා ගෙන ඇත. ගේල් ට අමතරව මෙම කණ්ඩායමේ සිටින එකම වමත් පිතිකරුවා වෝනර් බැවින් පිතිකරණ ලැයිස්තුව සමබර කිරීම සඳහා වෝනර් මැදපෙළට යොමු කර ඇත. වෝනර් තැනට සුදුසු ලෙස පන්දුවට පහර දීමට දක්ෂයකු ලෙස ඔවුන් දක්වා ඇත.

**● කිරන් පොලාර්ඩ්**

අංක 5 ස්ථානය හිමි වී ඇත්තේ පසුගියදා බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායමෙන් ඉවත් වූ එම කණ්ඩායමේ හිටපු නායක කිරන් පොලාර්ඩ් වෙතටය. වැඩිම ලකුණු ලාභීන් අතර හොඳම ප්‍රහාරාත්මක වේගය හිමි තුන්වැන්නා ලෙස සැලකෙන කිරන් පොලාර්ඩ් කඩුලු තුන්සියකට වඩා දවා ගෙන ඇත.

**● ග්ලේන් මැක්ස්වල්**

ඔස්ට්‍රේලියාවෙන් මෙම කණ්ඩායම සඳහා තෝරා ගෙන ඇති අනෙක් ක්‍රීඩකයා වන්නේ ග්ලේන් මැක්ස්වල් ය. අවශ්‍ය ඕනෑම විටක දී ක්‍රීඩා පිටියෙන් ඉවතට යැමට පන්දු පහර එල්ල කිරීමේ හැකියාව ඇති මැක්ස්වල් සුපිරි ගණයේ තුන් ඉරියව් ක්‍රීඩකයකු ද වේ.

**● ඇන්ඩ්‍රි රසල්**

පන්දු වාර විස්සයි විස්ස ක්‍රිකට් පිටිය තුළ නම කිව්වත් ප්‍රතිවාදීන්ට බය හිතෙන ක්‍රීඩකයකු ලෙස රසල් හැඳින්විය හැකිය. තරග 400කට වඩා ක්‍රීඩා අතර ඇති රසල් එහි දී කඩුලු 364ක් දවා ගෙන තිබෙන අතර පිතිකරණයේදී ඔහුගේ ප්‍රහාරාත්මක වේගය 170කට ආසන්නය. එමෙන්ම ඔහු තරගයක් වෙනස් කළ හැකි ක්‍රීඩකයකු ලෙස ද ප්‍රකටය.

**● මහේන්ද්‍ර සිං දෝනි**

කණ්ඩායමේ කඩුලු රකින්නා සහ නායකයා වන දෝනි අංක 8 පිතිකරු ලෙස තෝරාගෙන තිබෙන්නේ තරග අවසන් කිරීමට දෝනි තුළදී ඇති මහත් හැකියාව පිළිබඳව සැලකිලිමත් වෙමිනි. එමතුද නොව දෝනි අංක 8 ඉන්නවා කියන්නේ මැද පෙළ පිතිකරුවන්ට සහ ඉදිරි පෙළ පිතිකරුවන්ට රිසි සේ පන්දුවට පහර දීමට ඉඩ හසර වෙන් කර දීමක් බව හින්දු පුවත්පත දක්වයි.

**● ඩ්වේන් බ්‍රාවෝ**

පන්දු වාර විස්සයි විස්ස ක්‍රිකට් පිටියේ පිත්තෙන් ලකුණු 6700ක් ලබා ගෙන සහ පන්දු යැවීමෙන් කඩුලු 573ක් දවාගත් තවත් ක්‍රීඩකයකු නොමැති තරම් ය. එම දස්කම් අසමසමය. එමෙන්ම නියමිත පන්දු වාර හතර තුළදී ප්‍රතිවාදීන්ට අඩු ලකුණු සංඛ්‍යාවක් ලබා දීමට බ්‍රාවෝ තුළ ඇති හැකියාවද විශිෂ්ට බව හින්දු පුවත්පත සඳහන් කර සිටී. ලකුණු පනහක් දී කඩුලු දෙකක් දවා ගැනීමට වඩා කඩුලු නැතත් ලකුණු 10කට පන්දු වාර හතර සීමා කිරීම දක්ෂතාවයක් ලෙස ඔවුහු දක්වති.

**● රෂීඩ් ඛාන්**

දකුණත් පාදග පන්දුවෙන් පිතිකරුවන් මං මුළා කරන ඇෆ්ගනිස්ථානයේ රෂීඩ් ඛාන් අංක 10 ක්‍රීඩකයා ලෙස මෙම කණ්ඩායමට එක් වේ. අවසන් පන්දු වාර කිහිපයේ දී පන්දුව හතරේ සීමාවෙන් ඉක්මවා යැමට පහර දීමේ හැකියාව රෂීඩ් ඛාන් සතුව පවතින අතර ලොව පුරා ප්‍රිමියර් ලීග් තරගවලට හේ නැතුවම බැරි ක්‍රීඩකයෙකි.

**● ලසිත් මාලිංග**

ක්‍රිකට් පිටියේ යෝකර් රජු ලෙස පිළිගැනෙන ශ්‍රී ලංකාවේ ලසිත් මාලිංග මෙම කණ්ඩායමේ සිටින ප්‍රධානතම වේග පන්දු යවන්නා වේ. ජාත්‍යන්තර ක්‍රිකට් පිටියේ දී ශ්‍රී ලංකාව වෙනුවෙන් අති දක්ෂ පන්දු යවන්නෙකු වූ මාලිංග එකල බිහි කළ වාර්තා ක්‍රීඩා ලෝලීන්ගේ මතකයේ සදා තැන්පත් වී ඇත. එමෙන්ම ඔහු අයිපීඑල් තරගාවලියේ ද වීරයකු වේ.

සැකසුම

**● කුෂාන් සුබසිංහ**





උපාලි නිව්ස්පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් 2022 මැයි මස 01 වැනිදා ඉරිදා හෝමාගම පිහිටි උපාලි යන්ත්‍රාලයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

දිවයින
ඉරිද සංග්‍රහය
2022 මැයි මස 01 වැනිදා ඉරිදා



## තෙල් සහනාධාරයක් නොලැබුණොත්

# ධීවර කර්මාන්තය කම්මුතුයි


ටිරෝන්


රොද්‍රිගෝ


නිලංග

වැල්ලෙන් උපදින තෙල් ගින්න බිහිසුණුය. 2012 වර්ෂයේ පෙරබවාරි මස 15 වැනිදා හලාවත එගොඩවැල්ල තෙල් ගින්නකින් පිච්චී ගිය අයුරු අදට ද අපට මතකය. තෙල් සහනාධාරයක් ඉල්ලා ධීවරයන් සිදු කර එම උද්ඝෝෂණයේදී ඩබ්ලිව්. ඇන්ටනී ප්‍රනාන්දු වෙඩි කා මැරී වැටී සිටි අයුරු දූනිදු සිහි ගැනේ වේ.

එකසිය එකොළහට තිබුණු ඩීසල් ලීටරය කෙටි කාලයක් තුළ රුපියල් එකසිය හැත්තෑඅටකින් මිල ඉහළ යෑමත් සමඟ දූනුදු ධීවර ප්‍රජාව ගිනියම් වෙමින් සිටින බව සැබෑය. එමෙන්ම මේ දිනවල මෙරට ජනතාව මුහුණ දී සිටිනුයේ ඉතිහාසයේ දරුණුතම ආර්ථික අර්බුදයට ය. එහෙයින් ගිනියම් වැල්ලෙන් නැවතත් ගිනි දලු මතු වීමට පෙර ධීවර ගැටලු විමසා බැලීමට පසුගිය දිනක අපි මීගමුව ධීවර වරායට ගියෙමු.

දිය නොපෙනෙන තරමට මුළු වරායම බෝට්ටුවලින් පිරී ඇත. බෝට්ටු හාරපන්සියකට වැඩිය. එහෙත් පස් හයදෙනකුට වඩා මිනිසුන් නැත. වල් බල්ලො රජදහනක් කරගෙන සිටි ධීවර වරාය භූමිය පුරා මගේ දෙනෙත් දිව ගියේය. විසල් ශාලාව තුළ දැල් පිළියම් කරන තිදෙනෙක් අසල මගේ දෙනෙත් නතර විය. ඔවුන් දැල් වියන ලෝකයේය. බාහිර කිසිවක් සන්නිවේදනය නොවෙන ගාණය. අසලට ගිය අපි ඔවුන්ගේ දූහැන බින්දෙමු.

අද බෝට්ටු මුහුදු ගියේ නැද්ද?

''තෙල් නැතුව මුහුදු යන්නේ කොහොමද? අද නෙමෙයි මේ ටිකේම බෝට්ටු මුහුදු ගියේ නෑ...'' දැලට බර වී තිබෙන මුහුණු අප දෙසට ඉස්සිණි.

''මට වයස අවුරුදු 58 යි. මගේ ජීවිත කාලයට මෙවැනි ආර්ථික අභේතියක් නම් ඇවිත් නෑ. උදේ කඩේට ගිහින් ගන්න භාණ්ඩයේ මිල හවසට වැඩි වෙනවා. ඒත් ආර්ථික වියදම ඉහළ ගියාට අපිට ලැබෙන කුලිය වැඩි වෙලා නෑ. මේ දැල් පිළියම් කරනවට පහුගිය කාලේ දවසට ලැබුණු රුපියල් 2000 තමයි අදටත් ලැබෙන්නේ. රුපියල් 2000 කින් අද කොහොමද ජීවත් වෙන්නේ. ඒ වගේම මේ ජොබ් එක හැමදාමත් නෑ. දූන් ලොකු බෝට්ටු මුහුදු යනවා අඩු නිසා අපිට වැඩක් ලැබෙන්නේ කලාතුරකින් දවසක්. අර ආවේ ධීවර සංගමයේ සභාපති. අපේ කර්මාන්තයට වෙලා තියෙන නස්පැත්තිය ගැන එයා හොඳට පැහැදිලි කරයි. මහත්තෙලා එයත් එක්ක කතා කරන්න...'' දැල් පිළියම් කිරීම ජීවන වෘත්තිය කරගෙන සිටින ෂෙල්ටන් සිල්වා වරාය තුළට පැමිණි පුද්ගලයෙක්ව අපට හඳුන්වා දුන්නේය. ඔහු ද අප අසලට පැමිණියේය. හේ ටිරෝන්ය. සමස්ත ලංකා බහුදින ධීවර යාත්‍රා හිමියන්ගේ සංගමයේ සභාපතිය. දූන හඳුනාගැනීමත් සමඟ පෙළගැසෙන කතාවට ඔහු මෙසේ ප්‍රවේශයක් ලබාගත්තේය.

''ඩොලරයේ මිල ඉහළ යෑමත් එක්ක සියලුම අමුද්‍රව්‍යවල මිල වැඩි වුණා. ඒ බරත් අපිම දරාගෙන කර්මාන්තය කරගෙන ගියා. මේ වෙනකොට දෙපාරකට ඩීසල් මිල වැඩි වුණා. රුපියල් 111 ට තිබුණු ඩීසල් ලීටරය දූන් 289 යි. කෙටි කාලයක් තුළ රුපියල් 178 කින් ඩීසල් මිල වැඩි වෙලා තියෙනවා. ඒ සමඟ සියලු වියදම් වැඩි වුණා. දූන් අපේ බහුදින ධීවර යාත්‍රාවක් මුහුදට පිටත් කරන්න රුපියල් ලක්ෂ විස්සක්, විසිපහක් වැඩියෙන් වැය කරන්න වෙලා. මාස දෙකකට ඉස්සෙල්ලා බෝට්ටුව පිටත් කරන්න මට ගියේ ලක්ෂ තිස්පහයි. මේ වාරේ බෝට්ටුව මුහුදට පිටත් කරන්න රුපියල් ලක්ෂ 50 ට වඩා වියදම් වුණා. එක ගමන් වාරයකට තෙල් ලීටර් 10500 ක් විතර පිච්චෙනවා. 15000 ක් විතර අරගෙන යන්න ඕනෑ. තෙල්වලට විතරක් රුපියල් ලක්ෂ 17 ක් වැඩි වෙලා තියෙනවා. විවිධ ප්‍රමාණයේ බහුදින ධීවර යාත්‍රා එක මුහුදු ගමන් වාරයකට තෙල් ලීටර් හාරදාහේ ඉඳලා පහළොස්දහස දක්වා අරගෙන යනවා. නාවික සැතපුම් එක්දාහස් පන්සියකට ඈත දියඹේ රස්සාව කරන්නේ. මාස දෙකකට ආසන්න කාලයක් මුහුදේ ඉන්නවා. කෑම, බීම, තෙල්, තංගුස්, ඇම්, අයිස් ඇති වෙන්න ගෙනියන්න ඕනෑ. පහුගිය කාලේ තංගුස් කිලෝ එක රුපියල් අටසිය ගාණයි. දූන් දෙදහස් ගාණක්. සියලුම වියදම් ඩබල්, ට්‍රිබල් වෙලා තියෙනවා. සේවක පඩි නඩි ගෙව්වට පස්සෙ අපිට ඉතුරු වෙන්නේ සොච්චම් ලාභයක්. ඒක බෝට්ටුවේ නඩත්තු වියදමටත් මදි. ඒ වගේම බහුදින යාත්‍රාවක් නිපදවන්න පහුගිය කාලේ වියදම් වුණේ මිලියන 20 ක් විතර. පවතින ආර්ථික ක්‍රමය තුළ බහුදින යාත්‍රාවක් නිපදවන්න මිලියන 35 ක් විතර වැය වෙනවා. දූන් අපිට මේ කර්මාන්තයෙන් ලාභයක් නැති තරම්. සියලු බෝට්ටුකාරයො ණය වෙලා ඉන්නේ. වතුපිටි, වාහන සියල්ල බැංකුවට උකස් කරලා. හොඳ තැනකට ගෙනත් තිබුණු ධීවර කර්මාන්තය මේ ආණ්ඩුව අගාධයටම ඇදලා දැම්මා. අපේ හීන මේ පාලකයො විසින් ඝාතනය කරලා. අනාගතය ගැන මතක් වෙනකොට පුදුම දුකක් දූනෙන්නේ...'' ජන ශූන්‍ය වරාය ශාලාව තුළ ටිරෝන්ගේ හඬ රැව්පිළිරැව් දෙන්නේය. ඔහුගේ ආවේගශීලී වචන මූණිස්සම් සේ මුහුදු සුළඟට මුසු වන අතරේ තවත් ධීවරයෙක් කතාවට එකතු විය. ඔහු රොද්‍රිගෝය. පාරම්පරික ධීවරයෙකි.

''ඩොලරයේ අගය වැඩි වුණා කියලා මාළු පිටරට යැවීමෙන් අපිට ලොකු ලාභයක් ලැබිලා නෑ. ඒ ලාභය ගෙඩිය පිටින් ගන්නේ මාළු පිටරට යවන ආයතන. අනෙකුත් කර්මාන්තකරුවො ඉන්ධන මිල වැඩිවීම රටේ ජනතාව පිට පටවලා පාඩුව පියව ගන්නවා. ඒ විදිහට මාළු මිල වැඩි කරන්න අපිට පුළුවන්කමක් නෑ. මාළු මිල තීරණය වෙන්නේ ඉල්ලුම සහ සැපයුම මතයි. දූන් ඉල්ලුමට සාපේක්ෂව මාළු දෙන්න බෑ. මාළුත් අඩුයි. මාළු මිලත් උපරිමයට ගිහින් තියෙන්නේ. තවත් වැඩි කළොත් අපේ රටේ මිනිස්සු මාළු කන්නේ නැතිව යනවා. විදේශීය රටවලින් අපේ මාළු ගන්නෙ නැතිව යනවා. අපි කරන්නේ ජාත්‍යන්තර වෙළෙඳාමක්. මාලදිවයින ධීවරයන් මාළු අල්ලන්නේ ඉතාම සුළු පිරිවැයකින්. ඒ නිසා මාලදිවයින ධීවරයන්ට ඉතාම අඩු මුදලකට පිටරටවලට මාළු සපයන්න පුළුවන්. අපි මාළු අල්ලන්නේ විශාල පිරිවැයක් දරාගෙන. ඒ නිසා මාලදිවයිනේ ගාණට අපිට මාළු දෙන්න බෑ. ඒක මෙරට ධීවර කර්මාන්තයට විශාල තර්ජනයක්. දූනටත් විදේශීය වෙළෙඳපොළ තුළ මෙරට මාළුවලට ඉල්ලුම තියෙන්නේ අපේ මාළුවල තියෙන කොලටිය හොඳ නිසයි. අපේ ධීවරයො මාස ගාණක් ජාත්‍යන්තර මුහුදේ ඔට්ටු වෙමින් වැඩිපුර මාළු ටිකක් අල්ලගෙන එන නිසයි. එහෙම නොවෙන්න මාලදිවයිනේ ධීවර කර්මාන්තයත් එක්ක අපිට තරඟ කරන්න බෑ. මේ තෙල් වැඩි වෙන විදිහට අපි නිකංම තරඟයෙන් එළියට විසි වෙනවා. ඒ වගේම යාත්‍රා නිරීක්ෂණ පද්ධති (වෙසල් මොනිටර් සිස්ටම්) ඉස්සර දුන්නේ නොමිලේ. දූන් රුපියල් ලක්ෂ හයක් අය කරනවා. ඊට අමතරව මාසෙකට රුපියල් 6000 බැගින් මාස් පතා ගෙවන්න ඕනෑ. ජාත්‍යන්තර මෙහෙයුම් බලපත්‍රය දෙන්න රුපියල් පනස්දාහසක් අය කරනවා. මුහුද මැද දී බෝට්ටුවක කාර්මික දෝෂයක් හෝ අනතුරක් වෙලා ඇදගෙන එන්න වුණොත් ලක්ෂ දහයක්, පහළොවක් ගෙවන්න ඕනෑ. ඒ වගේම අපේ මුහුදු සීමාවේදී නාවික හමුදාව බෝට්ටු පරීක්ෂා කරලා තුංගස් පෙට්ටි විනාශ කර දානවා. නාවික හමුදා පරීක්ෂා කරලා පැටළුණු තුංගස් පෙට්ටි විස්සක් විතර අපේ ගෙදර අයින් කරලා තියෙනවා. කිලෝ 20 ක තුංගස් පෙට්ටියක් දූන් රුපියල් 52000 ක් වෙනවා. මට වෙලා තියෙන්නේ පොඩි අලාභයක් නෙමෙයි. බෝට්ටු පරීක්ෂා කරනවට අපි විරුද්ධ නෑ. ඒකට ක්‍රමයක් තියෙන්න ඕනෑ. මේ කර්මාන්තය කරගෙන යන්න විඳින දුක දන්නේ අපි විතරයි...'' අපි අසා සිටියෙමු. තෙල් ගැටලුවෙන් දූවෙන ධීවරයන් එක හුස්මට කතාව කියාගෙන යන්නේය. ඒ ගිනියම් මිනිසුන් අතරින් රොද්‍රිගෝ ගේ හඬ ඉස්මතු විය. දූන් තවත් ධීවරයන් සිව්දෙනකු කතාවට එකතු වී සිටිති. ඒ සමස්ත ලංකා බහුදින ධීවර යාත්‍රා හිමියන්ගේ සංගමයේ ලේකම් රුවන් සහ බෝට්ටුවල රස්සාවේ යන තිදෙනෙකි. මාතර ධීවර සංගමයේ සභාපති දිලීප දූරකථනය ඔස්සේ පෙළගැසෙන කතාවට කරුණු ඉදිරිපත් කළේය. මේ එම ධීවරයන්ගේ පොදු හඬය.

''සමස්ත ලංකා බහුදින ධීවර යාත්‍රා හිමියන්ගේ සංගමයේ පමණක් සාමාජිකයන් එක්දාහස් ගාණක් ඉන්නවා. ලංකාව පුරාම බහුදින ධීවර යාත්‍රා පන්දාහස් ගාණක් කර්මාන්තයේ නියැලෙනවා. ඒ බහුදින ධීවර යාත්‍රාවල ප්‍රධාන ඉලක්කය ටූනා මාළු ඇල්ලීම. අපි අල්ලගෙන එන ටූනා මාළු බහුලව දෙන්නේ විදේශීය වෙළෙඳපොළට. ඒ වගේම අපි රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් ලබාදෙනවා. ටූනා මත්ස්‍ය කර්මාන්තයෙන් පමණක් පහුගිය වසරේ ඩොලර් මිලියන තුන්සිය අසූගාණක ආදායමක් රටට ගෙනත් දීලා තියෙනවා. එක බෝට්ටුවකින් ඍජු, වක්‍ර රැකියා සීයක් විතර බිහිවෙනවා. ඒ වගේම පහුගිය වර්ෂයේදී ධීවර කර්මාන්තයේ විශාල වර්ධනයක් පෙන්නුම් කළා. ඒත් මේ තෙල් මිල වැඩිවීමත් එක්ක රාජ්‍ය ආර්ථිකයට අපෙන් ලැබුණු දායකත්වය අඩු වෙනවා. එක බෝට්ටුවක් වරායේ ගාල් කරනවා කියන්නේ රැකියා අවස්ථා සීයක් අහිමි වෙනවා. ඒ මිනිස්සුන්ගේ ආර්ථිකය බින්දුවට වැටෙනවා. රජයෙන් කියලා තඹ දොයිතුවක සහනයක් ධීවරයන්ට දෙන්නෙත් නෑ. රජය සහන දෙන්නෙත් මාළු පිටරට යවන ආයතනවලට විතරයි. ධීවරයන්ට හම්බ කරගත්තොත් කන්න පුළුවන්. ඒත් අපි සහන ඉල්ලගෙන හිඟා කෑවේ නෑ. දූන් අපි තෙල් සහනයක් ඉල්ලන්නේ කාලා ඇඳලා ජීවත් වෙලා රාජ්‍ය ආර්ථිකයට ආදායම් උපද්දලා දෙන්න...''

''අපි ඉල්ලා සිටින්නේ ධීවර වරායන් තුළ තිබෙන රජයේ ඉන්ධනහල්වල තෙල් මිල අඩු කරලා දෙන්න කියලා. ධීවර වරායන් තුළ තියෙන සියලුම ඉන්ධනහල් ඛනිජ තෙල් සංස්ථාවට අයිති ඒවා. ඒ ඉන්ධනහල්වලින් තෙල් ගහන්නේ බහුදින ධීවර යාත්‍රාවලට විතරයි. වෙනත් කිසිම කටයුත්තකට තෙල් දෙන්නේ නෑ. ඒ නිසා ඉතාම පහසුවෙන් රජයට අපේ ඉල්ලීම ඉටුකරන්න පුළුවන්. තෙල් සහනයක් දෙන්න බැරි නම් අපේ බෝට්ටු විතරක් තෙල්වලට අය කරන බද්දෙන් නිදහස් කර දෙන්න. එහෙම නොවෙන්න මේ බෝට්ටු වරායන්වල දියබත් වෙන්න අරිනවා. එතකොට අපි හොයා දුන්න ඩොලර් ආදායමත් රටට අහිමි වෙනවා. රජයට ධීවර ප්‍රජාවත් රැකබලා ගන්න වෙනවා. රජය ෆේල් කියලා අපිටත් ෆේල් වෙන්න බෑ. අපිට වෙනත් රටවලට යන්නත් බෑ. මේ කර්මාන්තයේ බහුතරය එදා වේල හොයාගෙන අමාරුවෙන් ජීවත්වෙන මිනිස්සු...'' දකුණේ, මීගමුවේ ධීවරයන්ගේ ඒකමතික ඉල්ලීම ඉන්ධන සහනාධාරයකි. එහෙත් දුරකථනය ඔස්සේ ධීවර හඬට එකතු වූ ත්‍රිකුණාමලයේ සුළුපන්න ධීවරයෙක් වන විල්සන් කීවේ වෙනත් කතාවකි.

''මේ ප්‍රදේශවල ඉන්නේ දවසෙ බෝට්ටුකාරයො. අපි බෝට්ටුවලට දාන්නේ භූමිතෙල්. ලීටරයක් රුපියල් 87 යි. අපිට තියෙන ප්‍රධානම ගැටලුව මුස්ලිම් ෂෙඩ්කාරයො භූමි තෙල් දෙන්නේ නැති ඒක. ෂෙඩ් දෙකටම තෙල් ආපු හැටියේ මුලතිව්වලට ගෙනිහින් තෙල් ලීටරය රුපියල් 150 ගාණෙ වැඩි මිලට විකුණනවා. බස්වලට වැඩි මිලට විකුණනවා. සිංහල ධීවරයන්ට තෙල් නෑ. මුස්ලිම් ධීවරයන්ට ඇති වෙන්න තෙල් තියෙනවා. පොලිසියට කිව්වත් වැඩක් නෑ. ෂෙඩ්කාරයන්ට එරෙහිව නීතිමය පියවරක් ගන්නේ නෑ. ඒ වගේම මන්නාරම අවට මුහුදු තීරය ඉන්දියන් ධීවරයන් බදු අරගෙන වගේ තිත්ත පැටියගේ ඉඳලා හූරගෙන යනවා. ඒකත් මහා විනාශයක්...'' ඔහු ද නිහඬ විය.

මැයි මාසෙ 13 වැනිදා සිට හත්දින්න බිම් කන්න පටන් ගැනේ. නැවත හත්දින්න පායන්නේ ජූනි මාසෙ 13 වැනිදාය. ඔක්තෝබර් මාසෙ මැද භාගය වෙනකං නිරිතදිග මෝසම තදය. මේ කාලය ධීවරයන්ට අසුබය. මුහුදු යන ධීවරයන් වැඩිපුරම අනතුරුවලට මුහුණ පාන්නේ මේ කාලය තුළය. වාරකං කාලය තුළ මාළු මිල ද අධික ලෙස ඉහළ යන බව සැබෑය. එහෙත් මෙවර නිරිතදිග මෝසම සක්‍රියවීමටත් පෙර ධීවරයන්ට කෝඩේ වැදී ඇත. ඒ ඩීසල් මිල දෙසිය අසූනවයක් දක්වා වැඩිවීම නිසාය. ඉදිරියේදී මුහුදත් රෞද්‍ර වී, මාළු අස්වැන්නත් හිඟ වී ඩොලරයේ අගය තවත් ඉහළ යෑම තුළ ඉන්ධන මිල තවත් වැඩි වී ධීවර කර්මාන්තයටත් මූසල කාලයක් උදා වීමට ඉඩ තිබේ. එවැනි පසුබිමක වරායන්වල ගාල් වී තිබෙන ධීවර බෝට්ටු දිරාපත් වී මුහුදට බත් වේ. ලක්ෂ විස්සකට ආසන්න ධීවර ප්‍රජාවට යන එනමං නැති වේ. මෙරට බහුතරයකට මාළු කෑල්ලක්, කරවල කෑල්ලක් කෑමේ අවස්ථාව ද නැති වී යයි. මස්, මාළු කෑමට විදිහක් නැතිව පෝෂණය ඌන වූ ජනතාවක් සහිත රටක හිස් ගෙඩි වැනි දරුවො බිහිවීම, මන්දපෝෂණයෙන් දරුවො මියැදීම, කුසගින්දරේ වැඩිහිටියො මිය යෑම අරුමයක්

● තරංග රත්නවීර

ඩොලරයේ අගය වැඩි වීමේ වාසිය ගෙඩිය පිටින් ගන්නේ මාළු පිටරට යවන ආයතන...

මේ විදිහට තෙල් වැඩි වුණොත් මාලදිවයින් ධීවර කර්මාන්තය එක්ක අපිට තරග කරන්න බෑ...

මුස්ලිම් ෂෙඩ්කාරයො සිංහල ධීවරයන්ට භූමිතෙල් දෙන්නේ නෑ...


ෂෙල්ටන් සිල්වා





# අනාගතය වෙනුවෙන් වැඩ කළ අනාගතයට අහිමිවූ නායකයා ජනපති ප්‍රේමදාස

එන්ජිමක එක් දැති රෝදයක් ගිලිහුණු පමණින් හෝ එක් මුරිච්චියක් බුරුල් වූ පමණින් එහි ක්‍රියාකාරිත්වය අඩාළ විය හැකිය. රටට සමාජයට අත්‍යවශ්‍ය පුද්ගලයෙකුගේ මෙහෙය නොලැබී ගිය පමණින් රටට සමාජයට අවශ්‍යතා අඩාළ වීමට පුළුවන. දිවංගත ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතාගේ අභාවයත් සමග ඇති වූ හිඩැස රටට පමණක් නොව එක්සත් ජාතික පක්ෂයට ද වෙසෙසින් දැනිණ. එක්සත් ජාතික පක්ෂය නම් මහා දේශපාලන රුක්ෂයේ ග රාවැටීමත් එතුමාගේ අභාවයත් සමග ආරම්භ වූවා යැයි කීම වඩාත් නිවැරදිය. කලක් පාර්ලිමේන්තුවේ 5/6ක බලයක් තිබූ පක්ෂයක් එක් මන්ත්‍රී ධුරයකට පමණක් සීමා වූවා පමණක් නොව ඡන්ද ගණන් කිරීමට අවශ්‍ය අවම ඡන්ද ප්‍රමාණය වත් ලබා ගත නොහැකි පමණට ජනතාවගෙන් ඈත්විණ.

එහෙත් රණසිංහ ප්‍රේමදාස මහතාගේ උප නායකත්වයෙන් හා නායකත්වය ලබා දුන් සියලුම මැතිවරණවලින් ඉහළින්ම ජය ලැබීය. ඊට හේතු වූයේ තමන් සතු වගකීම මැනවින් ඉටු කිරීමට තරම් වගකීම් සහගත වීම පමණක් වුවද සමාජයේ මනා පැවැත්මට හේතුවෙයි. 'කරතොත් කරපන් හරියට බැරිනම් පලයන් අහකට' යැයි පැලැනේ ශ්‍රී වජිරඥාන නාහිමිපාණන් වරෙක කියා ඇත. කළ යුතු දෙය නිවැරදිව කළ යුතු බවට ඉඟියකි. ඒ කුමන වැඩය වුවද හරියට නොකිරීමේ විපාකය අනාගතය විසින් ගෙවනු ලබන්නේය. රණසිංහ ප්‍රේමදාස මහතාගේ අභාවයත් සමග එක්සත් ජාතික පක්ෂයට සිදුවී ඇත්තේ එයමය. ජයග්‍රහණයේ මූලික ලක්ෂණය කළ දෙය නිවැරදිව කිරීම පමණකි. රණසිංහ ප්‍රේමදාස මහතා එය මැනවින් අවබෝධ කර ගෙන තිබිණ.

කෙසේ වෙතත් දේශපාලනඥයා ඉදිරි ඡන්දය බලා වැඩ කරයි. නායකයා හෙට උපදින මතු පරපුර වෙනුවෙන් අනාගතය බලා වැඩ කරයි. දිවංගත ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතාද දේශපාලනඥයෙකුට වඩා නායකයෙකු බව කීම වඩාත් නිවැරදිය. ඔහු උදාගම යටතේ දස දහස් ගණනින් නිවාස ඉදි කළේද හිසට සෙවණක් ලබා දීමේ අරමුණෙනි. එය වත්මන් පරපුරට මෙන් අනාගත පරපුරටද හිසට සෙවණක් විණ. බුද්ධශාසන අමාත්‍යාංශයක් පිහිටුවූයේ ද අනාගතයේ ද බුද්ධශාසන චිරස්ථිතිය සඳහාමය. කුඩා කෑලිවලට කැඩී බිඳී ගිය මාළිගාවිල බුදු පිළිමය පිළිසකර කළේ මතු පරපුරට ද වන්දනා මාන කිරීමටය. දළදා මාළිගාවට රන් වියනක් පූජා කිරීමත් ගම් උදාව යටතේ එම ප්‍රදේශයේ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කළේද මතු පරපුරට රැකදීමටය වන්දනමානා කිරීමටය.

සුද්දන්ට ජංගි මහනවා කියා ඉදිකළ ඇඟලුම් කම්හල්වලට අපහාස කළ ද මතු පරපුරට ද එහි රැකියා දොර විවර විණ. ඊට සමගාමීව ඉදිකළ ඔර්ලෝසු කණුව මගින් වත්මන් පරපුර මෙන්ම මතු පරපුරද ඉන් ප්‍රයෝජනයක් ගන්නේය. මෙසේ රට පුරා ඔර්ලෝසු කණු ඉදි කළේ ප්‍රේමදාස මහතාට වේලාව බලන්නට නොව ජනතාවට එම පහසුකම් ලබාදීමටය. හෙට උපදින දරුවන් ද මෙම පහසුකම ලබනු ඇත. එහෙත් කුහක දේශපාලනඥයින් ප්‍රේමදාස නාමය අකාමකා දැමීමට සමහර ඔර්ලෝසු කණු කඩා බිඳ දැමූ අතර සමහර ඔර්ලෝසු කණු අක්‍රිය කරමින් ගරා වැටෙන්නට ඉඩ හළේය. එතුමා මියගියද ඔහුගෙන් පළි ගැනීමට එම ප්‍රදේශයට ලැබුණු සම්පතෙන් පළි ගැනීමට තරම් කුහක විය. මෙවැනි දේශපාලනඥයින්ගෙන් රටට යමක් සිදුවේදැයි සිතිය යුතුය.

කෙනෙකුට දුප්පත් ව ඉපදිය හැකිය. එහෙත් දුප්පත්ව මරණයට පත් විය නොහැක. එසේනම් ඊට උදාසීනත්වය කම්මැළිකම බෙහෙවින් හේතු වේ. කෙසේ වෙතත් උපතින් ගෙන ආ දුප්පත්කම නැතිකර අනුන්ට අත නොපා මිනිසෙක් මිනිසෙකු විදියට ජීවත්වීමේ අරමුණෙන් ජනසවිය ආරම්භ කළේය. ඉන් ආර්ථිකමය වශයෙන් දියුණු වීමට මුදලකුත් ජීවත්වීමට අවශ්‍ය මුංඇට කව්පි වැනි දේශීය ආහාර මෙන්ම අනිකුත් ආහාර සහිත බඩු මල්ලක්ද ලැබිණ. මෙය මතු පරපුර වෙනුවෙන් ද ක්‍රියාත්මක වූවකි. එහෙත් එතුමාගේ අභාවයෙන් පසු දේශපාලන විරුද්ධවාදීන් ජනසවිය නම අකාමකා දමා ඊට සමෘද්ධිය යන නම යෙදීය. ජනසවිය යන නමින් පවත්වා ගෙන ගියහොත් ප්‍රේමදාස මහතාගේ නාමය ජනතාව අතර සිහියට නැගෙන බැවින් එතුමා පමණක් නොව එතුමාගේ නාමයත් ජීවිතක්ෂයට පත්කළ යුතු යැයි කුහක දේශපාලනඥයින් සිතීය.

එදා ජනසවිය තුළ තිබූ අවංක සැබෑ සුභසාධනයට වඩා අද දේශපාලන මුහුණුවරක් ගත් සමෘද්ධියකි. කෙසේ වෙතත් වංචාවලින් පිරිපුන් වෘත්තීය සමිති පවා ඇති දූෂිත වූවකි. අසරණයින්ට පිහිට වීමට වඩා අටවා ගත් වෘත්තීය සමිතිවල ඉල්ලීම් දිනා ගැනීමටත් ඉදිරි ඡන්ද බලා දේශපාලනය කරන තරමට පිරිහී ඇත. අනාගතයේ දූෂිතයන් අතට පත්ව දූෂිත ආයතන බවට පත්වන බව ප්‍රේමදාස මහතා එදා දැන සිටියා නම් කිසිවිටෙකත් ජන සවිය නම් සුබසාධක කටයුත්ත ආරම්භ වන්නේ නැත.

ජාතික රුක් රෝපණ වැඩපිළිවෙළ ද හෙට උපදින දූ දරුවන් වෙනුවෙන් ක්‍රියාවට නැංවූවකි. එහි ඵල එතුමා බුක්ති වින්දේ නැත. ගසට කොළයට ඔහු ආදරය කළේය. ඒ අනුව මග දෙපස පැළ රෝපණ කළේය. ඉන් තද පෑවිල්ලට සෙවණක් මෙන්ම ජීවත්වීමට අවශ්‍ය ඔක්සිජන් ද ලැබිණි. පසුකාලයේ ඔක්සිජන් කන්නදැයි ඇසූ මුග්ධ දේශපාලනඥයින් ද අපට සිටී. කතරගම සෙල්ලකතරගම පාර දෙපස එදා රුක් රෝපණ කළ පැළ අද විශාල සෙවණක් ලබා දෙන සෞම්‍ය පරිසරයක් නිර්මාණය කොට ඇත්තේය. මරදානේ දෙපසද එසේ පැළ රෝපණය කර එහි සාත්තු කටයුතු ඉදිරිපස ව්‍යාපාරික ආයතනවලට පවරා තිබුණි. එහෙත් එම කටයුතු එපරිද්දෙන් පවත්වාගෙන යෑමට පසුකාලීන දේශපාලනඥයින් උත්සාහ කළේ නැත. එහි ප්‍රතිඵලය වූයේ කර්කශක ප්‍රදේශ බවට නිතැතින්ම පත්වීමය.

සෑම පුද්ගලයෙකු තුළ හොඳ හා නරක ඇත. ඉතාම නරක පුද්ගලයා කෙරෙහි වුවත් යම් හොඳක් දැකිය හැකිය. එසේම හැම හොඳ පුද්ගලයෙකු කෙරෙහිම නරකක් දක්නට ලැබේ. ඔබත් මාත් ඒ ස්වභාවයට අයත්ව සිටියි. එහෙයින් හැම මිනිසෙකුගේම හොඳ ගැන කථා කරමු, නරක අමතක කර දමමු, නැතිව ගිය කිසිවක් නැවත ලබා ගැනීම අපහසුය. එහෙයින් අවශ්‍ය හැම දෙයම ආරක්ෂා කර ගැනීම වැදගත්ය.

කෙසේ වෙතත් එක්සත් ජාතික පක්ෂය ගැන කථා කිරීමේ දී දිවංගත ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතාගේ නම කිසි විටෙකත් අමතක කළ නොහැක. එතුමා එපමණට ජනතාවට සේවය කර ඇත එතුමා නායකත්වය දුන් සියලුම මැතිවරණ ජයග්‍රහණය කළේය. එපමණට ජනතාව ඔහුට සමීපය. එතුමාගේ අභාවයත් සමග ඒ උණුසුමට පැවැතුණු පළාත් සභා මැතිවරණය ද ඉහළින් ජයග්‍රහණය කළේය. ඉන්පසු පැවති මැතිවරණ 28ක් ම එක්සත් ජාතික පක්ෂය පරාජයේ අමිහිරි අත්දැකීම් ලැබීය. එතුමාට චෝදනා නගන සාධු චරිත පසුකාලීනව නායකත්වය දුන්න ද අද අලියා හතරගාතෙන්ම බිම වැටී පාර්ලිමේන්තුවේ එක් අසුනකට පමණක් සීමා විණ. ''දිරි අලියා දිරි අලියා'' කියා අලි බසින් කථා කළද කිසිවක් නොඇසෙන ලෙසින් බිහිරිය. එසේ නැතිනම් කිසිවක් නොපෙනන ලෙසින් අන්ධය.

එදා පක්ෂයට මහ හයියක් වෙමින් පොදු ජනතාවට සේවය කළ ප්‍රේමදාස නාමය අකාමකා දැමීමට යම් යම් දේශපාලන වවුලන් වූ කබ්බන් පිරිසක් මෑත කාලයේ අසාර්ථක උත්සාහයක යෙදෙති. එතුමාගේ නාමය සිහිපත් නොකළ යුතු බවත් එහෙත් එම නම අකා මකා දමා ජනතාවට සමීප විය නොහැක.

කෙසේ වෙතත් දිවංගත ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතා පවුල් වාදයෙන් බැහැරව කටයුතු කළ දේශපාලනඥයෙකි. පවුල් වාදයට අනුව පහසුවෙන් කළ හැකි වුවද කිසි විටෙකත් බිරිඳ දරුවන් දේශපාලනයට කැඳවා ගත්තේ නැත. දේශපාලනය නැමති මේ නරුම වළේ තමන් වැටුණ ද පවුලේ අය එහි වැටීමට අකමැති විය. මේ නිසා දරුවන් හෝ බිරිඳ දේශපාලනයට කැඳවාගත්තේ නැත. එහෙත් අද පිය පුත්වරු මෙන්ම දේශපාලනඥයින්ගේ බිරින්දෑවරු ද පාර්ලිමේන්තුවේ හෝ පළාත් සභාවල හෝ ප්‍රාදේශීය සභාවල සිටිති. එතුමාගේ පුත් සජිත් ප්‍රේමදාස මහතා දේශපාලනයට පිවිසෙන්නේ පියා අභාවප්‍රාප්තව වසර 7කට පසුවය. එතුමා ජීවතුන් අතර සිටියානම් කිසිවිටෙකත් තම පුත් සජිත් ප්‍රේමදාස මහතාව දේශපාලනයට සම්බන්ධ කර ගන්නේ නැත. එතුමාගේ අභිලාෂය පැවතියේ උසස් අධ්‍යාපනයක් ලබා දෙමින් එවන් පරිසරයක වෘත්තීමය කටයුත්තක නිරතවනවා දැකීමය.

රණසිංහ ප්‍රේමදාස මහතා ජාතික ලැයිස්තුව සකස් කළේ ද එක් එක් වෘත්තීන්ට අනුකූලව මෙන්ම සුළු ජාතික නියෝජනත්වයක් ලැබෙන අයුරිනි. දේශීය වෛද්‍යවරුන් නියෝජනය වන පරිදි ඩබ්ලිව්. අයි. ප්‍රනාන්දු වෙදැදුරුතුමා දේශීය කලාව වෙනුවෙන් ද කාළිංග ඔබේවංශ මහතා මෙන්ම සුළු ජාතීන් වෙනුවෙන්ද මන්ත්‍රීවරු පත් කර ගත්හ. එහෙත් පසුකාලීනව ජාතික ලැයිස්තු සකස් වූයේ පරාජිත අය නැවත පාර්ලිමේන්තුවට කැඳවා ගැනීමටත් මැතිවරණයකට ඉදිරිපත්ව ජයග්‍රහණය කළ නොහැකි අයට අවස්ථාව ලබා දීමටත් තම දූ දරුවන්ට එම අවස්ථාව ලබා දීමටත්ය. මෙය සැබවින්ම ජාතික ලැයිස්තුවට වඩා පිං ලැයිස්තුව යැයි සඳහන් කිරීම වඩාත් උචිතය. දිවංගත ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතා එවන් පිං ලැයිස්තුවක් ජාතික ලැයිස්තුවට එක්කාසු කළේ නැත.


කැළයේ විවිධ ගස් තිබේ. ඒ ගස් අතර කොස් බුරුත, තේක්ක, කළුවර වැනි ශක්තිමත් ප්‍රබල ගණයේ ගස් ඉඳහිට හමුවෙයි. වැඩිපුරම දක්නට ලැබෙන්නේ කනේරු එරමුදු වැනි නොවටිනා ගස්ය. රස ගස් මෙන්ම වස ගස්ද වෙයි. සමාජය ද කැලෑවක් බඳුය. එහි ද විවිධ මනුෂ්‍යයෝ වෙති. එහි බුද්ධිමත් අය මෙන්ම මෝඩයෝද සිටිති. කලාකරුවෝ දාර්ශනිකයෝ ලේඛකයෝ නළුවෝ ක්‍රීඩකයෝ වෙති. හොරුද පාතාලකාරයෝ ද වෙති. බෝසත්වරු මෙන් හොඳ මිනිස්සු කලාතුරකින් හමුවේ. කැලෑවට කළුවර බුරුත තේක්ක මෙන් සමාජයට උගත්තු දක්ෂයෝ දුර්ලභය. දස්කමක් නැති මිනිස් ජීවිත රටට වැඩදායක නැත. මිනිසා යහපත් නිවැරදි කුමකට හෝ දක්ෂ විය යුතුය. ඒ දක්ෂයාට සමාජයේ ප්‍රණාමය හිමිය. එවන් අය ඉතිහාසගතවෙති. ඔවුහු අවශේෂ වූ නොමැරෙන අයයි. දක්ෂයා මරණින් පසු ද නාමයෙන් හෝ අමරණීය වන්නේය. ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතා දිවංගත වූ පසු ද නාමයෙන් හෝ අමරණීය වන්නේ එබැවිනි.

එතුමාට නිවන් සුව පතමු


*(දිවංගත ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතාගේ 29 වන ගුණ සමරුව නිමිත්තෙන් පළවන ලිපියකි)*

**● අමල් වික්‍රමතුංග**
**නියෝජ්‍ය භාණ්ඩාගාරික ශ්‍රී සුචරිත ව්‍යාපාරය**

# මෙන්න මැයි ඉතිහාස කතාව



## මැයි පළවෙනි දින සමරණ 136 වන ජාත්‍යන්තර කම්කරු සහයෝගිතා දිනය




1886 වර්ෂයේ ඇමෙරිකාවේ නිව්යෝක් හි සිට සැන් ප්‍රැන්සිස්කෝ දක්වා විහිදුණු වැඩවර්ජන හා පෙළපාළිවලින් යුත් අරගල වසරක් විය. ඊට තුඩු දුන් ප්‍රධාන ඉල්ලීම වූයේ පැය අටකට සීමා වූ සේවා කාලයක් දිනකට ලබා ගැනීමයි. මේ සටන් රැල්ලේ අරගල මධ්‍යස්ථානය වූයේ චිකාගෝ නගරයයි.

1886 යේ මැයි 1 දින චිකාගෝ නගරයට හතළිස් දහසක පමණ වැඩ වර්ජිත කම්කරුවන් පිරිසක් වීදි බැස සාමකාමී පෙළපාළියක් පැවැත්වූහ. මේ පෙළපාලිය මැයි 2 හා 3 යන දෙදින තුළත් පැවැත් විණ. චිකාගෝ නගරයේ මැක්කොමික් කර්මාන්ත ශාලාවේ වැඩවර්ජනය කඩා කප්පල් කර දැමීමට හාම්පුතුන් දැරූ උත්සහයේදී වැඩ වර්ජකයින් හා එය මර්දනය කිරීමට පැමිණි හොරිකඩයින් අතර ගැටුම් ඇති විය. මැයි 3 වන දින මේ සිදුවීම් උග්‍රවීම හේතුකොට ගෙන පොලීසිය ඊට වෙඩි තැබීම නිසා හය දෙනෙකු මියගොස් පනස් දෙනෙකු තුවාල ලැබූහ. පෙළපාලියේ ගෙන ගිය සුදුපාට බැනර් කොඩි කම්කරුවන් හෙළූ ලෙයින් රතු පැහැගැන්වී තිබිණි. මෙම සිදුවීමෙන් පසු කම්කරුවන්ගේ පාට ලෙස රතුපාට තෝරාගනු ලැබිණි.

**● යෝධ රැලිය**

මේ වෙඩි තැබීමට විරෝධය පාමින් මැයි 4 වන දින යෝධ රැලියක් චිකාගෝ නගරයේ මධ්‍යම චතුරශ්‍රයේ පවත්වනු ලැබීය. මේ රැලිය අමතා චිකාගෝ නගරයේ වැඩ වර්ජිත කම්කරු නායකයෝ රැසක්ම කථා කළහ.

හාම්පුතුන්ට විරෝධය පළ කිරීමට පැවැති මේ අරගලය පසුව පොලීසියට විරුද්ධත්වය පළ කිරීමට පැවැති අරගලයක ස්වරූපයක් ගත්තේය. ආණ්ඩුව තවදුරටත් හිංසාකාරී පිළිවෙතකට පිවිසීමට ඉඩ ඇති හෙයින් නොසැලී සාමකාමීව සංවිධානාත්මකව අරගලය ඉදිරියට ගෙන යෑමට නායකයෝ වැඩ වර්ජිකයින්ට උපදෙස් දුන්හ.

අනතුරුව රැලිය අවසන්වීමට මදකට පෙර පොලිසිය ඒ ප්‍රදේශයට පිවිසියේය. එහිදී නාඳුනන පුද්ගලයෙකු විසින් විසිකරනු ලැබූ අත්බෝම්බයකින් පස්දෙනෙකු තුවාල ලැබූ අතර එක් අයකු මරුමුවට පත් වූයේය. මෙසේ මරුමුවට පත් වූ පුද්ගලයා පොලිස් නිලධාරියකු බැවින් එතැන් පටන් පොලීසිය ඉවක් බවක් නොමැතිව කම්කරුවන්ට වෙඩි තබන්නට පටන් ගත්තෝය. ඉන් පසු පොලීසියේ මර්දනකාරී වැඩපිළිවෙළ මුළු ඇමෙරිකාව පුරාම ක්‍රියාත්මක කෙරිණි. වැඩවර්ජකයින් දුටු තැන පහර දෙන්නටත් වෘත්තීය සමිති කාර්යාල කඩා බිඳ දමන්නටත් පටන් ගත්තේය. එතැන් පටන් සටන ආණ්ඩුව සහ කම්කරුවන් අතර සටනක් බවට පරිවර්තනය විය. බෝම්බ ගැසූ සිදුවීම සම්බන්ධයෙන් චිකාගෝ නගරයේ කම්කරු නායකයන් අට දෙනකු අධිකරණය හමුවට මිනීමැරුම් චෝදනා මත ඉදිරිපත් කෙරිණි. ඉන් හත් දෙනකු සිද්ධිය වූ මොහොතේ නොසිටියත් ඔවුන්ට විරුද්ධව විරෝධතා ගොනු කෙරිණි.

**● අල්ලස් දීම**

කම්කරු විරෝධී පුද්ගලයන් මේ ජූරි සභාවට කැඳවා තිබිණි. ඒ දැඩි දඬුවම් ලබාදීමේ පූර්ණ නිගමනවලට අනුවය. මෙහි සාක්ෂි ලබාදුන් අයට අල්ලස් දී තිබූ බව පසු කලෙක හෙළිදරව් විය.

අධිකරණයට ඉදිරිපත් වූ විත්තිකරුවන් දැඩි ආත්ම ගෞරවයකින් හා එඩිතර බවකින් යුක්තව තමන් නිවැරැදිකරුවන් බව ප්‍රකාශ කරමින් ආණ්ඩුවටත් පොලීසියටත් විරුද්ධව තියුණු ලෙස චෝදනා ඉදිරිපත් කළෝය. මෙහිදී ඔස්කාර් තිබේම යන වෘත්තීය සමිති නායකයාට වසර පහළොවක සිරදඬුවමක් හා අනෙකුත් සියලු කම්කරු නායකයන් එල්ලා මරා දැමීමට නියම කෙරුණි. මොවුන්ව එල්ලා මරණ දිනය ළං වෙත්ම අධිකරණ තීන්දුවට එරෙහිව දැවැන්ත විරෝධතා ව්‍යාපාරයක් මුළු රට පුරාම දියත් කරනු ලැබීය. ඊට විරෝධය පළ කොට විදේශ රටවලින්ද පෙත්සම් ගලා එන්නට විය. මේ පිරිසට ලබාදී තිබෙන දඬුවම ලිහිල් කරන ලෙසද ඉල්ලා සමාජයේ විවිධ ක්ෂේත්‍රවලින් බලපෑම් එල්ලවන්නට විය. මේ බලපෑම් නිසාම සැමුවෙල් පීල්ඩන් සහ ඉයුජින් ෂවාබ්ට පමුණුවා තිබූ මරණීය දණ්ඩනය වෙනුවට ජීවිතාන්තය දක්වා සිර දඬුවම් ලිහිල් විය. මොවුන් එල්ලා මරා දැමීමට නියමිතව තිබූ 1887 නොවැම්බර් 11 වන දිනට පෙර දිනයේ 10 වන දින ලුවිස් ලින්ග් සියදිවි නසා ගත්තේය. ඒ අනුව 11 වන දින ඇල්බට් පර්සන්ස්, ඕගස්ට් ස්පයිස්, ජෝර්ජ් ඒංගල් සහ ඇඩෝල්ප් පිෂර් යන කම්කරු නායකයින් හතර දෙනා එල්ලා මරා දමන ලදී. ඔවුන් කම්කරු පන්ති විමුක්තියේ වීර භටයින් ලෙස මරණයට එඩිතරව මුහුණ දුන්හ. එල්ලා මරා දැමීමට මොහොතකට පෙර ඕගස්ට් ස්පයිස් අවසාන වශයෙන් මෙසේ ප්‍රකාශ කළේය. ''අපේ වචනවලට වඩා අපේ නිශ්ශබ්දතාව බලගතු වන කාලයක් වැඩි කල් නොගොස් උදාවෙනවා.''

1893 දී සිර දඬුවම් ලබමින් සිටි සැමුවෙල්, ඉයුජින් හා ඔස්කාර් යන තිදෙනා නිදහස් කරන ලදී. මේ වනවිට ඉලිනොයිස් ප්‍රාන්තයේ නව ආණ්ඩුකාරවරයා වශයෙන් ජෝන් පී. ඇල්ටිහෙල්සි නම් අයෙක් පත් වූයේය. පසුව ඔහු මේ නඩු තීන්දුව සම්බන්ධයෙන් ප්‍රකාශයක් කළේය. ඒ අනුව යථෝක්ත නඩු විභාගය පක්ෂපාතීව පවත්වා තිබෙන බවත් එල්ලා මරා දමනු ලැබූ පුද්ගලයන් ඇතුළු අට දෙනාටම විරුද්ධව චෝදනා එල්ලවී නොතිබුණු බවත් පක්ෂපාතී ජූරි සභාවක් තෝරා ගෙන තිබුණු බවත් හෙළි විය.

**● පැය අටේ වැඩ අයිතිය**

මේ අනුව දිනකට පැය අටක් වැඩ ඉල්ලා 1886 මැයි මාසයේ ඇමරිකාවේ චිකාගෝ නගරයේ පැවැති වැඩ වර්ජනයේදී හය දෙනකු වෙඩි තබා මරා දමනු ලැබූ අතර සතර දෙනකු එල්ලා මරා දමනු ලැබීය. එක් අයකු සියදිවි හානි කර ගත්තේය. තිදෙනකු හත් වසරක් සිර දඬුවම් ලැබූහ. සියගණන් වෙඩි උණ්ඩවලට ලක් වූ අතර දහස් ගණනක් අත්අඩංගුවට ගැණිනි. පොලිස් ප්‍රහාරයන්ට ලක් වූ ප්‍රමාණය අපමණය. අද පැය අටේ වැඩ දිනය භුක්ති විඳින මුළු ලොව පුරාවූ කම්කරු පන්ති ජනතාව දිවිපිදූ ඒ වීර ඇමෙරිකානු කම්කරු නායකයන් සැමරීම සහ ඔවුන්ට ගෞරවය දැක්වීමට තම පන්තිමය යුතුකමක් වශයෙන් සලකමින් වසරක් පාසා මැයි 01 වන දින රැලි හා පෙළපාලි පවත්වති.

1886 මැයි අරගල ඛේදවාචකයකින් අවසන් වූවත් ඇමෙරිකානු කම්කරු පන්තියේ සටන් රැල්ල නොනැවතී පැවැතිණ. සමස්තයක් වශයෙන් ගත් කල 1886 මුළු වැඩ වර්ජන ව්‍යාපාරය ජාත්‍යන්තර කම්කරු පන්ති ව්‍යාපාරයේ ජය ස්ථම්භයක් වශයෙන් සලකනු ලබයි. 1887 සිට 2 වන කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ තීරණ අනුව ජාත්‍යන්තර කම්කරු සහයෝගිතා දිනය ලෙස මැයි මස 1 වන දිනය පවත්වයි.

**● ශ්‍රී ලංකාවේ ප්‍රථම මැයි දිනය**

ශ්‍රී ලංකාවේ මැයි දිනය පැවැත්වීම ආරම්භ වනුයේ 1933 දීය. එවකට ඉංග්‍රීසි ගුරුවරයෙකු ලෙස කටයුතු කළ ඒ. ඊ. ගුණසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පිටකොටුව ප්‍රයිස් පාක් හීදි මේ මැයි රැලිය පවත්වනු ලැබීය. මෙහි තේමාව වූයේ '' රාජ්‍ය පාක්ෂික වෙමු'' යන්නයි. මේ අවස්ථාවට යටත් වජිත ආණ්ඩුවේ නිලධාරීන්ට හා ඔවුන්ගේ බිරියන්ට ආරාධනා කර තිබිණි.

1934 දී ශ්‍රී ලංකාවේ දෙවන මැයි දිනය පැවැත්වූයේ මාක්ස්වාදී සංගමයයි. මෙය ප්‍රථම වරට වමට සම්බන්ධ සමාජවාදී මතවාදය පළ කරන මැයි දින සැමරීම වේ. දොස්තර සරවනමුත්තුගේ ප්‍රධානත්වයෙන් පිටකොටුව ප්‍රයිස් පාක්හිදී පැවැත්විණි. මෙහි තේමාව වූයේ ''ජාතික නිදහස හා සමාන වැටුප්'' යන්නයි. මෙම මැයි රැලියේ ප්‍රධාන කථිකයා වූයේ එවකට රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මන්ත්‍රීවරයෙකු වූ දොස්තර එස්. ඒ. වික්‍රමසිංහයි. ඊටත් වඩා ප්‍රබල මැයි දිනයක් 1935 දී පැවැත්විණි. මෙය ලංකා සම සමාජ පිහිටුවීම ආසන්නයේදී පැවැත්වුණු අතර වැල්ලවත්ත රෙදිමෝලේ සේවක ගැටලුවක් මුල්කරගෙන පසු කලෙක ලංකා සම සමාජ පක්ෂයේ නායකයකු වූ ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් වෘත්තීය සමිතියක්ද පිහිටුවීම මේ වකවානුවේ සිදුවිය. එතැන් පටන් දිගටම ලංකා සම සමාජ හා ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් යන වමේ දේශපාලන පක්ෂවල මූලිකත්වයෙන් මැයි රැලි හා පෙළපාළි පැවැත්විණි. කම්කරුවන්ට එරෙහිව අසාධාරණ ලෙස සම්මත කර තිබූ නීති රීති, අතිකාල දීමනා, පැය අටේ වැඩ දිනය ඉල්ලීම යන අයිතීන් දිනා ගැනීමේ සටන් පැවැති අතර 1946 හා 1947 වැඩ වර්ජන, 1953 හර්තාලය යන සිදුවීම් සමග කම්කරු සටන් පැවතෙද්දී 1956 සිදුවූ පෙරළියත් සමග කම්කරු පන්තියට ඇහුම්කන් දෙන නායකයකු වූ එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා අගමැති තනතුරට පත්විය. ඉන්පසුව පැය අටේ සේවය නීතිගත වීම, විශ්‍රාම වැටුප් අයිතිය හිමි වීම, පුද්ගලික අංශයේ සේවකයන්ට අර්ථසාධක අරමුදල් අයිතිය ලබා ගැනීම මේ සඳහා පීටර් කෙනමන් මහතා හා එම්. ජී. මෙන්ඩිස් මහතා සිදු කළ මෙහෙය අගය කළ යුතුයි. එමෙන්ම ටී. බී. ඉලංගරත්න මහතා කම්කරු ඇමැති ලෙස අර්ථ සාධක අරමුදල් අයිතිය පෞද්ගලික අංශයට ලබාදීමට ගත් තීරණය වැදගත් වේ. ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය ඇතුළු වමේ ව්‍යාපාරය විසින් ගෙන ගිය අරගලයක ප්‍රතිඵලයක් ලෙස 1956 දී අග්‍රාමාත්‍ය එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා විසින් මැයි දිනය නිවාඩු දිනයක් බවට පත් කළේය. ඒ අනුව මැයි දිනය නිවාඩු දිනයක් කර හැටහයවෙනි සංවත්සරය මෙවර මැයි දිනයට යෙදෙන්නේය.

1987 හිටපු ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මහතා විසින් මැයි දින පෙළපාළි හා රැස්වීම් පැවැත්වීම තහනම් කළේය. එදින ලංකා සම සමාජ පක්ෂය, ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය, ශ්‍රී ලංකා මහජන පක්ෂය ඇතුළු වමේ ව්‍යාපාරය සංවිධානය කළ මැයි පෙළපාළියට පොලිස් ප්‍රහාරයක් එල්ල විය.

කෙසේ වෙතත් අද මැයි දිනය කම්කරු පන්තියේ අවශ්‍යතා මත නොපවත්වන අතර එක් එක් දේශපාලන පක්ෂවල පටු දේශපාලන අවශ්‍යතා සඳහා මැයි දිනය යොදා ගනී. නිල්පාට, කොළ පාට, කහ පාට විවිධ වර්ණ යොදා ගනිමින් කම්කරු පන්තියේ අරමුණු අපේක්ෂා හා ඉල්ලීම්වලට පටහැනිව පත්වන මැයි සැණකෙළිවලින් වෙන් වී කම්කරු පන්තියේ වර්තමාන හා අනාගත අරමුණු සඳහා මැයි දිනය යොදා ගැනීම ගැන වැඩ කරන ජනතාව නියෝජනය කරන දේශපාලන පක්ෂවල හා සංවිධානවල වගකීම වෙයි.

**එස්. සුදසිංහ**
**නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය**

# ගේ දොර ඉඩකඩම්



## රැකියා ඇබෑර්තු

### ගෘහ සේවය

වයස අවුරුදු 30 ත් 55 ත් අතර ගෘහ සේවිකාවක් කෑම පිසීම සහ පිරිසිදු කිරීම සඳහා බත්තරමුල්ලේ තනි තට්ටුවේ නිවසකට අවශ්‍යව ඇත. අමතන්න 0771161248

01/6665

## ගේ. දො. ඉ.

අතුරුගිරිය මාළඹේ 170 සහ 190 ප්‍රධාන බස් පාරට හා අධිවේගී පිවිසුමට නුදුරින් සුන්දර වෙල් යායට මුහුණලා පර්චස් 8 ඉඩම විකිණීමට. 0714290392

01/6666

## මනාලයෝ

බස්නාහිර බොදු ගොවි වයස 27 උස. 5' 5'' මිටුන සුදු වංචල සහ නිශ්චල දේපළ හිමි පරිගණක ඉංජිනේරු ගැලපෙන සහකාරියක මව සොයයි. දුනක: 011 2700838

ම/01/1130

පොලොන්නරුව දිඹුලාගල බොදු ගොවි 1988 උපන් උස 5' 6'' පොලිස් විශේෂ කාර්ය බළකායේ සේවයේ නියුතු නිවසක් හිමි වැඩිමහල් පුතුට සුදුසු සහකාරියක් මව සොයයි. සහෝදරියන් දෙදෙනා විවාහකයි. බාල සහෝදරයා අවිවාහකයි. ඊමේල් : chandaragedara@gmail.com

ම/1/1274

## මනාලයෝ

උඩරට බොදු ගොවි 65 5' 5 එතරම් වයස නොපෙනෙන නීතියෙන් වෙන්වූ (පැමිණිලිකරු) නිවසක්, කාර් එකක් හිමි මා සොයනුයේ ගේදොර ඉවුම් පිහුම් වැඩකටයුතු මනාව දත් ළමයින් නැති වැන්දඹු දික්කසාද යුවතියකටයි. සියලු විස්තර පළමු ලිපියෙන් දුරකථන අංකය සමග තමාම ලියන්න.

ම/01/5977

24K පවුමට රු.155,000/- දක්වා (22K,21K,20K,19K/18K.......9K)

උ ක ස්

රිදී ආභරණ
ජංගම දුරකථන
ටැබ්, ලැප්ටොප්,ටීවී
සෙට්ප්, ඩීවීඩී ප්ලේයර්ස්
ශීතකරණ
රෙදි සෝදන යන්ත්‍ර
මහන මැෂින්, වතුර මෝටර්
DSLR කැමරා
ඇතුළු අනෙකුත් විදුලි උපකරණ
මෝටර් සයිකල්, ත්‍රීවීල්
හිස් ඉඩම්
උකස් ගනු ලැබේ

W.S.L.රූපසිංහ(පුද්)සමාගම
316, මාතර පාර, මාගාල්ල, ගාල්ල.
0767 907 744 / 0912 242 186

## මනාලයෝ

ගොවිකුල වයස අවුරුදු 43කි. මා සීනි කම්හලේ සේවයේ නියුතුය. මා සොයනුයේ වයස 40ට අඩු රූමත් යුවතියකි. කුල භේද අනවශ්‍යයි. බදුල්ල දිස්ත්‍රික්කය විශේෂයි.

ම/01/1273

දිවයින ඉරුපිට

ජය මංගලම්
පිළිතුරු ලිපි එවන විට
පිළිතුරු බහා එවන කවරයේ ලිපිනය පහත
ආදර්ශය පරිදි සටහන් කළ යුතුය.

අංකය..................
මුද්දරය
ඉරුපිට ජය මංගලම්
උපාලි පුවත්පත් සමාගම
223, බිලුමැන්ඩල් පාර
කොළඹ 13.

කවරයේ වම් පස ඉහළ කෙළවර මංගල යෝජනාවේ අංකය සඳහන් කිරීමට මතක තබාගන්න.

දිවයින
Sunday Island
දිවයින
The Island
නවලිය
සූප්‍ය
විදුසර

දැන්වීම් සඳහා විමසන්න
011-2434190
011-2449287
011-2497533

උපාලි නිව්ස්පේපර්ස් ප්‍රයිවට් ලිමිටඩ්


NISACO නිසාකෝ நிசாகோ
Special discounts Every day. On everything

Packing Size 37" 75" 7"
Transport & Fixing Very Easy
Bunk Bed 00260036
Mettres Size 72" X 36"
Recliner Sofa 00100346
Workman Locker 00260030
Computer Table
Office Chair
Upward Rs.5325
010/123 010/241 010/042 025/09

Special Discounts For All Items
NISACO Hospital Road,Kalubowila.
Tel : 011-2744444 / Fax: 011-2560535
www.nisaco.lk nisacofurniture@gmail.com
Athurugiriya Embuldeniya Narahenpita Pannipitiya

## දිවයින The Island ඔබගේ දැන්වීම් ඔබ ප්‍රදේශයේ අප නියෝජිත වෙත බාරදෙන්න

| අනුරාධපුරය | මහගල්කඩවල | අනුරාධපුරය | අනුරාධපුරය | පොළොන්නරුව | කැබිතිගොල්ලෑව |
|---|---|---|---|---|---|
| සත්සර පොත් හල<br>40. කඩ පනහ<br>0252222806 | සමගි පොත්හල<br>ප්‍රධාන වීදිය<br>0372253196 | මහජන පොත්හල<br>10, ධර්මපාල මාවත<br>0252221411 | ස්වර්ණ ස්ටෝස්<br>කඩපනහ<br>0252223615 | ගෝල් සිටි ස්ටෝර්ස්<br>412, ප්‍රධාන වීදිය | නන්දා හොටෙල්<br>0252298679 |
| **කැකිරාව** | **තලාව** | **වැලිකන්ද** | **කන්තලේ** | **කලාඔය** | **මැදවච්චිය** |
| සංජීව පොත්හල<br>0252264331 | නිව් සිටි හොටෙල්<br>කැකිරාව පාර<br>0252276153 | ජයලත් ස්ටෝර්ස්<br>නො, 78 නව නගරය | සමන්තිකා පොත්හල<br>ප්‍රධාන වීදිය<br>0262234166 | විජය ග්‍රොසරි<br>පුත්තලම පාර<br>0252257980 | ගලප්පත්ති ස්ටෝර්ස්<br>0252245695 |







# අරගලයක කාන්තාව














විවියන් ගුණවර්ධන | නදෙෂ්දා කෲප්ස්කයා | බිකාජි කාමා | සුනිලා අබේසේකර | හුදු ෂාරාවි | කුසුමා ගුණවර්ධන



අරගල යනු මේ වන විට පොදු ව්‍යවහාරික වචනයකි. දේශපාලනික වශයෙන් රටක ස්වාධීනත්වය තහවුරු කර ගැනීමට අරගල කරමින් සිටීම දෛනික දසුනක් වී තිබේ. ලංකාවේ ආර්ථික සංවර්ධනය උදාකර ගැනීමට ගෙන යන ලද දීර්ඝ සටන් ඉතිහාසය තුළ කාන්තාවන් අරගල ඔස්සේ පෙරමුණ ගත් වග දැක්වේ. එම කාන්තා අරගලවලින් පෝෂණය වූ කාන්තා විමුක්ති ව්‍යාපාරවලින් සිදුවූ වටිනා සේවය මේ මොහොතේ ද අමතක කළ යුතු නොවේ.

කාන්තා විමුක්ති අරගල කෙරෙහි ශ්‍රී ලංකාව පමණක් නොව මුළු ලෝකයටම පොදු වූ අරගල ඉතිහාසයක් තිබේ. වෙනත් අයකුගෙන් යැපෙන තාක් කල් කාන්තාවකට නිදහස නොලැබෙන බව කාන්තා අරගල සංවිධානය කළවුන් එදාත් ප්‍රකාශ කළේය. කාන්තාවකට සැමියාගේ මුදලින් ජීවත්වන මුළු ජීවිත කාලයම සැමියාට යටත්ව ජීවත්වීමට සිදුවන බව ද එම මතධාරීන් කියා සිටියහ.

බොහෝ කාන්තා අරගල ආරම්භ වූයේ ස්වාධීන අයිතිය ඉල්ලා සිටිමිනි. පුරුෂාධිපත්‍යයට යටත් නොවී ස්වාධීනව නැඟී සිටීමේ ඒකායන ප්‍රාර්ථනයක් මේ අරගල තුළ දක්නට ලැබීය. මේ අරමුණ ඔස්සේ ශ්‍රී ලංකාවේ පාලකයන්ට ද කාන්තාවෝ ඒත්තු ගන්වා තිබුණේ, ශක්තිමත් ආර්ථිකයක් නිර්මාණය කිරීමට නම් කාන්තාවගේ දායකත්වය අනිවාර්ය බවය. එය අදටත් බලපාන ආදර්ශයක් විය. ස්වයං ආදායමක් නැති ස්ත්‍රිය සැමියාගේ වහලියක බවට පත්ව ඇති බවත් අනුන්ගෙන් යැපෙන්නන් කිසි දිනක විමුක්තිය නොදකින බවත් අරගල කළ කාන්තාවන්ගේ අදහස වී තිබිණි. ඔවුහු එපමණක් නොව අධ්‍යාපනය රැකියාව සහ තමන්ගේ අනන්‍යතාවය රැකගැනීම ආදිය පෙරටු කොට ගෙන අරගල කර තිබිණි.

කාන්තාවන්ගේ අධ්‍යාපන අයිතිවාසිකම ගැන සටන් කළ ස්ත්‍රීන් සහභාගි වූ ජාත්‍යන්තර කොමියුනිස්ට් කාන්තා සම්මේලනය 1920 දී පිහිටුවා තිබිණි. එහි ලේකම් මණ්ඩලයට වී. අයි. ලෙනින්ගේ භාර්යාව සහභාගි විය.

ලෝක කාන්තා අරගලයෙහි විශේෂයෙන් කැපී පෙනෙන වීර කාන්තාවන් රැසකගේ නම් කියවේ. ඉන් පෙරමුණ ගත්තේ ඉන්දියාවේ බිකාජි කාමා සහ ඊජිප්තුවේ හුදා ෂරාවි ය. මේ දෙදෙනාම කාන්තාවන්ගේ මූලික ජීවත්වීමේ ඉල්ලීම් ඉදිරිපත් කරමින් රැස්වීම් පැවැත්වීමටත් කාන්තාවන්ගේ උද්ඝෝෂණ පෙළ ගැස්වීමටත් පෙළපාලි පැවැත්වීමටත් එම පෙළපාලි පැවැත්වීමටත් එම පෙළපාලිවල ධජයක් රැගෙන ඉදිරියෙන්ම ගමන් කිරීමටත් ඉදිරිපත් වූ වීර කාන්තාවන් ය. කාන්තා අරගල හමුවේ, චීනයේ කාන්තාවන් පැය දහයක වැඩ මුරයක් ඉල්ලීම කැපී පෙනෙන්නට තිබිණි. ජපානයේ කාන්තාවන් නැව්වලට හාල් ගෝනි පැටවීම ප්‍රතික්ෂේප කිරීම ද ඈත දියඹෙන් ගලා එන මහා රැල්ලක් සේ ආසියාතු කාන්තා අරගලය ප්‍රබෝධවත් කළේය. මෙම සටන්කාමී කාන්තාවෝ වැඩි වැටුප් ඉල්ලීමට අමතරව කාන්තා නිදහස ද ආත්ම ගෞරවය ද ඉල්ලා සිටියහ.

කාන්තාවන් පිරිසක් එක් වූ විට ඔවුන් නඟන හඬ පිරිමින්ගේ හඬට වඩා ප්‍රබල බවත් එබැවින් කාන්තා උද්ඝෝෂණ ප්‍රතිඵල ලබාදෙන බවත් වියට්නාමයේ 'නුයෙන් තියා' නමැති වීර කාන්තා නායිකාව වරක් ප්‍රකාශ කොට තිබිණි. කාන්තාවන් ඉතා දක්ෂ පිකටින් වීරවරියක් බව පවසන ලද්දේ ඉන්දුනීසියාවේ 'කර්තිනී' විසිනි.

ශ්‍රී ලංකාවේ ජනතාව සිය කම්කරු අයිතිවාසිකම් දිනා ගැනීමේ සටනේ එක් හැරවුම් ලක්ෂ්‍යයක් 1919 ලංකා ජාතික සංගමය පිහිටුවීමෙන් ආරම්භ විය. එයට දොස්තර නලම්මා මුරුගේෂන් සහ මහේශ්වරී ජෙයරාජසිංහම් ද සහභාගි වූහ. මෙම ද්‍රවිඩ කාන්තාවන් දෙදෙනා කාන්තා විමුක්ති අරගලයේ ගෞරවයෙන් සිහිපත් කළ යුතු වීරවරියෝ දෙදෙනෙකි.

ශ්‍රී ලංකා කාන්තා පරපුරට ඡන්ද බලය දිනා ගැනීමට මහා අරගලයක් කිරීමට සිදුවිය. 1912 දී පිරිමින් පිරිසකට පමණක් හිමිවූ ඡන්ද බලය කාන්තාවට ද ලබාදෙන ලෙස ඉල්ලා 1925 ලංකා ජාතික සංගමයේ වාර්ෂික සම්මේලනයට ඉදිරිපත් කළ යෝජනාව මල්ලිකා කුලඟන සමිතිය විසින් ඉදිරිපත් කරනු ලැබිණි. 1931 දී කාන්තාවන්ට ඡන්ද බලය ලැබුණේ ඇග්නස් සිල්වා කළ සටනෙහි ප්‍රතිඵලයක් වශයෙනි.

රතු හැට්ට ඇඳගෙන ඒ. ඊ. ගුණසිංහ ගේ මැයි දින පෙළපාලියේ ගිය කාන්තා බළකාය කාන්තා විමුක්ති අරගලයේ රතු ධජය ඔසවා ගෙන යන ලද සටන් කාමී සංකේතය විය. හැත්තෑව දශකයෙන් මෙපිට අරගල සන්ධර්භයේ මුල් තැන ගත්තේ, සුනිලා අබේසේකර ය., ලංකාවේ කාන්තා ව්‍යාපාරය ගොඩනඟන්නට මුල් තැන ගත්තේද ආසියාව තුළ කාන්තා ව්‍යාපාරය ව්‍යාප්ත කිරීමටද ඇය ප්‍රබල වෙහෙසක් ගත්තාය. ඉන්පසු සමස්ත ලංකා කාන්තා සම්මේලනය 1944 දී පිහිටුවා ගැනීමෙන් ඉදිරි පියවරක් තැබුවා ය. කම්කරු ස්ත්‍රිය වූ දලු නෙළන, රබර් කිරි කපන, කෝපි ඇට තෝරන ස්ත්‍රීහු උද්ඝෝෂණ කළහ. සිගරට් කොම්පැනියේ සහ ගෑස් කොම්පැනියේ ද වැඩි වැටුප් ඉල්ලා කාන්තා උද්ඝෝෂණ ඇති විය. ට්‍රෑම් කාර් වැඩ වර්ජනයටත් 1952 හර්තාලයටත් කාන්තාවන් දැක්වූ සටන්කාමීත්වය එවකට රටේ ප්‍රබල කතාබහට ලක්වූ අවස්ථා විය.

මිනිරන් පතල්, පොල් කොහු පැඟිරි මෝල් සහ කුරුඳු තෙල් මෝල්වල වැඩ කළ කාන්තාවෝ ඉතා අඩු වැටුප් ලැබූ ශ්‍රම සූරා කෑමට එළිපිටට ගොදුරු වූ නිවාඩුවක් නැති දුක්ඛිත ජීවිත ගෙවූ කොටසක් වූහ. හුණුපිටියේ එමලියාහාමි, වනාතමුල්ලේ ඉසබෙලාහාමි (කැප්ටන්), එමි නෝනා (සාංචි ආරච්චිවත්ත), පවස්තිනා හාමි (කොටහේන) යන අය කාන්තා අරගලය මුවහත් කළ ශ්‍රී ලංකාවේ සිටි ඉතා දිළිඳු කම්කරු කාන්තා නායිකාවෝ වූහ. දක්ෂ කථිකාවක වූ ඉසබෙලා හාමි කොළඹ නගරයේ පමණක් නොව ඈත ප්‍රදේශවලට ද යමින් කම්කරු කාන්තාවන් සංවිධානය කළා ය. උදේ වරුවේ දර පළන ඉසබෙලා හවස කම්කරු රැස්වීම්වල උද්යෝගිමත් කථිකාවක් වූවාය. වැල්ලවත්තේ රෙදිමෝලේ ද කොටහේනේ සිගරැට් කොම්පැනියේ ද මැකී සහ අනෙකුත් සුදු ජාතිකයන්ට අයත් සමාගම්වල ද සේවය කළ කම්කරුවන් දිරිගැන්වූ මධ්‍යම පාන්තික බුද්ධිමත් කාන්තා පිරිසක් ද එවකට වූහ.

මනෝරාණි, ඩොරීන් වික්‍රමසිංහ, තේජා ගුණවර්ධන, කුසුමා ගුණවර්ධන, විවියන් ගුණවර්ධන, කැරලයින් ගුණසිංහ, මැඩ්ලින් ජයවර්ධන, 'දෙමළ ස්ත්‍රිය' සඟරාවේ කර්තෘ මහේශ්වරී නවරත්නම්, නැන්සි විජේකෝන් (කිවිඳිය) සහ 1927 දී කාන්තාවන්ට ඡන්ද බලය ඉල්ලා පවත්වන ලද ප්‍රථම රැස්වීමේ මුලසුන හෙබවූ ඩයස් බණ්ඩාරනායක (ඇස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමාගේ මව) ද මේ මොහොතේ ගෞරවයෙන් සිහිපත් කළ යුතුය. එපමණක් නොව තනිව නැඟී සිටිමින් සොබා දහමේ දායාදයන් ආරක්ෂා කිරීමට හඬ අවධි කළ දේවාණි ජයතිලක ද කාන්තා අරගලයේ ප්‍රබල චරිතයක්ය. වත්මන් ශ්‍රී ලංකාවේ අකටයුතු කම් හමුවේ දේශපාලන තීන්දුවලට එරෙහිව නැඟී සිටි දේවාණිලා වැන්නවුන් අද හෙට තව තවත් බිහි විය යුතුය. එසේ නොමැති විට අමනෝඥ තීන්දු මත අපට රටක් අහිමි වනවා නිසැකය.

● සමන්තී වීරසේකර



# ප්‍රේමණීය ලලනාව...

ලෝක ප්‍රකට නාට්‍යවේදී federico garcia lorka කීවේ කාන්තාව පෙම්බරයි අහිංසකයි ආදරණීයයි කියාය.

එසේ කියන්නට ඔහුට අත්දැකීම් තිබිණි. වරක් ඔහු මවගේ උණුසුම අත් වින්දේය. තවත් වරක් පෙම්වතියගේ ආදරය උණුසුම වින්දේය. කවියකු වූ ගාර්සියා ලෝකා කීවේ, නූල හා ඉදිකටුව ගැහැනුන්ට කොට luo සහ කසය පිරිමින්ට කියාය.

ඒ කතාව සැබෑය. වචනයේ පරිසමාප්තියෙන්ම එය එසේ වූයේ නම් අද සමාජයේ සිතින් කයින් දුක් විඳින දූ දරුවෝ දක්නට නොලැබෙන බව නම් ඒකාන්තය.

අද දරුවන් අතරින් බහුතරයක් ළමා තරුණ දරුවෝ සිතින් තනිවී සිටිති. ඒ මව නිවසින් නික්ම යෑම නිසාය. පවතින ආර්ථික අර්බුද හමුවේ පවුලක නඩත්තුව සඳහා පියාගේ මූල්‍ය දායකත්වය පමණක් නොසෑහෙන බව ද සැබෑ ය. එහෙත් ඊට පිළිතුරු වශයෙන් මව රැකියා නියුක්ති අයෙකු වීම මත දරුවෝ අසරණව සිටිති.

මවක යනු දරුවාගේ ජීවිතය හැඩගස්වන්නීය. ඇය දරුවෙකු පෝෂණය කරන්නේ ආහාර වලින්ම පමණක් නොවේ. උපන්දා සිට දෙතන කිරි පොවා කය පෝෂණය කරමින් කවි ගී ගායනා කොට සිතේත් හදවතේත් ජාත්‍යාලය ජනිත කරවන්නී ඇය ය. සුළැඟිල්ල පටලා මේ මිහිමත පා තබන්නට දරුවන්ට හුරු කරවන්නී ද මව ය.

එනමුදු අද එවන් මවක් දකිනු දුර්ලභය. අද මම කාර්යබහුලය. උදෑසනින් කුමක් හෝ රත් කර කන්නට පුරවා දරුවන් තැන තැන තබා ඇය යන්නේ මුදල් හම්බ කරන්නට ය. අද මවට යහපත් දේ කියා දීමට වේලාවක් නැත. ආදර්ශවත් මවක් ලෙස යහපත් ගති පැවතුම් සිරිත් විරිත් චාරිත්‍ර විධි සේම ගුණගරුක වීම් කියා දීමට ද වෙලාවක් නැත. මේ වන විට මෙය සෝචනීය තත්ත්වයක් දක්වා ගමන් කර තිබේ. ආදර්ශවත් වැඩිහිටියන් නොදකින දරුවන් කෙරෙන් දැන් යහපත් ගෞරවනීය ආකල්ප වර්ධනය වීමක් දක්නට නොලැබෙයි. ඉස්සර මව්වරු පියවරු අතරමග දරුවකු කැටුව යන විට දරුවන් තම ඇකයේ හොවාගෙන රැගෙන ගියහ. එක්කෝ දෙකකුල් මත හිඳුවා ගෙන ගියහ. එහෙත් අද දරුවාට ආසනය දී වැඩිහිටියන් සිත ගෙන යන්නේ දරුවාට ඇති ආදරය හින්දා හෝ ඒ ආරක්ෂිත යැයි ඔවුන් සිතනවා නිසා විය හැකිය. මෙවන් කුඩා සිදුවීමක් පවා දරුවා දකින්නේ වැඩිහිටියන්ගෙන් ගත යුතු ආදර්ශයක් කියයි. ඒ අත්විඳින දරුවන් අනාගතයේදී වැඩිහිටියෙකු හිටගෙන යනවිට අසුනක් ලබාදිය යුතු යැයි නොදනිති. එවන් සුළු හෝ ගෞරවයක් නැති දරුවන් තුළින් වැඩිහිටියන්ට ගරු කිරීමක් කවදා දකින්නද...

නවීන තාක්ෂණයත් දියුණු ආර්ථිකයත් ගෝලීය බැඳීමක් ඔස්සේ මේ වන විට බිහිව ඇත්තේ යාන්ත්‍රික මව්වරු සහ යාන්ත්‍රික දූ දරුවෝ බව පෙනෙන්නට තිබේ.

ඉදින් කොහෙද අද...?.. garcia lorka කීවා වැනි ප්‍රේමණීය ආදරණීය අහිංසක අ කාන්තා පරපුරක් ..? අද නැති තැන අනාගතේ බලාපොරොත්තු පවා කොහිද..?

● සවී




# ඇය දුර්වලද?

මේ මිහිතලය මත මානව සංහතියේ පැවැත්ම තීරණය කරන්නී කාන්තාව ය.

''ලෝකය නිර්මාණය වී ඇත්තේ හිරුගේ රැස්වලින් සහ මවු කිරිවලිනි.''

මැක්සිම් ගෝර්කි ලොව සියලු කාන්තාවන් වෙනුවෙන් ගොනු කළ එකී සරල සුන්දර වැකිය සමස්ත කාන්තා වර්ගයටම මහත් ආශ්වාදයක් මෙන්ම ආශිර්වාදයකි.

සමහර අප්‍රිකානු, අරාබි සහ ආසියාතික සමාජ පරිසර තුළ කාන්තාව අදත් ඉඳහිට හෝ සති පූජාව, ලිංග ඡේදනය වැනි අතිශය අමානුෂික සිද්ධිවලට මුහුණ දෙන බව අසන්නට ලැබේ.

එසේ නමුත් ගැහැනිය නොහොත් කාන්තාව යනු පුරුෂාධිපත්‍යයට යටත්ව කටයුතු කළ යුතුව ඇති ළඳ බොළඳ, සුකොමල හා සුනම්‍ය ජීවී කොට්ඨාසයක් නොවන බව මේ වනවිට ලෝකය පසක් කොටගෙන සිටී.

එහෙත් බොහෝවිට එකී පසුබිම තුළ ආසියාතික කාන්තාව යුරෝපීය කාන්තාවට වඩා පසුපසින් සිටින බව අපි අදත් අත්දකිමින් සිටිමු.

කවුරු මොනවා කීවද අපේ රටේ ගැහැනිය සිය කුටුම්භය තුළ තවමත් තම ජීවිතය සිරකොටගෙන සිටින්නීය. වර්ෂ 1956 දී ලෝකයේ පළමුවෙනි අග්‍රාමාත්‍යතුමිය බිහිවූයේ ලංකාවෙන් බව අපි ආඩම්බරයෙන් පුන පුනා පවසමු. ලංකාව, ශ්‍රී ලංකාව බවට පත්වූයේ ද 1972 දී ඇයගේ මූලිකත්වයෙන් ගෙන ආ ජනරජ ව්‍යවස්ථාව යටතේය.

ප්‍රබල සහ ශක්තිමත් පවුල් පසුබිම යටතේ නමුත් පසුව ඇගේ දියණිය අපේ රට තුළ ප්‍රථම ජනාධිපතිනිය බවටද පත්වූවාය. එහෙත් ලොව ප්‍රථම කාන්තා අගමැතිනිය බිහිකොට වසර හැට ග ණනකට පසුවත් අපගේ පාර්ලිමේන්තුව තුළ මන්ත්‍රීවරුන් 225ක් අතර මන්ත්‍රීවරියන් සිටින්නේ 12 දෙනෙක් පමණකි.

අධ්‍යාපනය, දේශපාලනය, සංස්කෘතිය, ආර්ථිකය මේ සෑම ක්ෂේත්‍රයක් තුළම කාන්තාව උපරිම නිදහසක් ලබා ඇති බව ද සැබෑවකි. ඒ සියලු තත්ත්වයන් යටතේ වුව සමස්තයක් වශයෙන් ගත් කල කාන්තාවට නිසි තැන ලැබී ඇතැයි යන්න අවිශ්වාස සහගත කියමනක් පමණකි.

කාන්තාව ලිංගික වහලියක්, දරුවන්ගේ, ස්වාමිපුරුෂයාගේ සහ ගෙදර දොරේ සියලු වැඩ කටයුතු කළ යුතු ගෘහ සේවිකාවක් ලෙස නොදක්නා පිරිමි ඇස් තවමත් අප අතර ඇත්තේ සියයට තිහකටත් අඩුවෙන් විය හැකියැයි මට නම් සිතේ.

ඊටත් වඩා ශෝචනීය තත්ත්වය නම් සමහර අවස්ථාවලදී නීත්‍යානුකූල ලෙසම ගැහැනිය එවන් අවතක්සේරුවකට ලක් කිරීමය.

එකම රැකියාව එක ලෙසම කරන වතු කම්කරු ගැහැනිය සහ පිරිමියා අතර වැටුපෙහි වෙනස එයට හොඳම නිදසුනකි.

(මා අසා දැක ඇති පරිදි රැකියාව ආශ්‍රයේදී කාන්තාවෝ පුරුෂ පක්ෂයට වඩා වගකීමෙන් සහ කැපවීමෙන් යුක්තව කටයුතු කරති)

Getting to work (Unlocking Womenzs Potntial in Sri Lanka Labor Force) නමැති 2020 ලෝක බැංකු වාර්තාවට අනුව විවාහය හේතුවෙන් ශ්‍රී ලංකාවේ කාන්තාවගේ වෙළඳපොළ ශ්‍රම දායකත්වය සියයට 26 කින් අවම කරයි. ඒ සමගම පිරිමි පාර්ශ්වය අරබයා එය සියයට 2.5 කින් වර්ධනය කරයි.

ජෛව විද්‍යාත්මක වශයෙන් ශාරීරිකව කාන්තාව පුරුෂයාට වඩා කිසියම් ප්‍රමාණයකින් පසුගාමී වුවද ඇය සතු මානසික ශක්තිය අහස පොළොව තරමටම බලසම්පන්න බව නොකිවමනා ය. දැනුම උකහාගැනීම, කුසලතා සංවර්ධනය, චින්තන ශක්තිය සහ ඒවායෙහි ධනාත්මක භාවිතය පිළිබඳව සලකා බැලීමේදී කාන්තාව පිරිමියාට වඩා පසුපසින් සිටින බවක් කිසිවෙකුත් , කිසිකලෙකත් ඔප්පුකොට පෙන්වා දී නැත.

දරු ප්‍රසූතිය පමණක් නොව දරුවන්ගේ, නිවසේ, රාජකාරි ස්ථානයේ අප්‍රමාණ ගැටලු ඉවසා විඳ, දරාගනිමින් ඇය නිරන්තරවම උත්සාහ ගන්නේ සාමූහික විමුක්තිය සොයා ගැනීමට ය. අම්මා කෙනෙක් තනිව බුදුවන්නට ප්‍රාර්ථනා නොකරන්නීය. ඇය නිරන්තරවම වෙහෙස වන්නේ පවුලේ සියලු දෙනා දුකෙන් මුදාගෙන ඔවුනට සතුට සැලසීමටය.

එහෙත් අවාසනාවට බොහෝ ස්වාමිපුරුෂයන්ට පමණක් නොව අපේ රටේ සමහර දූ දරුවන්ට ද අම්මා යනු වහලියකි. මිටි තැනින් දිය බැස යන්නා සේ බොහෝ නිවෙස් තුළ දරුවන් පවා සියලු වරද, අඩුපාඩු ඇයටම පවරන්නීය.

වැඩිමනත් ශ්‍රී ලාංකික විවාහක ගැහැනු පීඩා විඳින්නේ සිය ස්වාමිපුරුෂයාගේ බේබදුකම, සල්ලාලකම සූදුවට ඇබ්බැහිවීම හෝ වෙනත් කිසියම් ආකාරයකින් පවුලේ ආර්ථික කළමනාකරණය දුර්වලවීම වැනි තත්ත්වයන් යටතේ ය. එසේ වුව මහමෙර සේ ඉවසා දරාගනිමින් මනා ඉවසීමේ ශක්තියක් ප්‍රගුණ කොටගෙන සිටින ගැහැනිය දික්කසාදය වැනි විසඳුමකට නොයා ඉවසාගෙන සිටී.

එසේ ඉවසා දරාගත නොහුණු කල සියදිවිනසා ගැනීම වැනි ඝෘණාත්මක විසඳුම් සොයා යන අමනෝඥ කාන්තාවන් ද අප අතර නැතුවා නොවේ. නමුත් ඒ බොහෝ ළඳුන් අප්‍රමාණ ශක්තියකින් හෙබිවුන්ය. කලාත්මක, සාහිත්‍යමය, තාක්ෂණික, කෘෂිකාර්මික, වාණිජමය වැනි නොයෙකුත් කුසලතාවන්ගෙන් පරිපූර්ණ වූවන් ය.

තමන් සතු එම ශක්තීන් භාවිතයට නොගැනීම සැබවින්ම ශ්‍රී ලාංකික කාන්තාව තමාටම කරගන්නා අසාධාරණයකැයි සිතේ.

නොයෙකුත් දුක් වේදනා සිත තුළම සඟවා තබාගනිමින්, තමා විසින්ම නිර්මාණය කරගත් කිසියම් සංස්කෘතික රාමුවක් තුළ ම සිරගතවෙමින් ජීවිතය විඳවන තැනින් ඔවුන් පිටතට ආ යුතු නොවේද? මේ දිනවල පවත්නා දේශපාලන අස්ථාවර තත්ත්වය යටතේ හඬනංවන තරුණ දරුවන් අතර ඉස්මතු වන ප්‍රබල කාන්තා හඬවල් අපි අසා සිටිමු. එය සතුටට කාරණාවකි. ජාති ආගම් කුල භේද කිසිත් නොමැති ඒ වපසරිය තුළ ස්ත්‍රී, පුරුෂ භේදයක් ද නොමැති බවක් පෙනේ. එය එකී රාමුවෙන් පිටතදී ද නොසැලී නොබිඳී දිගින් දිගටම පවත්වාගත හැකිනම් නිහඬ නිදහස් අරගලයක් තුළින් අපේ රටට අයත් කරගත හැකි වූ තවත් එක් මිහිරි ප්‍රතිඵලය ක් වනු නිසැකය.

සාමාන්‍යයෙන් ඉංග්‍රීසි සාහිත්‍ය කෘති පරිශීලනය කරන කාන්තාවක් ලෙස සහ අසා, දැක, කියවා ඇති පරිදි අපේ රටේ කාන්තාවන් තුළ මා දකින තවත් පසුගාමී තත්ත්වයක් තිබේ. වයස 60-65 වන විට අපේ රටේ සමහර කාන්තාවෝ ජීවිතය අත් හරින්නට සැදී පැහැදී බලාගෙන හිඳිති. දැන් ඉතින් ඊළඟ ආත්මය වෙනුවෙන් සූදානම් විය යුතු යැයි තීරණය කොටගනිමින් තම ජීවිතයේ නොයෙකුත් අභිමතාර්ථයන් පවා අත් හැර දමති. එක අතකට එය මහත් ආත්මාර්ථකාමී සිතුවිල්ලක් නොවේද? රට දැය සමාජය වෙනුවෙන් ඉන් එහා ඔවුනට කළ හැකි යුතුකම් සහ වගකීම් කොතෙක්නම් තිබෙනවාද?

සැබවින්ම ගැහැනු අප පුරුෂාධිපත්‍යය, වයස වැනි නොයෙකුත් අනවශ්‍ය, අසාධාරණ තක්සේරු කිරීම් යටතේ පසුබා සිටිය යුතු නැත. ගැහැනිය කාර්යක්ෂම ය. නුවණ ඇත්තීය. සැලසුම්සහගතව කටයුතු කරන්නීය.

''කියන ලද යමක් ගැන සොයා දැන ගන්නට නම් ඔබ පිරිමියෙකු හමු විය යුතුව ඇත. කරන ලද යමක් ගැන සැබෑ තතු සොයා විමසන්නට නම් ගැහැනියක හමුවන්නට සිදුවනු ඇත.''

*එක්සත් රාජධානියෙහි අග්‍රාමාත්‍යතුමියව සිටි (1979-1990) මාග්‍රට් තැචර් වරෙක එසේ පවසා ඇත්තීය.*



සුනිලා විජේසිංහ



# වසර තිහකට පසු සිදුවන සෙනසුරු මාරුව ඔබට සහ රටට

අප්‍රේල් 29 වැනිදා සිදුවුණ සෙනසුරු මාරුව පිළිබඳව විවිධ ජනමාධ්‍යයන් හරහා මේ වනවිට සාකච්ඡා කර තිබේ. ජීවන ගැටලු රාශියකට මැදිහත්ව සිටින අසරණ ජනතාව, මේ සෙනසුරු මාරුවෙන් වත් යහපතක් සිදුවේ දැයි හිතනවා විය හැකිය. එබැවින් මේ පිළිබඳව පසු විපරමක් කිරීම මේ ලිපියේ අරමුණයි.

ආකාශ වස්තුවක් හෙවත් ග්‍රහයකු වන සෙනසුරු මිනිසුන්ට අපල කරන්නේය යන මිත්‍යා මතයන් කාලයක සිට සමාජයේ මුල් බැසගෙන තිබේ. ආකාශ වස්තුවක් වන ග්‍රහයකු අපල කරන්නේ කෙසේ ද? මුලින්ම ග්‍රහ අපල වශයෙන් හඳුන්වන්නේ කුමක් ද යන්න වටහාගත යුතුය. කේන්ද්‍රයක ග්‍රහ පිහිටීම්වලින් පෙන්වන්නේ කර්ම විපාකයි. යමකු කරන ලද කර්ම විපාක මෙසේ යැයි හඳුනාගැනීම මිස ග්‍රහයන් ශුභ හෝ අශුභ දෙන්නේ නැත. මේ අනුව යමකු කළ අකුසල කර්ම විපාක සෙනසුරු අපල ලෙස හඳුනාගැනීම අවශ්‍ය වේ.

සේවකයන්ට වැටුප් නොදීම, විවේකය නොදීම අනුන්ගේ දුකට සවන් නොදීම, ඊර්ෂ්‍යාව නිසා උතුමන්ට කරන ගුරුහරකම්, අපවාද, හදි හූනියම් කිරීම, බොරු ප්‍රචාර කිරීම, දේපළ කොල්ලකෑම ආදිය නිසා ඇති වන රෝග පීඩා දුක් කරදර සෙනසුරු අපල වශයෙන් උදා වෙයි.

මේ අනුව අප්‍රේල් 29 වැනිදා සිදු වූ සෙනසුරු මාරුව ද කර්ම විපාක පෙන්වන බව හඳුනාගත හැකිය. අතීතයේදී කරන ලද අකුසල විපාක වර්තමානයේදී දුක් ඇති කරන්නේ නම්, වර්තමානයේ කරන දේ අනාගතය තීරණය කරනවා ඇත. එනම් අද කරන දේ අනුව අනාගතය තීරණය වන බවයි. මේ නිසා අපලවලට බිය වීමට අවශ්‍ය නැත. අතීත කර්ම ගැන පසුතැවිලි වීමට ද අවශ්‍ය නැත. අතීත කර්ම අහෝසි කොට සැප ලැබීමට අංගුලිමාලට පුළුවන් උනානම් ඔබට ද මට ද එසේ කළ හැකිය. උපන් ලග්න අනුව එසේ කළ යුතු දේ පහත දක්වනු ලැබේ.

මේ අතර ශනි ග්‍රහයා මාරු වූයේ ශනිට ම හිමි රාශිය වන කුම්භ රාශියටය. මේ නිසා තරමක ශුභඵල අපේක්ෂා කළ හැකිය. ශනි බලවත් වීම යනු වැඩ කරන ජනතාවට ශුභඵල දීමකි. මේ නිසා පොදු ජනතාව ලබන ජයග්‍රහණ කිහිපයක් ඉදිරි මාස දෙක තුළදී අත්දැකීමට ලැබෙනවා ඇත. නමුත් මේ ශනි මාරුව ජූලි 12 දක්වා පමණක් පවතී. ශනි වක්‍ර වී නැවත මකර රාශියට පැමිණේ. මේ නිසා ඉහත ධනාත්මක තත්ත්වය නැවත මුල් තත්ත්වයට ම පැමිණීම අපේක්ෂා කළ යුතු වේ. ග්‍රහයන්ට ම තැන නොදී අප කරන යහපත් ක්‍රියාකාරකම්වලින්ම තත්ත්වය ජයගත යුතුවේ. පහත සඳහන් වන්නේ උපන් ලග්න අනුව ශනි මාරුව නිසා ඇති විය හැකි ප්‍රතිඵල හා පිළියම් වේ.

### මේෂ



මේෂ ලග්න හිමියන්ට යහපත් මිතුරන්ගේ ඇසුර ලැබේ. සහෝදරයකුට සුබයි. සේවක සහයෝගය ලැබේ. උසස් අයගේ උදව් උපකාර ද ලැබේ. නායකත්ව ගතිගුණ ඉස්මතු වේ. ගෞරවය ලැබේ. නමුත් ගුරු දුර්වලව ගමන් කරන නිසා ශරීරයේ සීනි හා මේදය නිසා ඇති වන රෝගවලට ඉඩ තිබේ. භික්ෂූන් වහන්සේලාට හෝ පූජ්‍ය පක්ෂයට ඖෂධ පරිත්‍යාග කිරීම, ගැබිනි මාතාවන්ට දන්දීම, සිල් සමාදන් වන අයට ඇඳුම් පරිත්‍යාග කිරීම, මේ අපල දුරුවීමට හේතු වනවා ඇත. සෞඛ්‍යය රැකගන්න.

### වෘෂභ



ඔබේ ලග්නයෙන් දහවැන්නට ශනි මාරු වීම මිශ්‍රඵලදායක බව පෙනේ. නමුත් ආදායම් මාර්ගවලට තිබූ බාධා ඉවත් වේ. උසස් මිතුරන් හඳුනාගැනීමට ඉඩ ලැබේ. අධ්‍යාපන කටයුතුවලින් ජය ලැබේ. නමුත් රවි හා රාහු දශා ගත කරන අයට උෂ්ණාධික රෝග හා හිතේ අවුල් බව ඇති කරයි. උඳු ගිතෙල් මිශ්‍ර කිරි ආහාර පූජාව, ආලෝක පූජාව ගුණදායකයි. වැදගත් තීරණ ගන්නා සෑමවිට ම විශේෂඥ උපදෙස් ගැනීම මැනවි. සූරිය පිරිත භාවිත කරන්න. උෂ්ණාධික ආහාර පාන හා තෙම්පරාදු ආහාර අඩුකරන්න.

### මිථුන



මෙතෙක් තිබූ ශනි ඒරාෂ්ටක අපලය තරමක් දුරට සමනය වේ. ශනි මාරුව නවවැන්නට සිදු වේ. මේ අතර බුධ දොළහේ ගමන් කරයි. ගෘහ ජීවිතයට තරමක බාධා ඇති වීමට ඉඩ තිබේ. දිළිඳු ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අධ්‍යාපන උපකාරක පරිත්‍යාග කරන්න. ධර්ම ප්‍රචාරය, දහම් පඬුරු පූජාව නිසා අපල දුරු වේ. කතාවෙන් ප්‍රවේශම් වෙන්න. අන් අයගේ දුක් කරදරවලට සවන් දෙන්න. කරණීය මෙත්ත සූත්‍රය භාවිත කරන්න.

### කටක



ඔබේ කේන්ද්‍රය ශනි අටවැන්නට මාරු වන්නේ කුජත් අටවැන්නේ සිටියදීයි. මෙයට අමතරව ගුරු භාග්‍යස්ථානගතව ගමන් කරන නිසා මිශ්‍රඵලදායක තත්ත්වයක් ඇති කරාවි. මුල් මාස දෙකක කාලය නායකත්ව ගති ගුණ මතු වෙයි. රැකියා සාර්ථකයි. පෙර පින වාසනාව ක්‍රියාත්මක වෙන නිසා බොහෝ දේ ජයගන්න අමාරු නෑ. නමුත් ශනි ඒරාෂ්ටක තත්ත්වයක් තියන නිසා ශරීර සෞඛ්‍යය රැක ගැනීම අවශ්‍යයි. සතුන්ට අභය දානය දීම, ලේ දන්දීම, ඖෂධ පූජා කිරීම වැනි පිංකම් නිසා මේ අපල දුරු වී සුබඵලදායක තත්ත්වයන් ඇති වේවි.

### සිංහ




ශනි හත්වැන්නට මාරු වෙනවා. රවි උච්චව නවයේ ගමන් කරයි. සේවක පක්ෂයේ සහයෝගය ලබාගන්න පුළුවන්. බිරිඳ නැත්නම් සැමියාට සුබදායකයි. ඔබේ කේන්ද්‍රයේ ගුරු අටවැන්නේ ගමන් කරන නිසා අවිවේකි බවක් ඇති වෙන්න පුළුවන්. ඒ වගේම රුධිරගත සීනි/ කොලෙස්ටරෝල් වගේ රෝග තත්ත්වයන් තියනවා නම් ටිකක් ප්‍රවේශම් වෙන්න. වෛද්‍ය උපදෙස් පිළිපදින්න අමතක කරන්න එපා. මේ අපල සමනය වෙන්න බෙහෙත් ද්‍රව්‍ය දන්දීම, අටපිරිකර පූජාව, චතු මධුර පූජාව හොඳයි. දස දිසා පිරිත භාවිත කරන්න.

### කන්‍යා



සෙනසුරු ඔබේ ලග්නයෙන් හයවැන්නට මාරු වීම සුබයි. උත්සාහය ඉහළ යනවා ඇත. සේවක පක්ෂයේ සහයෝගය ලැබේ. නමුත් රවි රාහු අටවැන්නේ ගමන් කරන නිසා උෂ්ණාධික රෝග, රුධිර ධාවනය පිළිබඳ ගැටලු, මානසික ආතතිය වැනි අපල ඇති වීමට ඉඩ ඇත. උසස් අය ඇසුරු කිරීම, උපදෙස් මත තීරණ ගැනීම මැනවි. ආලෝක පූජාව, මෛත්‍රී භාවනාව හා දිනපතා ආගමික වතාවත් කර සූරිය පිරිත භාවිත කිරීම මෙම අපල දුරු කර ගැනීමට හේතුවේ.

### තුලා



තුලා ලග්න හිමියන්ගේ ලග්නයෙන් පස්වැන්නට ශනි මාරුවීම සිදුවන අතර ගුරු හයවැන්නේ ගමන් කරයි. විවාහ මංගල යෝජනා හෝ පෙම් සබඳතා ස්ථිර කර ගැනීමට බාධා ඇති වීමට ඉඩ තිබේ. මුදල් ආයෝජනය කරනවිට දුරදිග බලා කටයුතු කරන්න. අලස බව, වැඩ කල්දැමීම ආදිය අධ්‍යාපන කටයුතුවලට බාධා ලෙස පෙන්වයි. මේ අපල දුරුකර ගැනීමට දිළිඳු ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට උදව් දෙන්න. අධ්‍යාපන උපකරණ පරිත්‍යාග කරන්න. ධර්ම දේශනා කරවීම, දහම් පඬුරු පූජා කිරීම, ඖෂධ පූජා කිරීම විශේෂ ශාන්තිකර්ම වන්නේය.

### වෘශ්චික



ලග්නපති කුජ සමග ශනි හතරවැන්නේ ගමන් කිරීම ආරම්භ කරයි. ගෘහ ජීවිතය පිළිබඳව තරමක බාධා ඇති වීමට ඉඩ තිබේ. නමුත් ඉඩම්වල දියුණුවට කරන කටයුතු සාර්ථක වේ. ගුරු පස්වැන්නේ ගමන් කිරීම සුබයි. දරුවන්ගේ දියුණුවට කරන කටයුතු සාර්ථක වේ. විභාගවලින් සමර්ථ වේ. මංගල යෝජනා ස්ථිර වේ. කේතු දශා ගත කරන අය ශරීරයේ පෝෂණය ගැන සැලකිලිමත් වෙන්න. විටමින්, යකඩ අඩංගු ආහාර ගන්න. කළු පාට ඇඳුම් අත්හරින්න. කරණීය මෙත්ත සූත්‍රය භාවිත කරන්න. මෛත්‍රී භාවනාව කරන්න.

### ධනු



ශනි ග්‍රහයා ලග්නයෙන් තුන්වැන්නට මාරුවීම සුබයි. අධික වියදම පාලනය කර ගැනීමට හැකි වේ. උත්සාහය හා ධෛර්යය වැඩි වේ. ප්‍රයෝජනවත් ගමන් බිමන් යෙදේ. සේවක සහයෝගය ලැබේ. ගෘහ ජීවිතයේ දියුණුවට කරන කටයුතු සාර්ථක වේ. ස්වයං රැකියාවලින් ලාභ ලැබේ. රාහු දශා ගත කරන අය මුදල් ආයෝජනය ප්‍රවේශමින් කළ යුතු වේ. උදරාබාධ ආශ්‍රිත, හිසේ රෝග, ගැස්ට්‍රයිටිස් වැනි රෝග ඇති විය හැකියි. බලු කපුටු දානය දීම, චන්ද පිරිත හා සූරිය පිරිත භාවිත කිරීම මැනවි.

### මකර



ලග්නයෙන් දෙවැන්න ශනි මාරුවීම නිසා වියදම් ඉහළ යෑමට ඉඩ තිබේ. පවුලේ වියදම් පාලනය කර ගන්න. මේ අතර රවි හතරවැන්නේ ගමන් කරයි. මේ නිසා රුධිර ධාවනය පිළිබඳ රෝග හා උෂ්ණාධික රෝගවලින් ප්‍රවේශම් වෙන්න. පහන් ආලෝක පූජාව, අසරණ කෙනකුට ඇස් කණ්ණාඩියක් පරිත්‍යාග කිරීම, උඳු ගිතෙල් මිශ්‍ර කිරි ආහාර පූජාව, අපල දුරුවීමට හේතුයි. එමෙන්ම දිනපතා ආගමික වතාවත් කර සූරිය පිරිත භාවිත කරන්න.

### කුම්භ



ශනි ලග්නයට මාරු වන අතර කුජ ද ලග්නයේම ගමන් කරන නිසා මිශ්‍රඵලදායක බවක් පෙන්වයි. ආදායම් තත්ත්වය සතුටුදායක වෙයි. ගෙදර දියුණුවට කරන කටයුතුවලට තිබූ බාධා ඉවත් වෙනවා ඇත. උත්සාහය උනන්දුව වැඩි වේ. සේවක සේවිකාවන්ගේ සහයෝගය ලැබේ. ඉක්මන් කෝපය හා කලබල වීම නිසා ගැටලු ඇති විය හැකියි. තුවාල ලත් රෝගීන්ට උපකාර කිරීම, ලේ දන්දීම, සතුන් මරනයෙන් නිදහස් කිරීම, අපල දුරු වීමට හේතුයි. මංගල සූත්‍රය භාවිත කරන්න.

### මීන



සෙනසුරු දොළොස්වැන්නට මාරුවීම හා ගුරු ලග්නයේ ගමන් කිරීම මිශ්‍රඵලදායක බව පෙන්වයි. විදේශ ගමන් පිළිබඳ බලාපොරොත්තු සාර්ථක වීමට ඉඩ තිබේ. දුරගමන් යෙදේ. එහෙත් වියදම් ඉහළ යා හැකියි. ආදායම් මාර්ගවලට ද තරමක බාධා පවතී. දුගී දුප්පත් අයට හැකි අයුරින් උපකාර කරන්න. අන් අයගේ දුක් කරදරවලට සවන් දෙන්න. ලේ දන්දීම විශේෂයි. දිනපතා කරණීය මෙත්ත සූත්‍රය භාවිත කරමින් ටික වේලාවක් වත් මෛත්‍රී භාවනාව කරන්න. අපල දුරු වේ.

කෑගල්ලේ **සුනිල් කුමාර ගම්ලත්**
දු.අංකය - 0771 234 313





# බෝධි පූජා සාර්ථක වීමේ එකම රහස...

## අපල සඵල කරන බොදු පිළිවෙත් 03

ජෝති යනු ආලෝකය හෙවත් බැබළීමයි. රාත්‍රී කාලයේ දී ආලෝකය විහිදුවන ග්‍රහ වස්තූන් හා දිවා කාලයේ ආලෝකය පතුරුවන හිරු දෙස බලා ඒවා විශ්වයේ ගමන් කරන ස්වභාවය අනුව ලෝකයට සිදුවන යහපත හා අයහපත විමසන හා පෙන්වා දෙන ශාස්ත්‍රය ජ්‍යොතිෂය වේ. එනම් යම් මනුෂ්‍යයකු තමන්ගේ කුසල් අකුසල් අනුව උපදින ස්ථානය හා වේලාව අනුව විශ්වයේ ග්‍රහ තරු පිහිටීම තුළ එම පුද්ගලයාගේ ජන්ම චරිතය හා පෙර ආත්මවලදී කරන ලද පින් පව් අනුව මෙලොව දී ඔහුට හෝ ඇයට සිදුවන හොඳ හෝ නරක දේවල් එළිදැක්වීම මෙම ශාස්ත්‍රය උපයෝගි කරගනිමින් කළ හැකිවේ. ජ්‍යොතිශ්‍ය වනාහි ඉපැරණි ශාස්ත්‍රයක් වන නමුත් ඕනෑම කෙනකු මේවායේ ප්‍රමාණයට වඩා අන්ධානුකරණයෙන් එලඹගෙන නොසිටිය යුතු වේ. එනම් එය රාත්‍රී කාලයේ දී ගමන් කිරීමට විදුලි පන්දමක් පාවිච්චි කරන්නකුට හා සමානය. එනම් අඳුරේදී වළවල්වල නොවැටී, ගල් මුල්වල නොවැදී විවිධ බාධකයන් ජය ගෙන තම ඉලක්කය කරා යෑමට ඔහුට එම විදුලි පන්දම උදව් උපකාරී වේ. ජ්‍යොතිෂය ද මෙවැනිම වේ. එසේම බුද්ධිමත් ජ්‍යොතිර්වේදීන් ප්‍රකාශ කරන්නේ ග්‍රහයින් අපල නොකරන බවය. එනම් අප පෙර ජීවිතවල කරන ලද කුසල් අකුසල්ම අපගේ අද ජීවන තත්ත්වය සඳහා ප්‍රධාන හේතුවම වේ. අප අද කරන කුසල කර්මයන් තුළින් පෙර කරන ලද අකුසල කර්මයන්ගේ යම් ප්‍රමාණයක් යටපත් කිරීම හා පෙර කරන ලද කුසල කර්මයන්ගේ සුබ ඵල ලබා ගැනීම කළ හැකි වේ.

ජ්‍යොතිර්වේදීන්ගෙන් තමන්ට අපල යැයි දැනගත් බොහෝ පිරිස් ඉන් පසුව බොහෝවිට කරනුයේ මිථ්‍යාදෘෂ්ටික මතවාදයන් කරපින්නා ගමන් කිරීමයි. රාජ්‍ය නායකයන් පවා විවිධ මිථ්‍යා දෘෂ්ටික මාර්ගයන්ගෙන් ගමන් කොට අඳුරෙන් අඳුරටම යන ආකාරයක් අද ද විද්‍යමාන වේ. එයින් වන්නේ අපල සඵල බවට පත්වීම නොව අපල තව තවත් අපල බවටම පත්වීමය. ඔවුන්ගේ මේ ජීවිතය සුගතිගාමී වුවද මෙම නිසා මතු ජීවිතය බොහෝ දුගතිගාමී විය හැකි වේ.

පෙර ලිපිවලින් අප පැහැදිලි කළ ආකාරයට අපල තත්ත්වයක් යනු අප පෙර කරන ලද අකුසල් මෙම ජීවිතය තුළ විපාක දෙන කාලයන්ම වේ. මෙම කාලයන් තුළ බෞද්ධයන් ලෙස අප කළ යුත්තේ දස අකුසලයන්ගෙන් වෙන්ව, දස කුසලයෙන් මත පිහිටා කටයුතු කිරීමය. තවද එහිදී මූලිකවම දෙවියන්, බ්‍රහ්ම රාජ්‍යයන්ගේ පවා වන්දනාවට නිරන්තරයෙන් පාත්‍රවන, බොහෝ දෙවිවරුන්ගේ ද ශාස්තෲවරයා වූ සත්ථා දේවමනුස්සානං වන ඒ භාග්‍යවතුන් වහන්සේ නිවැරදිව සරණ යෑම හා නිරන්තරයෙන් වන්දනාමාන කිරීම කළ යුතුය.

චත්තාරෝ ලෝකේ පජ්ජෝතා
පංච මෙත්ත න විජ්ජති
දිවා තපති ආදිච්චෝ
රත්තිං ආභාති චන්දිමා
අත අග්ගි දිවාරත්තිං
තත්ත පකාසති
සම්බුද්ධො තපතං
සෙට්ඨෝ ඒසා ආභා අනුත්තරා ති,

ආලෝක සතරක් තිබෙයි. නමුත් ආලෝක පහක් නැත. දවල්ට සූර්යයා බබළයි. රාත්‍රියට සඳ බබලයි. දිවා රාත්‍රී දෙකේම ගින්න බබළයි. මේ බබළන හැම දේකටම වඩා සම්බුදු රජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨය. ඒ ආලෝකය අනුත්තර වේ යන්න එම ගාථාවේ අර්ථය යි.

මේ අනුව මෙම ලොව සෑබෑම ආලෝකය වන දෙවියන් බඹුන් පවා වඳින සම්බුදුරජාණන් වහන්සේ අප ද වන්දනා කරන විට අපට නිරන්තරයෙන් දේව ආශිර්වාදයම ලැබේ. එහිදී බෝධි වන්දනාව මූලික වශයෙන් බුදුරජාණන් වහන්සේගේ පවා නේත්‍ර වන්දනාව ලද (අනිමිසලෝචන පූජාව) වන්දනාමාන සිදුකරන්නට අනුදැන වදාළ (ආනන්ද බෝධි පුවත) උතුම් පූජාවකි. පසුගිය කලාප දෙකකින් අප බෝධි පූජාව සිදුකිරීමෙන් අකුසල කර්මයන් වෙනස් වූ මේ ජීවිතේම උදාහරණ කිහිපයක් දැක්වූවෙමු.

නමුත් බෝධි වන්දනාවේ සාර්ථකත්වය සඳහා බලපාන ප්‍රධානම කාරණා ගණනාවක් ඇත. ඉන් කිහිපයක් අද සරලව මෙසේ අප සාකච්ඡා කරමු.

1) බෝධි වන්දනාව කරන දින කිහිපය තුළ දස අකුසල්වලින් වෙන්වී දස කුසල් වෙත පැමිණිය යුතුය.
2) එම දින කිහිපය තුළ ආජීව අෂ්ටමක සීලය සමාදන් වීම කළ යුතුය.
3) බුදුරජාණන් වහන්සේගේ ගුණ මොනවාද යන්න සොයා බලා එම බෝධි පූජාව සිදුකරන කාලය තුළ නිරන්තරයෙන් බුදුගුණ සිහි කිරීම කළ යුතුය.
4) කරණීය මෙත්ත සූත්‍රය රතන සූත්‍රය, ධජග්ගසූත්‍රය මෙවැනි සූත්‍ර සජ්ඣායනා කිරීම කළ යුතුය.
5) බෝධි වන්දනාවට පෙර අදාළ ස්ථාන සුද්ද පවිත්‍ර කිරීම කළ යුතුය.

සියලු අකුසල්වලින් වෙන්වූ (අරහං) සියලු අකුසලයන්ගෙන් වෙන් වීමට නිසි මග පෙන්වූ (බුද්ධ) ඒ ශාස්තෲවරයාණන් ශ්‍රද්ධාවකින් යුතුව වන්දනාමාන කරන විට සිදු වන්නේ පෙර කරන ලද අපගේ අකුසලයන් යටපත්වී කුසල ශක්තීන් මතු වීම වේ.

එනම් බෝධි පූජා සාර්ථක වීමේ ප්‍රධාන රහස ශ්‍රද්ධාවකින් යුතුව කිරීමම වේ. ඔබගේ නිවසේ ප්‍රධාන දොරටුවේ යතුරින් ඔබගේ අල්මාරිය හෝ වෙනත් දොරටුවක් විවෘත කළ නොහැකිය. ඒ ආකාරයම බෝධි වන්දනාව යම් දොරටුවක් නම් එය සාර්ථකව විවෘත කිරීමේ යතුර ත්‍රිවිධ රත්නය කෙරෙහි ශ්‍රද්ධාවම වේ. එසේ නම් ඔබ බෝධි පූජාවක් සාර්ථකව සිදුකිරීම සඳහා මූලිකවම එහි භෞතික පැත්තට වඩා අවධානය යොමුකළ යුත්තේ ඔබගේ ශ්‍රද්ධාව බලවත් කර ගැනීම වෙතමය. එහිදී ඔබ මූලිකවම නව අරහදි බුදු ගුණයන්ගේ තේරුම හොඳාකාරවම දැන සිටිය යුතුමය.

පෙර කරන ලද අකුසලයන් නිසා දුකට පත් වී සිටින අප, සියලු දුක් දුරු කළ, සියලු දුක් නසන මඟ දෙසූ ඒ ශාස්තෲවරයන් සඳහා ශ්‍රද්ධාවෙන් බෝධි පූජා සිදු කරන විට, සියලු දුකින් මිදෙන මාවතකට අපත් යොමුවී අපගේ ද අපල සඵල වීම සිදු නොවන්නේ ද යන්න ඔබම මදක් බුද්ධිමත්ව සිතා බලන්න.

ජ්‍යොතිෂවේදී, මනෝවිද්‍යා උපදේශක
● ශාස්ත්‍රපති, **ශ්‍රී නුවන්තික බුලත්සිංහල**
දම්හිරු ජ්‍යොතිෂ උපදේශන සේවය
දු. අ 0706181000/ 0777957700

# නැකත් වරුණ කවියෙන්

● **අද....**

සංචාරයට කොයි කවදත් හිත — බැන්ද
සංතෝෂයම අතොරක් නැතිවම — වින්ද
සංවේගයට පත්වන අය අත — රින්ද
සම්මානයකි අද නැකතට පට — බැන්ද

බරුවා ලෙඩෙකි දිවිමග තුළ යන — තුරුම
දරුවන් නිසා උසුලයි අපමණ — කරුම
සරු බව තිබෙන මුත් මතුකරදී — කරුම
සරු බව නිසරු වෙයි පෙරළෙයි — නිරතුරුම

පෙරළෙන පැත්තකින් ජය ලැබ ගැනුමෙ — මඟ
අරගෙන දකියි ජීවන දුක රඟන — රඟ
කරගත් වැරදි ගැන නොතැවෙයි අතර — මඟ
පර තෙර සොයයි එතුළින් මුදුනටම — නැඟ

වැඩ කරනවා කොතැනත් ලොව ප්‍රකා — සෙට
හැඩ වැඩ වේවි යයි ඉහළම සමා — ජෙට
හඬ පතුරවයි බලවත් ලෙස බලා — සිට
ඉඩ කඩ ගෙනෙයි නොදැනිම තම විනා — සෙට

බල බල ඉන්න බැහැ එන අවහිරය — පෙනී
කලබල ගතිය නිරතුරුවම පෙරට — පනී
උල හෝ පිලත් එක යැයි ඇත සිතට — දැනී
කළ සැම වරදෙ වගකීම ද අතට — ගනී

● **පුනාවස**

වංශය කුලය පිළිබඳ නැඹුරුවක් — ඇත
ළංකර ගනී දියුණුව පිළිවෙළක් — මත
සුන්කර නොගෙන පිළිවෙළ තම පැතුම — මත
අන්තිම මොහොතේදී ජය දද නඟනු — ඇත

පුනා වසේ මනා විසේ යන කියමනට — ලෙද
ගෙනා කුසලතා පෙන්වයි සබය — මැද
මනා ලෙසින් පිරිපුන් වුණ නුවණ — මැද
තනා ගනී සැප සම්පත් සිතුව — ලෙද

පිරුණු ගුණය ඇති ලෙද හද තුළ — රන්දා
දරුණු බවද ඇත හදවත යට — රන්දා
කරුණු කාරණා නිසි නොම දත් — හන්දා
කෙරුණු දීගයේ සැප ඇති වේවිද — මන්දා

සිත දියුණුවට දෙන ගැඹුරැති සතර — වෙත
සිත යොමු කෙරෙයි, උරුමයෙ අත්ගුණය — ඇත
ඇත හැකියාව කොයි කාටත් ගෙනෙන — සෙත
නිතරම ඇදෙයි තුම් ලොව්තුරු ගුණය — වෙත

උගතුන් පඬිවරුන් ඇසුරෙහි නිති — යෙදෙන
අග කළ හේතුවකි, එය පන්සලෙ — රැඳෙන
ළඟ නොව බොහෝ දුරකට සිතුවිලි — ඇදෙන
මග සොයනවා සරු සාරය වෙත — බැඳෙන

● **පුස...**

සුරු විරු ගතිය පා දිරි බව පෙරට — දිදී
අරු මැති ලෙසින් යයි දිවිමග ඉහළ — ඇදී
කරුණා ගුණය ඇත යුතුකම සමග — බැඳී
බොරු සටකපටයන් දැනගෙන මුත් හොඳට — හිඳී

දෙක තුන වයස්වල සිටදී දඟැති — විසේ
සැක නැත තැලුම්, වැටෙමින් ඇති කරන — හිසේ
එක එක වරට වැටි, නැගිටින, හරින — දොසේ
නැකතෙහි බලය, එසේ මෙසේ නොවෙය — පුසේ...

● **සිතුවිලි...**

සිතුවිලි හොඳයි උත්සාහෙද අපිරි — මිතයි
මිතුරන් රැකී සැම නෑදෑයන්ට — හිතයි
පතුරන ගුණය පරිසිදු බව සමග — ඔතයි
නෙතු පිය වෙන්න පෙර කළ හොඳ නරක — සිතයි

ළංවෙන පැත්ත මත හොඳ නරකට — මුසුව
ළංකර ගනී, නම, තම දේපොළ — නැසුව
සුන්වුණ පසුව, යළි නැණ බලයට — පසුව
තැන්පත් වෙන්නෙ මැදි වයසෙන් — පසුව...

කොහොම නමුත් කරදර බාධක — අධිකයි
මොහොතින් මොහොත සිය අදිටන මත — රජවෙයි
පොහොසත් මෙන්ම සරු බව ලැබගනු — නියතයි
බොහොවිට විවාහය සැප දෙනවා — නියතයි...

● **පුවපල්**

පිය පතු මතය ගැටුමක දෙන — පුරුද්දට
පිය උරුමයටද වැඩි දුරකට දුරස් — කොට
සිය නැණ බලය, දිරියද දී — ඉලක්කෙට
දිය ජය ගනී නිරතුරු ජය — පසක්කොට

අවතැන් වන නමුදු ජීවිත කාලයෙදි — පොඩි
දිව යයි දිවිය උරුමය කරවමින — දැඩි
කව දත් පුදුම ලෙස බාධක ගතිය — මඩි
පව හැර පිනට තැන දීගෙන ලොව — වඩි

අම්මා තමයි සම්පත මේ — සැමගේම
සොම්නස හදයි දුක හැර සැම — මොහොතේම
දොම්නස වින්ද දුක් සලකුණු ඇති — සේම
සම්පත් ලබයි උත්සාහෙට සම — සේම

විසිතුරු හරණ සැප වාහන වැනි — දේට
රිසි බව වැඩියි උරුමය ළංවෙයි — ඊට
මැසිවිළි නඟන බව පෙනුමට තිබු — ණට
කිසි විට අහක නොබලයි තම වරි — ගේට

උස මිටි නොමැත කවුරුත් වසගයට — ගනී
කස කාරයන් මෙනි නොදැනීම පෙරට — පනී
විස බව නසන තැන කොතැනද හොඳට — දනී
පස මිතුරාගෙ ළඟ මුහුණට මුහුණ — ගනී....

හේලි ජ්‍යොතිෂඥ කාව්‍ය ශ්‍රී
● **බී. එස්. යූ. කේ. දිසානායක**

සාහිත බිමේ ඇවිද යන්න එන්න

# අකුරැදිගේ





# බක් මහ මතකය කවියක රැඳුණා

**බක් මාසය ගැන අනාදිමත් කාලයක සිට කවි ලියවුණේ බක් මාසයේ අසිරිය මුල් කරගෙන. බක් මාසය ගහ කොළ මලින්ඵලින් බරවෙලා රතුපාට එරබදු මල් පොකුරු අතර හැංගිලා කොහෝ කොහෝ හඬ පැතිරෙන අසිරිමත් මාසයක් විදියට අපේ මතකයෙ තියෙන්නෙ. රටම එකම උත්සව සැණකෙළි විලාසයක් ගන්න මාසයක් විදියටයි බක් මාසය නැත්නම් සිංහල දෙමළ අවුරුද්ද සැමරෙන මේ මාසය හඳුන්වන්නෙ. 1984 දි බක් මාසය ගැන අරීසෙන් අහුබුදු කවියා ලියපු පද්‍ය පංතියක අවුරුද්ද වර්ණනා කර තිබුණෙ මෙහෙම.**

රැස් අස් පෙළ දිනිඳු දෙව් රිය අදින නිති
'මින් රැස' කෙළවරට දැන් ළංවෙමින් ඇති
යන්නට 'එළු' රැසට නැකතින් කල් බලති
සිංහල අවුරුද්ද මින් ඇරඹෙති යි නිති

සූර්යයා මීන රාශියේ සිට මේෂ රාශියට ගමන් කිරීමෙන් සිංහල අවුරුද්ද ඇරඹෙන කියන අහුබුදු කවියා බක් මාසයේ අසිරිය වර්ණනා කරන්නෙ මෙහෙම.

ලබා නව යොවුන් යුවතියක ගේ වෙස
සොබා දම ද සැරසෙන ගෙන වසත් රස
දුබා හඹා 'බා අග > බග > බක්' මෙ මස
සුබා සිරි ගෙනේ අවුරුදු පඬුරු ලෙස

බක් මාසයේ අවුරුදු පඬුරු ලෙස සුබාසිරි ගෙනෙන බවයි අහුබුදු කවියා පවසන්නේ. වසන්ත රසයෙන් සැරසෙන බක් මාසය නව යෞවනියකගේ මුහුණුවරින් පැමිණෙන බව කියන්නේ අවුරුද්දේ සුන්දරත්වයත් අපේ මතකයට ගෙන එමින්. අවුරුද්ද එක්ක එකතුවුණු චාරිත්‍ර වාරිත්‍ර, නොනගතය, බුලත් හුරුළු, රබන් ඟැසූ සද්ද, ගැමි සිරියාව, ගැමි කෙළි සෙල්ලම්, යෞවන යෞවනියන් අතර පමණක් නෙවි ගමේ වැඩිහිටියන් අතරත් සුහද බවක් වෙනදා නොතිබුණු මිත්‍රත්වයක් ප්‍රදර්ශනය කළ වගක් තමයි අපේ මතකය. ඒත් අවුරුද්දේ මේ සුපුරුදු අසිරිය හැංගිලා ගිහිං අඳුරු අලුත් අවුරුද්දක මතකය අපට මුලින් ම ගෙනාවෙ 1971 බක් මාසයෙ දි.

දවස හරියට ම 1971 අප්‍රියෙල් 5 වන සඳුදා. අදින් අවුරුදු පනස් එකකට ඉස්සර දවසක අපේ රටේ ඉතිහාසයෙ පළමු වතාවට ඒ වෙලාවෙ විසාල ජයග්‍රහණයකින් දිනපු ආණ්ඩුවකට විරුද්ධ ව තරුණයො කණ්ඩායමක් රට පුරා ආයුධ ගත්ත කැරැල්ලක් පටන් ගත්ත දවස විදියට 71 අප්‍රේල් 5 මතකයෙ තියෙනව. 71 කැරැල්ල - තරුණ පිබිදීම වගේ නම් වලින් හැඳින්වුණු මේ ඓතිහාසික සංසිද්ධිය අද මතක් කරන්න පුරුදුවෙලා තියෙන්නෙ 71 කැරැල්ල කියල. 71 කැරැල්ලෙන් පස්සෙ 88-89 කාලයෙත් අපේ රටේ තරුණයො මුල්වෙච්ච කැරැල්ලක තොරතුරු අපේ මතකයට එනවා. මේ කැරලි හැම එකකින් ම අපේ රටේ තරුණ කණ්ඩායම් විසාල පිරිසක් ඝාතනයට ලක්වුණා. 71 දි නම් ඒ දවස්වල ආණ්ඩුව කැරැල්ලට සම්බන්ධවුණු තරුණ තරුණියො පුනරුත්ථාපනය කරල සමාජයට වැඩදායී තරුණ පුරවැසියන් විදියට ගෙන ඒමේ වැඩපිළිවෙළට නායකත්වය දුන්නෙ ඒ දවස්වල අගමැතිනිය සිරිමාවෝ බණ්ඩාරනායක. තරුණ පිබිදීමට සම්බන්ධවෙලා හිටිය බහුතරය උගත් පිරිසක් වුණ නිසාත් ඔවුන්ගෙන් වැඩිදෙනා ගම්වල සාමාන්‍ය දරුවන් වීමත් කැපී පෙනුණ විශේෂත්වයක්. මේ තරුණ නැගිටීමේ ප්‍රතිඵලයක් විදියට එදා ආණ්ඩුව සමාජ ක්‍රමයේ වෙනස්කම් අපේක්ෂාවෙන් සංශෝධන රාශියක් ම කළ බව ඉතිහාසය කියනව. අද මේ මොහොතෙත් අපේ රට ඒ වගේ ම අත්දැකීමකට මුහුණ දී ඉන්නව කියල සිහිපත් වෙනව. එදා අපේ රටේ විශ්වවිද්‍යාල පුනරුත්ථාපන කඳවුරු බවට පත් කරල චූදිතයන් අධිකරණය හමුවට ගෙන ගිය බවත් අධිකරණ තීන්දු අනුව ඔවුන්ට දඬුවම් ලැබුණු බවත් මතක යි. 71 තරුණ පිබිදීම පස්සෙ කාලෙක මේ රටේ සාහිත්‍ය කලා ක්ෂේත්‍ර හැම එකක ම නිර්මාණකරණයේ වැදගත් ම සාධකයක් වුණු වග පශ්චාද් කැරලි සමයේ බිහි වූ නිර්මාණ සාක්ෂි දරනව. 70 දශකයේ නිර්මාණ විදියට මේ කාලයේ පළ වූ කවි හඳුන්වන්නත් විචාරකයන් උත්සුක වුණා. 71 න් පස්සෙ පළ වුණු කාව්‍ය සංග්‍රහ බොහොමයක ම තරුණ පිබිදීමේ ඡායාවන් පේන්න තිබුණා. කවියෙ පමණක් නොවෙයි, කෙටිකතාව, නවකථාව, නාට්‍යය, සිනමාව, ගුවන් විදුලිය, ජන මාධ්‍යය ආදී සාහිත්‍ය කලා ප්‍රවර්ග හැම එකක ම නිර්මාණකරුවන්ට 71 කැරැල්ලත් ඊට හේතු වුණු කරුණු කාරණාත් බලපෑමක් වුණු බව පැහැදිලිව ම දකින්න පුළුවන් 71 කැරැල්ලේ බලපෑම් අපූරුවට පෙන්වන පද්‍ය කාව්‍ය නිර්මාණ දෙකක් මේ විෂය වෙනවා. පළමුවන නිර්මාණය තමයි අපගේ මහා කවියා ලෙස හඳුන්වන ගුණදාස අමරසේකර 1975 දී රචනා කළ දින පොතේ ලියූ කවිය නම නිර්මාණය. ආවර්ජනා කාව්‍ය සංග්‍රහයෙ තමයි ඒ කවිය ඇතුළත් වෙන්නෙ. දෙවනි කවිය විමල් දිසානායකගෙ ඛේදවාචකයක් කවි තුනක් නිර්මාණය. 1972 අප්‍රියෙල් පළවුණු ඉන්ද්‍රචාපය කවි පොතේ එන්නෙ.

### දින පොතේ ලියූ කවිය

*(සිය පුතු එවා ඇති ඔහු සතු අන්තිම වස්තුව වූ මුද්ද, ඔර්ලෝසුව, පෑන සහ ඇඳුම් පොදිය තුරුලු කරගෙන, පොලිසියක් ඉදිරිපිට වැලපෙන මවකගේ රූපයක්, 1971 කැරැල්ල සමයේ දී ලන්ඩන් පුවත් පතක පළ විය. දින පොතේ ලියන ලද කවියට නිමිත්ත එය වෙයි )*

'උඹේ මුද්ද අත් ඔරලෝසුව පෑන
ඇයි රත්තරන් පුතුනේ එව්වේ මොට ද
මතක් වෙන්න ද නැත් නම් විකුණගෙන
හාල් තුනපහේ අරගෙන කන්නට ද'

...........

මගෙ දින පොතේ කවියක් ඇත
එය ලියන්න ( නිම කරන්න )
බැතියක් නැත
අද නැති මුත් ඒ බැති සිත
කවදා හෝ ලිවිය යුතු ය

හිම වැටෙනා උදෑසනක
ලන්ඩන්යේ අඳුරු මගක
දෙ නෙත නැගුණු කඳුළු අතර
ඒ කව මගේ සිත ලියැවිණ

මගෙ දිනපොතෙ කවියක් ඇත
එය ලියන්න බැතියක් නැත
අද නැති මුත් ඒ බැති සිත
කවදා හෝ ලිවිය යුතු ය

ඔවුන් හරි ද අපි වැරදි ද
අපි හරි නම් උන් වැරදි ද
ඇති මග පියවිලි උඩින් ද
වගුරන ලේ වැල් තුළින් ද

නැගෙන කුකුස නිති මා සිත
සිඳලයි බැති සිත මා තුළ

මගෙ දිනපොතෙ කවියක් ඇත
එය ලියන්න බැතියක් නැත
අද නැති මුත් ඒ බැති සිත
කවදා හෝ ලිවිය යුතු ය

මම කවියෙකි හදැති සසල
ලොසත සියලු දුක වළඳන
ඒ දුක ලොවට කියනු විනා
නොමැත මසතු අන් යුතුකම

'උඹේ මුද්ද අත්ඔරලෝසුව පෑන
ඇයි රත්තරන් පුතුනේ එව්වේ මොට ද
මතක් වෙන්න ද නැත්නම් විකුණගෙන
හාල් තුනපහේ අරගෙන කන්නට ද'

අමරසේකර කවියාගේ හද සසැලෙන්නේ එතෙර සිටිය දී දකින මෙරට පුවතක් රැගත් පත්තර වාර්තාවකිනි. කවියා ම පවසන ලෙස ඔහු සැබැවින් ම සංවේදී සිදුවීමකින් සසල වන හදැත්තෙකි. විප්‍රවාසයේ සිටිය ද ඔහු ජීවත්වන්නේ ඔහුගේ සහෝදර ජනතාව සමග ය. ලන්ඩනයේ සිටින ඔහු සිත පුවත්පත් වාර්තාවකින් සසලවන්නේ ඔහු තම මව්බිමට, එහි වෙසෙන ජනතාවට ආදරය කරන්නෙකු නිසා බැවින් නොවෙ ද? කවියෙහි නිරූපිත අත්දැකීමට පසුබිම් වන දේශපාලනය ඔහු ප්‍රශ්න කරයි. එහෙත් ඔහු ප්‍රශ්නයට විසඳුම් ඉදිරිපත් නොකරයි. ඔහුගේ නෙතෙහි කඳුළක් නැගෙන්නේ හිම වැටෙන උදයක ලන්ඩනයේ අඳුරු මඟක දීය. ඒ කඳුළු අතර මේ කවිය ලියැවී ඇත. පුතු සොයා ගිය මවක ගේ චිත්ත රූපය මවන කවියා ඇ හද වූ දාරක ස්නේහය කුළුගන්වන්නේ පුතුගේ ඇඳුම් කැඩුම්, අත්ඔර්ලෝසුව, පෑන ඇ සන්තකයේ තිබෙන බව කීමෙනි. පුතු නොමැති ව ඇයට ඒ කිසිවක අගයක් වේ ද? හාල් තුනපහේ අරගෙන කන්නට ද යන්නෙන් ඇගේ පුත්‍ර ස්නේහය කෙතරම් විසාල ද යන්න පාඨකයනට හඟවයි. ලියා නිම කරන්නට බැතියක් නොවූ බැති සිත අවසන කවියක් ලෙස ලියැ වී ඇත. එය අප හද කම්පනයට පත් කරවයි. කවියකුගේ යුතුකම කුමක් ද? අමරසේකර කවියාගේ පිළිතුර කවියකුට පමණක් නොව ඕනෑ ම නිර්මාණකරුවකු විසින් ප්‍රගුණ කළ යුතු වූ උතුම් ගුණාංගයක් සිහිපත් කිරීමකි.

මම කවියෙකි හදැති සසල
ලොසත සියලු දුක වළඳන
ඒ දුක ලොවට කියනු විනා
නොමැත ම සතු අන් යුතුකම
දෙවැන්න ඛෙදවාචකයක්
: කවි තුනක්

අඳුරු රෑ එක දිගට
රුදුරු වෙඩි හඬ නැගිණ
සිහිනයක් කුඩු වෙමින්
ලේ ගඟක් ඇද හැලිණ

තරුණයකුගේ සිරුර
ගලන ලේ මත වැටිණ
නො එන පුතු දැන් එතැයි
බල බලා සුසුම්ලන
අසරණ වු මවකගේ
නෙත'ග නැගි දුක් කඳුළු
ඉතිහාසයේ කොපුල්
මත සෙමෙන් ගලා යයි

සිය දැතින් ගෙල සිඳගෙන
උණු ලේ වගුරාගෙන හිරු
ඇඹරි, කැරකී, පෙරළී
රකුසු අඳුර යට වැළලෙයි

මරණය කළු කොඩි නගමින්
සිය තෙද ඔද බල පෙන්වයි

දෙපසින් වෙඩි හඬ ගුගුරයි
වැලපුම් හඬ විහිදී යයි
ජීවිත පස් යට වැළලෙන
මරණය තව කොඩි ලෙලවයි

තැතිගෙන බියපත් වූ මම
ගන වනපෙත මැද තනි වූ
අසරණ මල් පෙත්තක් සේ
බලා සිටිමි අනාථ වී

කිසිදු දිනෙක මම අවියක්
නොම ලෙලදෙව්වෙමි සකි සඳ
කුරා කුහුඹුවෙකු හට මම
වධ හිංසාවක් නොකළෙමි
සැබෑ බසක් වේ මෙය නම්
එනමුත් මාගේ මතකය
බිහිසුණු රුදු රණ බිමක්ය
එහි නෙක අවි විසිරී ඇත
ගැලූ ලෙයින් නැහැ වී ඇත

විමල් දිසානායක කවියාගේ නිර්මාණයෙහි ප්‍රස්තුතය වන්නේ වෙඩි වැදීමෙන් මිය ගිය, නො එනා පුතකු පිළිබඳ සුසුම්ලන වැලැපෙන මවකගේ ශෝකාන්දරයකි. එකී සිදුවීමෙහි කථානායිකා මවගේ දුක් කඳුළු ඉතිහාසයේ කොපුල් මත සෙමින් ගලා යනු කවියා දකී. කවියා ඔහුගේ කවි බසෙහි විශේෂිත හා ඔහුට ම අනන්‍ය වූ රූපක භාවිතයෙන් නිර්මාණය කොට ඇති සංකල්ප රූප කාව්‍යානුභූතියෙහි ජීව ගුණය හා කවියාගේ පරිකල්පනයෙහි ප්‍රභාව ද මනාව විශද කරයි. හිරු රකුසු අඳුර යට වැළලෙන්නේ සිය දැතින් ගෙල සිඳගෙනය. මරණය සිය තෙද බල පෙන්වන්නේ කළු කොඩි පෙන්වමිනි. කිසිදිනෙක අවි අත නොදැරූ කවියා තැතිගෙන බියපත් ව අනාථ වී සිටින්නේ අසරණ මල් පෙත්තක් ලෙසිනි. ඔහු අවිහිංසාවාදී වුව ඔහු මතකය දිව යන්නේ නෙක අවි විසිරී ඇති රුදු රණ බිමක් වෙතය. ගැලූ ලෙයින් නැහැවුණු අවි එහි වේ. කාව්‍ය නිර්මාණය ආරම්භයේ කවියා අප හමුවට ගෙන ආ තරුණයා අවි දැරූවෙකු ද? ඔහුගේ සිහිනය ද රුදුරු වෙඩි හඬින් අඳුරු රැයක කුඩු වී යන්නේ? ඔහු එන තෙක් බලා සිටිනා මවගේ මුහුණෙහි චිත්ත රූපය අපට පෙනේ. එහෙත් ආ පුතු යළි නො එනා බව අපි දනිමු. එකී සිදුවීමෙහි ප්‍රතිවිරෝධය කවියා අපූරුවට ප්‍රතිනිර්මාණය කරයි. මේ කවියෙහි සිදුවීම වුව බක් මස මෙරට සිදු වූ සිද්ධීන් හි එක් සිදුවීමක් ලෙස කවියා දැක ඇති බව නිසැක ය. බක් මස මෙලෙස අඳුරු අත්දැකීම් රැගත් නිර්මාණ සාහිත්‍යයක ඇරැඹුම 71 අප්‍රේල් මස තරුණ පිබිදීමෙහි බලපෑමෙන් බිහි වූවක් නොවේද යන්න අඩ සියවසක මතකය ආවර්ජනය කරන කල්හි දැනේ. හැඟේ.


● බුද්ධදාස ගලප්පත්ති
bgalaps@gmail.com


# රංගන වින්‍යාසයේ හිරාන් මානය



**ලන්ඩනයේ වෘත්තීය රංග කලාවේ විශිෂ්ටත්වය අගැයීම වෙනුවෙන් පැවැත්වෙන 'ලෝරන්ස් ඔලිවියර්' සම්මාන උළෙල හෙවත්, 'ඔලිවියර්' සම්මාන උළෙල පසුගියදා ලන්ඩන් අගනුවර දී උත්සවාකාරයෙන් පැවැත්විණි.**

නාට්‍ය, සංගීතය, නැටුම්, ඔපෙරා ඇතුළු කාණ්ඩ ගණනාවක් ආවරණය කරමින් ලන්ඩනය පදනම් කරගත් නිෂ්පාදන සහ අනෙකුත් ප්‍රමුඛ පෙළේ වාණිජ නොවන සිනමාහල්වලට සම්බන්ධ පුද්ගලයන්ට මෙම සම්මාන පිරිනැමේ. ඊට අමතරව එහි විනිසුරු මඬුල්ලේ අභිමතය පරිදි තරගකාරී නොවන අංශයක් සඳහා ද විශේෂ 'ඔලිවියර්' සම්මානයක් සෑම වසරකම පිරිනමනු ලැබේ.

චිත්‍රපට සහ රූපවාහිනිය සඳහා වන 'බැෆ්ටා' සම්මාන උළෙල සහ සංගීතය සඳහා වන 'බ්‍රිට්' සම්මාන උළෙලට සමානව පැවැත්වෙන 'ඔලිවියර්' සම්මාන උළෙල ලන්ඩන් රංගන ක්ෂේත්‍රයේ ඉහළම ගෞරවාන්විත සම්මාන උළෙල ලෙස ජාත්‍යන්තරව පිළිගැනේ. එසේ ම මෙම 'ඔලිවියර්' සම්මාන උළෙල ඇමෙරිකාවේ බ්‍රෝඩ්වේ රඟහල වාර්ෂිකව පිරිනමන 'ටෝනි' සම්මාන ප්‍රදානයට සහ ප්‍රංශයේ 'මොලියර්' සම්මාන උළෙලට ද නොදෙවැනි ය.

මෙම සම්මාන උළෙල 1976 දී ලන්ඩන් රඟහල සංගමය විසින් 'සොසයිටි ඔෆ් වෙස්ට් එන්ඩ් තියටර්' සම්මාන උළෙල ලෙස ප්‍රථම වරට පවත්වන ලද අතර, එය නිර්මාණය කරන ලද්දේ චිත්‍ර ශිල්පී ටොම් මෙරිෆීල්ඩ් විසිනි. මෙහි පළමු සම්මාන උළෙල පැවැත්වූයේ 1976 දෙසැම්බර් මාසයේ දී ලන්ඩන් නුවර 'රෝයල් කැෆේ' හි දී ය.

1984 දී බ්‍රිතාන්‍ය නළු ලෝරන්ස් ඔලිවියර් මෙම සම්මාන උළෙල තමාට ගෞරවයක් ලෙස තමාගේ නමින් නැවත නම් කිරීමට සිය කැමැත්ත ලබා දුන් අතර, ඉන්පසු එය 'ලෝරන්ස් ඔලිවියර්' සම්මාන උළෙල ලෙස ප්‍රසිද්ධයට පත්වී ය. පසුගිය අප්‍රේල් 10 දා පැවැති මෙවර 'ඔලිවියර්' සම්මාන උළෙලේ හොඳම නළුවාට හිමි සම්මානය ශ්‍රී ලංකීය රංගන ශිල්පියකු වන හිරාන් අබේසේකර වෙත පිරිනැමිණි. ඒ, මැක්ස් වෙබ්ස්ටර් නිෂ්පාදනය කළ Life of Pi වේදිකා නාට්‍යය සඳහා ඔහු දැක්වූ විශිෂ්ට රංග කුසලතාව වෙනුවෙනි. එම සම්මාන උළෙලේ ඔහු සමඟ එම සම්මානයට නිර්දේශ වූ අනෙකුත් රංගන ශිල්පීන් වූයේ, Constellations වේදිකා නාට්‍යයේ රඟපෑ ඔමාරි ඩග්ලස්, The Normal Heart වේදිකා නාට්‍යයේ රඟපෑ බෙන් ඩැනියෙල්, Best of Enemies වේදිකා නාට්‍යයේ රඟපෑ චාර්ල්ස් එඩ්වර්ඩ්ස් ය. ඔවුන් තිදෙනාම ඉංග්‍රීසි ජාතික රංගන ශිල්පීන් වීම මෙහි තවත් විශේෂත්වයකි.

එංගලන්තයෙහි රාජකීය නාට්‍ය කලා ඇකඩමියෙහි (Royal Art & Drama Academy) උපාධිලාභියකු වන හිරාන් අබේසේකර කොළඹ නාලන්ද විද්‍යාලයේ ආදි සිසුවෙකි. ශ්‍රී ලංකාවේ 'ළමා හා යොවුන් රඟහල පදනම' මගින් නාට්‍ය හා රංග කලාව පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇති ඔහු 2007 වසරේ කොළඹ බ්‍රිතාන්‍ය කවුන්සිලයේ නිෂ්පාදනය වූ Peter Shafferzs Equus වේදිකා නාට්‍යයේ ප්‍රධාන චරිතය රඟපෑවේ ය. මේ හේතුවෙන් ඔහුට 'එක්සත් රාජධානියේ නාට්‍ය පාසල'ට ඇතුළත්වීමට හැකි වූ අතර, ඉන් පසුව ඔහුට ලන්ඩනයේ පිහිටි 'රාජකීය නාට්‍ය කලා ඇකඩමිය'ට ඇතුළත්වීමට හැකිවී ය. 2011 දී ඔහු එම නාට්‍ය කලා ඇකඩමියෙන් උපාධිය ලබාගත්තේ එවැන්නක් කළ දෙවැනි ශ්‍රී ලාංකිකයා බවට පත්වෙමිනි.

2011 දී 'ඉංග්‍රීසි සංචාරක රඟහල' සමඟින් තම වෘත්තීය වේදිකා නාට්‍ය දිවියට ඔහු පිවිසෙන්නේ Valere in Tartuffe වේදිකා නාට්‍යයේ රඟපාමිනි. එහි රඟපෑම වෙනුවෙන් ඔහු එම වසරේ හොඳම සම්භාව්‍ය වේදිකා රංගනයට හිමි 'ඉයන් චාර්ල්සන් රඟහල සම්මානය' සඳහා නිර්දේශ වී ය.

2015 දී ඔහු ලන්ඩන් වේදිකාවේ රංගගත වූ Peter Pan වේදිකා නාට්‍යයේ රඟපෑවේ ය. 2016 දී ඔහු 'රාජකීය ෂේක්ස්පියර් රඟහල'ට සම්බන්ධ වූ අතර, එහි දී චරිත ගණනාවකට රංගනයෙන් දායකත්වය ලබාදෙන්නට ඔහුට හැකි වී ය.

ඔහු රඟපෑ Puck in A Midsummer Nightzs Dream වේදිකා නාට්‍යය රූපවාහිනි චිත්‍රපටයක් සඳහා අනුවර්තනය කරන ලද අතර, එය BBC රූපවාහිනිය සේවය ඔස්සේ විකාශය වී ය. තව ද, 'රාජකීය ෂේක්ස්පියර් රඟහල' නිෂ්පාදනය කළ වේදිකා නාට්‍ය වන Cymbeline හි පොස්තමියුස් ලෙසත්, Hamlet නාට්‍යයේ හොරාෂියෝ ලෙසත් ඔහු චරිත නිරූපනය කළේ ය.

2011 සිට මේ දක්වා වේදිකා නාට්‍ය 08 කට රංගනයෙන් දායක වී ඇති හිරාන් අබේසේකර 2018 දී සුප්‍රකට Hulu රූපවාහිනි කතා මාලාවේ Find Me in Paris හි පෙනී සිටීමට පටන් ගත් අතර, 2019 දක්වා එහි 'ඩෑෂ් කෑන්'ගේ චරිතය නිරූපණය කළේ ය. ඔහු 2019 වසරේ ලොලිටා චක්‍රබාර්ති විසින් අනුවර්තනය කරන ලද Life of Pi නාට්‍යයේ මංගල දර්ශනයේ පයි පටෙල් ලෙස රඟපෑ අතර, ඒ සඳහා ඔහු 'එක්සත් රාජධානියේ රඟහල' සම්මානය දිනා ගත්තේ ය. 2021 දී එම නාට්‍යය 'වෙස්ට් එන්ඩ්' රඟහල වෙත මාරු වූ විට ඔහු නැවත එම චරිතයට පිවිසි අතර, එහි දී ඔහු දැක්වූ විශිෂ්ට රංගන දායකත්වය වෙනුවෙන් මෙවර හොඳම නළුවාට හිමි 'ඔලිවියර් සම්මානය' දිනා ගැනීමට ඔහුට හැකි වී ය.

මීට අමතරව, Lion in the Tent කෙටි චිත්‍රපටයටත්, Midsummer Nightzs Dream රූපවාහිනි සිනමාපටයටත්, Supervized සිනමාපටයටත් ඔහු රංගනයෙන් දායක වී තිබේ. ශ්‍රී ලාංකීය රංගන ශිල්පියකු ලෙස 2022 'ඔලිවියර්' සම්මානය දිනාගනිමින් ඔහු අප රටට අත්කර දුන් කීර්තිය නාට්‍යලෝලීන් වන අප බෙහෙවින් අගය කර සිටිමු.


● අනුර බී. සෙනෙවිරත්න

# කවිමිහිර

## පිළිරුව

### කුමාර හෙට්ටිආරච්චි

කෞතුකාගාරයට
අපි සෙමින් ඇතුළු වෙමු

මා දුව ද මා පුතු ද මා බිරිඳ
මා ඉදිරියෙන් සෙමින් පිය නඟති

කෞතුකාගාරයෙහි
මැදිරියෙන් මැදිරියට
සන්සුන්ව ඇවිද යමු
පැරණි ඉපැරණි මහ උරුමයක
රුව ගුණ ද තේජස ද විඳ ගනිමු

සිහසුන ද අසිපත් ද තුවක්කු ද අබරණ ද
සමීප ව සමීප ව කුහුල් දෑසින් දකිමු

එක් වර ම
විපිළිසර වී සැණින් නතර වෙමි
සියොළඟ ම හිරිවැටී ගල් ගැහෙමි

උස වීදුරු කුටියක් තුළ
කිරිගරුඬ කාන්තා පිළිරුවකි
මා දිහා බලාගෙන කට කොනින් සිනාසෙන

ඈ සුරත රිදීවන් අසිපතකි
ගෙල වටා දිදුලනා මුතුපොටකි
හිනාවෙන කොට සුමුදු දෙකම්මුල් වල ගැසෙයි
ඒ උපන් ලප දෙක ද එහෙම්ම ම

සොඳුරු සරසවි බිමේ
දෑත් පටලා එකට ඇවිද ගිය
මේ මගේ පෙම්වතිය ම ය

මේ කිසිත් නොදන්නා
දරු දෙදෙන හා බිරිඳ සිත් තොසින්
මේ රුවෙහි හැඩ බලති

ඈ අතෙහි අසිපතක් ඇති බැවින්
දං ගෙඩිය මතක් වී
මම හනික ඉවත යමි

කුමාර හෙට්ටිආරච්චි 80 දශකයේ දී කාව්‍යකරණයට පිවිස අද දක්වා ම දශක හතරකට ආසන්න කාලයක් පුරා සක්‍රීයව නිර්මාණකරණයෙහි නිරතව සිටින සම්මානිත කවියා ය. 1985 දී සක්මන් මළුව කාව්‍ය සංග්‍රහය පළ කරන ඔහු, 2021 දී ඔහුගේ නවතම පද්‍ය කාව්‍ය සංග්‍රහය, දූරියන් ගහක් යට හද්‍ර කල්පය ගෙවමි නමින් පළ කොට සිටී. ඉහත නිර්මාණය එම කවි එකතුවෙන් උපුටා ගත්තකි. ඉතා වේගයෙන් කවි ලියන කුමාර හෙට්ටිආරච්චි 1985 සිට අද දක්වා විරචිත කාව්‍ය සංග්‍රහ සංඛ්‍යාව දහනවයකි. ප්‍රකාශිත කාව්‍ය සංග්‍රහ මෙන්ම ඔහු විසින් Face Book කවියට නිරන්තරයෙන් ම එක් කරනු ලබන කාව්‍ය නිර්මාණ අසීමිත ය. මෑත කාලයේ පාඨක අපට රස විඳින්නට ලැබුණු බහුතර කාව්‍ය තුළ සමකාලීන සමාජ හා දේශපාලන විඥානය ගැබ් ව තිබුණු බව සිහි වේ. ඊට අමතර ව ඔහුගේ කවියෙන් නිරතුරුව ම විශද වන උත්ප්‍රාසය ද කුමාර කවියෙහි අනන්‍ය ලක්ෂණයක් ලෙස කැපී පෙනෙන බව කිව යුතු ය.

නිර්මාණ කාර්යයෙහි දී අනුභූතිය ප්‍රමුඛ වන බව පැවසෙතත් එහි ස්වරූපය හෙවත් ආකෘතිය ද වැදගත් බව කියවේ. වඩා වැදගත් වන්නේ අනුභූතිය හෙවත් අන්තර්ගතය ද නොවේ නම් ස්වරූපය ද යන්න විවාදාත්මක ය. එහෙත් අනුභූතිය හෝ ආකෘතිය කෙතරම් ප්‍රබල වූවත් අපූර්ව ගුණයෙන් විහීන නිර්මාණයක් රසික පාඨක හදවතට සමීප නොවන අතර පාඨක හද කම්පනයට පත්කිරීමට ද අපොහොසත් වේ. පිළිරුව නම් වූ ඉහත නිර්මාණය සඳහා කවියා විසින් තෝරා ගෙන ඇති අනුභූතිය නිසැක වශයෙන් ම අපූර්ව ගුණයෙන් යුක්ත ය. අපූර්ව වූ පමණින් ම එය පරිසමාප්ත කලාත්මක නිර්මාණයක් නොවන බව අපගේ අත්දැකීමයි. අපූර්ව ගුණයෙන් හෙබි අත්දැකීම කවියාගේ පරිකල්පනයෙන් අලංකාරවත් වූ කල් හි පරිසමාප්ත කලාත්මක නිර්මාණයක් බවට පත්වනු දක්නට හැකි ය. පිළිරුව නම් වූ ඉහත නිර්මාණය කුමාර හෙට්ටිආරච්චි කවියා ගේ අනන්‍ය ලක්ෂණ පෙන්වන නිර්මාණයක් ලෙස හැඳින්විය නොහැකි ය. එහෙත් කවිතාවෙන් පිරිපුන් නිර්මාණයක් බව නිසැකව ම කිව හැකි ය. මේ නිර්මාණය සඳහා ප්‍රස්තුත අනුභූතිය කුමක් ද? මතුපිටින් පෙනෙන්නේ ඉතා සරල සිදුවීමකි. එහෙත් ඊට යටින් දිවෙන්නේ ජීවිතය පිළිබඳ විවරණය වන, පුද්ගල සිතක හට ගන්නා සංකීර්ණ මනෝ භාවයක් පිළිබඳ ගැටුමක තතු ය. නිර්මාණයෙහි කථකයා ඔහුගේ බිරිඳ, දුව හා පුතු සමග කෞතුකාගාරයක් නැරඹීමට යති.කෞතුකාගාරයක නැරඹීමට තබා ඇති කෞතුක වස්තූන් පිළිබඳ අපූරු චිත්‍රයක් නිර්මාණය කරනු ලබන කවියාගේ හදවත තිග ැස්මකට ලක් වූ කෞතුක භාණ්ඩයක් ඔස්සේ නිර්මාණය අපූර්ව ගුණයෙන් යුතු කවියක් බවට පත් වේ. කථකයා හා පවුලේ සෙසු පිරිස දකින කෞතුක වස්තු මොනවා ද?

**කෞතුකාගාරයෙහි**
**මැදිරියෙන් මැදිරියට**
**සන්සුන් ව ඇවිද යමු**
**පැරණි ඉපැරණි මහ උරුමයක**
**රුව ගුණ ද තේජස ද විඳ ගනිමු**
**සිහසුන ද අසිපත් ද තුවක්කු ද අබරණ ද**
**සමීප ව සමීප ව කුහුල් දෑසින් දකිමු**

ඔවුහු සන්සුන් ව කුහුල් සිතින් පැරණි ඉපැරණි උරුමය කියාපානා සිහසුන්, අසිපත්, තුවක්කු හා අබරණ නරඹති. කෞතුකාගාර චාරිකාවක සාමාන්‍ය ස්වභාවය එය නොවෙද? එහෙත් ඒ ස්වභාවයෙන් ඔබ්බට ගිය සිත කැලඹීමකට කථකයා පත්වනු අපි දකිමු.

**එක් වර ම**
**විපිළිසර වී සැණින් නතර වෙමි**
**සියොළඟ ම හිරිවැටී ගල් ගැහෙමි**
**උස වීදුරු කුටියක් තුළ**
**කිරිගරුඬ කාන්තා පිළිරුවකි**
**මා දිහා බලාගෙන කට කොනින් සිනාසෙන**

කෞතුකාගාරයක වීදුරු කුටි තුළ නෙක පිළිරූ දක්නට ලැබීම අරුමයක් නොවේ. එහෙත් කට කොනින් සිනාසෙන කාන්තා පිළිරුවක් දැකීම නම් අරුමයක් නොවන්නෙ ද? කවියා එම කාන්තාවගේ රූ සොබාව අපූරු කාව්‍ය සංකල්ප රූපයක් ලෙස නිර්මාණය කරයි.

**ඈ සුරත රිදීවන් අසිපතකි**
**ගෙල වටා දිදුලනා මුතු පොටකි**
**හිනාවෙන කොට සුමුදු දෙකම්මුල් වල ගැසෙයි**
**ඒ උපන් ලප දෙක ද එහෙම්ම ම**

සිනාසෙන කාන්තා පිළිරුව සැබවින් ම රූමත් ය. ගෙල වටා දිදුලන මුතු පොට, සිනාසෙන කල වල ගැසෙනා දෙකම්මුල, උපන් ලප දෙක පෙර සේ ම. එහෙත් වෙනසකට ඇත්තේ ආ සුරත රිදීවන් අසිපතක් වීම ය. කථකයා මේ දකින්නේ මායාවක් ද? ඔහු සිත එක් වරම අතීත මතකයට දිව යයි. ඔහු ඉදිරියේ මේ සිටින්නේ එදා සොඳුරු සරසවි බිමෙහි දෑත් පටලා ඇවිද ගිය ඔහුගේ පෙම්වතිය ම නොවෙද? ඔහු සිත වික්ෂිප්තවන්නේ කිමද? වීදුරු කුටියක සිටින පිළිමයක් දුටු සැණින් ඔහු සිත බියට පත්වූයේ ඔහු විසින් අත් හළ පෙම්වතිය ඈ වීම නිසාද? කථකයා දැන් දෙදරු පියෙකි. ඔඅහු සිත කැලඹුම ඔවුන් දකීද? බිරිඳ දරුවන් ඔහුගේ සිත කැලඹුම නොදැන කාන්තා පිළිරුවෙහි හැඩ බලනු ඔහු දකී. සරසවි ප්‍රේමයේ බිඳුණු නටබුන් අතරින් එක්වර මතු වූ මේ රුව දැකීමෙන් ඔහු කෙතරම් සසල් වී ද යන්න කවියා පවසන'යුරු බලන්න." විපිළිසර වී සැණින් නතර වෙමි - සියොළඟ ම හිරිවැටී ගල් ගැහෙමි" කථකයා අප්‍රාණික පිළිරුවක් දැකීමෙන් බියට පත්වන්නේ එහි සිටින්නී ඔහුගේ සරසවි පෙම්වතිය බව බිරිඳ හා දරුවන් දැනගනීවි යන බියෙන් පමණක් ද? කවියා කථකයාගේ බියපත් චංචල සිත හා ඔහු වරදකරුවකු ය යන හැඟීමෙන් මඬනා ලද්දකු බව පැවසීමට භාවිත කොට ගත් සංකල්ප රූප කවියාගේ ප්‍රතිභාව පෙන්වයි.

**ඈ අතෙහි අසිපතක් ඇති බැවින්**
**දං ගෙඩිය මතක් වී**
**මම හනික ඉවත යමි**

සරසවියේ දී ඔහු අතින් සිදු වූ වරදට ඈ ඔහුට දඬුවම් දෙන්නී ද යන බිය ඔහු සිත වේ. ඈ අතැති අසිපත සමග දංගෙඩිය ඔහුට සිහිවන්නේ එබැවිනි. ඔහු බිරිඳ හා දරුවන් මේ පුවත දැන ගනීවි ද යන්න ඔහු ගේ සිත සසල වීමේ අනෙක් හේතුව යි. පිළිරුවක් හමුවේ වුව සැබෑ ජීවන අත්දැකීමකට මුහුණ පාන පුද්ගලයකුගේ සංකීර්ණ මනෝභාව ප්‍රබලව නිර්මාණය කිරීමට කවියා සමත් වේ. මායාමය රුවක් වුව අතීතාවර්ජනයක් ඔස්සේ සිතක් කලඹන ආකාරය කවියා අපූරුවට නිර්මාණය කිරීමට සමත් ව සිටී.

● බුද්ධදාස ගලප්පත්ති
bgalaps@gmail.com

## අහස් මං තීරුවක

නෙතු පැහැර සිතු අතුළ මුදු කැටි
වලා පෙළ සුදු සුසුදු පුළුනෙව්
කඩ කඩා අද හෙටම වැතිරෙන
අනාගතයට තබන පියවර
දෙපා නොරිදන නවමු ම තීරු

ඇරී නෙතු දහසම නොතුටු හිත
සුරඟනන් පිරිවරා සක් දෙව්
සැලෙන නිතඹින් සලිත පිරිපුන්
හංසයින් පිහිනනා නුඹ ගැබ
වරෙව් දෙව් මග මෙන්න ඇස් දොර

මලෙක පහනෙකැ තබා කෙළවර
මතුළ සුපැතුම් දිනෙක මතු භව
අදම යා යුතු හැමට අවසර
එනුව සබඳිනි නොහැර තත්පර
සදෙව් ලොවටම දිගුව ළඟ ළඟ

ඉහළ මුදුනට මෙතෙක් අත් බැඳ
පැතු මග සුර කුමර කුමරියො
උනුන් හා බැඳි බැඳී මනහර
වඩිමු පහලින් දුලන සෑ කොත

● රණතුංග මල්ලවආරච්චි

## රතු එරබදු මල් පිපේවි

මගේ රටට
වැළඳී ඇත
සුව කරනට බැරි ලෙඩ

දන් එළියට වඩිනු පෙනේ
නිරිඳුනගේ වැඩකිඩ

ගෙවනු හැකිද
අපට තවත්
අනුන්ගෙ වරදට දඩ

ගාලු මුවදොරත්
තිබුණා
අරමුණකට ඉඩකඩ

රතු එරබදු පිපෙයි පුතේ
මතු දවසක
දොරකඩ

● දඹේගොඩ ජිනදාස

## අරගලය

2500 ක අපේ ඉතිහාසය
විසුණු කරා පරගැති පාලන
ජාතිය ආගම පාවා දී අද
දේශපාලනේ ජරා ජීර්ණය

රාජකාරියට යන එක එන එක
එකත් මග දූකක්ය හැමහට
අව්වට වේලෙන වැස්සට හේදෙන
අවිහිංසාවාදී අපේ මේ ජීවිත

අරගල කරනට හැර විසඳුම කිම
නූගත් වයසක පාලනයට එරෙහිව
අද හිටගත්තොත් හැම එකලෙස
හෙටවත් හැක අපට එළිය දකින්නට

ආදර සෙනෙහස දයාව නැත්තේ
ක්‍රෝධය වෛරය සදහට ඇත්තේ
මනුස්සකම හැම රජ විය යුත්තේ
එවිටයි මව් රට දිනවිය හැක්කේ

එකා ලෙසින් හැම එක් වී ජයගමු
කිසි ලෙසකින්වත් භේද නොවීඉමු
අප ශක්තිය අපිහඳුනාගෙන ඉමු
එකමුතුවෙන් අපි අප රට දිනවමු

● මල්මී රාජපක්ෂ

## නුඹ සහ මම

මම මලක්
නිම් නොවන
ගිම් දෙවන
අහසකට
සෙත් පතන

නුඹ රළක්
නිරන්තර
ඇවිත් යන
දුක් දරන
වෙරළකට
වග නොවන


● චූලා දමයන්ති හේමමාලා

## ඉල්ලීම්

ගෑස්
ලැබිලත්
කඳුළු
ඇස්වල

● හේමපාල පෙරුම්බුලි

## විදුලිවැට ළඟදී ය



වීරගස් - මණ්ඩියේ අලි මිනිස් කොලහලෙන්
ගල් ගැසුණු කටු පතොක් කදුරු ගස් පීරමින්
විදුලිවැට ළඟට විත්, දෙවසරක ඇවෑමෙන්
පොඩි සිඤ්ඤො මස්සිනේ, ඔබේ රුව සොයන්නෙමි

මොකක්දෝ වෛරයක් පපුව යට හිර කරන්
මෙතන මේ එරමිණිය ගාල ළඟ සැඟවිලා
වලිග කොට හස්තියා තළා පොඩි කර දමූ
කෝටු අත පය ඔබේ මට මැවී පෙනෙන්නෙය

අඹන්පොළ පොළට ගොස් බව බෝග විකුණලා
මාසයක් පැටවුන්ට කන්න දේවල් අරන්
නයින්ටියෙ උඹ ආවෙ මටත් සැලියුට් ගහන්
නඟාගේ මඟුලටත් මාල මුදු අරගෙනයි

ගල්අරඹ කෙළවරේ වනස්පති සංහිඳේ
කොළ අත්ත එල්ලලා බැන්ද උඹෙ අත් කඩා
ගිජින්දා සිද්ධ කළ අරෝවෙන් එළි වුණේ
සීවරං දෙවියන්ගෙ බැරිකම ද? මස්සිනේ,

උඹේ මළකඳ තිබුණු බුරුත ගහ යට ඉඳන්
නියගලා මල් වැලක් හේබාපු කොළ හළා
පණ අදින ඇස්වලින් නිහඬවම කියන්නේ
කෙදිනක දි හෝ නැවත මලක් උපදින බවයි


මේ සැරෙත් පන්සලේ පින්කමක් තියෙනවා
පොඩි එවුන් උඹ ලියූ ගී නළුව කරනවා
අපේ හාමුදුරුවොත් උඹේ හොඳ කියනවා
අපට පෙන්නුවෙ නැතත් ඒ ඇසුත් තෙමෙනවා

● ජේ. ජේ. වික්‍රමසේන

# කවි මුතු

සංස්කරණය - රුවන් ජයවර්ධන

## (අ) හිමි



කරන්නම දෙයක් නැති තැන
මා පතා රඳුණු නුඹ ගැන
ආදරේ මෙපමණයි නොකියමි
චන්න කින්නරී
නොකළාට ප්‍රේම කම්නැත
මෙමට යළි හැරී

ළඟ ඉඳන් දුරින් සැනහෙන
අහිමිකම් බලා හිනැහෙන
මහ විසල් හදක් මා සතු
නුඹට පේ වෙවී
ජීවිතේ තුඩින් අරගෙන
හෙට උදෙත් සිඹියි නළලත
ආදරේ අරුත එහෙමලු
අහිමි සුන්දරී

යම් දිනක නොයා බැරි තැන
පිළියමක් නොවුණු තැන වෙන
මා නොවන දිනක අසලක
යන්න යළි හැරී
කරන්නම දෙයක් නැති කල
මා ළඟින් උන්නු වග නුඹ
මතකයත් වටී අපමණ
රකිමි පණ සරී

● දීපිකා පෙරේරා

## කෑම...

දෙස් - විදෙස් නා නා විධ කෑම
රිසි ලෙස - ඔබට
ජීර්ණය වන සීමාවේ සිට
තෝරා ගැනීමට
ඔබට පූර්ණ අයිතිය ඇත...

වැරදී ඉඳුල් කළැයි,
නොතැවෙන්න,
වරද නීතිගත නොකර ඉන් මිදෙන්න...

ලබා උපන් හැටි යැයි කියා
නියමිත නැත,
ඔබට 'කටු' කන්න

දැනුණ මොහොතේම
නැගෙන්න...
ඔබට නීතිමය ඉඩක් ඇත...
මිදෙන්න....

මදක් නවතින්න....

මේ සියල්ල.....

තුන්වැනියෙකුට පෙර
සිතන්න.....

● ඒ. ඒ. බදුර්නිශා

## කල්ලා

මම කල්ලෙක්:
රෑ අඳුර මෙන් කළු!
මගේ අප්‍රිකාවේ පත්ල මෙන් කළු!

මම වහලෙක්ව උන්නෙමි:
සීසර් ඔහුගේ 'එළිපත්ත සුද්ද කරපන්' යැයි
මට කීය.
වොෂිංටන්ගේ බූට් සපත්තු
ඔප දැමුවේ මාය.

මම කම්කරුවෙක්ව උන්නෙමි:
පිරමීඩ නැගිට්වේ මගේ දෑතිනි
වූල්වර්ත් ගොඩනැගිල්ල තැනුමට
මම බදාම ඇනුවෙමි

මම ගායකයෙක්ව උන්නෙමි:
අප්‍රිකාවේ සිට ජෝර්ජියාව දක්වා
සියලු මංමාවත්හි මම මගේ
සෝ ගී රැගෙන ආවෙමි.
ඉන් මම සංගීතයක් නිමැවූවෙමි

මම ගොදුරක්ව උන්නෙමි:
බෙල්ජියානුවෝ කොංගෝවේදී
මගේ දෑත් කපා දැමූහ.
මිසිසිපිහිදී ඔවුහු තවම මට
නඩු නැතිව දඬුවම් කරත්.

මම කල්ලෙක්:
රෑ අඳුර මෙන් කළු!
මගේ අප්‍රිකාවේ පත්ල මෙන් කළු!

(කළු අමෙරිකානු කවියකු වූ ලැන්ග්ස්ටන් හියුස්ගේ 'Negro' නමැති කවියේ අනුවාදයකි)

● ප්‍රභාත් චින්තක මීගොඩගේ

## සෙනෙහස තවම ඇත

තබා යන්නෙපා මෙහි
අයිති හැමදේම ගෙන යන්න
මිතුරන් කියයි දෑත අල්ලා ගෙනම
සහස් දුම්රියේ නැග බලයි
හැම දෙනා දෙස

ඇය කඳුළු වගුරන්නී
ඇදී යන දුම්රියේ තම හදවතද
ඇදී යනු දුනෙද්දී
ඒ දෑස දකින්නට තව කාලයක් යාවි
වෙන් වෙන්න මේ ලෙසට
කිමද අප හමුවුණේ

දම්මි සුමිතුරු අබේ කොඳුරයි
මේ චොකලට් පෙත්ත
කඳුළු පිරි දෑසින් ඇය බලයි
මල් වත්තෙ තුරු ගොමුවෙ
සිනාසුනු දම්මි හා සහස් ගැන
සුසුමන් පිටකරන අබේ

අපි යමු
ඈ බලයි. ඇදී යන දුම්රිය දිහා
සහස් නැහැ දකින්නට
අද නෙත් ඇත යන දුම්රිය පමණි
මිතුරු - මිතුරියන් කැළ
ඇය වටා පවුරු බැඳ
ගෙන ගියත් හැමදේම
සෙනෙහස තවම ඇත මා ළඟම

● කමලා ධර්මලතා ජයසූරිය

## කොහිද

ඉහිලුව දුක්
වසන් කළ.....
අම්මාගේ
කැඩපත

● එන්. ඩබ්. පී. ලාල්

## බක්මහා ගිනි දැල්

සිහල දමිළ
බක් මහා
අවුරුදු කුමරියගේ
සොඳුරු
ගමන් මග
වළකන,
නිවී නිවී
තවම
ඇවිලෙන,
පාට
පාට
ගිනිදැල්....

නීතිඥ කීර්ති කපුවත්ත

## ඒ එයාම ද?

ගොඩ ගැහුනු අතීතේ අබලි මැද
පෙනෙන නොපෙනෙන දෑස් අතර වැද
ඉරි තැලුනු රාමුවක සිරගතව
කිරි දසන් විදා තාමත් හිනා නගන්නේ....

හොවා මා උකුල මත - පොවා සිප් සකලවිද
ඇත නුඹ සරන්නට පියාපත් සරි කෙරූ....

විදා අත් - සිනා තත් අපේ හදවත් ඇතුලෙ
පුරවන්නට හෙට දිනට හීන වැල් හදා දුන්...

දයාබර - හිතේ බර සෙනෙහසින් නිමාකර
අම්මගෙයි මගෙයි හෙට දවස සුව කරන්නට
ඇත අහසට පැන්න අපෙ ලොවේ දිවාකර
අඩ නෙතට වහන් වී ගොහින් කොච්චර කල්ද?

ඉර හැරෙන තැපෑලෙන්
මහ ගෙදර උරුමයට අත තියා මතක් කළ
හිමි අතැර ගිය නැගනිගේ කරුමෙ
කරගහන්නේ කොහොම
සහෝදර ගති ඇත වසන් කළ
අත් බණුවෙ තිර පටින් කතා කළ හැම මොහොතෙ
අපේ අඩුපාඩු ගැන මෙනෙහි කළ

ගොඩ ගැහුනු අතීතේ අබලි මැද
පෙනෙන නොපෙනෙන දෑස් අතර වැද
ඉරිතැලුනු රාමුවක සිරගතව
කිරි දසන් විදා තාමත් හිනා නගන්නේ
ළමයින්ගේ අම්මේ
ඒ අපේ ලොකු පුතාමද?

● ජයන්ත නිමල්සිරි

